# ලොව්තුරු හුදකලාව

දන්කන්දේ ධම්මරතන හිමි

"සියලුම හිමිකම් ඇව්රිණි"

ප්‍රථම මුද්‍රණය 2007 වෙසක්

© දන්කන්දේ ධම්මරතන හිමි

## කර්තෘගේ වෙනත් පොත්

| | |
|---|---|
| 1. ආනාපාන සති භාවනාව | නොමිලේ බෙදා දෙන ලදී |
| 2. කඨිනානිශංස | නොමිලේ බෙදා දෙන ලදී |
| 3. සෝවාන් වීමට නම් | නොමිලේ බෙදා දෙන ලදී |
| 4. උපේක්ෂාවෙන් නිවනට | නොමිලේ බෙදා දෙන ලදී |
| 5. නිවන ඔබ ළඟම ය | නොමිලේ බෙදා දෙන ලදී |
| 6. නිවන ඔබටත් | නොමිලේ බෙදා දෙන ලදී |
| 7. ශූන්‍යතාවය හා නිවන | නොමිලේ බෙදා දෙන ලදී |
| 8. නිවනට ඒකායන මාර්ගයක් | - - |

මීළඟ පොත :

මෙත් සිතින් නිවන් දකිමු

මෙම පොත් මුද්‍රණය කර නොමිලේ බෙදා හැරීමට කැමැති කෙනකුට හෝ ඉදිරියේදී පළ කරනු ලබන දහම් පොත් සඳහා අනුග්‍රහය දැක්වීමට කැමැති කෙනකුට විමසීම් කළ හැකි ය.

**දුරකථන :** **(011) 2 843 062** (අනුරාධ මයා)
**060 2 140 837** (ධම්මරතන හිමි)

## කාරුණික ඉල්ලීමයි

ප්‍රායෝගික අත්දැකීම් පාදක කරගෙන කළ අපගේ ධර්ම දේශනා කැසට් පටි, සංයුක්ත තැටි හා මුද්‍රිත පොත් හෝ මුද්‍රිත නො වූ අත්පිටපත් ඒ අයුරින් ම තමන් ගේ දේ ලෙසින් කියන-ලියන-වාදනය වන අවස්ථා ඇත. ධර්මය පිළිබඳ මසුරු කමක් මා හට නො මැත ; එවැනි දේ ගැන විරෝධයක් ද නැත. එහෙත් එසේ කරන අය ගැන, කියන-අසන අය "වරදවා" තේරුම් ගන්නා බැවින්, එවැනි උපුටා ගැනීමක් කරන විට ඒ බව සඳහන් කරන්නේ නම්, අන් අය මුලාවට පත් නො වන බව කරුණාවෙන් සළකන්න.

# පෙරවදන

සුත්ත නිපාතයේ මෙන් ම අපදාන පාළියේ දැක්වෙන 'ඛග්ග විසාණ සූත්‍රය' විස්තර කරමින් ලියැවුණු 'ලොව්තුරු හුදකලාව' නමින් පළ කෙරෙන මෙම පොත මුලින් ම ලියන ලද්දේ මා ආරණ්‍යයක සිටි කාලයේ දී එහි සිටි 'විනයවංශ' නම් වූ හාමුදුරු කෙනෙකුන්ගේ ඉල්ලීම පරිදි ඔහුට ශීලවන්ත භික්ෂු ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කරුණුත්, විශේෂයෙන් ම නිවන් අවබෝධ කර ගැනීමට අවශ්‍ය කරුණුත් පෙන්වා දීමේ අදහසිනි. දැනට අවුරුදු 16 කට පමණ උඩ දී එදා ලිවූ එහි භාෂා ශෛලිය එතරම් සුගම්‍ය නො වේ.

මෙහි අත් පිටපත කියවූ ගිහි පිංවතුන් භාවනාවෙන් ඉතා සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට එහි කරුණු බෙහෙවින් ප්‍රයෝජනවත් වූ බව අපට දැක්වූ අවස්ථා ඇති බැවිනුත්, මෙය පොතක් වශයෙන් මුද්‍රණය කිරීමට සමහර අය අපගෙන් ඉල්ලීම් කළ බැවිනුත්, මෙහි දැක්වෙන ධර්ම කරුණු භාවනාවෙන් උසස් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා තවත් බොහෝ දෙනකුට ප්‍රයෝජනවත් වන බැවිනුත්, නිවන් ලැබීමට අවංකවම උත්සාහ ගන්නා අයට අතහිත දීමේ කරුණාධ්‍යාශයෙන්, මුල් පිටපත ලියා තිබූ අයුරින් ම මෙම පොත පළ කිරීමට අදහස් කළෙමි.

මුල් පිටපතේ සඳහන් වූ කෙටියෙන් ලියා තිබූ ධර්ම පාඨයන් ද, සාමාන්‍ය පාඨකයා නො දන්නවා ඇතැයි සිතූ සමහර ධර්ම කරුණු ද කෙටියෙන් විස්තර කර දැක්වීම සඳහා මෙම පොතේ අගට උප ග්‍රන්ථයක් එක් කෙළෙමි. එසේම තේරුම් ගත නොහැකි යැයි සිතූ වචනවල සරල අදහස ද ඒ ඒ පිටුවල යටින් දැක්වීමි. **මෙම පොත කියවීමේ දී, ගාථා අනුපිළිවෙලට හා ධර්ම කරුණු ලියා ඇති අනුපිළිවෙලට ලියා ඇති උපග්‍රන්ථය බැලීම ද ප්‍රයෝජනවත් වනු ඇත.**

මෙම පොතෙන් ඔබට ප්‍රයෝජන ගත හැක්කේ එය කියවා එහි ධර්ම කරුණු වටහා ගැනීමෙන් හෝ මතක තබා ගැනීමෙන් පමණක් නො වේ. එහි ඇති කරුණු තමාට ම ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ වී, ඒවා තම ගැඹුරු සිතට පෙනී යමින් කියවීම අත්‍යවශ්‍යය ය.

මෙම පොත මුද්‍රණය කිරීමට ආධාර කළ අය ගේ නාම ලේඛනයක් පොතේ කෙළවර දක්වා ඇත.

මෙම කුශල ශක්තියෙන් ඒ සැම දෙනාට ම නිදුක් බව, නිරෝගී බව, සුවපත් බව ලැබේවා ! නිවන් සුවම අත් වේවා !!

මෙම පොතෙහි ටයිප් සෙටිං කර දුන් ලුශාන්ති නිල්මිණී ලියනගේ මහත්මියටත්, මෙය මුද්‍රණය කළ ඩයෝර්ග් මුද්‍රණාලයේ සසංක ලියනගේ මහතා ඇතුළු සැමටත් නිවන් සුව ම අත්වේවා !

දන්කන්දේ ධම්මරතන හිමි
දුරකථනය : 060 2 140 837
2007-04-20

# පිවිසුම

අපදාන පාළියට අනුව, ඛග්ග විසාණ සූත්‍රයේ ගාථාවන් දේශනා කළේ ආනන්ද ස්වාමීන් වහන්සේ විසින් පසේබුදුවරුන් ගේ අභිනීහාරයන් (පුරන ලද පාරමී ආදී විස්තර) ගැන විමසූ විට දී ය. එවිට බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

**සබ්බම්හි ලෝකම්හි මමං ඨපෙත්වා**
**පච්චේක බුද්ධේහි සමෝ'ව නත්ථි**
**තේසං ඉමං වණ්ණ පදේසමත්තං**
**වක්ඛාමහං සාධු මහා මුනීනං**

සකල ලෝකයෙහි ම, මා හැර, පසේ බුදුවරුන් හා සමාන අන් කෙනකු නැත. ඒ පසේබුදුවරුන් ගේ ගුණස්කන්ධයෙන් ස්වල්ප මාත්‍රයක් පමණක් දේශනා කරමි.

**පච්චේක බුද්ධානං සමාගතානං**
**පරම්පරා ව්‍යාකරණානි යානි**
**ආදීනවෝ යංච විරාග වත්ථු**
**යථාච බෝධිං අනුපාපුණිංසු**

පසේ බුද්ධත්වයට පත් ඒ උතුමන් විසින් දේශිත කාමයන් පිළිබඳව ආදීනව ද, නො ඇල්ම විරාගය දනවන කරුණු ද ඇතුළත් යම් ප්‍රකාශයන් වේ නම් ඒවා ද, උන්වහන්සේලා පසේ බුද්ධත්වයට පත් වූ ආකාරය ද කියමි. (එය අසත්වා).

**යේ පුබ්බ බුද්ධේසු කතාධිකාරා**
**අලද්ධ මොක්ඛා ජින සාසනේසු**
**තේනේව සංවේග මුඛේන ධීරා**
**විනාපි බුද්ධෙහි සුතික්ඛ පඤ්ඤා**
**ආරම්මණේනාපි පරිත්තකේන**
**පච්චේක බෝධිං අනුපාපුණන්ති**

පෙර බුදුවරුන් වෙත කරන ලද මහත් පුණ්‍ය සම්භාර ඇති, ඉතා සියුම් තීක්ෂණ ප්‍රඥාවෙන් සමන්නාගත, ඒ ප්‍රඥාවන්තයෝ ඉතා සුළු අරමුණක් හෝ විදර්ශනාවට නගා පසේබුද්ධත්වයට පත්වෙත්.

**සරාග වත්ථූසු විරාග සඤ්ඤී**
**රත්තම්හි ලෝකම්හි විරත්ත චිත්තා**
**හිත්වා පපඤ්චං ජිත ඵන්දනානි**
**තථෙව බෝධිං අනුපාපුණිංසු**

සරාගී අරමුණු කෙරෙහි විරාග සංඥා ඇති, ඇලෙන බැඳෙන ලෝකයෙහි නො ඇලෙන, තණ්හා දිට්ඨි මාන ආදී ප්‍රපඤ්ච ධර්මයන් නසා, විවිධ දෘෂ්ටි චලනයන් දිනා ඔවුහු පසේ බුද්ධත්වයට පත් වූහ.

**විසුද්ධ සීලා සුවිසුද්ධ පඤ්ඤා**
**සමාහිතා ජාගරියානුයුත්තා**
**විපස්සකා ධම්ම විසේසදස්සී**
**මග්ගංග බොජ්ඣංග ගතේ විජඤ්ඤා**
**සුඤ්ඤතප්පණිහිතංචානිමිත්තං**
**ආසේවයිත්වා ජිනසාසනම්හි**
**යේ සාවකත්තං න වජන්ති ධීරා**
**භවන්ති පච්චේක ජිනා සයම්භූ**

ඒ පසේබුදුවරු වෙසෙසින් පිරිසිදු සිල් ඇති, අති පරිසුද්ධ ප්‍රඥාවන් ඇති, සමාහිත සිත් ඇති, ජාගරියානුයෝගයෙහි (නිදි වැරීමෙහි) යෙදුණු, විදර්ශනා වැඩූ, නව ලෝකෝත්තර ධර්මය මැනවින් දත්, බොජ්ඣංග ආදී ධර්මයන් මාර්ග අවස්ථාවන්හි දී ක්‍රියාත්මක වූ ආකාරය දන්නා, සුඤ්ඤත - අනිමිත්ත - අප්පණිහිත විමොක්ෂයන් භාවිතා කළ, තමා විසින් ම චතුරාර්ය සත්‍යයන් අවබෝධ කළ අය වෙති.

**සන්තින්ද්‍රියා සන්තමනා සමාධි**
**පච්චත්ත ගම්භීර මතප්පචාරා**
**දීපං පරත්ථං ඉධ විජ්ජලන්තා**
**පච්චේක බුද්ධා සතතච්චිතා'මේ**

සංසුන් ඉඳුරන් ඇති, සංසුන් සිත් ඇති, සමාධි සම්පන්න, තමා විසින් ම අවබෝධ කළ ගැඹුරු ප්‍රඥාවකින් යුතු, ලෝකයාට ද්වීපයක් බඳු වූ, මොලොව බැබලෙන්නා වූ ඒ පසේබුදුවරු සැමදා පුදනු ලද්දෝ වෙති.

**පහීණ සබ්බාවරණා ජනින්දා**
**ලෝකප්පදීපා ඝන කඤ්චනාභා**
**නිස්සංසයං ලෝක සුදක්ඛිණෙය්‍යා**
**පච්චේක බුද්ධා සතතච්චිතා'මේ**

සකල නීවරණයන් ප්‍රහීණ කරන ලද, ලෝකයාට ප්‍රදීපයක් බඳු වූ, ජනයන් ට මහෝත්තම පුරිෂ වූ, ඝන රත් පැහැයෙන් සෝභාසම්පන්න, නිසැකව ම ලෝකයා ගේ දක්ෂිණාවන් පිළිගැනීමට සුදුසු ශ්‍රේෂ්ඨ දක්ෂිණාර්හ වූ ඒ පසේබුදුවරු සැමදා පුදනු ලද්දෝ වෙති.

**මහන්තධම්මා බහුධම්ම කායා**
**චිත්තිස්සරා සබ්බ දුක්ඛෝඝ තිණ්ණා**
**උදග්ග චිත්තා පරමත්ථදස්සී**
**සීහෝපමා ඛග්ගවිසාණ කප්පෝ**

පුරන ලද මහත් වූ බෝධි සම්භාර ධර්ම ඇති, බොහෝ වූ ධර්ම කායකින් සමන්නාගත, චිත්තේශ්වර (සිතට අධිපති) වූ, සකල සංසාර ඕඝයන් තරණය කළ, නිරාමිස සොම්නසින් පිරුණු සිත් ඇති, පරමාර්ථ ධර්මයන් මැනවින් දන්නා ඒ පසේ බුදුවරු සිංහයන් වැනි වෙත් ; ඛගවේණ අඟක් වැනි වෙත්.

**සයමේව බුද්ධානං මහා ඉසීනං**
**සාධූනි වාක්‍යානි මධූංව බුද්දං**
**අනුත්තරං භේසජං පත්ථයන්තා**
**සුණාථ සබ්බේසු පසන්න චිත්තා**

පරෝපදේශ රහිතව තමා විසින් ම චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කර ගත්, ඒ මහා ඍෂි පසේ බුදුවරුන් ගේ මිහිරි වූ උදාන වාක්‍යයෝ මී වදයක් සේ ම මිහිරි වෙත්. **අනුත්තර නිර්වාණ**

**සඞ්ඛ්‍යාත ඖෂධය ප්‍රාර්ථනය කරන අය මනාකොට ප්‍රසන්න සිතින් එය අසත්වා.**

මෙම කරුණු දේශනා කිරීමෙන් පසුව දේශිත ගාථා 41 ක් ඛග්ගවිසාණ සූත්‍රයේ දක් වේ. එම ගාථාවන්හි සමහර වචනවල අර්ථ විවරණයන් දක්වීමේ දී චූල නිද්දේසය ද, එසේම ගාථා හා සබැඳි නිදාන කථා හෝ වෙනත් ධර්ම කරුණු වලට අදාළ විස්තර කතන්දර දක්වීමේදී අට්ඨකථාව ද උපයෝගී කර ගතිමි. එහෙත් ප්‍රායෝගිකව විස්තර කරන ධර්ම කරුණු කිසිවක් කිසිම උපුටා ගැනීමකින් තොරව, සිත තුළින් ගලා ආ ප්‍රායෝගික ධර්මයන් පදනම් කරගෙන ම ලියා ඇත.

මෙම සූත්‍රයේ දක්වෙන ගාථා සියල්ල ම පසේ බුද්ධත්වයට පත් වීමෙන් පසුව, ඒ ඒ පසේ බුදුරජාණන් වහන්සේලා විසින් පළ කළ උදාන (ප්‍රීති) ගාථාවන් ය. එබැවින් එම ගාථාවල අර්ථය හා එම ගාථා තුළින් චතුරාර්ය සත්‍යය මතු වී එන ආකාරය සැබැවින් ම පෙනී යන්නේ නිවන් අවබෝධ කළ කෙනකුට පමණි. පසේ බුද්ධත්වයට පත්වීමට පෙර කරන ලද විදර්ශනාමය භාවනා මනසිකාර පාදක කරගෙන ඒ උදාන ගාථා ප්‍රකාශ කොට ඇත. එවැනි විදර්ශනාමය භාවනා මනසිකාර නානාවිධ ආකාරයෙන් විය හැකි වන අතර, ඒ අතුරෙන් අනුමාන වශයෙන් මෙවන් භාවනා මනසිකාර තුළින් චතුරාර්ය සත්‍යය අවබෝධ කරන්නට ඇතැයි අපට පෙනී ගිය ආකාර අතුරෙන් එක් ආකාරයක් පමණක් මෙම ගාථා විස්තර කිරීමේදී උපයෝගී කර ගතිමි. එහෙත් මුලදි ලියැවුණු ගාථා 15 ක දී පමණ එවැනි දීර්ඝ විස්තරයක් ලිවීමට දන දන වුවත් මැලි වුවත්, පසුව දක්වෙන ගාථා විස්තර කිරීමේදී, කියවන අය ගේ ප්‍රයෝජනය සඳහා එවැනි ප්‍රායෝගික විස්තරයක් දක්වීමට කරුණා පෙරදැරි සිතින් අදහස් කොට, ඒ අයුරින් ඒ ගාථා විස්තර කොට ලිවීමි.

මෙම පොතේ එවන් විස්තර වලදී සමහර විට වාක්‍යයක් වශයෙන් දක්වෙන්නේ එක් වචනයක් හෝ නැත්නම් වචන කිහිපයක් පමණක් විය හැකි ය. උදාහරණ වශයෙන් කාමාදීනව දක්වෙන විස්තරයකදී එක් එක් වචනය බැගින් දක්වෙන වචන රාශියක් දක්වා ඇත.[1]

1. පිටු 44 .......

මෙය හිස් වචන මාලාවක් නො වන අතර, ඒ එක් එක් වචනය තුළින් ගම්‍ය වන ගැඹුරු ප්‍රායෝගික අර්ථයන් ඇති බැවින් එය අවබෝධ කර ගන්න උත්සාහ ගන්න. (උප ග්‍රන්ථය ද බලන්න).

මෙම පොතෙහි එක් එක් ගාථාවක විස්තර වෙන් වෙන් වශයෙන් නොව, පොතේ ම ධර්ම කරුණු සමස්ථයක් වශයෙන් ගත් කල, සෝවාන්-සකෘදාගාමී-අනාගාමී-අරහත් යන සියළුම මාර්ග ඵලයන් අවබෝධ කර ගැනීමට උපකාර වන ඉතා ප්‍රයෝජනවත් ධර්ම කරුණු මෙහි අන්තර්ගත වන බව ඔබට පෙනී යනු නො අනුමාන ය.

යම් යම් මාර්ගඵල නො ලබාම, ලබා ඇතැ යි සිතා සිටිනා අධිමානී කෙනකුට වුවත්, තමා ගේ වැරැදි අවබෝධයන් දුරු කර ගැනීමට උපකාර වනු පිණිස, 'ප්‍රහීණ සංයෝජන ප්‍රත්‍යවේක්ෂාව' ගැන තරමක විස්තරයක් මුල් අත් පිටපතේ අවසානයේ ලියා තිබුණත්, එය මෙම පොතෙහි ගාථා 28 අවසානයේ දක්වා ඇත.

මෙම පොතෙහි ධර්ම කරුණු ඔබට ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ වන්නේ ඔබගේ ප්‍රඥාවේ මට්ටමට අනුව ය. ඔබේ ප්‍රඥාව වැඩි වන්නට වැඩි වන්නට, වැඩියෙන් වැඩියෙන් මෙහි ධර්ම කරුණු ගැඹුරින් ගැඹුරින් ඔබට අවබෝධ වනවා ඇත.

ඛග්ගවිසාණ සූත්‍රයේ දක්වෙන සෑම ගාථාවක් ම අවසන් වන්නේ **"ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ"** (ඛගවේණ අඟක් සේ එකලාව හැසිරේ) යන පදයෙනි. මෙම පොතේ "එකලාව හැසිරේ" යන්න විස්තර කර ඇත්තේ චූල නිද්දේස පාළියේ දක්වෙන විස්තරයන්ට අනුව ය. එම විස්තරය සමහර විට ඔබට එතරම් හොඳට අවබෝධ කරගත නො හැකි විය හැකි වුවත්, එය මෙම පොත කියවා ප්‍රයෝජනයක් ගැනීමට කිසිසේත් ම බාධාවක් නො වනු ඇත. ප්‍රායෝගික වශයෙන් "එකලාව හැසිරේ" යන්නෙහි අදහස, පහත සඳහන් විස්තරය හොඳින් කියවා අවබෝධ කර ගත හැකිය. (උප ග්‍රන්ථය ද බලන්න).

රහත් වූ කෙනකුට විමුත්ත සිතක් උදා වේ. එය මුළු විශ්වයත්, තමා ගේ පංචස්කන්ධ ලෝකයත්, නිවනත් සහිතව ඒ සියළුම සඞ්ඛත

අසඞ්ඛත ධර්ම අතහැරී ගිය නිදහස් දැනීම් මාත්‍රයකි. එම සිත කිසිම සංස්කාරයක නො එල්ලී අඛණ්ඩ ලෙස පවත්නා සියුම් දැනීමක් පමණකි. එම සිතට කිසිම අරමුණක් නැත. එය කිසිම දෙයක් හා බැඳී නැත. ශරීරයට දැනෙන කිසිම වේදනාවක් ඒ සිතට දැනෙන්නේ නැත ; ඒ කිසිම වේදනාවක් ඒ සිත ගණන් ගන්නේ ද නැත.

කිසිම රූපයක්, කිසිම ශබ්දයක්, කිසිම ගන්ධයක්, කිසිම රසයක්, කයට දැනෙන කිසිම දෙයක් හෝ මතු පිට සිතට දැනෙන කිසිවක් කෙරෙහි කිසිම සංඥාවක් එම සිතේ ඇතිවන්නේ නැත.

ආත්මය-අනාත්මය, ශුභය-අශුභය, කුශල්ය-අකුශල්ය, හොඳය-නරකය ආදී ද්වයතාවයන් කිසිවක් නො මැති එම සිත, සකල ධර්මයන්ගෙන් ම බැහැරව, නො බැඳී, විසංයුත්තව හුදකලාව තනිව තමන්ගේ පාඩුවේ ඔහේ පවත්නා නාම මාත්‍රයක් පමණි.

සියළුම ධර්මයන්ගෙන් නිදහස්ව කිසිවක් හා නො බැඳී පවත්නා ඒ සිත චේතෝ විමුත්තියකි.

එහි කිසිම අරමුණක් නැති නිසාත්, කිසිම අරමුණක නො එල්ලී පවතින නිසාත් එය "අනාරම්මණ චිත්තං" යනුවෙන් ද ; කිසිම ආකාරයකින් කිසිවකට සම කර දැක්විය නො හැකි පෙන්විය නො හැකි නිසා "අනිදස්සන විඤ්ඤාණය" යනුවෙන් ද; කිසිම අරමුණක නො පිහිටා පවතින නිසා "අප්පතිට්ඨිත විඤ්ඤාණය" යනුවෙන් ද; නො සැලී දිගටම පවත්නා චේතෝ විමුක්තියක් නිසා 'අකුප්පා චේතෝ විමුත්තිය' යනුවෙන් ද ; සියල්ලන්ගේ ම නිදහස්ව පවත්නා බැවින් 'විමුත්ත චිත්තං' නැත්නම් "විමෝචයං චිත්තං" යනුවෙන් ද; රාග-දෝෂ-මෝහ ආදී කිසිම ක්ලේශයක් එහි ගෑවීවත් නො මැති නිසා "රාගක්ඛය, දෝසක්ඛය, මෝහක්ඛය" යනුවෙන් ද හැඳින්විය හැකි මේ සිත, 'අවිජ්ජා නිරොධා, සංඛාරා නිරෝධෝ' - අවිද්‍යාව නිරුද්ධ වී යාමෙන් සංස්කාර විරහිත භාවයට පත්වීම නිසා ලත් ප්‍රතිඵලයකි.

මෙම සිතින් කිසිවක් සිතන්නට හෝ කියන්නට හෝ කිසිම ක්‍රියාවක් කරන්නට නො හැකිය. සියළු කුශලාකුශල සංස්කාර අත හැරී ගොස් පවත්නා මෙම සිත එම නිසාම නිවී-සංසිඳී ගිය 'පටිප්පස්සද්ධි

සීලස්කන්ධයක්' බවට පත් වේ.
දිගින් දිගට ම අඛණ්ඩ ලෙස සමාධි ප්‍රවාහයක් ලෙසින් පවත්නා මෙම සිත, එම නිසාම නිවී-සංසිඳී ගිය "පටිප්පස්සද්ධි සමාධිස්කන්ධයක්" බවටත් පත් වේ.

මෙම සිතේ කිසිම මෝහයක් ගෑවිලාවත් නො මැති නිසා එය නිවී-සංසිඳී ගිය 'පටිප්පස්සද්ධි පඤ්ඤාස්කන්ධයක්' බවට ද, එසේම එය සකල ධර්මයන්ගෙන්ම නිදහස් ව පවත්නා බැවින් නිවී-සංසිඳී ගිය 'පටිප්පස්සද්ධි විමුත්ති'-ස්කන්ධයක් බවට ද පත් වෙමින්, පටිප්පස්සද්ධි සීල-සමාධි-ප්‍රඥා-විමුත්ති යන ස්කන්ධ 4 ම බවට මෙම එකම සිත පත් වේ.

රහත් වූ කෙනෙකු ගේ ප්‍රතිසන්ධි ජනක කර්ම ශක්තිය හා ජීවිත ශක්තිය තිබෙන තාක් කල් පවත්නා මේ සිත, මරණයෙන් පහනක් නිවුනා සේ නිවී ගොස් ජාතිය ක්‍ෂය වී යන්නේ ය.

මේ සිත මෙලෙසින් ම පවතිත්දී ම මතුපිට සිතින් කථා කිරීමට, ක්‍රියා කිරීමට, වෙනත් අවශ්‍ය දෙයක් සිතීමට කළ හැකි වන අතර, ඒ කිසිවක් කුශල් හෝ අකුශල් නො වන නිසාත්, මේ සිත ඒ සියල්ලන්ගෙන් ම වෙන් ව නො බැඳී, විසංයුක්තව පවත්නා නිසාත්, මතුපිට සිතින් කරනු ලබන ඒ සෑම ක්‍රියාවක් ම ක්‍රියා මාත්‍ර ම පමණි; ක්‍රියා සිත් ම පමණි. එසේ කථා කිරීම්, ක්‍රියා කිරීම්, සිතීම් වලින් බැහැරව සිටින සෑම විටක දී ම මේ සිත ඔහේ පැවතෙමින් පවතී; වෙනත් කිසිම සිතක් නිරායාසයෙන් නො උපදී.

මෙම සිතින් රහත් වූ කෙනෙකුට කැමැතිතාක් කල් සිටිය හැකිය. මිනිසුන් දස දහස් ගණනක්, ශබ්දවාහිණී යන්ත්‍ර ද සහිතව එකවර ශබ්ද කරන අවස්ථාවක දී වුවත්, ඒ කිසිවක් හා නො බැඳී මේ සිත ඔහේ හුදකලාව පවතී. එම නිසා ම මෙවැනි සිතක් ඇති කෙනෙකුට 'කේවලිනෝ' (හුදකලාව වාසය කරන කෙනා) යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාරා ඇත.

**'යේ සුවිමුත්තෝ, තේ කේවලිනෝ, යේ කේවලිනෝ වට්ටං තේසං නත්ථි පඤ්ඤාපනාය'** මෙසේ මැනවින් මිදුණ තැනැත්තා කේවලී

(හුදකලා) අයෙකි. එවැනි කේවලී අයෙකුට සසර වට්ටයක් පැණවීමට නො මැත යනුවෙන් සංයුත්ත නිකායේ සත්තට්ඨාන සූත්‍රයේ දක් වේ.

මෙන්න මෙවැනි විමුත්ත සිතකින් සිටිනා කෙනකු ගේ මෙම හුදකලාව 'ලොව්තුරු හුදකලාවකි.' 'ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ' - ඛගවේණ අඟක් සේ එකලාව හැසිරේ යනුවෙන් ඛග්ගවිසාණ සූත්‍රයේ දක්වෙන්නේ එම පසේ බුදුරජාණන් වහන්සේලා මෙම ලොව්තුරු හුදකලාවෙන් වැඩ සිටි බවයි. මෙම ලොව්තුරු හුදකලාව අත්දකිය හැක්කේ බුදු-පසේබුදු-හෝ රහත් වූ කෙනෙකුට පමණි.

ඝන කැලෑවක-ආරණ්‍යයක-ගල් ගුහාවක- ගසක් මුල නැත්නම් ශූන්‍යාගාරයක වැනි කවර තැනක හුදකලාවම විසුවත්, ඔහුගේ සිත තුළ රාගාදී ක්ලේශ ධර්ම ජනිත වන්නේ නම් ඔහු ඒකචාරීව සිටින්නකු ලෙස ගණන් ගැනීම නුසුදුසු ය.

**'තණ්හා දුතියෝ පුරිසෝ....'** යනුවෙන් බුදුරජාණන් වහන්සේ දක්වා ඇති පරිදි තණ්හාව-රාගය-ද්වේශය ආදී ක්ලේශ ධර්ම දෙවැන්නකු ලෙස ඔහු ළඟ ම සිටින බැවින් එවැන්නකු හුදලකාව වසන්නකු නො වේ.

**කෙදිනක හෝ මෙවන් විමුත්ත සිතක් උදාකර ගෙන ජාතිය ක්‍ෂය කරමින් මේ සසර දුකින් ගැලවීමට ඔබට ද වාසනාව උදාවේවා !**

## ගාථා අංක 1

**සබ්බේසු භූතේසු නිධාය දණ්ඩං**
**අවිහේඨයං අඤ්ඤතරම්පි තේසං**
**න පුත්තමිච්ඡෙය්‍ය කුතෝ සහායං**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

ආනන්ද තෙරුන් පසේබුදුවරුන් ගේ අභිනීහාරයන් [1] ගැන බුදුරදුන්ගෙන් විමසූ විට මේ සූත්‍රය දෙසූහ. මෙහි නිදාන කථා 40 කි.

මෙම ගාථාවේ නිදාන කථාව මෙසේ ය. කාශ්‍යප බුදුරදුන් කල ගතපච්චාගත[2] පිරූ භික්ෂුවක් දෙව්ලොව ඉපැද, පසුව ඉන් චුතව බ්‍රහ්මදත්ත නම් රජුව ඉපදී, අගමෙහෙසිය සමඟ රහස් සබඳකම් පැවැත් වූ එක් අමාත්‍යයකු රටින් නෙරපීය. ඔහු විසින් ගෙන එන ලද බරණැස් රජු, ලේ බිඳකුදු නො සොල්වා ජයගත් අයුරු ගැන සිතා, මෛත්‍රිය වඩා එය පාදක කොට විදර්ශනා කොට පසේබුදු වූ බ්‍රහ්මදත්ත රජු, ගන්ධමාල පර්වතයට වඩින්න යන විට, සහාය අමාත්‍යාදීන් නතර වීමට කළ ඉල්ලීම නිසා, "පුත්‍රයන් පවා අත්හරනා මට කවර නම් සහාය කෙනකු දැ"යි පළ කෙරෙමින් මෙම උදාන ගාථාව දෙසූහ.

මෙහි අදහස මෙසේ ය. **සියළු සත්වයන් කෙරෙහි බහා තබන ලද දඬු ඇති, කිසිවෙකුටත් හිංසාවක් නො කරන, කිසිම පුත්‍රදාරාදී කෙනෙකු කෙරෙහි අපේක්ෂාවක් නො කරන මට සහායකයන් ගැන කවර නම් අපේක්ෂාවක් ද ? කගවේණ අඟක් සේ එකලා වූවාහු, දෙවැන්නකු නැත්තාහු, මිදුණු බැඳුම් ඇත්තාහු, හුදෙකලාව ම හැසිරෙමි.**

මෙහි සියළු සත්වයන් යන්නට භීතියට සන්ත්‍රාසයට පත්වන නො රහත්හු ද, ස්ථාවරත්වයට පත්, සන්ත්‍රාසයන් ප්‍රහීණ කළ රහත්හු ද ගැනෙති.

බහා තැබූ දඬු යන්නෙන්, ත්‍රිවිධ වූ කායදුච්චරිත හෝ චතුර්විධ වූ

---

1 පූරණ ලද පාරමී ආදි කරුණු

2 සතිය නොපිරිහෙළා අඛණ්ඩ ලෙස පවත්වාගෙන යනු ලබන භාවනා ක්‍රමයකි.

වචීදුච්චරිත හෝ ත්‍රිවිධ වූ මනෝ දුච්චරිත හෝ නොමැතිව කිසිවෙකුටත් කයින් හෝ වචනයෙන් හෝ මනසින් හෝ කිසිදු වරදක් නො කරන බව අදහස් වේ.

එකලාව ම හැසිරීම යන්නෙහි විවිධ අර්ථ ඇත. ඒ පසේබුදුපියාණෝ සියළු ඝරාවාස[1] පළිබෝධ, පුත්තදාර පළිබෝධ - ඥාති පළිබෝධ හා සන්නිධි[2] පළිබෝධ යන පළිබෝධකර ධර්මයන් සිඳ දමා, පැවිදි වී සියළු රාග දෝස මෝහ යන කිඤ්චනයන් සිඳ අකිඤ්චන භාවයට පත් ව, ආරණ්‍ය වන සේනාසන ඇසුරු කරති. එකලාව ම හැසිරෙති. එකලාව ම යති, එකලාව ම හිඳිති, එකලාව ම සයනය කරති. එකලාව ම පිණ්ඩපාතයේ හැසිරෙති. එකලාව ම නික්මෙති. එකලාව ම පිවිසෙති. එකලාව ම සක්මන් කෙරෙති. එකලා විහරණයෙන් යුතු වෙති. මේ අර්ථයෙන් ඒ බුදුපියණෝ හුදෙකලා භාවයට පත්වූහ.

තවද ඒ පසේබුදුපියාණෝ අප්‍රමාද විහරණයෙන් යුතු වූයේ, පඤ්ච මහා මාරයන් පරාජය කොට, තණ්හාව සිඳ දමා වැඩ සිටි බැවින් ද එකලා වූයේ වෙයි. තණ්හාව දෙවැනි කොට ගත් රහත් නො වූවෝ සංසාරයේ සැරිසරති. උන්වහන්සේට සෙවනැල්ලක් මෙන් පසුපස ගමන් කරන ඒ තණ්හාව නැමැති දෙවැන්නා නො මැත.

එසේම උන්වහන්සේ ඒකාන්ත වීතරාගී, ඒකාන්ත වීතදෝසී, ඒකාන්ත වීතමෝහී, ඒකාන්ත නිකෙලෙස් භාවයට පත් වූ බැවින් ද එකලා වූයේ වෙයි.

මෙලෙසින්ම උන්වහන්සේ සතර සතිපට්ඨාන, සතර සම්මප්පධාන, සතර ඍද්ධිපාද, පඤ්චින්ද්‍රිය, පඤ්ච බල, සත්ත බෝජ්ඣංග, ආර්ය අෂ්ටාංගික මාර්ග යන ඒකායන මාර්ගයේ ගමන් ගත් බැවින් ද එකලා වූයේ වෙයි. (උප ග්‍රන්ථය බලන්න).

තවද පහත සඳහන් ධර්මයන් එකලාව ම අවබෝධ කළ බැවින් ද උන්වහන්සේ එකලා වූයේ වෙයි.

---

1 ගිහිගෙහි
2 රැස්කර තබා ගැනීම්

- එනම්, ඒ පසේබුදුපියාණෝ චතු මග්ග පච්චේක බෝධි ඥාණයෙන් සියළු සංස්කාරයෝ අනිත්‍යයෝ ය, සියළු සංස්කාරයෝ දුක්ඛයෝ ය, සියළු ධර්මයෝ අනාත්මයෝ යැයි අවබෝධ කළහ.

- අවිජ්ජාව නිසා සංස්කාර වේ. සංස්කාර නිසා විඤ්ඤාණය වේ. ..... පෙ ..... (උප ග්‍රන්ථය බලන්න).

- අවිජ්ජා නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ. සංස්කාර නිරෝධයෙන් විඥාන නිරෝධය වේ. .... පෙ .... ජරාමරණ නිරෝධය වේ. මෙසේ මේ දුක්ඛ පිණ්ඩයේ නිරෝධය වන්නේ යැයි අනුලෝම පටිලෝම පටිච්ච සමුප්පාද ධර්මයන් අවබෝධ කළහ.

- මේ දුක්ඛාර්ය සත්‍යය / මේ සමුදය සත්‍යය / මේ නිරෝධ සත්‍යය / මේ මාර්ග ආර්ය සත්‍යය යැ'යි එකලාව ම චතුරාර්ය සත්‍ය අවබෝධ කළහ.

- මේ ආශ්‍රවයන් ය.[1] මේ ආශ්‍රව සමුදය ය, මේ ආශ්‍රව නිරෝධය ය, මේ ආශ්‍රව නිරෝධගාමිණී පටිපදාව යැ'යි එකලාව ම අවබෝධ කළහ.

- මෙම ධර්මයෝ පිරිසිඳ දත යුත්තාහ. මේ ධර්මයෝ ප්‍රහාණය කළ යුත්තාහ. මේ ධර්මයන් සාක්‍ෂාත් කළ යුතු ය. මේ ධර්මයෝ වැඩිය යුතු යැයි එකලාව ම අවබෝධ කළහ.

- මෙසේ ම සවැදෑරුම් ඵස්සායතනයන්, එහි සමුදය - අත්‍ථඞ්ගමය - ආශ්වාදය - ආදීනවය හා නිස්සරණය යන ධර්මයන් එකලාව ම අවබෝධ කළ සේක.

- මේ පඤ්චූපාදානස්කන්ධය ය - මේ එහි සමුදය ය - මේ එහි අත්‍ථඞ්ගමය (නිරෝධය ය) මේ එහි ආශ්වාදය - මේ එහි ආදීනවය ය, මේ එහි නිස්සරණයැයි එකලාව ම අවබෝධ කළහ.

---

1 කාමාශ්‍රව ; භවාශ්‍රව, දිට්ඨාශ්‍රව, අවිජ්ජාශ්‍රව

- මේ සිවු වැදෑරුම් මහා භූතයෝ ය ඔවුන්ගේ සමුදය - නිරෝධය - ආශ්වාදය - ආදීනවය හා නිස්සරණය මේ යැයි එකලාව ම උන්වහන්සේ අවබෝධ කළහ.

- යම් සමුදය ධර්මයක් වේ ද, ඒ සියල්ල නිරෝධ ස්වභාවකොට ඇත්තා හ යැයි එකලාව ම අවබෝධ කළහ.

- යම් දතයුතු - නුවණින් ස්පර්ශ කළ යුතු - සාක්ෂාත් කළ යුතු - දෙයක් වේ නම්, ඒ සියල්ල එම පසේබුදුපියාණෝ එකලාව ම අවබෝධ කළහ.

    මේ අර්ථයෙන් ද උන්වහන්සේ එකලා වූයේ වෙයි.

එකලාව ම හැසිරේ යන්නෙහි "එකලා" යන අර්ථය ඉහතින් දැක්වූ පරිදි වන අතර, "හැසිරීම" යන්නෙන් දැක්වෙන විවිධ අර්ථ මීළඟට විමසා බැලිය යුතු ය.

- උන් වහන්සේගේ ඉරියාපථයන් ශාන්ත භාවයට පත්ව ඇත. අකප්පිය වූ, භික්ෂූන්ට අනුරූප නොවූ කිසිම ඉරියාපථයක් උන්වහන්සේට නැත. මෙවන් 'ඉරියාපථ චරියාවකින්' උන්වහන්සේ එකලාව ම හැසුරුණු සේක.

- අධ්‍යාත්මික හා බාහිර සවැදෑරුම් ආයතනයන් නිසා කිසිදු ඇලීමක් හෝ ගැටීමක් නො මැතිව, ඉන්ද්‍රියගුත්තද්වාර භාවයෙන්[1] සමන්නාගත වූ උන්වහන්සේ එවන් 'ආයතන චරියාවකින්' යුතුව එකලාව ම හැසුරුණු සේක.

- සතර සතිපට්ඨාන ධර්මයන්ගේ මනා ප්‍රභාවිත භාවයකින් සමන්නාගතව, අප්‍රමාද විහරණයෙන් හා සති සම්පජඤ්ඤයෙන් යුක්තව වැඩ සිටි උන්වහන්සේ එවැනි 'සති චරියාවකින්' එකලාව ම හැසුරුණු සේක.

- සතර රූපාවචර හා සතර අරූපාවචර ධ්‍යානයන් මැනවින්

1 ඉන්ද්‍රිය සංවරභාවයෙන්

වශීකෘත කළ සමාහිත වූ අධිචිත්තයකින් සමන්නාගත උන්වහන්සේ 'සමාධි චරියා', විහරණයෙන් එකලාව ම හැසුරුණු සේක.

- නාමරූප පරිච්ඡේද ආදී සියළු විදර්ශනා ඥානයන් හා චතුරාර්ය සත්‍යයන් පිළිබඳ හසල වූ 'ඥාණ චරියාවකින්' යුක්තව උන්වහන්සේ එකලාව ම හැසුරුණු සේක.

- සෝවාන් ආදී චතුර්විධ මාර්ග ඥානයට පිළිපන් උන්වහන්සේ 'මග්ග චරියාවකින්' ද යුතු වූ සේක.

- චතුර්විධ සාමඤ්ඤ ඵල අධිගත කළ උන්වහන්සේ, 'පත්ති චරියාවකින් ද', සමන්නාගත වූ සේක.

- සියළු සත්වයන් කෙරෙහි ඒක පදේසගත 'ලෝකාර්ථ චරියාවකින්' ද උන්වහන්සේ සමන්නාගත වූ සේක. (සම්මා සම්බුදුරජාණන් වහන්සේලා සර්වප්‍රකාරයෙන් ම ලෝකාර්ථචරියාවේ යෙදෙන අතර, පසේ බුදුවරුන්ට එසේ සර්වප්‍රකාරයෙන් ම ලෝකාර්ථචරියාවේ යෙදිය නො හැක).

මෙසේ ම උන්වහන්සේ අධිමුච්චන සද්ධාවෙන් යුතුව හැසිරෙති. චතුසම්මප්පධාන විරියෙන් යුතුව හැසිරෙති. සිහියෙන් අරමුණු දකිමින් සතියෙන් යුතුව හැසිරෙති. අවික්ෂේප භාවයට නො පැමිණ සමාධියෙන් යුතුව හැසිරෙති. යථා භූත ඥාණ දර්ශනයෙන් යුතු වූයේ නුවණින් සමන්නාගතව හැසිරෙති. ඉන්ද්‍රිය සම්ප්‍රයුක්තවූ ජවන් සිත්වලට පූර්වංගම වූ ආවර්ජන කෘත්‍යයන් සිදුකරන ආවජ්ජන සිත්වලින්, අරමුණු හැඳිනීම් මාත්‍රයෙන් ම නැවතෙමින් (දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සාමි .....) හැසිරෙති. මෙසේ පිළිපැද්ද කල්හි සමථ විපස්සනා සංඛ්‍යාත කුශල ධර්මයන් වර්ධනය වේ යනුවෙන් දකිමින් "ආයතන චරියාවකින්" යුතුව හැසිරෙති. මෙසේ හැසිරීමෙන් තදංග - වික්ඛම්භන - සමුච්ඡේද - පටිප්පස්සද්ධි වශයෙන් විශේෂාධිගමනයන් වන්නේ යැයි දකිමින් "විශේෂ චරියාවකින්" යුතුව හැසිරෙති.

තවද උන්වහන්සේ ප්‍රත්‍යක්ෂ වශයෙන් අසංඛත නිර්වාණ ධාතුව

දුටු සම්මා දිට්ඨියෙන් සමන්නාගත වූයේ "දස්සන චරියාවකින්" යුතුව හැසිරෙති. මිච්ඡා සංකප්පයන් බැහැර කොට සම්මා සංකප්පයෙන් සමන්නාගත වූයේ "අභිනිරෝපන චරියාවෙන්" යුතුව හැසිරෙති. මිච්ඡා වාචාවන්ගෙන් වෙන්ව, චතුර්විධ වචී සංවරයෙන් සමන්නාගත වූයේ "පරිග්ගහ චරියාවකින්" හැසිරෙති. ත්‍රිවිධ කාය සංවරයෙන් සමන්නාගතව "සමුට්ඨාන චරියාවකින්" හැසිරෙති. පරිසුද්ධ ආජීවයකින් සමන්නාගත වූයේ "වෝදාන චරියාවකින්" හැසිරෙති. සම්මා වායාමයෙන් සමන්නාගත වූයේ "පග්ගහ චරියාවකින්" හැසිරෙති. සම්මා සතියෙන් සමන්නාගත වූයේ "උපට්ඨාන චරියාවකින්" හැසිරෙති. සම්මා සමාධියෙන් යුතු වූයේ "අවික්ඛේප චරියාවකින්" හැසිරෙති.

මෙසේ උන්වහන්සේ "ඒකාචාරී" වූයේ වෙයි. කගවේණ අඟක් සේ එකලාව ම හැසිරෙති.

(මෙවන් අංගයන්ගෙන් සමන්නාගත වූ කල්හි ම "ඒකචාරී" වන බව දත යුතු ය.)

## ගාථා අංක 2

**සංසග්ග ජාතස්ස භවන්ති ස්නේහා**
**ස්නේහන්වයං දුක්ඛමිදං පහෝති**
**ආදීනවං ස්නේහජං පෙක්ඛමානෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

කාශ්‍යප බුද්ධ ශාසනයේ ගතපච්චාගත වත් පිරූ භික්ෂුවක් බඹලොව ඉපැද ඉනික්බිතිව, මනුලොව ඉපැදුණු පසු ස්ත්‍රීන් පිළිකෙව් කළ නිසා 'අනිත්ථිගන්ධ' නමින් හැඳින්විණි. දෙමාපියන් විවාහ වීමට කළ යෝජනා ප්‍රතික්ෂේප කොට, දෙමාපියන් ගේ බලවත් ඉල්ලීම නිසා ඉතා ලස්සන රන් රුවක් සාදා මෙවැනි ළඳක් ලද හොත් විවාහ

වන බව පවසයි. රන් රුවද ගෙන එවැනි රූමතියක සොයමින් යන විට එවැන්නක සම්භ වේ. අනිත්ථිගන්ධ කුමරුට මෙය සැළ කළ පසු ඇය කෙරෙහි නො දැක රාගයක් පහළ වේ. ඇය තමාට විවාහ කර දීමට කැටුව එන විට අති සුකුමාල බැවින් ඈ මගදී මිය යයි. මෙය අසා අනිත්ථිගන්ධ කුමරු බලවත් ශෝකයට පත් වේ. මේ ශෝකය කුමක් නිසා ඇති වුනේ දැයි කල්පනා කළ අනිත්ථිගන්ධ කුමරුට එය ස්නේහය නිසා උපන් බව දැන, එය විදර්ශනාවට නගා පසේබුද්ධත්වයට පත් වේ. ඊට පසුව ගැයූ උදාන ගාථාවයි මේ.

මෙහි කෙටි අදහස මෙසේ ය. **සංසර්ගය නිසා සෙනෙහයක් ඇති වේ. ඒ ස්නේහයෙන් දුක් ඇති වේ. ස්නේහයේ මේ ආදීනව දකිමින් කඟවේණ අඟක් සේ එකලාව ම හැසිරේ.**

මෙහි සංසර්ගය පස් වැදෑරුම් ය. එනම් දස්සන සංසග්ග - සවණ සංසග්ග - කාය සංසග්ග - සමුල්ලාපන සංසග්ග හා සම්භොග සංසග්ගයි.

**දස්සන සංසග්ග**

යම් ස්ත්‍රියක හෝ පුරුෂයෙකු හෝ දෙයක් යන කිසිවක් දැක එහි අත් පා ලස්සනය, මුහුණ ලස්සනය ආදී වශයෙන් අනුබ්‍යඤ්ජන ගෙන එය කෙරෙහි තුටු වේ. තුටු වදන් බෙණෙයි. එය ප්‍රාර්ථනා කරයි. එය සිහිකරයි. එහි ස්නේහෙ බන්ධනයෙන් බැඳේ.

කාළදීඝවාපී කැළණි විහාර භික්ෂුවක් පිඬු පිණිස හැසිරෙත්දී, එක් කාන්තාවක් දැක ස්නේහයක් උපදවා ගෙන, ඇය කෙරෙහි දුක් විඳිමින් සිටින විට ඇය කළුරිය කරයි. ඈ පාවිච්චි කළ රෙද්දක් මේ භික්ෂුවට ලැබුණු පසු හදවත පැලී මැරී වැටුණි. මේ දස්සන සංසග්ගය විපත යි.

**සවණ සංසග්ග**

යම් ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ දෙයක් ගැන අසා ඒ ඇසීම් මාත්‍රයෙන් ම ස්නේහෙයක් ඇති කර ගනී.

ගිරිමවාසී කුමරියන් 500 දෙනකුගේ ගී හඬ අසා, අහසින් යමින්

සිටි පඤ්චංකුල ලෙණවාසී දහර භික්ෂුවක් ඉන් පිරිහී ගියේ සවණ සංසග්ගය නිසයි.

**කාය සංසග්ග**

කායික සංසර්ගයක් ඇතිවීමයි. මහා විහාරයේ දහම් දෙසන තරුණ භික්ෂුවක්, බණ ඇසීමට ආ රාජ කුමරියක් දැක, දෙදෙනාට ම බලවත් රාගයක් උපන් කල රජු වහාම වටතිර ඇද දෙදෙනා ම එකලාව සිටීමට සැළැස් වූ කල්හි, ඔවුනොවුන් වැළඳ ගත්, ඒ දෙදෙනා ම මැරී වැටුණි. මේ කාය සංසග්ග දෝසය යි.

**සමුල්ලාපන සංසග්ග**

දුටුගැමුණු රජු දන් දෙන තැනට (මිරිසවැටිය ළඟ) පැමිණි තරුණ භික්ෂුවක් එහි සිටි සාමනේරියක හා සිනහ විය. දෙදෙනාම උපසම්පදා වී අවුරුදු 60 ක් සිට පිටරටකදී ඔවුනොවුන් හමු වූ පසු ඔවුන්ගේ ඒ ආලපන සමුල්ලාපන සිහිවී අවුරුදු 60 ක උපසම්පදාව පාරාජිකාවක් බවට පත් කර ගැනීම සමුල්ලාපන සංසග්ගයට උදාහරණයි. කථාබහ සිනහසීම් ආදිය කෙරෙහි ඇති කරගන්නා ස්නේහය සමුල්ලාපන ස්නෙහය යි.

**සම්භෝග සංසග්ග**

ඔවුනොවුන් පරිභෝග කරන උපකරණ දැක එයට උපදින රාගය සම්භෝග සංසග්ගය යි.

මේ ආදී පස් වැදෑරුම් සංසර්ගය නිසා ස්නේහයක් උපදී. එය "මෙය මගේ ය, තෙල මගේ ය, මෙතෙක් මගේ ය, මෙතෙකින් මගේ ය" යනාදීන් ලෙසින් ඇති කර ගන්නා තණ්හා ස්නේහයක් විය හැකි ය.

එසේ ම ස්ත්‍රියක, පුරුෂයෙක යනාදී වශයෙන් ගනු ලබන සක්කාය දිට්ඨි හා වෙනත් දිට්ඨීන්ට සම්බන්ධ දිට්ඨි ස්නේහයක් ද විය හැකි ය.

මෙම ආකාර ද්විවිධ ස්නේහය නිසා බොහෝ කායික වාචසික මානසික දුශ්චරිත සිදු කෙරේ. සමහර විට සතුන් මැරීම, සොරකම් කිරීම, පරදාර සේවනය වැනි අකුශල සිදු කරයි. මේ සොරකම්

කිරීම් ආදී අපරාධ වලට පොලීසි වලට යමින් හිරගෙවල්වල දුක් විඳිමින් දඬුවම් විඳීමට සිදු වේ. එවැනි දුක් ඇති වූයේ කුමක් නිසාද ? ස්නේහය නිසා ය.

මෙසේ ම මේ අපරාධ නිසා මරණින් මතු තිරිසන් ලෝකවල, අපායවල, ප්‍රේත ලෝකවල ඉපැද දුක් විඳීමට සිදුවේ. එවැනි දුක් ලබා දෙන්නේ ද මේ ස්නේහය නිසා ය. තම බිරිඳ කෙරෙහි ස්නේහයක් මළ පුරුෂයකු ගැරඬියකු වී ඉපැද, ඇයගේ ඇඟ මත වැටීම නිසා, ගැරඬියා මැරවූ පසු, නැවත බල්ලකු වී ඈ පසු පසම යන බැවින් බල්ලා ද මැර වූ බව කථාවක සඳහන් වේ. ඒ බල්ලාට නැවත සතර අපායෙන් ගොඩ එන්න ලැබෙන්නේ කවදා ද ? මෙවැනි භයානක දුක් විඳීමට සිදුවන්නේ ස්නේහය නිසා ය.

මෙසේ ම මේ ස්නේහය හෙවත් ආශාව නිසා නැවත නැවත ඉපැදීමට සිදු වේ. ආශාව සමුදය සත්‍යය ය. සංසාරයේ මෙසේ යම්තාක් දුක් විඳීමට ඇත්නම් ඒ දුක් ඇති වන්නේ සෙනෙහස නම් වූ ආශාව නිසා ය. ඉන් ඇති වන දුක පිරිසිඳ දත යුතු ය-ආශාව සර්වප්‍රකාරයෙන් ම ප්‍රහාණය කළ යුතු ය - ආශාව ඇති කරවාලන, දුක් ලබා දෙන සියළු සංස්කාර නිරෝධයට පත්වන නිර්වාණය සාක්ෂාත් කළ යුතු ය - එය ලබා දෙන මේ භාවනා මනසිකාරය වර්ධනය කළ යුතු ය - යනුවෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කළ ඒ පසේබුදුපියාණෝ මුදාහළ සියළු බැඳුම් ඇත්තේ එකලාව ම හැසිරෙති.

## ගාථා අංක 3

**මිත්තේ සුහජ්ජේ අනුකම්පමානෝ**
**හාපේති අත්ථං පටිබද්ධචිත්තෝ**
**ඒතං භයං සන්ථවේ පෙක්ඛමානෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

පෙර බරණැස් නමින් රජ කෙනෙක් පළමු ධ්‍යානය උපදවා ගෙන

වෙසෙයි. විනිශ්චය ශාලාවේ ඇතිවන මහත් ශබ්ද අසා ඒ ධ්‍යානය පිරිහෙයි. මෙයින් කළකිරීමට පත්ව, ඒ ගැන සිතා විදර්ශනා වඩා පසේබුද්ධත්වයට පත්වේ. ඉන්පසු පිටවුණු උදාන පාඨයයි මේ.

**සුහද මිතුරන් ආදීන් කෙරෙහි අනුකම්පා කිරීමෙන් හා ඔවුන් සම්බන්ධව පටිබද්ධ සිත් පහළ කර ගැනීමෙන් අර්ථ සිද්ධිය විනාශ වී යෙයි. මිත්‍ර සම්බන්ධකම් පැවැත්වීමේ මේ ආදීනවය දැක ඛගවේණ අඟක් සේ එකලාව ම හැසිරේ යන්න** මෙහි සාමාන්‍ය අදහස ය.

තමාට ඒකාන්ත හිතකාමී පුද්ගලයා මිත්‍රයකු ලෙස සැළකේ. හමුවීම් දැකීම් සිනාසීම් ආදිය නිසා සුහද බවක් ප්‍රීතියක් දනවන තැනැත්තා 'සුහජ්ජ' නමින් දැක්විය හැකි ය. මේ දෙකම ඇති විට 'සුහජ්ජමිත්තා' හෙවත් සුහද මිතුරන් ලෙසින් ගැනේ.

මේ මිත්‍රයන් අගාරික හා අනගාරික වශයෙන් දෙදෙනෙකි.

අගාරික මිත්‍රයන් උපකාරක - සමානසුඛදුක්ඛ හා අනුකම්පක වශයෙන් ත්‍රිවිධාකාරය ය. (මොවුන් ගැන විස්තර සිගාලෝවාද වැනි සූත්‍රයකින් දත හැකි ය).

අනගාරික මිත්‍රයා නිර්වාණාර්ථයෙන් උපකාර කරයි. ප්‍රිය වූ, මනාප වූ, ගරු භාවනීය වූ, ඉවසන සුළු වූ, ගම්භීර දහම් කරුණු කියා දෙන්නා වූ, අයහපතෙහි නො යොදවන්නා වූ, ඔහු සිය මිතුරා අධි ශීලයෙහි පිහිටුවාලීමට උපකාර කරයි. අධි චිත්තයෙහි පිහිටුවාලීමට උපකාර කරයි. අධි ප්‍රඥාවෙහි පිහිටුවාලීමට උපකාර කරයි. සතර සතිපට්ඨානයෙහි යොදවාලයි. සම්මප්පධානයන්හි, ඉද්ධිපාදයන්හි, ඉන්ද්‍රිය ධර්මයන්හි, බල ධර්මයන්හි, බොජ්ඣංග ධර්මයන්හි, ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි යොදවාලනු ලබයි. සමථ විදර්ශනා භාවනාවන්හි නිරත කරවාලයි.

මෙවන් මිත්‍රයන් කෙරෙහි හෝ තණ්හා දිට්ඨි මාන වශයෙන් උපාදාන කරමින් සම්බන්ධකම් පැවැත්වීමෙන් තමාගේ අත්‍ථ සිද්ධිය නැසේ. අජීව, සජීව කිසිවක් උපාදාන නො කළ යුතු ය. උපාදානය

නිසා කර්ම භවයන් ද ඉන් ජාතිය ද ඇති වේ. මෙයින් ස්වකීය නිවන් මාර්ගය නැසේ, පිරිහේ, දුරුවේ. අතුරුදහන් වේ.

මෙසේම කිසිවකු කෙරෙහි හෝ කිසිවක් කෙරෙහි තණ්හා දිට්ඨි මාන වශයෙන් සම්බන්ධකම් පැවැත්වීමෙන් පරාර්ථය ද නැසේ. ස්වාර්ථය හා පරාර්ථය යන දෙකම ද නැසේ. දිට්ඨධම්මික අර්ථය ද[1] සම්පරායික අර්ථය ද[2] නිවාර්ණ පරම අර්ථය ද විනාශ වේ.

එබැවින් සියල්ල කෙරෙහි පවත්නා පටිබද්ධ චිත්තය ප්‍රහාණය කළ යුතු ය. එය ප්‍රහාණය නො කිරීමෙන් අති භයංකාර සංසාර දුක්ඛයෙහි ම නැවත නැවත ගැලෙමින් මහා දුක් අනුභව කිරීමට සිදු වේ. මෙසේ දුක්ඛ සත්‍යයත්, දුක්ඛ සමුදය සත්‍යයත් අවබෝධ කළ ඒ පසේබුදුපියාණෝ ස්වකීය විදර්ශනා චින්තාමය සන්තතිය නැවත නැවත වැඩීමෙන් නිරෝධ සත්‍යාවබෝධ කොට පසේබුද්ධත්වයට පත්ව, දෙවැන්නකු නො මැතිව හුදෙකලාව ම බගවේණ අඟක් සේ හැසිරෙති.

## ගාථා අංක 4

**වංසෝ විසාලෝව යථා විසත්තෝ**
**පුත්තේසු දාරේසුච යා අපෙක්ඛා**
**වංසකළීරෝව අසජ්ජමානෝ**
**ඒකො චරේ ඛග්ග විසාණ කප්පෝ**

කාශ්‍යප බුදුරදුන් කල ගතපච්චාගත වත පිරූ තිදෙනෙකු පසුව රජවරුන් වී ඉපිදී, දෙදෙනෙකු පසේබුදු වෙත්. ඒ පසේබුදුවරු පැරණි යහළුවා හමුවීමට වඩිති. 'අසජ්ජමානො' යන වචනය පමණක්

1. මේ ලෝකාර්ථය
2. පරලෝකාර්ථය

දේශනා කොට උන්වහන්සේලා අහසින් ආපසු වැඩිය පසු, මෙය නිමිතිකොට භාවනා වැඩූ ඒ රජු ද පසේබුද්ධත්වයට පත් වේ. මේ දැක්වෙන්නේ උන්වහන්සේ එසේ පසේබුදු වී පළකළ උදානය යි.

මෙහි සාමාන්‍ය අදහස මෙසේ ය. **හුණ පඳුරක් පැතිරී පැතිරී විශාලව වැඩෙන්නා සේ පුත්තදාරාදී සචෙතනික අචේතනික වස්තූන් හා පුද්ගලයන් කෙරෙහි වූ තණ්හාව ලියල ලියලා වැඩෙන්නේ ය. කුඩා හුණ කිළිලක් හුණ පඳුරෙන් වෙන්ව ඒ හා නො ගැටී පවතී. එසේම කඟවේණ අඟක් බඳුව එකලාව ම හැසිරේ.**

විසත්තිකා යනු තණ්හාවට කියනු ලබන නමකි. පැතිරි පැතිරී විශාලවන අර්ථයෙන් විසත්තිකා නම් වේ. (තවත් නොයෙක් අර්ථයෙන්ද විසත්තිකා වශයෙන් හැඳින්වේ).

මෙම තණ්හාව, රූප-ශබ්ද-ගන්ධ-රස-පොට්ඨබ්බ-ධම්ම-කුල-ගණ-ආවාස-ලාභ-යස-ප්‍රශංසා-සුඛ-චීවර-පිණ්ඩපාත-සේනාසන-ගිලානපච්චය භේසජ්ජ පරික්ඛාර-කාමධාතු-රූපධාතු-අරූප ධාතු-කාම භව-රූප භව- අරූප භව- සඤ්ඤීභව, අසඤ්ඤීභව-නේවසඤ්ඤානාසඤ්ඤී භව - ඒකවෝකාර භව - චතුවෝකාර භව - පඤ්චවෝකාර භව- අතීත - අනාගත - වර්තමාන - දිට්ඨ සුත මුත විඤ්ඤාත ධර්ම[1] ආදී නොයෙක් අරමුණු ගෙන පැතිරි පැතිරී වැඩේ.

මේ ආදී තණ්හාවෙන් හෝ දිට්ඨියෙන් හෝ නො බැඳී සිටීම 'අසජ්ජමාන' යන්නෙන් අදහස් කෙරේ.

මෙසේ තණ්හාව දුටු ඒ පසේබුදුපියාණෝ දුක්ඛ සමුදය සත්‍යය දක්නා ලදහ. යම් සත්‍යයක් දක්නා ලද්දේ ද එවිට සෙසු ත්‍රිවිධාකාර සත්‍යයන් ද දුටුවා වේ.

**"යෝ භික්ඛවේ දුක්ඛං පස්සති, දුක්ඛ සමුදයම්පි සෝ පස්සති, දුක්ඛ නිරෝධම්පි පස්සති, දුක්ඛ නිරෝධගාමිණී පටිපදම්පි පස්සති. යො දුක්ඛ සමුදයං පස්සති, දුක්ඛම්පි සො පස්සති, දුක්ඛ නිරෝධම්පි**

---

1. දකින ලද, අසන ලද, මනසින් දැන ගන්නා ලද දේ

**පස්සති, දුක්ඛ නිරෝධගාමිණී පටිපදම්පි පස්සති ......."** (සං/නි. සච්ච සංයු. ගවම්පති සූත්‍රය).

යමෙක් දුක දකී ද හේ දුක්ඛ සමුදය ද දකී. දුක්ඛ නිරෝධය ද දකී. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව ද දකී. යමෙක් දුක්ඛ සමුදය දකීද හේ දුක්ඛය ද දකී. දුක්ඛ නිරෝධය ද දකී. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව ද දකී. මෙසේ චතුරාර්ය සත්‍යාවබෝධ කළ ඒ පසේබුදුපියාණෝ සචේතනික අචේතනික කිසිවක් කෙරෙහි නො ඇලේ - නො ගනී. (ආදානය නො කරයි) නො බැඳේ. පළිබුද්ධ නො වේ. සංයෝග නො වේ.

සියළු සංස්කාරයන් කෙරෙන් නික්මී, බැහැරවී, මිදී, විසංයෝග වී, තණ්හා දිට්ඨි බන්ධනයන් ගෙන් විසංයුක්ත වී, එබැවින්ම සර්වප්‍රකාරයෙන් ම ඒකචාරී භාවයට පත්ව කඟවෙණ අඟක් සේ හුදෙකලාව ම ඒ පසේබුදුපියාණෝ හැසිරෙති.

## ගාථා අංක 5

**මිගෝ අරඤ්ඤම්හි යථා අබද්ධෝ**
**යේ නිච්ඡකං ගච්ඡති ගෝචරාය**
**විඤ්ඤූ නරෝ සේරිතං පෙක්ඛමානෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

කාශ්‍යප බුදුරදුන් කල එක් උපාසකයකු මියගොස් සිටුවරයෙක්ව ඉපැදී පරදාරකම් කොට ගැහැණියක වී ඉපැදේ. ඇය සියළු දෙනාටම අප්‍රිය ය. සිය ස්වාමි පුරුෂයා ද ඇයට නො සළකා වෙසඟනුන් ගෙන උයන් කෙළි සඳහා යයි. ස්වාමිපුරුෂයාට දීමට පිළියෙළ කර ගෙන රැගෙන ගිය කැවිලි ආදිය අතරමගදී හමු වූ පසේබුදු නමකට පූජා කරයි. පදුම මල් ද පූජා කරයි. ස්ත්‍රීන් භාවයෙන් මිදීමට ද නිවන් අවබෝධ කර ගැනීමට ද ප්‍රාර්ථනා කරයි.

ඊට පසුව දෙව්ලොව පදුම දේවපුත්ත නමින් ඉපැදේ. ඉන් චුතව බරණැස් රජුගේ පොකුණේ නෙලුම් ගැබක ඉපැදේ. මොහු වැඩුණු පසු පසේබුදු කෙනකුට නිගරු කරයි. වෙනත් අය එහි ඇති බැරෑරුම් භාවය දක්වා සමාව ලබා ගන්නා ලෙස ඉල්ලති. මෙසේ සමාව ගැනීමට යත්දී නිදැල්ලේ හැසිරෙන මුවකු දකී. තමාටත් මෙසේ නිදැල්ලේ හැසිරීමට කවදා ලැබේවිදැ'යි සිතා සමථ විපස්සනාවට සිත නැඹුරු කොට පසේබුද්ධත්වයට පත් වේ. ඉන් පසු ගැයුණු උදානයයි මේ.

**වනයේ සිටිනා, බන්ධනයකට නො බැඳි, මුවකු කැමැති කැමැති තැනකට සිතු සේ යන්නාක් මෙන්, ඥානවන්ත පුරිෂ තෙමේ සෙවරීභාවය අපේක්ෂා කරමින් ඛගවෙණ අඟක් සේ එකලාව ම හැසිරේ යන්න මින් දැක්වෙන කෙටි අදහස ය.**

වනයෙහි සිටිනා මුවා, මුව වැද්දන් වැනි ආබාධකර දේ නො මැති විට සිත් සේ හැසිරෙයි. විශ්වාසයෙන්ම යුතුව යයි - හිඳී - නිඳයි. මෙම අදහස අරියපරියෙසන සූත්‍රයේ (මජ්ඣිම නිකාය) මෙසේ විස්තර වේ.

**"සෙය්‍යථාපි භික්ඛවෙ, අරඤ්ඤකෝ මිගෝ අරඤ්ඤෙ පවනේ චරමානෝ විස්සත්ථෝ ගච්ඡති, විස්සත්ථෝ තිට්ඨති, විස්සත්ථො නිසීදති, විස්සත්ථො සෙය්‍යං කප්පේති. තං කිස්ස හේතු ඃ අනාපාථගතෝ භික්ඛවෙ ලුද්දස්ස.**

**ඒවමේව ඛො භික්ඛවේ භික්ඛු විවිච්චේව කාමේහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති භික්ඛවේ භික්ඛු අන්ධමකාසි මාරං, අපදං වධිත්‍වා මාරචක්ඛුං අදස්සනං ගතෝ පාපිමතෝ.......... (අටවන ධ්‍යානය දක්වා) ................ සෝ විස්සත්ථෝ ගච්ඡති විස්සත්ථෝ තිට්ඨති විස්සත්ථෝ නිසීදති, විස්සත්ථෝ සෙය්‍යං කප්පේති තං කිස්ස හේතු ඃ ආනාපාථගතෝ භික්ඛවේ පාපිමතෝ" ති.**

මුව වැද්දා නො පැමිණීම නිසා මුවා සිත්සේ විශ්වාසයෙන් යුතුවම හැසිරෙන්නාක් මෙන්, ප්‍රථම ද්වීතීය ආදී ධ්‍යානයන් ගෙන් සමන්නාගත වූ භික්ෂුව විශ්වාසයෙන් යුතුවම සිත් සේ හැසිරෙයි.

එයට හේතුව කුමක් ද ? පාපකාරී මාරයා නො පැමිණි බැවිනි. **"අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං. අපදං වධිත්වා, මාරචක්ඛුං අදස්සනං ගතෝ පාපිමතෝ,"** මාරයා අන්ධ කරවාලීම, මාරයාගේ මාර ඇසට නො පෙනී යාම කියන්නේ මෙයට ය.

ඒ බෝසතාණෝ පරෝපදේශ රහිතව මෙම සම්මා සමාධිය නුවණින් දැක, එම සියළු සමාධීන් වඩා සෛවරී ලෙස කෙසේ නම් හැසිරෙම්දැයි විමසූහ.

සෛවරීභාවය ද්විධාකාර ය. ධම්ම සේරී හා පුද්ගල සේරී යනු ඒ දෙයාකාරය ය. ධම්මසෙරී යනු සතර සතිපට්ඨාන, සම්මප්පධාන, ඉද්ධිපාද - ඉන්ද්‍රිය - බල - බොජ්ඣංග හා ආර්ය අෂ්ඨාංගික මර්ගය යන ධර්මයන් ය. මෙම ධර්මයන් ගෙන් සමන්නාගත වූ තැනැත්තා 'පුද්ගල සේරී' නම් වේ.

රහත් භාවයට පත් නො වූ කිසිවෙක් සෛවරී භාවයට පත්ව නැත. සතර මහා දීපයට ම අධිපතිකම් කරන සක්විති රජ කෙනකු වුවත්, කාමාදී, ක්ලේශයන්ගේ දාසයකු බවට පත් වේ. ශක්‍ර සම්පත්තිය ලැබුවත් ඔහු ද දෙදෙව්ලොවටම අධිපතිකම් කළාට ක්ලේශයන්ගේ දාස භාවයට පත් වේ. මහා බ්‍රහ්මත්වය ලැබුව ද ඔහු ද මානාදී ක්ලේශයන්ගේ දාසයකු බවට පත් වන්නේ ය. මාර දිව්‍ය පුත්‍රව උපන්නත් අවිද්‍යාදී ක්ලේශධර්මයන්ගේ දාස භාවයට ඔහු ද පත් වන්නේ ය. මෙවන් තත්ත්වයක් තුළ කවර නම් සෛවරී භාවයක් ද ? තමාගේ සියළු ආධිපත්‍ය භාවයන්, සෛවරී භාවයන්, ක්ලේශයන් විසින් මැඩලනු ලබන්නේ ය. එබැවින් සියළු ක්ලේශයන් නැවත නූපදින ලෙසින් ම මැඩලීමෙන් සෛවරීභාවය ලැබිය යුතු ය. එම තත්වය නම් නිරෝධ සත්‍යාවබෝධය යි.

ඒ බෝසතාණෝ මෙම නිරෝධ සත්‍යය පිළිබඳ අවබෝධයත්, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම සංඛ්‍යාත මාර්ග සත්‍යයත් අවබෝධ කොට, ඒ අනුසාරයෙන් සෙසු සත්‍යයන් ද දකිමින් විදසුන් වඩා පසේබුද්ධත්වයට පත්ව, සම්පූර්ණ සෛවරීභාවයකින් සමන්නාගතව, කඟවෙණ අඟක් සේ එකලාව ම හැසිරෙති.

## ගාථා අංක 6

**ආමන්තනා හෝති සහායමජ්කෙඨ,**
**වාසේච ඨානේ ගමනේ චාරිකාය**
**අනභිජ්ඣිතං සේරිතං පෙක්ඛමානෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

'ඒකවජ්ජිත' නම් බ්‍රහ්මදත්ත රජු, නොයෙක් දෙනා තුටු කිරීමට සිතා වෙසේ. කෙනකු අවුත්, මට අසවල් ජනපදය දෙන්නැ'යි ඉල්ලූ විට ඔහු සතුටු කිරීමට ඒ ජනපදය දෙයි. ඊට කලින් ඒ ජනපදය භුක්ති විඳිමින් සිටි පුද්ගලයා මොහු සමඟ කලහ කොට ගෙන රජු වෙත පැමිණේ. ලෝභය නිසා කලහවීම ඇතිවන බව දැන එය විදසුනට නඟා පසේ බුද්ධත්වයට පත් වේ. ඉන්පසු පළ කළ උදානය මෙයයි.

**වාසය කරන ස්ථානයේදී ද, ගමනේදී ද, චාරිකාවේ යෙදෙන විට ද ඥාතිමිත්‍ර ආදී සහායකයන් විසින් "මෙය මට දෙන්න, මට මදක් ඇහුම්කන් දෙන්න" ආදී වශයෙන් අමතනු ලබයි. එබැවින් ප්‍රවෘජ්ජා සංඛ්‍යාත සෙවරීභාවය අපේක්ෂා කරමින් ඛගවේණ අඟක් සේ එකලාවම හැසිරේ යන්න මින් දැක්වෙන කෙටි අදහස ය.**

මෙවන් ඇමතීම් හා මිත්‍ර සන්ථවයන් නිසා ඇතිවන්නේ දුකක් ය. ඥාතිමිත්‍රාදී සවිඥානක හා එසේම අවිඥානක සංස්කාර කෙරෙහි ඇති බැඳීම් නිසා ම මෙවැනි තත්වයක් උදා වේ. එබැවින් අධ්‍යාත්මික කය සහිත සියළු සංස්කාර කෙරෙහි යම් ඡන්ද රාගයක් පහළවේ ද එය දුක උපදවන හේතුව ය. ලෝභය නිසා කලහ උපදින්නේ ද මෙම තත්වය නිසාම ය. එබැවින් ඡන්ද රාග සඞ්ඛ්‍යාත තණ්හාව දුරු කළ යුතු ය. එය හා බැඳි අවිද්‍යාව නසාලිය යුතුය. කාමයෙහි මුච්ඡිත බාලයන් විසින් කිසිදා අනපේක්ෂිත, නෛෂ්ක්‍රම්‍ය සඞ්ඛ්‍යාත ප්‍රවෘජ්ජාව (අනභිජ්ඣිතං) ලබමින් චිත්ත සෙවරී භාවය ලබා ගත යුතු ය. (කලින් ගාථාවේ මෙන් සෙවරීභාවය ගැන විස්තර දත යුතු ය).

මෙවන් විදර්ශනා මනසිකාර සන්තති තුළින් පහළ වූ පච්චේක බෝධි ඤාණයෙන් පසේබුද්ධත්වයට පත් ඒ උතුමාණෝ ඛගවෙණ

අඟක් සේ ඒකචාරීව හැසිරෙති.

## ගාථා අංක 7

ඛිඩ්ඩා රතී හෝති සහායමජ්ඣෙ
පුත්තේසු පේමං විපුලඤ්ච හෝති
පියවිප්පයෝගං විජිගුච්ඡමානෝ
ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ

'ඒකපුත්ත' බ්‍රහ්මදත්ත රජු සිය එකම පුතා මිය ගිය බැවින් බලවත් ශෝකයට පත් වේ. මෙම ශෝකය ම විදර්ශනා නැණින් බලමින් පසේ බුද්ධත්වයට පත්ව කළ උදානයයි මේ.

**ඥාති මිත්‍ර සුහජ්ජාදීන් මධ්‍යයේ කායික හා වාචසික ක්‍රීඩා තුළින් පඤ්චකාම ගුණික රතියක් පහළ වේ. පුත්‍රදාරාදීන් කෙරෙහි වූ ප්‍රේමය ද මහත් භාවයට පත් වේ. මෙම ප්‍රියයන් නිසා ඇතිවන ප්‍රියවිප්‍රයෝගය පිළිකුල් කෙරෙමින් ඉන් ලජ්ජාවට පත් වෙමින්, ඛගවේණ අඟක් සේ හුදෙකලාව ම හැසිරේ** යන්න මෙම ගාථාවේ දැක්වෙන සාමාන්‍ය අර්ථය ය.

නෑදෑ හිතමිතුරන් සමඟ කරනු ලබන කෙළි කවටකම් ආදී ක්‍රීඩා නිසා ප්‍රීතියක් ඇතිවන නමුදු එය එම මොහොතේ ම විනාශ භාවයට පත්වන බැවින් අනිත්‍යය ය. එම සුළු ප්‍රීතිය හා ඒ හා බැඳි ආශාව නිසා අති භයානක සංසාරයේ ම නැවත නැවත ඉපැදෙමින් මෙම සංසාර දුක්ඛය නැවත නැවත පහළ වන්නේ ය.

ප්‍රිය වූ සත්වයන් හා ප්‍රිය වූ රූප ශබ්ද ගන්ධ රස පොට්ඨබ්බ හා ධර්ම යන කරුණු නිසා මහත් වූ ප්‍රේමයක් හට ගන්නේ ය. එය මේ සංසාර බැම්ම බැඳ තබන බන්ධනය ය. මෙම බන්ධනයන් ගෙන් ගැළවීමට ම, මිදීමට ම සුදුසු ය.

ප්‍රියයන් හා ප්‍රිය වස්තූන් නිසාම ප්‍රියවිප්‍රයෝගය පහළ වන්නේ ය. ප්‍රිය දෙයක් නැතිනම්, ප්‍රිය විප්‍රයෝගයක් කොයින් ද ? මේ ප්‍රිය විප්‍රයෝගය දුක්ඛාර්ය සත්‍යය ය. ඒ ප්‍රිය සහගත, සාත සහගත[1] ස්වභාවය දුක්ඛ සමුදය සත්‍යය ය.

මේ ආකාර ප්‍රිය විප්‍රයෝගය පහළ වන්නේ සංස්කාරයන්ගේ ඇති අනිත්‍ය ස්වභාවය නිසා ය. එබැවින් සියළු සංස්කාරයෝ අනිත්‍යයෝ ය. අනිත්‍ය බැවින් ම දුක්ඛයෝ ය. අනිත්‍ය හා දුක්ඛ බැවින් ම අනාත්මයෝ ය.

මෙවැනි වූ විදර්ශනා මනසිකාර තුළින් චතුරාර්ය සත්‍යය දකිමින්, අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්‍ෂණාවබෝධයෙන් පසේබුද්ධත්වයට පත් උන්වහන්සේ ඛගවෙණ අඟක් සේ එකලා විහරණයෙන් යුතුව ම වැඩ වසන සේක.

## ගාථා අංක 8

**චාතුද්දිසෝ අප්පටිඝෝච හෝති**
**සන්තුස්සමානෝ ඉතරීතරේන**
**පරිස්සයානං සහිතා අඡම්හි**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

කාශ්‍යප බුදුරදුන් කල ගතපච්චාගත වත් පිරූ පස් දෙනකු බරණැස ඉපැද, ඉන් සතර දෙනෙක් පසේබුද්ධත්වයට පත් වෙති. අනෙක් අය තමා දුටු සිහිනයක් නිසා බිය වී, එය දුරු කරලීමට සිතා මහා යාගයක් කිරීමට සූදානම් වේ. මේ අවස්ථාවේ ඒ පසේබුදුවරු එහි වඩිති. එම පසේබුදුවරුන්ගේ නම් විමසූ විට 'චාතුද්දිසෝ' යැයි වදාරා අහසින් ආපසු වඩිති. චාතුද්දිසෝ යන්න සතර බ්‍රහ්ම විහරණයන්ට අධිවචනයක් බව තේරුම් ගත් ඔහු, බ්‍රහ්ම විහරණ

1. ලෝභය නිසා ඇතිවන සතුටින් සිත සනසවන පිනවන ගතිය.

ධ්‍යාන උපදවා ඒ පාදක කොට විදර්ශනා වඩා පසේ බුද්ධත්වයට පත් වේ. ඊට පසුව පළ කළ උදාන ගාථාවයි මේ.

(පසේබුදුවරුන් සතර නමක් නොව, එක් පසේබුදුකෙනකු අන් හතර දෙනාට 'චතුද්දිසෝ' යැයි වදාළ බව ද දැක්වේ).

**සියළු දිසාවන්හි නො ගැටී මෙත්තා කරුණා මුදිතා උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් යුක්ත ව, ලද දෙයින් තුටු වන ඉතරීතර සන්තුෂ්ටියෙන් සමන්නාගත ව, සියළු කායික මානසික උපද්‍රව මැඩ, නො සැලී, ඛඟවේණ අඟක් සේ ඒකචාරීව වෙසේ** යනුවෙන් මෙහි අදහස කෙටියෙන් දැක්විය හැකි ය.

(මෙහිදී සතර මහා බ්‍රහ්ම විහරණ විස්තර කළ යුතු ය. ඉතරීතර සන්තුෂ්ටිය ආර්යවංශ සූත්‍රය අනුව විග්‍රහ කළ යුතු ය. එම කරුණු මෙහි දක්වා නැත).

මෙම ගාථාවේ 'පරිස්සය' යනුවෙන් දැක්වෙන්නේ කායික හා මානසික උපද්‍රව වලට ය. මෙය පාකට පරිස්සය, පටිච්ඡන්න පරිස්සය යනුවෙන් දෙයාකාර ය.

ප්‍රකටව පෙනෙන (පාකට) උවදුරු නම්, සිංහ, ව්‍යාඝ්‍ර, දිවි, ඇත් ආදී නපුරු සතුන්; සොරුන්, මැසි මදුරුවන්, අව් වැසි, සුළං, ශිතල, උෂ්ණ; චක්ඛු රෝග, සෝත රෝග ආදී විවිධ රෝග; සා පිපාසා හා මල මුත්‍ර පහ කිරීම් ආදිය ය.

ප්‍රකට නොවූ පටිච්ඡන්න උවදුරු නම්, කාය දුච්චරිත, වචී දුච්චරිත, මනෝ දුච්චරිත, කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා, අරති, රාග දෝස මෝහ, ක්‍රෝධ උපනාහ මක්ඛ පළාස ඉස්සා මච්ඡරිය මායා සාඨෙය්‍ය ථම්භ සාරම්භ මාන අතිමාන මද පමාද, සියළු ක්ලේශ, සියළු දුච්චරිත, සියළු දරථ, සියළු පරිළාහ, සියළු සන්තාප හා සියළු අකුශලාභිසඞ්ඛාරයන් ය.

මෙම උවදුරු විසින් පුද්ගලයා මැඩලනු ලබයි, අල්ලා ගනු ලබයි. මිරිකාලනු ලබයි. හාත්පසින් යටපත් කරවාලනු ලබයි.

මේ උවදුරු සියළු කුශල ධර්මයන්ට අන්තරායය පිණිස, පරිහානිය පිණිස පවතී. සම්මා පටිපදාවට - අනුලෝම පටිපදාවට - අපච්චනික පටිපදාවට - අන්වත්ථ පටිපදාවට, ධම්මානුධම්ම පටිපදාවට, සීල පරිපූර්ණත්වයට ඉන්ද්‍රියගුත්තද්වාර භාවයට, භොජනේ මත්තඤ්ඤුතාවයට,[1] ජාගරියානුයෝගයට,[2] සතිසම්පජඤ්ඤයට, සතර සතිපට්ඨාන ධර්මයන් වැඩීමට, සම්මප්පධාන - ඉන්ද්‍රිය - බල - බොජ්ඣංග හා ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩීමට, සියළු පුඤ්ඤාභිසංඛාරයන් වැඩීමට, හා සියළු ආනෙඤ්ඤාභිසංඛාර වර්ධනයට මෙම උවදුරු බෙහෙවින් ම අන්තරායකර ය.

මෙම උවදුරු වලින් මැසි මදුරු ශීතල උෂ්ණ ආදී සමහරක් ඉවසීමෙන් මැඩලිය යුතු ය. **(අත්ථි ආසවා අධිවාසනා පහාතබ්බා ගාථා 18 ද බලන්න)**. නො එසේ නම්, එම උවදුරු නිසා කාමාශ්‍රව භවාශ්‍රව දිට්ඨාශ්‍රව හා අවිජ්ජාශ්‍රව ගලා ඒමට පටන් ගනු ඇත.

නපුරු සතුන් සර්පයන් වැනි උවදුරු පරිවජ්ජනයෙන්[3] මැඩලිය යුතු ය. (**අත්ථි ආසවා පරිවජ්ජනා පහාතබ්බා**).

සමහර උවදුරු උදාහරණ වශයෙන් කාමච්ඡන්ද ව්‍යාපාද ආදිය නො පිළි ගැනීමෙන්, උපන් විගස ම මැඩලීමෙන් යටපත් කළ යුතු ය. (**අත්ථි ආසවා විනෝදනා පහාතබ්බා**).

සමහර උවදුරු එනම් ක්ලේශ දුච්චරිත පරිළාහ ආදිය භාවනාවෙන් මැඩලිය යුතුය. (අත්ථි ආසව, භාවනා පහාතබ්බා).

(මේ අයුරින් සබ්බාසව සූත්‍රය අනුව විස්තර දත යුතු ය).

ඒ පසේබුදුපියාණෝ මේ සියළු උවදුරු මැඩලූහ. නො සැලෙන නො බියවන ස්වභාවයට පත් වූහ. මින් ගැනෙන්නේ නිරෝධ සත්‍යාවබෝධය ය.

---

1. භෝජනයේ පමණ දැනීම
2. නිදිවැරීම
3. ඉවත්ව යාමෙන්

සතර බ්‍රහ්ම විහරණ, ඉතරීතර සන්තුෂ්ටිය ආදියෙන් දැක්වෙන්නේ මාර්ග සත්‍යය ය.

ඒ අනුසාරයෙන් සෙසු සත්‍යයන් ද දකිමින්, චතුරාර්ය සත්‍යාවබෝධය තුළින් පසේ බුද්ධත්වයට පත් උන්වහන්සේ කේසර සිංහ රාජයකු සේ නො බියව, නො තැතිගතිව, උත්‍රාස නො වී, පහ වූ ලොමු දැහැගැනුම් ඇතිව, පළා නො ගොස්, ප්‍රහීණ කළ බිය හා බිය අරමුණු ඇතිව, ඉන්ද්‍රඛීලයක් සේ නො සැලී, ඛගවෙණ අඟක් සේ හුදකලාව ම වැඩ වෙසෙති.

## ගාථා අංක 9

**දුස්සඞ්ගහා පබ්බජිතාපි ඒකේ**
**අථෝ ගහට්ඨා ඝරමාවසන්තා**
**අප්පොස්සුක්කෝ පරපුත්තේසු හුත්වා**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

එක් බරණැස් රජ කෙනෙක් සිය දේවිය මියගිය පසු, වෙනත් ගැබ්ගත් කාන්තාවක් මෙහෙසිය කර ගනී. ඇගේ පුතා තමාගේම පුතකු ලෙසින් සෙනහසින් හදාවඩා ගනී. ඒ කුමරා තමාගේ පියා රජ්ජුරුවන් නො වන බව දැනගත් පසු, කලින් මෙන් රජතුමාට සෙනහසක් නො දක්වයි. මෙය ගැන රජ කළකිරේ. පැවිදි වේ. පසේබුදුධත්වයට පත් වේ. උන්වහන්සේගේ මුවින් නික්මුණු ප්‍රීති වාක්‍යයයි මේ.

මෙහි කෙටි අදහස මෙසේ ය. සමහර පැවිද්දන්ට සංග්‍රහ කළ විට ඊට අනුරූප වූ ප්‍රතිචාරයක් ඔවුහු නො දක්වති. සමහර ගිහිගෙයි වසන්නෝ ද මෙසේම වෙති. (ඔවුහු තෘප්තිමත් කළ නො හැක). අනුන්ගේ පුත්‍රයන් ගැන උත්සුක නො වී ඛගවේණ අඟක් ලෙසින් එකචාරීව ම වෙසේ.

සමහර පැවිද්දන්ට චීවර ආදී සිවුපසයකින් සංග්‍රහ කරන විට, නිස දෙන විට, යම් කරුණක් විමසන විට, යම් අවවාදාත්මක දෙයක් කියා දෙන විට, ගම්භීර සුඤ්ඤත පටිසංයුත්ත[1] ධර්මයක අර්ථ විවරණයක් කරන විට යන මේ ආදී අවස්ථාවලදී අසතුටින් මැඩී, සමහර විට එයට කන් යොමු නො කරයි. නො සතුට දක්වයි. දැන ගැනීම පිණිස නො පිහිටයි. අවවාද නො අසයි, ඒ අනුව නො පිළිපදියි. ඉවත බලයි, විරුද්ධ පැවතුම් ඇතිව සිටී.

සමහර ගිහි අයද මෙබඳු ම ප්‍රතිචාරයන් දක්වති.

තමාගේ ස්නේහය තිබුණ නමුත් අන් අයගේ පුත්‍රයෝ එම සෙනෙහසට ප්‍රති-සෙනෙහසක් නො දක්වති. මෙය මෙසේ වන්නේ ඔවුන් අන් අය නිසා ය. තමාගේ නො වන නිසා ය.

තමාගේ ම පුත්‍රයන් වුව ද යම් යම් අවස්ථාවන්හිදී මෙවැනි ම ආකල්පයන් දක්වන බව හා එසේ දැක්වීමට ඉඩ ඇති බව නො රහසකි. කිසිවකු තමාට අවශ්‍ය පරිදි හැසිරෙන්නේ නොවේ. කිසිවක් තමාට අවශ්‍ය පරිදි නො පවතී. 'මම' 'මගේ' යැයි ගනු ලබන මේ කය ද තමාට අවශ්‍ය පරිදි නො පවතින කල්හි, බාහිර දෙයක් කෙසේ තම වශයෙහි පවතියි ද ? සියල්ල අනාත්මය ය. මමෙක් නැත. 'මගේ' යැයි ගත හැකි දෙයක් නැත. කාරකයෙක් නැත. විඳින්නෙක් නැත. අධිපති බවක් නැත. ඉසුරු බවක් නැත. වශයෙහි පැවැත්මක් නැත. සාරයක් නැත. අනාත්ම වූ මේ සංස්කාරයෝ හේතූන්ගේ සංයෝගයෙන් ඇති වෙත්. හේතූන්ගේ නිරෝධයෙන් නිරුද්ධ වෙත්.

මෙවන් අනාත්ම ලක්ෂණයන් ද, ඒ හා ම සම්බන්ධ දුක්ඛ ලක්ෂණයන් ද අනිත්‍යය ලක්ෂණයන් ද අවබෝධ කර ගනිමින් පසේ බුද්ධත්වයට පත් උන්වහන්සේ ඛගවේණ අඟක් සේ ම ඒකචාරී විහරණයෙන් ම වෙසෙති.

---

1 ශූන්‍යතාවය විදහා දක්වන, ශූන්‍යතාවය හා මුසු වූ

## ගාථා අංක 10

**වෝරෝපයිත්‍වා, ගිහිබ්‍යඤ්ජනානි**
**සංසීන පත්තෝ යථා කෝවිළාරෝ**
**ඡෙත්‍වාන වීරෝ ගිහි බන්ධනානි**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

චාතුමාසික බ්‍රහ්මදත්ත රජ කොබෝලීල ගසක් යට සැතපී, එහි මල් පිපී බරවී තිබීම ගැන තුටු වේ. පසු දිනක ඒ ගසේ මල් හා කොළ හැලී ඇති බව දැක කළකිරී, පසේබුද්ධත්වයට පත්ව මේ උදානය දෙසූහ.

**කොබෝළීල ගසේ පත්‍ර ගිලිහී පතිත වූවා සේ, සියළු ගිහි ස්වරූප අතහැර, සියළු ගිහි බන්ධන සිඳ දමා, ඛගවෙණ අඟක් සේ එකලාව ම හැසිරේ යන්න මෙහි සාමාන්‍ය අදහස යි.**

කොබෝළීල ගසෙහි කොළ හා මල් සියල්ල බිම පතිත වී නැතිව ගියා සේ සියලු සංස්කාරයන් අනිත්‍යය ස්වභාව කොට පවතී. සෑම ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා සංස්කාරයෝ නිරුද්ධ වන්නාහ. එසේ ක්‍ෂණික නිරෝධයට පත්වන සංස්කාරයන් ගේ සන්තතියේද අන්තයක් ඇත්තේ ය. සෑම සංස්කාරයක් ම ක්‍ෂණික නිරෝධයට පත්වෙමින් ගොස් අවසන සන්තති නිරෝධයට පත්වන්නේ ය. එසේ ක්‍ෂණික හෝ සන්තති නිරෝධයට පත්වන සංස්කාරයෝ නැවත නූපදින ලෙසින්ම නිරුද්ධ වෙති. පෙර නො තිබීම, හේතූන්ගේ සම්ප්‍රයෝගය මත පහළ වෙති. හේතු නිරෝධයෙන් නිරෝධයට පත් වෙති. සංස්කාර අනිත්‍යය ය, සංඛත ය, පටිච්ච සමුප්පන්න ය, නැසෙන ස්වභාවයෙන් යුතු ය. විනාශවන ස්වභාවයෙන් යුක්ත ය. විපරිනාමයට පත්වන ස්වභාවයෙන් යුතු ය, නිරෝධයට පත්වන සුළු ය. හේතූන්ගෙන් හටගත් යම්කිසි ධර්ම කෙනෙක් වෙත්ද, ඒ සියල්ල නිරෝධයට පත්වන්නේ ම ය. මෙවන් අනිත්‍ය වූ සංස්කාර අනිත්‍ය බැවින් ම දුක්ඛයහ. අනිත්‍ය හා දුක්ඛ බැවින් ම අනාත්මයහ. මෙවන් ත්‍රිලක්ෂණාවබෝධයකින් පසේබුද්ධත්වයට පත් උන් වහන්සේ, නෙක්ඛම්ම සුව විඳිමින්, පවිවේක[1] රසෙහි ගැලෙමින්,

1. විවේක සුව

වූපසම[1] සුඛයෙන් පිරී ඉතිරී යමින්, ලෝකෝත්තර සුඛයෙන් සිසිල් වෙමින් ඛගවෙණ අඟක් සේ, දෙවැනි වූ පුද්ගලයකු හෝ දෙවැනි වූ ක්ලේශයන් නො මැතිව එකලාව ම හැසිරෙති.

## ගාථා අංක 11 සහ 12

**සචෙ ලභේථ නිපකං සහායං**
**සද්ධිං චරං සාදු විහාරි ධීරං**
**අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි**
**චරෙය්‍ය තේනත්තමනෝ සතීමා**

**නො චෙ ලභේථ නිපකං සහායං**
**සද්ධිං චරං සාදු විහාරි ධීරං**
**රාජාව රට්ඨං විජිතං පහාය**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

කාශ්‍යප බුදුරදුන් කල ගතපච්චාගත වත පිරූ දෙදනකු, පසුව එක් අයෙකු රජකු වශයෙන්ද, අනෙකා පුරෝහිත පුත් වශයෙන් ද ඉපැද, එක් පසේබුදු කෙනකුට මිනිසුන් උපස්ථාන කරනු දැක, පසේබුදුරදුන් ශිල්ප දනිතැ'යි සිතා ගොස් තමන්ටත් ශිල්ප උගන්වන ලෙස ඉල්ලති. එසේ නම් පැවිදි වන්නැයි වදාළ බැවින් පැවිදි වෙති. පසුව පසේබුද්ධත්වයට පත්ව ගැයූ උදාන ගාථා දෙකයි මේ.

**සාධු විහරණයන් ගෙන් සමන්නාගත, ධීර වූ, නැණවත් වූ සහායකු ලැබේ නම්, සියළු උවදුරු මැඩ, ඔහු සමග සතුටින් හැසිරෙන්න.**

**එවැන්නකු නො ලැබෙන කල, රාජ්‍යයක් අතහැර දමා යන රජකු සේ, ඛගවෙණ අඟක් මෙන් එකලාව ම හැසිරෙන්න.** මෙම

---

1. කෙලෙස් සන්සිඳීමෙන් ලැබෙන සුවය

ගාථාවලින් දැක්වෙන සාමාන්‍ය අදහස මෙය යි.

මෙහි 'සාධුවිහාරි' යනුවෙන් හැඳින්වෙන්නේ පළමු ධ්‍යාන-දෙවන-තෙවන-සිවුවන ධ්‍යාන-ආකාසානඤ්චායතන-විඤ්ඤාණඤ්චායතන-ආකිඤ්චඤ්ඤායතන-නෙවසඤ්ඤානාසඤ්ඤායතන-ඵල සමාපත්ති-නිරෝධ සමාපත්ති -කාය විවේක-චිත්ත විවේක-උපධි විවේක-අරිය විහරණ-බ්‍රහ්ම විහරණ-දේව විහරණ-අනිමිත්ත සමාධි-අප්පණිහිත සමාධි හා සුඤ්ඤත සමාධි යනාදිය යි. මෙවන් සාධු විහරණයන්ගෙන් සමන්නාගත වූ ඒ පසේබුදුපියාණන් වහන්සේ ඇසුරු කළ එම බෝසතාණන් ද මෙම සාධු විහරණයන් සම්පාදනය කර ගත්හ. මෙයින් මාර්ග හා නිරෝධ සත්‍යයන් දෙක දැක් වේ.

සතුරු රජ කෙනකු සිය රාජ්‍යය අල්ලා ගැනීමට එන විට, තමන් පරදින බව දන්නා රජ කෙනකු සිය රාජ්‍යය අතහැර දමා යා යුතු ය. නො එසේ නම් මරණය පවා සිදු වේ. ලෝභනීය පුද්ගලයන් හා වස්තූන් අත් නො හරින තැනැත්තා, එම නිසා ම සංසාරයේ නිමග්න වෙමින් අනන්ත අප්‍රමාණ මරණ දුක් වලට පත් වන්නේ ය. එසේ ම ජාති ජරා ආදී අනෙක් දුක්ඛයන් ද ඔහු කරා පැමිණේ. එම නිසා සියළුම ආශාවන් හළ යුතු ය. මෙයින් දැක්වෙන්නේ දුක්ඛ හා සමුදය සත්‍යයන් ය.

(අභිභූය්‍ය සබ්බානි පරිස්සයානි යන්න ගාථා 8 අනුව අවබෝධ කර ගන්න).

මෙසේ භාවිතා කළ යුතු ධර්මයන් වර්ධනය කරමින්, හළ යුතු ධර්මයන් පහාතබමින්, පිරිසිඳ දතයුතු වූ ධර්මයන් පිරිසිඳ දනිමින්, සාක්ෂාත් කළ යුතු ධර්මයන් ප්‍රතිවේධ කරමින් පසේ බුද්ධත්වයට පත් උන්වහන්සේ ඒකචාරී විහරණයන්ගෙන් ම වැඩ සිටිති.

## ගාථා අංක 13

**අද්ධා පසංසාම සහාය සම්පදං**
**සෙට්ඨා සමා සේවිතබ්බා සහායා**
**ඒතේ අලද්ධා අනවජ්ජභෝජී**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

කාශ්‍යප බුදුරදුන් කල මහණදම් පිරූ දෙදෙනකු බරණැස ඉපැද එක් අයකු පසේබුද්ධත්වයට පත් වේ. අනෙකා තමා දුටු සිහිනයක අපල ගෙවා දැමීමට යාගයක් කිරීමට සූදානම් වෙයි. මෙය දුටු පසේබුදුපියාණෝ සිය පැරණි සහායකයාට උපකාර කිරීමට සිතා එහි වඩිති. උන්වහන්සේගේ නම කවරේදැයි විමසූවිට 'අනවජ්ජභොජී' යැයි දේශනා කොට අහසින් වඩිති. මෙය විදසුන් ඇසින් බලමින් පසේබුද්ධත්වයට පත්ව කළ ප්‍රීති වාක්‍යය මෙම ගාථාවෙන් දැක්වේ.

මෙහි සාමාන්‍ය තේරුම මෙසේ ය. **කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ඒකාන්තයෙන් ම පසසමු. තමා හා සීලාදී ගුණයන් ගෙන් සම වූ හෝ ශ්‍රේෂ්ඨ වූ හෝ අය සේවනය කළ යුතු ය. එවැන්නකු නො ලැබෙන කල, නිවැරදි අන්දමින් ලත් සිවුපසය ම පරිභෝජනය කරමින් ඛගවෙණ අඟක් සේ එකලාව ම හැසිරිය යුතු වේ.**

තමා හා සීල-සමාධි-පඤ්ඤා-විමුත්ති-විමුත්ති ඤාණ දස්සනයන් ගෙන් සම වූ අය හෝ තමාට වඩා එම ගුණ ධර්මයන් වැඩි අය සමඟ ආශ්‍රය කිරීමෙන් තමාගේ නූපන් ශීලාදී ගුණ ධර්ම වැඩේ. උපන්නාවූ ගුණ ධර්ම විපුලත්වයට පත් වේ. තමා පිරිහීමකට පත් නො වේ.

'අනවජ්ජභෝජී' වීමට [1] කුහනා, ලපනා, නේමිත්තිකා, නිප්පේසිකතා, ලාභේනලාභ නිජගිංසනතාවන් ගෙන් වෙන්ව, පුෂ්ප දාන වේළු-දාරු-පත්ත-ඵල-සිනාන-චුණ්ණක-මත්තික-දන්තකට්ඨ-මුඛෝදක ආදී දානයන් ගෙන් විනිර්මුක්තව, වත්ථු-තිරච්ඡාන-අංග-නක්ඛත්ත ආදී විජ්ජාවන්හි නො යෙදී, චාටුකම්‍යතා, මුග්ගසුප්පතාය,

1. මේ සියල්ල පැවිද්දකු විසින් ජීවිතය පවත්වා ගෙන යාම සඳහා නො කළ යුතු දේ ය. උප ග්‍රන්ථය බලන්න.

පාරිභට්ඨතාය, පිට්ඨිමංසිකතාය යනාදියෙන් සපුරා වෙන් වී, දූතගමන, වෛද්‍ය කර්ම ආදිය ද නො කර ධාර්මිකව ම කැපසරුප් අන්දමින් සිවුපසය සෙවිය යුතු ය, පරිභෝග කළ යුතු ය. මෙයින් අදහස් වන්නේ ආජීව පාරිසුද්ධ ශීලය ය.

මෙවන් පරිසුද්ධාජීවයකින්[1] සමන්නාගත ව බගවෙණ අඟක් සේ ම උන්වහන්සේ එකලාව ම හැසිරෙති.

## ගාථා අංක 14

**දිස්වා ස්වණ්ණස්ස පභස්සරානි**
**කම්මාරපුත්තේන සුනිට්ඨිතානි**
**සංඝට්ටමානානි දුවේ භූජස්මිං**
**එකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බරණැස් රජ කෙනෙක් එක් අතක වළළු දෙකක් ඇති විට ශබ්ද ඇති වන බවත්, එක් වලලක් පමණක් ඇති අතේ ශබ්ද ඇති නො වන බවත් දැක, ඒ පාදක කොට විදසුන් වඩා පසේබුද්ධත්වයට පත් වේ. ඉන් පසු පළ කළ ප්‍රීති වාක්‍යයයි මේ.

මෙහි කෙටි තේරුම මෙසේ දැක්විය හැකි ය. **රන්කරුවා විසින් මැනවින් නිම කරන ලද දිලිසෙන ස්වර්ණමය වළලු දෙකක් එක් අතක ඇති විට, එය ගැටෙන බව දැක, බගවේණ අඟක් සේ නො ගැටී එකලාව ම හැසිරේ.**

වළළු දෙක එකට ගැටෙන්නා සේ, තණ්හා හා දිට්ඨි දෙකින් යුතු පුද්ගලයා වරෙක නිරයේ ගැටේ. තව වරෙක ප්‍රේත ලෝකයේ ගැටේ. මෙසේම තිරිසන් ලෝකයේ ගැටේ. මනුස්ස ලෝකයේ ගැටේ. දෙව්ලොව බඹලෝ යන ලෝකයන්හි ද ගැටේ. මෙසේ

1. පිරිසිදු වූ ආජීවයකින්

ගැටෙමින් නැවත නැවත ඉපදෙමින්, ගතියෙන් ගතියට, උප්පත්තියෙන් උප්පත්තියට, භවයෙන් භවයට, වට්ටයෙන් වට්ටයට, ප්‍රතිසන්ධියෙන් ප්‍රතිසන්ධියට, සංසාරයෙන් සංසාරයට යෙමින් මේ දුක්ඛ සංසාරයෙහි ම සංසරණය වේ. මේ සංසරණය තිබෙන තාක් කල් සසරෙහි කෙළවරක් නැත; දුකෙහි නිමාවක් නැත. එබැවින් මේ භයානක දුක් ඇතිකරනු ලබන ආශාව නැමැති සමුදය ප්‍රහාණය කළ යුතු ය. ඒ තණ්හාව උපදවාලන අවිද්‍යාව මුලිනුපුටා දැමිය යුතු ය. අවිද්‍යාව නැසීමට ප්‍රඥාලෝකය පහළ කර ගත යුතු ය. ප්‍රඥාව ඇතිවීමට ඇත්ත ඇති සැටියෙන් දැකිය යුතු ය. ඇත්ත ඇති සැටියෙන් දක්නා යථාභූත ඤාණ දර්ශනය පහළ වන්නේ අනිත්‍ය දෙය අනිත්‍ය වශයෙන් ම, දුක්ඛ දෙය දුක් වශයෙන් ම, අනාත්ම දෙය අනාත්ම වශයෙන් ම දකිමින්, විපරිත සඤ්ඤාවන් දුරු කරලීමෙනි. සියළු සංස්කාරයෝ අනිත්‍යයෝ ය, සංස්කාරයන්ගේ පැවැත්ම ම දුක්ඛ ය, සංස්කාරයන්ගේ නිරෝධය ම පරම සුවය වන්නේ ය. මෙවන් සුවය ද ඇතුළු සකල ධර්මයෝ ම අනාත්මයහ.

මෙවන් භාවනා මනසිකාර තුළින් පච්චේක බෝධිඤාණය ලත් උන්වහන්සේ ක්ලේශ සමඟ නො ගැටී, සංස්කාර සමඟ නො ගැටී, එක් වළල්ලක් සේ, ඛගවේණ අඟක් සේ වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම හුදෙකලා වූ සේක.

## ගාථා අංක 15

**ඒවං දුතියේන සහා මම'ස්ස**
**වාචාභිලාපො අභිසජ්ජනාච**
**ඒතං භයං ආයතිං පෙක්ඛමානො**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බරණැස් රජ කෙනෙක් රාජ්‍යය පාවාදී පැවිදි වීමට යාමට අදහස්

කළ කල්හි, රාජ්‍යයට හිමිකම් කීමට පුතකු ලබා දී යන්නැ'යි කළ ඉල්ලීමට ඉඩ දී නතර වේ. පසුව පුත්‍රයා වැඩිවිය පැමිණෙන තෙක් නතර වීමට සිදු වෙයි. මෙසේ කාලයක් ගොස් පැවිදි වී, යාමට සූදානම් වන විට මහජනයා පසුපස එති. රජතුමා පොළොවේ ඉරක් ඇඳ මෙයින් එහාට නො එන ලෙස අණ කරයි. මහජනයා පුතා පසුපස යවති. රජු පුතා ද සමඟ කැලයට යෙති. මැසි මදුරු සීතල ආහාර ආදිය නිසා පුතාගේ කැගැසීම් ඇත. රජු පුතා ආපසු ගෙනවුත් භාර දී පසුව හුදකලාව ම කැලයට ගොස් භාවනා කොට පසේබුද්ධත්වයට පත් වේ. ඉන් පසු නික්මුණු උදානයයි මේ.

**මට දෙවැන්නකු සිටි බැවින් නිසරු වචන ද ඇලීම් ද ඇති විය. දෙවැන්නකු සිටීමේ මේ බිය දැක, ඛඟවේණ අඟක් සේ එකලාව ම හැසිරෙමි යන්න** මෙම ගාථාවේ සාමාන්‍ය අදහස ය.

දෙවැන්නකු සිටීම යන්නෙන් අදහස් වන්නේ පුද්ගලයකු දෙවැන්නකු වශයෙන් සිටීම හා තණ්හාව දෙවැන්නකු වශයෙන් සිටීම ය. පුද්ගලයකු දෙවැනි කොට සිටින කල්හි නිසරු කථා ඇති වේ. රාජ කථා - චොර කථා - මහා මත්ත - සෙනා - භය - යුද්ධ - අන්න - පාන - වත්ථ - යාන - සයන - මාලා - ගන්ධ - ඤාති - ගාම - නිගම - නගර - ජනපද - ඉත්ථි - පුරිස - සූර - විසිඛා - කුම්භට්ඨාන - පුබ්බපේත - නානත්ත කථං - ලෝකක්ඛායිකං - සමුද්දක්ඛායිකං - ඉතිභවාභව කථං යනාදී එම දෙතිස් කථාවෙන් වැළකිය යුතු ය.

අප්පිච්ඡ කථා - සන්තුට්ඨි කථා - පවිවේක කථා - අසංසග්ග කථා - විරියාරම්භ කථා - සීල කථා - සමාධි කථා - පඤ්ඤා කථා - විමුත්ති කථා - විමුත්තිඤාණදස්සන කථා - සතිපට්ඨාන සම්මප්පධාන - ඉන්ද්‍රිය - බල - බොජ්ඣංග - ආර්ය අෂ්ඨාංගික මග්ග - මග්ග ඵල - නිබ්බාන සම්බන්ධ කථාවන් හැර මෙම දෙතිස් කථාවේ යෙදීමෙන් ස්වකීය අර්ථය ද, අන් අයගේ අර්ථය ද, උභයාර්ථය ද, මේ ලෝකාර්ථය ද, පරලෝකාර්ථය ද, නිබ්බානපරමාර්ථය ද විනාශ වන්නේ ය. පරිහානියට පත් වන්නේ ය. අභිවෘද්ධියට හානිකර වන්නේ ය.

තණ්හාව දෙවැන්නකු කොට සිටින විට උත්පත්තියෙන් උප්පත්තිය ගැට ගැසෙමින් නැවත නැවත සංසාර දුක්ඛයෙහි ම ගැලෙන්නේ ය.

**"තණ්හා දුතියෝ පුරිසෝ දීඝමද්ධාන සංසරං**
**ඉත්ථභාවඤ්ඤථාභාවං - සංසාරං නාතිවත්තති"**
යනුවෙන් බුදුපියාණන් වදාළේ මෙම අදහස ය.

'අභිසජ්ජනාච' යනුවෙන් මෙම ගාථාවෙන් දැක්වෙන්නේ තණ්හා සජ්ජනා හා දිට්ඨි සජ්ජනා යන දෙක ය. සචේතනික වූ සත්ව පුද්ගලයන් සම්බන්ධයෙන් හෝ අචේතනික වූ වෙනත් සංස්කාර සම්බන්ධයෙන්, සත්වයා තණ්හාවෙන් හෝ දිට්ඨියෙන් ඡන්දරාග පටිබද්ධ ඇලීම් ඇති කර ගනී. (ගාථා 14 විස්තරය ද බලන්න). යම්තාක් තණ්හා දිට්ඨි ඡන්දරාගයන් ඇත්ද, ඒතාක් සසරෙන් මිදීමක් නැත. එබැවින් එය පහ කළ යුතු ය. (මින් දැක්වෙන්නේ සමුදය සත්‍යය ය).

මේ ආදී අනන්ත ආදීනවයන් දකිමින් පච්චේක බෝධි ඤාණ පටිලාභයෙන් පසේබුද්ධත්වයට පත්ව උන්වහන්සේ ඛගවේණ අඟක් සේ ඒකචාරීව ම වැඩ වෙසෙති.

## ගාථා අංක 16

**කාමාහි චිත්‍රා මධුරා මනෝරමා**
**විරූප රූපෙන මථෙන්ති චිත්තං**
**ආදීනවං කාමගුණේසු දිස්වා**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

සිටු පුතකු දෙමාපිය විරෝධය මැද කුඩා කලම පසේබුදුරුන් කෙනකු වෙත පැවිදි වේ. ආසන හා ආහාර ගැන කළකිරී නැවත ගිහි වේ. මෙසේ ම තෙවරක් ම ගිහිවී, මහණ වී, පසුව පසේ බුද්ධත්වයට පත්ව කළ ප්‍රීති වාක්‍යයයි මේ.

**කාමයෝ විචිත්‍රයහ, මධුරයහ, මනොරම්‍යයහ. විවිධාකාර කාම වස්තූන් ගෙන් සිත් කැළඹේ. තුටුවේ. සිත් අලවනු ලැබේ. (එහෙත් කාමයන්ගේ ආදීනව බොහෝ ය). මෙම කාමගුණයන්ගේ ආදීනව**

**දැක බගවේණ අඟක් සේ එකලාව හැසිරේ.** මෙම ගාථාවේ කෙටි තේරුම මෙයයි.

වත්ථු කාම, ක්ලේශ කාම යැයි කාමයෝ දෙවැදෑරුම් ය. මනාප රූප ශබ්ද ගන්ධ රස පොට්ඨබ්බ ආදීහු වත්ථු කාමයෝ ය. ඡන්ද ආදී රාගයේ ප්‍රභේදයෝ කිලෙස කාමයෝ ය. බාල පුථුජ්ජනයන්ගේ මනස තුටු කරවන බැවින්, රමනය කරවන බැවින් කාමයෝ මධුරය, මනෝරම්‍ය යැයි කියනු ලැබේ.

කාමයෙහි ආදීනවයන් බොහෝ ය. **"අප්පස්සාදා කාමා, බහු දුක්ඛා, බහුපායාසො, ආදීනවෝ එත්ථ භියෝයා"**, කාමයන් ගෙන් ලැබෙන ආශ්වාදය ඉතා සුළු ය. ඒ ආශ්වාදය ද ඉබේම ආකස්මිකව නො ලැබේ. ඒවා ලබා ගැනීම සඳහා වෙහෙසිය යුතු ය. ලද කාම සුඛය ද, අකුශල සංස්කාරගත කර්ම රාශියක් ඉතිරිකර තබා වහා බිඳී යන්නේ ය. ඒ සුළු කාමාශ්වාදය නිසා ම සත්වයෝ අපායට යති, තිරිසන් ලෝකයට යති. ප්‍රේතයන් අතරට යති, සසරෙහි ම රැඳෙති. අති දීඝී කාලයක් දුක් අනුභව කරති. නන්ද නැමැති මානවකයා උප්පලවණ්ණා මහ රහත් මෙහෙණින් වහන්සේ දූෂණය කළේ ය. එයින් ඔහුට ලැබුණු ආශ්වාදය විනාඩි ගණනක සුළු එකකි. එහෙත් ඒ ආශ්වාදයට වන්දි ගෙවමින් ඔහු අද දක්වා ම අපායේ පැසෙයි. තව බොහෝ කල් ඉදිරියේදී ද නිරා දුක් විඳියි. ඔහුට ලැබුණු අශ්වාදය වැලි කැටයක් තරම් නම්, ඒ ආශ්වාදය නිසා ලද දුක මහ පොළොව තරම් විශාල ය. කාමයන්ගේ ආශ්වාදය ඉතා සුළුය. එහෙත් ඉන් ලැබෙන ආදීනවය, උපායාසය, දුක්ඛය, ඉතා බොහෝ ය.

**"යං ඛො භික්ඛවේ ඉමේ පඤ්චකාම ගුණේ පටිච්ච උප්පජ්ජති සුඛං සෝමනස්සං, ඉදං වුච්චති කාම සුඛං, මීළ්හ සුඛං, පුථුජ්ජන සුඛං, අනරිය සුඛං, න සේවිතබ්බං, න භාවේතබ්බං, න බහුලීකාතබ්බං, භායිතබ්බං ඒතස්ස සුඛස්සාති වදාමි."** පඤ්චකාම ගුණිත සුඛයන් වේ නම් එය අසූචි සුඛයකි. පුථුජ්ජන සුඛයකි. අනරිය සුඛයකි. එය සේවනය නො කළ යුතු ය. එයට බිය විය යුතු ය.

**"භයන්ති භික්ඛවෙ කාමානං අධිවචනංඃ රෝගෝති .... / ගණ්ඩෝති .../ සල්ලොති .... / භික්ඛවේ කාමානං අධිවචනං"** කාමය නිසා

දිට්ඨම්මික භයෙන් ද නො ගැළවේ. සම්පරායික භයෙන් ද නො මිදේ. එබැවින් බිය යනු කාමයට ම නමකි. කාමයෝ රෝගයෝ ය. කාමයෝ අසූචි වැගිරෙන නිසා ගඩුවක් වැනි ය. සත්වයාට උලකින් අනින්නාක් වැනි නිසා කාමයෝ උල් වෙති.

කාමයන්ගෙන් ලබන සැපය අල්ප ය, පහත් ය, මද ය, ලාමක ය, හීන ය, ස්වල්ප ය, **"අප්පකං ඒතං සුඛං, ඕමකං ඒතං සුඛං, ථෝකං ඒතං සුඛං, ලාමකං ඒතං සුඛං, ඡත්තකං ඒතං සුඛං, පරිත්තං ඒතං සුඛං."**

කාමයෝ හීන ය, ග්‍රාම්‍ය ය. පෝථුජ්ජනික ය. අනාර්ය ය. අනර්ථ සංහිත ය. **",.... හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ අනරියො අනත්ථසංහිතෝ"**

**"අට්ඨිකඞ්ඛලූපමා කාමා වුත්තා භගවතා. මංසපේසූපමා.... / තිණුක්කූපමා / අංගාරකාසූපමා / සුපිනකූපමා / යාචිතකූපමා / රුක්ඛඵලූපමා / අසිසූනූපමා / සත්තිසූලූපමා / සප්ප සිරූපමා, කාමා"** / කාමයෝ මස් ලේ නැති ඇටයක් බඳු ය (ගාථා 17 බලන්න). සර්ප හිසක් බඳු ය.

කාමයන් නිසාම සීතල උෂ්ණ සා පිපාසා ඉවසමින්, අතිශයින් දුක් විඳිමින් නොයෙක් කර්මාන්ත කරන්නට සිදුවන්නේ ය. එවැනි මහන්සියකින්, වෙහෙසකින් වුව තමාට රිසිසේ කාමයෝ නූපදිති. එයින් සෝක කිරීමට, තැවීමට, සුසුම්ලෑමට "අහෝ මාගේ උත්සාහය සාර්ථක වූයේ නැහැ" කියා කීමට සිදු වන්නේ ය.

එසේ උත්සාහයෙන් ලත් කාමයන් ද සොර සතුරු සත්ව ආදීන් ගෙන් දුක් විඳිමින් ආරක්ෂා කිරීමට සිදු වන්නේ ය. කෙතෙක් ආරක්ෂා කළත්, සොරුන් ගෙන්, සතුරන් ගෙන්, ගින්නෙන්, ජලයෙන් හා නොයෙක් හේතූන් ගෙන් ඒවා විනාශ වන්නේ ය. ඒ දුක ලැබෙන්නේ ද කාමයන් නිසා ය.

කාමයන් නිසාම වාද විවාද අඩදබර ජීවිත හානි පවා සිදු වේ. දූ පුතුන් දෙමාපියන් සොයුරු සොයුරියන් සමඟ පවා කාමයන් නිසා වාද විවාද ඇති වේ.

කාමයන් නිසාම අති බිහිසුණු යුද්ධ වලට යාමට, යුද හමුදා වලට බැඳීමට, එසේ බැඳී යුද කිරීමට, ඉන් අත්පා ආදිය නැති වීමට, ජීවිතය නැති වීමට, තවත් බොහෝ දුක් විඳීමට ද සිදු වේ.

කාමයන් නිසාම කායික දුච්චරිත, වාචසික දුච්චරිත, මානසික දුච්චරිත සිදු කෙරේ. සොරකම් කිරීම්, මිනී මැරීම් ආදී මෙවන් දුච්චරිත නිසා පොලීසි, උසාවි, හිර ගෙවල්, එල්ලුම් ගස් හා මරණින් මතු සතර අපායන් වෙත යාමට සිදු වේ.

තමාගේ පංචස්කන්ධය සම්බන්ධයෙන් ද අන් අයගේ පංචස්කන්ධයන් සම්බන්ධයෙන් ද කාමයෝ පහළ වෙති. අපවිත්‍ර වූ, දුගඳ හමන, බිය එළවන, කුණපයක් වූ, නිරතුරු අසූචි වැගිරෙන වැසිකිලි වලක් සේ පිළිකුල් වූ, අසූචියෙන් පිරුණු සම් පසුම්බියක් බඳු වූ මේ කුණුකය අභිනිවේෂ කරන්නේ කුමක් නිසා ද ? මෙහි ඇති පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතූන් කෙරෙහි ඡන්දරාගයක් ඇති කර ගන්නේ මක්නිසාද ? දුකක් නිසා, හුලක් නිසා, අසූචි වැගිරෙන නිසා, උප්පාද ජරා මරණ ඇති නිසා, මහත් වූ ගඩක් වණයක් නිසා, අසූචියෙන් බරවූ නිසා මෙහි ලා කවර ඇල්මක් ද ? මරණය කරා නිරතුරු ළඟාවන, එයින් ම මරහු ළඟ සිටි මේ කුණු කය මෙහි ම හැරපියා යා යුතු නො වේ ද ?

උමතු බව ඇති කරවන, අවිද්‍යාවෙන් වසාලන, දිට්ඨියෙන් බැඳී යන, සසරෙහි රඳවාලන, නිවන් මග වසාලන මෙම කය එක ම දුක්ඛ පිණ්ඩයක් නො වේ ද? නිරන්තරයෙන් බිඳී යන, වමන ආදියෙන් නිපදවන, වශයෙහි නො පවත්වනා මෙම කය කෙරෙහි 'මම' 'මගේ' යැයි ගනු ලබන කවර නම් මමායනයක් ද ? ෂඩ්ද්වාරික වූ, ද්වාදස ආයතනික වූ සචේතනික අචේතනික අධ්‍යාත්මික බාහිර සියළු සංස්කාරයන් මාරයා විසින් අටවන ලද පායාස නො වේ ද ? අල්ප වූ කාමසුඛය නිසා, මහත් වූ ලොවුතුරු සැපය කුමකට දුරු කරම් ද ? ස්වකීය පංචස්කන්ධ සංඛ්‍යාත සියළු කාම ලෝකය නිසා අනමතග්ග සංසාරයේ කෙතෙක් නම් දුක් වින්දෙම් ද ? අපරිමිත දුක් දොම්නස් ලබා දුන් භවමූලික 'කාම' සංඛ්‍යාත තෘෂ්ණාව අත්හරුව.

මේ ආදී අනේක සත සහස්‍ර ආකාරයෙන් දුක්ඛ සත්‍යය ද, දුක්ඛ සමුදය සත්‍යය ද දකිමින්, ඒ අනුසාරයෙන් සෙසු ආර්ය සත්‍ය ද්වය ද පටිවේධ කරමින් ස්වයම්භූඥාණයෙන් ම ත්‍රිලක්ෂණාවබෝධය කොට, පච්චේකබෝධි ඥාණය ප්‍රතිලාභ කළ ඒ පසේබුදුපියාණෝ විසංයෝගව, විසංයුත්තව, අනූපලිත්තව[1], සීතිභූතව[2] ඛගවේෂණ අඟක් සේ එකචාරි විහරණයෙන් ම වැඩ සිටිසේක.

## ගාථා අංක 17

**ඊතීච ගණ්ඩෝච උපද්දවොච**
**රෝගෝච සල්ලංච භයංච මේතං**
**ඒතං භයං කාමගුණේසු දිස්වා**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බරණැස් රජ කෙනකු ශරීරයේ හටගත් ගෙඩියක් පලා සුවයක් ලබා ගනී. එහෙත් තෙවරක් ම මෙම ගෙඩිය මතු වේ. තෙවරක් ම පලා සුව කිරීමට සිදු වේ. මෙයින් කළ කිරීමට පත් රජු පැවිදි වේ. පසුව පසේ බුද්ධත්වයට පත්ව මේ උදානය ගැයූහ.

**කාමය ව්‍යසනයකි. ගණ්ඩයකි. උපද්‍රවයකි. රෝගයකි. උලකි. භයකි. කාමයේ මේ භියජනක ස්වරූපය දැක (ඉන් වෙන්වී) ඛගවේෂණ අඟක් සේ එකචාරීව වෙසේ.** මෙම ගාථාවෙන් දැක්වෙන්නේ මෙම කෙටි අදහස ය.

කාම වස්තූන් පිළිබඳව හෝ ඉන් ජනිත වන ආශ්වාදය අභිනන්දනය කිරීමෙන් ඇතිවන කිලේශ ආශ්වාදය නිසා කාමය පහළ වේ. රාගය ආලය ආදරය ප්‍රේමය ආශාව ඕනෑකම තණ්හාව ඡන්දරාගය

1 නොඇලී
2 කෙලෙස් දැවිලි නො මැති බැවින් සිසිල් භාවයට පත්ව.

ලෝභය සෙනහස ඇල්ම යනාදී නොයෙක් අයුරින් දැක්වෙන්නේ ද කාමය ම ය.

අඹු දරුවන්-දෙමාපියන්-සොයුරු සොයුරියන්-හිතමිතුරන්-ගුරු ගෝලයන්-මැති ඇමති වරුන් වැනි ප්‍රභූවරයන්, නොයෙක් ආකාර තිරිසන් ගත සතුන් ආදි සත්වයෝ ද කාමවස්තූහු ය. (ගාථා 26 ද බලන්න).

සිනහව-කථා කිරීම-හැඬීම-ගායනය කිරීම-ක්‍රීඩා කිරීම-බැලීම-ගමනබිමන-ආදී ක්‍රියාවන් ද, පර්වත ආරණ්‍ය සේනාසන-ඇළදොළ ගංගා-වනපෙත්-කුඹුරු-ඉර-සඳ-තාරකා-වැව්-පොකුණු-රන් රිදී- මුතු මැණික්-දිය-ගිනි-සුළං-ශීතල-උෂ්ණ-ආලෝක-අන්ධකාර යනාදී ස්වාභාවික වස්තූන් ද කාම වස්තූහු ය.

ආහාර පාන - චීවර සේනාසනාදී සිවුපසය - ඇඳුම් පැළඳුම් - ගෙවල්, රථවාහන, ඇඳ පුටු මේස ආදී සියළු වස්තූන් ද කාම වස්තූහු ය.

තනතුරු - කීර්ති ප්‍රශංසා - ගරු බුහුමන් - නොයෙක් භාෂා දැනුම් - ශිල්ප ශාස්ත්‍ර - ධර්මය දැනීම - දහම් දෙසීමේ හැකියාව - විචිත්‍රව ගාථා සජ්ඣායනය කිරීමේ හැකියාව යනාදිය ද, විහාර දාගැබ් බුද්ධ රූප - බෝ මළු - ධර්ම පුස්තක පාත්‍ර සිවුරු ආදී ආගමික වස්තූන් ද කාම වස්තූන් ම ය.

දායක කාරක උපස්ථායක ආදීහු ද කාම වස්තූහු ය.

නෑදෑ හිතමිතුරන් දෙමාපිය සොයුරු සොයුරියන් දැකීමේ ආශාව, ක්‍රීඩා, පෙරහැර, උත්සව, පිංකම් ආදිය දැකීමේ ආශාව, නොයෙක් ආකාර විසිතුරු සතුන් ගල් පර්වත කඳු ආරණ්‍ය වැනි දේ දැකීමේ ආශාව, කාම වස්තූන් ලබා ගැනීමේ ආශාව, තිබෙන කාම වස්තූන් රැක ගැනීමේ ආශාව, දූ දරුවන් අඹුවන් සිප ගැනීමේ වැළඳ ගැනීමේ එක්ව විසීමේ ආශාව, සුරතල් මිහිරි වදන් ඇසීමේ ආශාව, නොයෙක් සුගන්ධ වර්ගයන් ආඝ්‍රාණය කිරීමේ ආශාව, වස්ත්‍රාභරණ සිවුරු පිරිකර සේනාසන මිදුල් බෝමළු ආදිය විසිතුරු කිරීමේ ආශාව,

පහසුවෙන් ගමන් කිරීමේ ආශාව, උත්සව පිංකම් පැවැත්වීමේ ආශාව, ඒවාට සහභාගී වීමේ ආශාව, ස්තුති ප්‍රශංසා ගරු බුහුමන් ලැබීමේ ආශාව, නොයෙක් දෑ ඉගෙන ගැනීමේ ආශාව, ශරීරය සුවපත් කිරීමේ ආශාව, ලබාගත් ධ්‍යාන පිළිබඳ නිකන්ති නම් වූ ආශාව, ඍද්ධි ප්‍රාතිහාර්යයන් පිළිබඳ ආශාව, අන් අයට වඩා විශේෂත්වයක් ඇතිව කැපී පෙනෙන ධූතාංග රකිමින් එකචාරීව අල්පේච්ඡව සිටීමේ ආශාව, භාවනාව දහම් කරුණු ආදිය කියා දීමේ ආශාව යනාදී දස දහස් ලක්‍ෂ කෝටි ආකාරයකින් කාමාශාවන් පහළ වේ.

මේ නොයෙක් ආකාර කාමයෝ සීල සමාධි පඤ්ඤා සතිසම්පජඤ්ඤ වීරිය ආදී කුශලයන් වනසන බැවින් මහත් ව්‍යසනයෝ ය. කාම වස්තූන් ඇති නිසාම සීල ව්‍යසන, ඥාති ව්‍යසන, භෝග ව්‍යසන ආදී අනේකප්‍රකාර ව්‍යසනයෝ ඇති වෙත්. ඥාතීන් ආදීන් නො මැති නම් ඥාති ව්‍යසනයක් කොයින් ද ? භෝගයක් නැති නම් භෝග ව්‍යසනයක් කොයින්ද ? මේ ආදී ව්‍යසන නිසා සත්වයෝ වෙහෙසට දුකට පීඩාවට පත් වෙති. මේ නිසාම ඔවුහු හඬති - වැළපෙති - පරිදේව කරති. සමහර විට ශෝකය ඉසිලීමට නො හැකිව සිහි මූර්ඡාවී වැටෙති. මේ කාමයන් ආරක්ෂා කිරීමට නොයෙක් ආකාර කුශලාකුශල සංස්කාර රැස් කෙරෙති. ඉන් භයානක සංසාරයේම ගැලෙති. දුකින් දුකට ම, ශෝකයෙන් ශෝකයට ම, පරිදේවයෙන් පරිදේවයට ම, ජාතියෙන් ජාතියට ම පරිභ්‍රමණය වෙති. සසරින් නො මිදෙති. නිවනෙන් ඈත් වෙති. නිවන් මග අහුරා ගනිති.

කාමයෝ ගණ්ඩයෝ ය. ගෙඩි වලින් දුගඳ හමන කුණු ලේ සැරව ගලන්නේ ය. විශාල දුකක් ලැබෙන්නේ ය. මෙසේම චක්ෂු ද්වාරයෙන් ද ශ්‍රොත්‍ර ද්වාරයෙන් ද, ඝ්‍රාණ ද්වාරයෙන් ද, ජිව්හා ද්වාරයෙන් ද, කාය ද්වාරයෙන් ද, මනෝ ද්වාරයෙන් ද, ක්ලේශ නැමැති අසූචි වැගිරෙන්නේ ය. රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ ධම්ම යන කාම වස්තූන් නිසා, ක්ලේශ අසූචි මෙසේ උතුරා පිටාර ගලන්නේ ය. ඒ ක්ලේශයන් නිසා ම සත්වයෝ කිලෙසෙති. ඉන් ජාති ප්‍රපාතයට වැටෙති, ජරා ප්‍රපාතයට වැටෙති, ව්‍යාධි මරණ ශෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස ප්‍රපාතයන්ට වැටෙති. එම ප්‍රපාතයෙන් ගොඩ නො එති. ගෙඩිය (ගණ්ඩය) තිබෙන තාක්ම දුක් ඇති වන්නා සේ

ආශාව තිබෙන තාක් කල්ම නැවත නැවත ද, නැවත නැවත ද දුක ම පහළ වේ. සත්වයා කාමයන් අභිනන්දනය කරමින් ඒ දුක ම අභිනන්දනය කරති. කාමයන් ප්‍රාර්ථනය කරමින් දුක ම ප්‍රාර්ථනය කරති. කාමයන් රැස් කරමින් දුක ම රැස් කරති. දුක් දෙන කාමය සැපක් ලෙසින් ගනිමින් මෝහයෙන් මුලාවට පත් වෙති. මුලාව නිසා 'සැබෑ සැපය'[1] නො දනිති.

මෙසේම කාමයෝ උපද්‍රවයෝ ය. කාමයන් නිසාම සත්වයන් කරා උපද්‍රවයන් ළඟා වන්නේ ය. සොර සතුරන් පැමිණීම්, ගෙවල් බිඳීම්, නෑ හිතමිතුරන් මරණයට පත් කිරීම්, මං පැහැර ගැනීම්, බිය ගැන්වීම්, නොයෙක් වධ බන්ධන වලට අසුවීම් වැනි උපද්‍රව මෙන් ම, ජලයෙන්, ගින්නෙන්, අව්වෙන්, වැස්සෙන්, සුළඟින් හා නොයෙක් ආකාර සතුන් ගෙන් විවිධාකාර උපද්‍රව කාම වස්තූන් නිසා ඇති වේ. මෙම උවදුරු නිසා සත්වයෝ අපමණ දුකට පීඩාවට වෙහෙසට බියට සංකාවට පත් වෙති. මෙවන් දුක් ඉපැදුනේ කුමක් නිසා ද ? කාමයන් නිසා ය. විවිධාකාර උපද්‍රව ලබා දෙන බැවින් ද, එයින් මහත් දුක් උපදවාලනු ලබන බැවින් ද කාමයෝ උපද්‍රවයෝ ය.

මෙසේම කාමයෝ රෝගයෝ ය. රෝගියකු මැනවින් ආරක්ෂා කළ යුතු සේ, කාමයෝ ද ආරක්ෂා කළ යුත්තාහ. රෝගයන් නිසා මහත් දුක් ලබා දෙන්නා සේ, කාමයන් නිසා මහත් වූ දුකක් ම ලබා දෙන්නේ ය. රෝගයන් නිසා මරණය පවා සිදුවන්නේ ය. එමෙන්ම කාමයන් නිසා සත්වයාට මරණයට පත් වන්නට සිදු වන්නේ ය. අන් අය විසින් කරනු ලබන මරණයට පත් කිරීම් වලට බඳුන් වන්නට සිදුවන්නේ ය. මැරි මැරී යන සංසාරයේ නැවත නැවත ද මැරීමට සිදුවන්නේ ය. මරණයෙන් නො මිදෙන්නේ ය. "අමත සුවය"[2] නො ලබන්නේ ය.

මෙසේම කාමයෝ උල්යහ. ශරීරයට කා වැදී ගිය උලක් සේ, කාමයන් නිසා සත්වයා මහත් දුකකට පත් වන්නේ ය. අවශ්‍යකම තිබුණත් කාම හුල ගලවා දැමීම ද දුෂ්කර ය. කාම හුල නිසා ඉන් ඇතිවන දුක පීඩාව ඉවසිය නො හැකිව සමහරු සිය දිවි නසා ගැනීම පවා

1. නිවන් සුවය
2. නිවන් සුව

කරති. කාම උල නිසා සතර අපායට මරණින් මතු වැටෙති. අපායේදී කාම හුලට වඩා දරුණු වූ උල් වලින් පීඩා විඳිති. "**තත්ථං අයොඛීලං හත්‍ථෙ ගමෙන්ති. තත්‍ථං අයොඛීලං දුතිය හත්‍ථෙ ගමෙන්ති. තත්‍ථං අයොඛීලං පාදේ ගමෙන්ති, තත්‍ථං අයොඛීලං දුතිය පාදේ ගමෙන්ති, තත්‍ථං අයොඛීලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති,**" ගිනිගෙන දැවෙන අති මහත් අයෝමය උල් වලින් අත් පා වලට ද පපුවට ද නිරයේදී ඇනුම් කන්න සිදුවන බව ඉන් දැක් වේ. කාම උල ඇණුන විට, වෙඩි කෑ ඌරකු ලෙසින් සත්වයා දඟලන්නේ ය. අප්‍රමාණ දුක් ගැහැට විඳිමින් දහසකුත් දෑ කරන්නේ ය. එසේ අප්‍රමාණ දුක් ගැහැට තමා විඳින බව ඔහුට නො වැටහෙන්නේ ය. අඹු දරුවන්ගේ යුතුකම් වශයෙන්, දෙමාපියන්ගේ යුතුකම් වශයෙන්, ගුරු ගෝලයන්ගේ යුතුකම් වශයෙන්, රටේ දැයේ භාෂාවේ ජාතියේ ආගමේ යුතුකම් වශයෙන් අනන්ත දුක් ගැහැට විඳිමින් නිරන්තරයෙන් උත්සුක වන්නේ ය. (**උයයුත්තෝ ලෝක සන්නිවාසෝ**). දේපල මිලමුදල් ඉඩකඩම්, උසස්වීම්, තාන්නමාන්න, ගරු බුහුමන්, සැළකිළි ආදී දහසකුත් එකක් ආශා පොදි කරපිට තබා ගෙන ඒ බරින් මිරිකෙන්නේ ය. මේ බර මතට, මහාමේරු පර්වතය සේ අවිද්‍යා බර පැටවෙන්නේ ය. ඒ නිසාම අයෝමය අති මහත් සංයෝජන බන්ධන වලින් දස අතින් බැඳෙන්නේ ය. ලෝකයටම බැඳී ඇති මේ මහත් බන්ධන නිසා ලෝකයේ ම කැරකෙන්නේ ය. ලෝකයෙන් "පරතෙරට"[1] යා හැකි නො වන්නේ ය.

මෙසේ ම කාමයෝ භයක් ද වන්නාහ. බිය ඇති වූ කල්හි සිතට මහත් දුකක් දැනේ. ගින්නෙකින් දැවෙන්නාක් මෙන් ශරීරය හා සිත දැවේ. උගුර කට වියලී දහඩිය දමා ගැහෙයි. සමහර විට මලමුත්‍ර පවා පිට වෙමින් සිහි නැතිව වැටේ. සමහර විට මරණය පවා සිදු වේ. මෙවැනි බියක් කාමයන් නිසා ඇතිවේ. තමාගේ කාම වස්තූන් සොරුන් සතුරන් පැහැර ගනීවි යැයි සිතෙන විට, තමාගේ අඹුවන් සැමියන් සමඟ වෙනත් අය සබඳකම් පවත්වයි යැයි සිතෙන විට, තමාගේ සොයුරු සොයුරියන් දෙමාපියන් අඹු දරුවන් ආදීන්ට කරදර පීඩා රෝගාබාධ මරණ වැනි අනතුරු සිදුවේ යැ'යි, සිදුවී යැ'යි සිතෙන විට, කෙත්වතු ඉඩකඩම් ආදිය ජලයෙන් නියගයෙන් සුළගෙන් සතුන් ගෙන් ආදී විවිධාකාර අයුරින්

1. නිවනට

විනාශ වේ යැ'යි සිතෙන විට, රටේ කලකෝලාහල කැළඹිලි ආරාවුල් යුද්ධ, හදිසි නීති, යුධ නීති, ඇඳිරි නීති, මිනීමැරීම්, මං පැහැරීම් ආදිය සිදුවේ යැ'යි සිතෙන විට, මේ ආදී සිය දහස් ගණන් කරුණු නිසා සත්වයාට මහත් බියක් ඇති වේ. ඒ බිය සැක හා දුක ඇති වූයේ කුමක් නිසා ද ? කාමයන් නිසාම ය.

**"කාමතෝ ජායතී සෝකෝ - කාමතෝ ජායතී භයං"**

කාමයන් නිසා ම ශෝකය ඇති වේ. කාමය නිසා ම බිය ඇති වේ. කාමයන් නැති විට කවර ශෝකයක් ද ? කවර බියෙක් ද ? මෙවැනි දිට්ඨධම්මික භය වලට අමතරව, කාමයන් නිසා සම්පරායික බිය ද ඇතිවන්නේ ය. නිරා බිය - ප්‍රේත බිය - තිරච්ඡානයොනි බිය - අසුර බිය - ජාති බිය - ජරා ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව. දුක්ඛ දෝමනස්ස, උපායාස බිය ජනිත කරවාලන්නේ කාමයන් නිසා ම ය. "නො බිය බව"[1] ලබා දෙන-මාර්ගය වසාලන කාමයෝ 'බිය' වන්නාහ.

මෙවන් බියජනක කාමයෝ; එම බියකරු භාවය අවිද්‍යාවේ අනුග්‍රහය ලැබ වසා දමා, සුඛයක්, මිහිරක්, ආශ්වාදයක්, තබා ගත යුත්තක්, රැස්කර ගත යුත්තක්, ඇලුම් කළ යුත්තක්, නො බිය විය යුත්තක්, විඳිය යුත්තක් ලෙසින් පෙන්වමින් සත්වයන් මුලාවට පත් කරලන්නාහ. හාත්පසින් කැලි කපන ඝන අන්ධකාරයකින් වැසී සිටින සත්වයාට, ප්‍රඥාලෝකයක් පහළ වන තාක් මේ මුලාව අවබෝධ වන්නේ නැත. ඒ තාක් ඔහු අඳුරේ ය. ඒ තාක් ඔහු දුකේ ය. ඒ තාක් ඔහු මෙතර ය. ඒ තාක් ඔහු සසරේ ය.

මෙවන් කාමයෝ මස් ලේ නැති ඇට කැබැල්ලක් වැන්නාහ. මස් ලේ නැති ඇට කැබැල්ලක් ලැබ ගත් බල්ලා එය සපමින්, ලෙවකමින්, ලඟාවන අයට පවා බුරමින් බොහෝ වේලාවක් වෙහෙස විඳින්නේ ය. එහෙත් ඔහුට ඇති වූ වෙහෙස හා දුක හැර අන්තිමේදී ඉතිරි වූ දෙයක් නැත. කමයෝ ද මෙසේ ම වන්නාහ. කොපමණ වෙහෙස ගත්තද, කොපමණ කල් ගිය ද කාමයෙන් තෘප්තියක් ලැබීමට යන්නාට අන්තිමේදී ඉතිරි වන්නේ ඒ වෙහෙසත්, ඒ දුකත්, අනාගත සතර අපා ආදී අනන්ත අප්‍රමාණ දුක් ලබාදෙන

1. නිවන

ඉන් ජනිත වූ අකුශල සංස්කාර රාශියත් පමණි. (**අට්ඨිකඞ්කලූපමා කාමා**). මෙම අතිරික්තය ඉතිරි කර ගැනීමට හා ඉන් මහත් දුක් විඳීමට උත්සුක වන්නේ නම් ඒ අවිද්‍යාව හැර අන් කවරක් ද ? අතෘප්තිකර වූ කාමයෝ, කාමාශ්වාද වින්දනය තුළින් කිසි දිනක තෘප්තිමත් කළ නො හැක්කාහ. පිපාසයට ලුණු දිය බොන්නා සේ කාමාශ්වාද වින්දනය කිරීමෙන් එය තව තවත් ලියල ලියලා වර්ධනය වන්නේ ය. කාමයේ තෘප්තිකර භාවයක් ලැබුයේ නම් එය ඒ මොහොතට පමණි. නැවත නැවත ද අතෘප්තිකර භාවය මතු වන්නේ ය. කාමයන් නිසා කිසි දිනක ඇති වීමක් ඇති වන්නේ නැත. සෑහීමක් ඇති වන්නේ නැත. නිමාවක් ඇති වන්නේ නැත. එහි නිමාවක් දැකිය හැක්කේ අතෘප්තිකර කාමයන් තෘප්තිමත් කරලීමට යාමෙන් නොව, අතෘප්තිකර භාවය සම්පූර්ණයෙන් නසාලීමෙන් පමණි.

මෙසේම කාමයෝ මස් වැදැල්ලක් වැන්නහ. (**මංසපේසූපමා කාමා**). මස් වැදැල්ලක් ගත් කපුටකු වැනි සතෙකුට එය අත්හැර දමන තාක් කල්, අන් කපුටන් ගෙන් බේරීමට ඉඩක් ලබෙන්නේ නැත. කාමයන් අල්ලාගත් තැනැත්තාට ද ඒවා අතහැර දමන තාක් කල් බේරීමට ඉඩක් නො ලැබේ. අඹුවක හිමිකරගෙන සිටින්නාට සිය අඹුව දෙස නොයෙකුත් දෙනා නෙත් අයාගෙන සිටින බව පෙනේ. ප්‍රමාද වන්නේ අවස්ථාවක් ලැබෙන තෙක් පමණි. සමහර විට සැමියා මරා දමා හෝ බිරිය ලබාගන්නා අවස්ථා එමට ඇත. සමහරවිට දෙමාපියන් මරා දූ වරුන් රැගෙන යති. අයිතිකරුවන් මරා වස්තුව පැහැර ගෙන යති. ඉඩකඩම් දේපල වැනි දේ නඩුහබ කියමින් තවත් අය අල්ලා ගැනීමට කටයුතු කරති. මේ ආදී දුකින් මිදීමට නම් කාමයෝ හළ යුත්තාහු ම ය. කාමයන් තිබෙන තාක් කල් දුක ය. අත්හළ විට සුව ය.

මෙසේම කාමයෝ තණ හුලක් වැන්නාහ. (**තිණුක්කූපමා කාමා**). තණ හුලක්, පොල් කොළ හුලක් වැන්නක් රැගෙන රාත්‍රියේ යන්නා එය නිරන්තරයෙන් දැවි දැවී නිමා වෙන නිසා එය හළ යුතු ය. නො හළේ නම් ඔහු ඒ ගින්නෙන් දැවේ. මෙසේම කාමයන් නො හරින තැනැත්තා ජාති, ජරා ආදී එකොළොස් ගින්නෙන් දැවේ. දැවි දැවී නැවත නැවතත් අපා ගිනි ආදී ගිනි මැදට ම පතිත වේ.

කාමයන් නො හළ විට ගින්නේ ය. හළ විට සිසිලේ ය.

මෙසේම කාමයෝ ගිනි අඟුරු වලක් වැන්නාහ. හාත්පසින් ගිනිගෙන දිලෙන ගැඹුරු වූ මහත් ගිනි වලක් සමීපයට ළංවීමට පවා නො හැකි ය. ඉන් විශාල දැවිල්ලක් ඇතිවේ. එම වලට වැටුනොත් ගොඩ ඒමට නො හැකිව එහිම කරවී කරවී දැවෙයි. කාමයන්ද ලංකර ගෙන සිටින්නා දවනු ලබන්නේ ය. කාමයන් අයත් කරගෙන සිටින තැනැත්තා ගිනිවලට වැටුනාක් සේ දැවෙන්නේ ය. වස්තුව ඇති තැනැත්තාට තමාගේ වස්තුව පැහැර ගැනීමට සොර සතුරන් එයි ද-ඉන් තමාගේ වස්තුව නැති වෙයි ද කියා නිරන්තරයෙන් ඇවිලගත් ගින්නක් ඇති වේ. දූවරුන් ඇති දෙමාපියන්ට ද තමාගේ දුවට අතවරයක් වේ දැයි කියා ගින්නක් ඇති වේ. රූමත් අඹුවක හිමි ස්වාමි පුරුෂයාට ද ඇය සමඟ වෙනත් අයකු සම්බන්ධකම් පවත්වාවි යැයි ගින්නක් ඇති වේ. මෙවැනි ගිනි නිසා ඔවුන්ට හරියාකාරව නින්ද යන්නේ ද නැත. මෙසේ දවන තවන ආකාරයක් ළඟාකර දෙන කාමයෝ ගිනි අඟුරු වලක් වැන්නාහ. (**අඞ්ගාරකාසූපමා කාමා**).

මෙසේම කාමයෝ, සිහිනයෝ ය. නින්දේදී දකින විසිතුරු සිහින අවදි වූ විට නැත. මනෝමය රූප දර්ශනයක් විනා ඉන් ලැබෙන කිසිවක් නැත. මෙසේම මෙතෙක් සංසාරයේ අප සතුව තිබූ කාමයෝ සිහින වැන්නාහ. ඒ කිසිවක් අද නැත. දැන් වසරකට දෙකකට ඉහතදී විදි කාමාශ්වාදයක් ඇත්නම් අද එය සිහිනයක් මෙන් ය. මෙසේම ඊයේ විඳි කාම සුඛය ද අද නැත. ඊයේ තබා මේ මොහොතේ විඳින කාම සැපයක් ඇත්නම් එය ඒ මොහොතේ ම නැතිවී යන්නේ ය. ඊළඟ මොහොත වන විට එය සිහිනයක් වැනි ය. කොතෙක් කාම වස්තූන් අත්පත් කරගෙන සිටියත් සියල්ල අත්හැර දමා යා යුතු දිනයක් එන්නේ ය. එදාට මහත් ආදරයෙන් සිතාගෙන සිටිනා අඹුවකවත්, සැමියකුවත්, මවකුවත්, පියකුවත්, සොයුරු සොයුරියකවත්, හිතමිතුරකුවත් මොනම වස්තුවක්වත් නැත. ඒ කිසිවෙක් හෝ කිසිවක් තමාගේ පිහිටට නො එන්නේ ය. එදාට ඥාති මිත්‍ර අම්බලම වස්තුව සමඟම නැතිවී යන්නේ ය. ඊට පසුව ගොඩනැගෙන අළුත් ඥාති අම්බලමට සිදුවන්නේ ද මෙයම ය. මෙම නිසා සැබවින් ම කාමයෝ සිහිනයෝ ය. (**සුපිනකූපමා කාමා**).

මෙසේම කාමයෝ අනුන් ගෙන් ආපසු දීමේ පොරොන්දුව පිට ඉල්ලා ගත් දෙයක් වැනියහ. (**යාචිතකූපමා කාමා**). එසේ ඉල්ලා ගත් දේ ආපසු දිය යුතු ය. එබැවින් ඒ තාවකාලික හිමිකමක් පමණි. කාමයන් ද ලබා දෙන්නේ තාවකාලික හිමිකමක් පමණි. ඒ හිමිකම වහා නැතිවී යන්නේ ය. ජරාජීර්ණයට පත් වීමෙන් හෝ, විනාශ වීමෙන් හෝ, අන් අයකු අයත් කර ගැනීමෙන් හෝ, වෙනත් කවර ආකාරයකින් හෝ කාමයෝ නැති වන්නාහ. ඉතා කෙටි කාලයක හිමිකමක් ඇති කාමයන් නිසා, බුද්ධාන්තර ගණන්, කල්ප ගණන් අති දීර්ඝ කාලයක් බොහෝ දුක් විඳීමට යාම අනුවණකමකි. නැතිවීම ස්වභාව කොට ඇති කාමයන් නැතිවීම ගැන කවර පරිදේවයක් ද ? කාමයන් නැතිවීම ම සැනසීමකි, සුවයකි, මහත් අස්වැසිල්ලකි. කිව නොහැකි නිදහසකි.

මෙසේම කාමයෝ ගසෙක ගෙඩි වැනියහ. ගසෙක සැමදාම ගෙඩි ඇත්තේ නැත. තිබෙන ගෙඩි ද සැමදා පවතින්නේ නැත. කාමයන්ගේ ද මෙම ස්වභාවය ඇත. ගෙඩි ඇති ගසට නැඟි මිනිසකු ඒවා කමින් සිටින විට, ගස මුලින් කපන්නේ නම් ඔහු ඉන් වහා බිමට බට යුතු ය. නො එසේ නම් මරණය හෝ මරණය තරම් දුකක් ඇති වන්නේ ය. මෙසේ ම කාමයන් අයත් කරගෙන සිටින්නා වෙත සොර සතුරු පැමිණිය හොත් වහා එය අත්හළ යුතු ය. නො එසේ නම් මහත් දුක් ලැබෙන්නේ ය. සමහර විට මරණය පවා සිදුවන්නේ ය. එබැවින් කාමයෝ ගසක ගෙඩි වැන්නාහ. (**රුක්ඛඵලූපමා කාමා**).

මෙසේම කාමයෝ මස් කපන කොටයක් සහ කඩුවක් වැනියෝ ය. මස් කපන කොටයේ තැබූ මස් වැදැල්ල කඩුවෙන් කැපී කැපී යන්නේ ය. එමෙන්ම කාමයන් නිසා සියළු ගුණධර්ම කැපි කැපී විනාශ මුඛයට පත් වෙයි. කාමය ඉස්මතු වූ විට ශීලය කැපී යන්නේ ය. කාමය නැඟී සිටි විට සමාධිය විනාශ වන්නේ ය. කාමය රජකම් කරන විට ප්‍රඥාව දාසත්වයට පත්වන්නේ ය. සියළු ආචාර ධර්ම කාමය නිසා පිරිහෙයි. අහසින් පවා යා හැකි ඍද්ධීන් කාමය නැඟී සිටි විට කඩා හැලෙන්නේ ය. කාමය නිසාම පැවිද්දෝ ගිහි බවට පත් වෙති. සමථ විපස්සනා භාවනා කරන්නෝ එය අත් හරිති. ත්‍රිවිධ සුචරිතයෙන් යුක්ත වූවෝ කාය දුච්චරිත වාග් දුච්චරිත

මනෝ දුච්චරිත කරන්නන් බවට පත් වෙති. ලජ්ජා බිය සම්පන්න අය හිරි ඔතප් නැති කර ගනිති. බලවත්කම්, සිල්වත්කම්, ගුණවත්කම්, අධිපතිකම්, නැණවත්කම්, පණ්ඩිතකම් ආදී සියල්ල ම කාමය විසින් පාගා මැඩලනු ලබන්නේ ය. කාමය නැගී සිටි විට මෙම සියල්ල හමාර ය. එවිට සත්වයා කාමයේ දාසයකු භාවයට පත් වේ. කාමය අධිපතිකම් කරන විට සත්වයාට නො කළ හැකි දෙයක් නැත. ඕනෑම නින්දිත වැඩක්, ඕනෑම පහත් වැඩක්, ඕනෑම තිරිසන් වැඩක්, ඕනෑම අකුශලයක් එවිට සත්වයාට කළ හැකි ය. මෙම නිසා කාමයෝ මස් කපන කොටයක් හා කඩුවකක් වැන්නෝ ය. (**අසිසූනූපමා කාමා**).

මෙසේම කාමයෝ කඩුවක් වැනි ආයුධයක ඇති අති තියුණු උලක් වැනියහ. කාම උලෙන් හදවත හිල්වී ගිය විට සත්වයාට විඳීමට සිදුවන දුක වෙහෙස පීඩාව බිය සැක අප්‍රමාණ ය. එහෙත් පුදුමය මෙවන් දුකක් පෙන්වනු ලබන්නේ මිහිරි සුඛයක් හැටියට ය. එය කාමයේ ඇති සාත ස්වභාවය විසින් මතු කරවනු ලබන අවිද්‍යාව ය. ඉන් ජනිත වන්නේ සුබ සඤ්ඤා විපල්ලාසය යි. එම මායාකාරී ස්වභාවය නිසා කය හා සිත දැවෙන සන්තාපයෙන් දැවෙමින්, ඉන් පෙළෙමින්, නින්ද පවා නො ලැබ රෝගාතුරු වෙමින්, සමහර විට සිය දිවි පවා නසා ගනිමින්, රත් වූ යකඩයක ඇලි ඇලී පිච්චෙන අමු මස් කැල්ලක් සේ, කාමයෙන් පිච්චි පිච්චී එහි ම ඇලෙන්නේ ය. ඇලි ඇලී පිච්චෙන්නේ ය. කාම උලේ ස්වභාවය එයයි. එම නිසා කාමයෝ ආයුධ උලක් වැනියහ. (**සත්තිසූලූපමා කාමා**).

මෙසේම කාමයෝ සර්ප හිසක් බඳු වන්නාහ. දැනුම් ඇති අයකු සර්ප හිසෙහි ගැටෙන්නේ නැත. කිසිවක් නො තේරෙන ළදරුවකු නම් සර්ප හිසක් ඇල්ලීමට යනු ඇත. සර්ප හිසෙහි ගැටීමෙන් ඇති වන්නේ මරණය හෝ මරණය හා සමාන දුකක් පමණි. කාමයෙහි ගැටීමෙන් ඇති වන්නේ අනමතග්ග සංසාර දුක්ඛය ම ය. බාලයාම එහි ගැටේ. නැණවතා එයට බිය වේ. බිය යුතු බැවින්, නො ගැටිය යුතු බැවින්, ළං නො විය යුතු බැවින්, අපේක්ෂා නො කළ යුතු බැවින්, නො ඇලිය යුතු බැවින් කාමයෝ සර්ප හිසක් වැනියහ. (**සප්පසීරූපමා කාමා**).

මෙසේම කාමයෝ මහත් වූ ගිනි කඳක් වැන්නෝ ය. ගිනි කඳට අසු

වූ සියල්ල දැවී හළු වේ. කාම ගින්නට අසු වූවෝ ද දැවෙති. හළු වෙති. කාය පරිළාහයෙන් ද චිත්ත පරිළාහයෙන් ද දැවෙමින්, ගුණ ධර්ම හළු කර ගනිති. ඉන් අපා ගිනි මැද ද අනන්ත අප්‍රමාණ කාලයක් දැවෙමින් දුක් විඳිති. ගිනිගෙන දැවෙන සංස්කාර ලෝකය තුළම ඉපැදෙති - දුක් විඳිති - මැරෙති - නැවත එහිම ඉපැදෙති. එබැවින් කාමයෝ ගිනි කඳක් හා සමානයහ. (**අග්ගික්ඛන්ධූපමා කාමා**).

කාමය වනාහි හිස මත පැටවී ඇති මහා බරකි. ගිනි ජාලාවකි. අසහනයකි. පීඩනයකි. මහා උගුලකි. සතුරු සේනාවකි. මඩ ගොහොරකි. මංමුලාවකි. පිස්සුවකි. තිරිසන් භාවයකි. ගුණ දහම් පැහැර ගන්නා සොරෙකි. පළිබෝධයකි. සංයෝගත්වයකි. ආයූහනයකි.[1] මුට්ඨස්සතියකි. ගොන් කමකි. අවුල් ජාලාවකි. අකුශල් දැලකි. සැඩපහරකි. සන්තාපයකි. පරිළාහයකි. යක්ෂ සේනාවකි. හීනත්වයකි. ග්‍රාම්‍යත්වයකි. අනර්ථයකි. පාපකාර තොණ්ඩුවකි. පහත් බවකි. ලාමක භාවයකි. අසරණ භාවයකි. සම්බාධකයකි. ප්‍රපාතයකි. පිපාසයකි. බන්ධනයකි. අදාන්ත භාවයකි. අපහසුවකි. විපරිත ජාලාවකි. විකෘතියකි. බියකි. නිරර්ථක භාවයකි. ලෙඩකි. අනතුරකි. අමතක වීමකි. අතපසු වීමකි. විනාශයකි. අකුසල සංස්කාර ජටාවකි. මාර බන්ධනයකි. පාරාජිත භාවයකි. නො සන්සුන් භාවයකි. දාසත්වයකි. දැගලිල්ලකි. හානියකි. සංසාරික අදන් මගකි. සඤ්ඤා විපල්ලාසයකි. මිච්ඡා සංකල්පයකි. ගොදුරකි. ඉන්ද්‍රිය අසංවර භාවයකි. මාරාවේශයකි. මාර පිරිසකි. අන්ධකාරයකි. විෂ මිශ්‍ර කැවුමකි. අතෘප්තිකර භාවයකි. සංයෝජනයකි. කෙළසීමකි. නාම රූප මාත්‍රයකි. ඇති වී නැති වෙන්නකි. ධාතුමාත්‍රික ඡන්දයකි. අනාත්මික සිතුවිල්ලකි. මාරයා දැමූ ඇමකි. සසරෙහි රඳවන්නකි. දුකෙහි ගිල්වන්නෙකි. ශූන්‍යත්වයකි.

මේ ආදී අනන්ත අප්‍රමාණ අයුරින් කාමාදීනව දුටු ඒ බෝසතාණෝ දුක්ඛ සත්‍යය ද, දුක්ඛ සමුදය සත්‍යය ද අවබෝධ කරමින්, තදනුරූපික[2] චතුසත්‍යාවබෝධයෙන් පච්චේක බුද්ධත්වය ලබා, සියළු බන්ධන කැඩී ගියේ, නිවහල් නිදහස් සෙවෙරී, නිර්භය ඒකචාරී විහරණයන්ගෙන් සමන්නාගතව වැඩ සිටිසේක. (ගාථා 26 සිට බලන්න).

1. කර්ම රැස්වීමකි. උප ග්‍රන්ථය ද බලන්න.
2. එයට ම අනුකූල, අනුරූප වූ

## ගාථා අංක 18

**සීතංච උණ්හංච ඛුදං පිපාසං**
**වාතාතපේඩංස සිරිංසපේච**
**සබ්බානි පේතානි අභිසම්භවිත්වා**
**ඒකො චරෙ ඛග්ග විසාණ කප්පෝ**

සීතාලුක බ්‍රහ්මදත්ත රජ පැවිදි වී, සීතල උෂ්ණාදිය ඉසිලිය නො හැකිව ගිහි වීමට සිතයි. නැවත සිතට අවවාද කරගෙන මහණදම් පුරයි. මෙසේ තෙවරක් ම ගිහි වීමට සිතා තමාට තමා ම අවවාද කරගෙන පසුව පසේබුද්ධත්වයට පත් වේ. ඉන්පසු පළ කළ ප්‍රීති වාක්‍යයයි මේ.

**සීතල - උෂ්ණය - සාගින්න - පිපාසාව - වාතය - ඉරු රැස් - මැසි මදුරුවන් - සර්පයන් යනාදී තෙල සියල්ල ම මැඩ, ඛගවෙණ අඟක් සේ එකලාව ම වෙසේ යන්න** මෙම ගාථාවේ සාමාන්‍ය අදහස ය.

වනගතව භාවනානුයෝගීව වසන්නන්ට මෙවැනි උවදුරු පැමිණීම ස්වභාවික ය. එම උවදුරු නුවණින් සිතා මර්ධනය නො කොට, ඒවා ගැන නුනුවණින් මෙනෙහි කිරීම නිසා නූපන් ආශ්‍රවයෝ ද උපදිත්, උපන් ආශ්‍රවයෝ ද වර්ධනය වෙත්.

මෙනෙහි කළ යුතු කරුණු හා මෙනෙහි නො කළ යුතු කරුණු නො දන්නා යෝගාවචරයා මෙනෙහි නො කළ යුතු අමනසිකරණීය ධර්ම මෙනෙහි කරයි. මනසිකරණීය ධර්ම මෙනෙහි නො කරයි. යම් ධර්මයක් මෙනෙහි කිරීමෙන් නූපන් කාම ව්‍යාපාද ආදී අකුශලයන් පහළ වෙත් ද, උපන් අකුශල ධර්මයෝ වැඩෙත් ද එවැනි කරුණු මෙනෙහි නො කළ යුතු ය. මෙය නො දන්නා යෝගාවචරයා මැසි මදුරු ශීතල උෂ්ණය ආදී යථෝක්ත උවදුරු පැමිණි කල්හි, ඒ හා සිත වික්ෂිප්ත භාවයට පත් කරවා ගනියි. සිත ඒ හා ගැටීමට සළස්වයි. එයින් අරතිය, දෝමනස්ස වැනි නීවරණයෝ පහළ වෙත්. මෙවැනි උවදුරු නො මැති ස්ථාන අපේක්ෂා කරයි. එම උවදුරු පීඩා නැති වාතාවරණයක් කැමැති වෙයි. මෙයින් කාමච්ඡන්ද නීවරණය මතු වෙයි. "මට මෙවැනි උවදුරු පීඩා විඳින්නට සිදුවී තිබේ, අනේ මා මෙයින් විඳින දුකක්" ආදී වශයෙන්

සිතන විට දිට්ඨි අකුශලය පැන නගී. මේ සෑම අවස්ථාවකදී ම අවිද්‍යාව මූලික වෙයි. මෙසේ අයෝනිසෝ මනසිකාර අන්දමට සිත පැවැත්වීමෙන් නීවරණ ආශ්‍රව ආදී අනේකවිධ ක්ලේශයෝ පහළ වෙත්. එයින් ස්වකීය අර්ථ සිද්ධිය පිරිහෙළයි. උපන්නා වූ යම් දියුණුවක් වී නම් එයද පිරිහීමට පත් වෙයි.

මෙනෙහි කළ යුතු ධර්ම දන්නා, යෝනිසෝමනසිකාරයෙන් යුතුව ඒ ධර්ම මෙනෙහි කරන්නාට මෙවන් තත්ත්වයක් උදා නො වෙයි. ඔහු ඒ ආදී උවදුරු ද භාවනාරම්මණයක් කර ගනී. මේ දුක්ඛ සත්‍යය ය, මේ දුක්ඛ සමුදය සත්‍යය ය, මේ දුක්ඛ නිරෝධ සත්‍යය ය, මේ දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යය යැයි යන කරුණු මෙනෙහි කළ යුතු බව ඔහු අවබෝධ කර ගනී.

මෙසේම ඔහු මෙසේ දැන ගනී, උවදුරු ඇති වී නැතිවෙන බැවින් ඒකාන්තයෙන් ම අනිත්‍යය ය. ඒ උවදුරු වලින් උපදින දුක්ඛ වේදනාව ද අනිත්‍යය ය. ඒ දුක්ඛ වේදනාව හේතුන්ගේ සංයෝගය නිසා ඉබේ ඇති වේ. ඒවා උපදවන්නකු නැත. ඒ දුක්ඛ වේදනාවත්, එහි හා සම්ප්‍රයුක්ත වූ විඤ්ඤාණයත්, තදනුරූපික[1] සඤ්ඤා හා සංස්කාරත්, ඒ නාම ධර්මයන් ඉපැදවීමට ප්‍රතිෂ්ඨාව[2] වූ චිත්තජ රූපත්, ඍතුජ රූපත්, ආහාරජ රූපත්, කර්මජ රූපත් යන නාම රූප ධර්මයෝ හේතුන් නිසා ම පහළ වෙත්, හේතු නිරෝධයෙන් නිරුද්ධ වෙත්, පටිච්චසමුප්පන්නික[3] නාම රූප ධර්මයන්ගේ ඇතිවීම නැතිවීම දෙක හැර එය විඳින්නෙක් නැත. එහි ලා අධිපතියෙක් නැත. එය තමා වශයෙහි නො පවත්වනා බැවින් හා තමාගේ අකැමැත්ත තිබුණ ද ඒවා පහළවන බැවින් එහිලා ඉසුරු බවක් නැත. මේ නාම රූප ධර්මයෝ අනිත්‍යයහ, දුක්ඛයහ, අනාත්මයහ, ඒ උවදුරුවලින් ජනිත වූ වේදනාව නිසා තණ්හාව උපදී. ඉන් උපාදානය ද එම නිසා කර්ම භව ද, එයින් නැවත උපදින ජාතිය ද පහළ වේ. ඒ වේදනාව ඵස්සය නිසා ඇති විය. ඵස්සය සළායතන නිසා ඇති විය. සළායතන ඇති වූයේ නාම රූප නිසා ය. නාම රූප පටිසන්ධි විඤ්ඤාණය නිසා ඇති වේ. ඒ විඤ්ඤාණය

1. ඊට අනුරූප වූ
2. ආධාරක ස්ථානය වූ
3. හේතුවෙන් හටගත්

සංස්කාර නිසා පහළ වේ. සංස්කාර අවිද්‍යාව නිසා ඇති වේ. අවිද්‍යාව ආශ්‍රව නිසා ඇති වේ. ආශ්‍රව අවිජ්ජාව නිසා පහළ වේ.

මෙසේ චතුරාර්ය සත්‍යයය දකිමින් ත්‍රිලක්ෂණාවබෝධයෙන් සතර මාර්ග, සතර ඵලයන් අධිගමනය කළ ඒ බෝසතාණෝ පසේබුද්ධත්වයට පත්ව ඛගවෙණ අඟක් සේ ඒකචාරීව වැඩ වෙසෙති. (ගාථා 8 ද බලන්න).

## ගාථා අංක 19

**නාගෝව යූථානි විවජ්ජයිත්වා**
**සඤ්ජාත ඛන්ධො පදුමී උළාරෝ**
**යථාභිරන්තං විහරං අරඤ්ඤේ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

පෙර බරණැස් රජ කෙනෙක් අවුරුදු 20 ක් රජකම් කොට නිරයේ ඉපැද, ඉන්පසුව ඇතකු වේ. මේ ඇතාට තමාගේ පෙර ජාතීන් දැන ගැනීමට හැකි වේ. මේ නිසා කළකිරී ඇත් රැළෙන් වෙන්ව එකලාව හැසිරේ. බ්‍රහ්මදත්ත රජ මේ ඇතා දැක තොරතුරු දැන ගනී. ඉන් රාජ්‍යය ගැන කළකිරේ. පැවිදි වී පසේබුද්ධත්වයට පත් වේ. ඉන්පසු ගැයුණු උදාන ගාථාවයි මේ.

මෙම ගාථාවේ කෙටි අදහස මෙසේ ය.
**පදුම කුලයේ උපන්, මැනවින් වැඩුණු කඳක් ඇති, උළාර වූ, ඇත්රජ, තරුණ ඇත් රැළ අතහැර, කැමැති සේ වනයේ හැසිරේ. එමෙන් ඛගවේණ අඟක් සේ එකලාව හැසිරෙමි.**

මෙම ගාථාවේ 'නාගෝ' යන්නෙන් දැක්වෙන්නේ ඇත් රජ යන්න ය. පසේබුදුපියාණන් ද 'නාග' නම් වේ.

**1. ආගුං න කරෝතීති නාගෝ**

**2. න ගච්ඡතීති නාගෝ**

**3. ආගච්ඡතීති නාගො** යන අර්ථ වලින් පසේබුදුපියාණන් වහන්සේ නාග නම් වන සේක.

ආගුං න කරොතීති නාගෝ යන්නෙන් දැක්වෙන්නේ සංකිලේසිත[1] වූ, දරථ සහිත වූ[2], දුක්ඛ විපාක ජනිත කරවා ලන්නාවූ, ජාති ජරා මරණ පුනර්භවය නැවත ඇති කර ලන්නාවූ අකුශල නො කරන බව ය. 'ආගු' යනු අකුශල ධර්මයන්ට කියන නමකි.

න ගච්ඡතීති නාගෝ යන්නෙන් දැක්වෙන්නේ ඡන්ද දෝස - මෝහ - භය අගති වලින් අගතිගාමී නො වන බව, රාග වශයෙන් නො යන බව, දෝස - මෝහ - මාන - දිට්ඨි - විචිකිච්ඡා - උද්ධච්ච වශයෙන් නො යන බව යන කරුණු ය.

න ආගච්ඡතීති නාගෝ යනුවෙන් දැක්වෙන්නේ සතර මාර්ග ඥාණයන් ගෙන් නැසූ කෙලෙසුන් නැවත නූපදවමින් ගමන් ගත් බව ය.

ඒ ඇත් රජ මැනවින් වැඩුණු සිරුරකින් යුතු වූවාක් මෙන්ම, පසේබුදුපියාණෝ ද මැනවින් වැඩුණු සීලක්ඛන්ධයෙන් - සමාධික්ඛන්ධයෙන් - පඤ්ඤාක්ඛන්ධයෙන් - විමුත්තික්ඛන්ධයෙන් හා විමුත්ති ඥාණ දස්සනක්ඛන්ධයෙන් සමන්නාගත වූහ.

ඒ ඇත් රජ පද්ම කුල ජාත වූවා සේ, පසේබුදුපියාණෝ ද බොජ්ඣංග පුෂ්පයෙහි ජනිත වූහ. සති - ධම්මවිචය - විරිය - පීති - පස්සද්ධි - සමාධි - උපේක්ඛා යන බොජ්ඣංග පුෂ්පයන්හි ජනිත වූහ.

ඒ ඇත් රජ සෙසු ඇත් රැළ හැර දමා වනයේ වසන්නා සේ, පසේබුදුපියාණෝ ද ගණයා කෙරෙන් වෙන්ව එකලාව ම වැඩ වෙසෙති.

ඒ ඇත් රජ සිත් සේ හැසිරෙන්නා සේ, පසේබුදුපියාණෝ ද පළමු

1. කිළිටි සහිත, කෙලෙස් වලින් හරිත.
2. පීඩාකාරී, රළු, තද බවක් ගෙන දෙන

ධ්‍යානයෙන් යුතුව සිත් සේ වෙසෙති. දෙවන - තෙවන - සිවුවන - ධ්‍යාන වලින් යුතුව, ආකාසානඤ්චායතන - විඤ්ඤාණඤ්චායතන- ආකිඤ්චඤ්ඤායතන - නේවසඤ්ඤානාසඤ්ඤායතන යන අරූප ධ්‍යානයන්ගෙන් යුතුව, නිරෝධ සමාපත්තියෙන් යුතුව, මෙත්තා චෙතෝ විමුත්තියෙන් යුතුව, කරුණා මුදිතා උපේක්ඛා චේතෝ විමුත්තීන් ගෙන් යුතුව, අරහත්ත ඵල සමාපත්තියෙන් යුතුව සිත් සේ වෙසෙති.

මෙසේ ඒ පසේබුදුපියාණෝ, එකලා වූ ඇත් රජ සේම, ඛගවේණ අඟක් සේ එකලාව ම වැඩ වෙසෙති.

## ගාථා අංක 20

**අට්ඨාන තං සඞ්ගණිකාරතස්ස**
**යං ඵස්සයේ සාමයිකං විමුත්තිං**
**ආදිච්චබන්ධුස්ස වචෝ නිසම්ම**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බරණැස් රජුගේ පුත් කුමරා දෙමාපිය විරුද්ධ මැද පැවිදි වේ. උයනේ ම වසයි. දිනකට කිහිප වතාවක් දෙමාපියෝ එහි යෙති. ආදිච්චබන්ධු නම් වූ පසේබුදුරදහු මොහුට අනුග්‍රහය පිණිස උයනට වැඩ පැවිදි වූ කෙනකු තුළ සංසර්ග නො මැති බව දේශනා කොට අහසින් වඩිති. මෙය අසා එකලා වූ හේ පසේබුද්ත්වයට පත්ව ගැයූ උදානය මෙයයි.

මෙහි සාමාන්‍ය අදහස මෙසේ ය. ගණයා සමඟ සංසර්ග ඇතිව **වෙසෙන්නාට, ලෞකික සමාධියක් ලැබේවි යැයි යන්න නො සිදුවිය හැකිය යනුවෙන්, ආදිච්චබන්ධු නම් පසේ බුදුපියාණන් කළ දේශනය අසා (ඉන් වෙන්වැ) ඛගවේණ අඟක් සේ එකලාව ම හැසිරේ.**

ලෞකික ධ්‍යානයන් උපදවා ගැනීමට හුදෙකලා භාවය

පවිවේක භාවය[1] අත්‍යවශ්‍යය ය. ගණයා සමඟ විසීමෙන් නො ලැබූ ධ්‍යානයන් උපදවාලිය නො හැක, ඉපැද වූ ධ්‍යානයන් ගෙන් පවා පිරිහීමට ඉඩ ඇත. ලෞකික ධ්‍යානයන් පමණක් නොව, ලෝකෝත්තර මාර්ගඵලාවබෝධයන්ට ද සඞ්ගණිකාරාමය අතිශයින් හානිකර ය.

එබැවින් එකලාව පවිවේකත්වය ලැබූ ඒ බෝසතාණෝ ලෞකික ධ්‍යානයන්, ශීලයක පිහිටා සිටිමින් අධිගත කළහ. සමාධිමත් මනසක් තුළින් ම යථාභූත ඤාණ දස්සනය පහළ වේ. දුක්ඛාදි චතුරාර්ය සත්‍යයන් පටිවේධ කළ හැක්කේ ද සමාධිමත් මනසක් තුළිනි. මෙසේ ශීල සමාධි පරිපූර්ණත්වයෙන්, පඤ්ඤා පරිපූර්ණත්වය ලැබූ උන්වහන්සේ පසේබුද්ධත්වයට පත්ව, කාය - චිත්ත - උපධි - විවේක සඞ්ඛ්‍යාත පවිවේක සුඛයෙන් ද, කිලේසූපසම[2] සඞ්ඛ්‍යාත උපසම සුඛයෙන් ද, ඵල සමාපත්ති සඞ්ඛ්‍යාත සම්බෝධි සුඛයෙන් ද සමන්නාගතව ඛගවේණ අඟක් සේ ම එකලාව වැඩ වෙසෙති.

## ගාථා අංක 21

**දිට්ඨී විසූකානි උපාතිවත්තෝ**
**පත්තෝ නියාමං පටිලද්ධ මග්ගෝ**
**උප්පන්න ඤාණෝම්හි අනඤ්ඤනෙය්‍යෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බරණැස රජ කෙනකු ශීතලයට විරුද්ධ උෂ්ණය ඇතිවාක් මෙන්, වට්ටයට[3] විරුද්ධ විවට්ටයක් තිබිය යුතු යැයි සිතා ඒ ගැන අමාත්‍යයන් ගෙන් විමසූ කල, ඔවුහු ශාස්වත ආදී ඔවුනොවුන්ගේ දෘෂ්ටි පළ කළහ. රජු මොවුන් දිට්ඨිගතින වී ඇතැයි සිතා පැවිදිව පසුව පසේබුදු වේ. ඊට පසු ගැයූ උදාන ගාථාවයි මේ.

**පරෝපදේශ රහිතව උපන් ඤාණයන් ගෙන් සෝතාපත්ති ආදී**

---

1. විවේකී බව    2. කිලේස සංසිඳීම    3. සසර ඉපැද ඉපැද යාමට

**මාර්ග ප්‍රතිවේධ කොට සියළු දෘෂ්ටීන් ඉක්මවා බගවේණ අඟක් සේ එකලාව හැසිරේ යන්න** මේ ගාථාවේ සාමාන්‍ය අදහස ය.

(පරෝපදේශ රහිතව උපන් ඤාණයන් පිළිබඳව විස්තරයක් ගාථා අංක 1 හි දක්වා ඇත).

මෙම ගාථාවේ දිට්ඨි ගහණයන් වශයෙන් දැක්වෙන්නේ විසි ආකාර සක්කාය දිට්ඨිය. දසාකාර මිච්ඡාදිට්ඨි - දසාකාර අන්තග්ගාහික දිට්ඨි හා දෙසැට මිච්ඡාදිට්ඨීන් ය.

අශ්‍රැතවත් පෘථජ්ජනයා රූපය ආත්මය වශයෙන් ගනී. වේදනාව ආත්මය වශයෙන් ගනී. සඤ්ඤාව ආත්මය වශයෙන් ගනී. සංඛාර ආත්මය වශයෙන් ගනී. විඤ්ඤාණය ආත්මය වශයෙන් ගනී. මේ එකිනෙකක් වෙන් වෙන් වශයෙන් හෝ මේ පසම එක්කොට හෝ 'මම ය' 'මගේ ය' 'මාගේ ආත්මය ය' යනාදී වශයෙන් වරදවා උපාදාන කරයි.

එහෙත් මේ පඤ්චස්කන්ධය පඨවි-ආපෝ-තේජෝ-වායෝ-ආකාස-විඤ්ඤාණ යන ධාතු මාත්‍රයක් පමණි. හේතූන්ගේ සංයෝගයෙන් ම පෙර නො තිබී පහළ වෙයි. හේතු නිරෝධයෙන් සම්පූර්ණ නිරෝධයට පත් වේ. සෑම ක්‍ෂණයක් පාසාම මේ ධාතූහු ඇතිවෙමින් නැතිවෙත්. මේ ක්‍ෂණයේ තිබූ සියළු නාම රූපයෝ ඊළඟ ක්‍ෂණය වන විට සියල්ල ම නිරුද්ධ වෙති. ඊළඟ ක්‍ෂණයේ ඇත්තේ අළුතින් පහළ වූ නාම රූපයෝ ය. මෙසේ ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා මේ නාම රූපයෝ කිසිවක් ඉතිරි නොවී නිරෝධයට පත් වන බැවින් පංචස්කන්ධය ආත්මය වශයෙන් ගන්නාට ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා තමාගේ ආත්මය ද නිරුද්ධ වන බව පෙනේ. 'ආත්මය' එසේ සෑම මොහොතක ම වෙනස් වන්නක් නොව ස්ථිර එකක් විය යුතු ය. 'ආත්මය' යන්නෙහි තේරුම ද එය ය. එවැනි ස්ථිර භාවයක් මෙම පංචස්කන්ධයේ නො මැති බැවින් මෙහි ආත්මයක් ඇතැයි ගැනීම මුලාවකි. මෙසේ සෑම මොහොතක ම වෙනස්වන 'ආත්මය' නොහොත් 'මමයා', සෑම ක්‍ෂණයකදී ම නිරෝධයට පත් වන්නේ නම් මම කියා කවර නම් දෙයක් අභිනිවේශ[1] කළ හැකි ද

1. සිතින් තදින් අල්ලා ගෙන එහි ම ඇලෙමින් තුටුවීම

? මේ ක්ෂණයේ ඇති රූපයෝ ඊළඟ ක්ෂණය වනවිට සම්පූර්ණ නිරෝධයට පත් වෙති. මේ ක්ෂණයේ ඇති නාමයෝ ද ඊළඟ ක්ෂණයේ නිරෝධයට පත් වෙති. එබැවින් මේ ක්ෂණයේ සිටි "මමයා", ඊළඟ ක්ෂණයේදී නැත. එහි ඇත්තේ අළුත් නාම රූප ගොඩක් හෙවත් 'අළුත් මමෙකි.' ඊළඟ ක්ෂණයේදී ද, ඉදිරි සෑම ක්ෂණයකදී ද සිදුවන්නේ මෙයමය. පසුගිය ක්ෂණවලදී සිදුවූයේ ද මෙයම ය. මෙසේ හේතු සංයෝගයට අනුකූල වන පරිදි නිරන්තරයෙන් වෙනස් වන නාම රූප පරම්පරාවක් මිස, මේ පංචස්කන්ධය තුළ 'ආත්මයක්' හෙවත් 'මම' කියා කෙනෙක් නැත. එසේ මම මගේ ආත්මය වශයෙන් යමෙක් ගනු ලබයි නම් අවිද්‍යාව හැර එය අන් කවරක් ද ?

මෙසේ පංචස්කන්ධය ශූන්‍ය වශයෙන් දකිමින්, චතුසච්චාවබෝධයෙන් ද, පරෝපදේශ රහිතව පච්චේක බෝධි ඥාණ ප්‍රතිලාභයෙන් ද පසේබුද්ධත්වයට පත් උන්වහන්සේ සියළු දිට්ඨි ගහණයන් ඉක්මවා, ඛග්ගවිෂාණ අඟක් සේ එකචාරීව වැඩ වෙසෙති.

## ගාථා අංක 22

**නිල්ලෝලුපෝ නික්කුහෝ නිප්පිපාසෝ**
**නිම්මක්ඛෝ නිද්ධන්ත කසාව මෝහෝ**
**නිරාසයෝ සබ්බ ලෝකේ භවිත්වා**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බරණැස් රජ කෙනෙක්, අරක්කැමියා ඉතා රසට ආහාර පිළයෙළ කළ නමුත්, මේ රජු ආහාරයට හරි ලොල් යැයි කියනු ඇතැයි යන බියෙන් ඒ ආහාර වර්ණනා නො කරයි. මේ නිසා අරක්කැමියා රස ගුණ අඩු කරයි. රජු එවිට ද කිසිවක් නො කියයි. අරක්කැමියා ක්‍රමයෙන් තව තවත් රස ගුණ අඩු කොට ආහාර පිළියෙල කිරීම ගැන රජු කළකිරේ. පැවිදි වේ. පසේ බුද්ධත්වයට පත් වේ. මේ උදානය ඊට පසුව පළ කරති.

තණ්හාව-කුහකකම-කාම පිපාසය-මකුකම නැතිව, ප්‍රහීණ කළ රාගාදී කසට ඇති ව, (එබැවින්) ආශා නැත්තේ, සියළු ලෝකයන් අභිභවනය කොට ඛඟවේණ අඟක් සේ එකචාරීව වෙසේ යන්න මේ ගාථාවේ සාමාන්‍ය තේරුම ය.

මෙහි නිල්ලෝලුපෝ, නිප්පිපාසෝ, නිරාසයෝ යන වචන තුනෙන් ම දැක්වෙන්නේ ආශාව ප්‍රහීණ කළ බව ය.

නික්කුහො යන්නෙන් දැක්වෙන්නේ ත්‍රිවිධාකාර කුහන වස්තූන් ප්‍රහීණ කළ බව ය.
- පච්චය පටිසේධන සඞ්ඛාතං කුහන වත්ථු
- ඉරියාපථ සඞ්ඛාතං කුහන වත්ථු
- සාමන්ත ජප්පන සඞ්ඛාතං කුහන වත්ථු

යනුවෙන් ඒ ත්‍රිවිධාකාර කුහන වත්ථු දැක්වේ. සමහර පැවිද්දෝ බොහෝ ප්‍රත්‍යය ලබා ගැනීමේ චේතනාවෙන් ලූබ, රළු සිවුපසයන් පරිභෝග කරති. ගිහියන් සිවුපසය පූජා කිරීමට යත්දී, අපට ඕවායින් "කවර වැඩක් ද, පැවිද්දන්ට අනගි සිවුපසයෙන් වැඩක් නැත, පැවිද්දන්ට සුදුසු පාංශුකූල චීවර ය, රුක්ඛ මූල වැනි සෙනසුන් ය, පූතිමුත්ත භෙසජ්ජය ය, පිණ්ඩපාතයට ලැබෙන දෙයක්" ය කියා පූජා කිරීමට යන සිවුපසය නො පිළිගනිති. රළු සිවුපසය පරිභෝග කරති. දායකයෝ මේ ශ්‍රමණයන් වහන්සේ අල්පේච්ඡ ය, යථා ලාභ සන්තුට්ඨී ගුණයෙන් යුක්තය, ධූතාංගවාදී ය යනාදියෙන් සිතා වැඩි වැඩියෙන් සිවුපසය පිළිගැන්වීමට උත්සුක වෙති. "ඔබලාට දෙන දෙයක් තිබෙනවා, ශ්‍රද්ධාවත් තිබෙනවා, ප්‍රතිග්‍රාහකයකුත් සිටිනවා, මට නම් මේවායින් වැඩක් නැහැ, එහෙත් ඔබලාට පින් ලබාදීම සඳහා ම මේවා පිළිගනිමි"යි ඒ සිවුපසය පිළිගනිති. මෙසේ බොහෝ වූ සිවුපසය ලබති. මෙය ප්‍රත්‍යයන් ප්‍රතික්ෂේප කිරීම සඞ්ඛ්‍යාත වූ කුහකකම ය. (පච්චය පටිසේධන සඞ්ඛාතං කුහනවත්ථු).

සමහර පැවිද්දෝ දායකයන් ගෙන් සිවුපසය ලබා ගැනීමේ අදහසින් මැනවින් සතියෙන් යුතුව මෙන් ඉරියවු පවත්වති. ගමන් කිරීම, සිටීම, හිඳීම, ශයනය කිරීම, කථාබහ කිරීම, සිනාසීම ආදී ක්‍රියා සමාහිත සිත් ඇතිව කරන්නාක් සේ කරති. මෙසේ කොට ලබනා සිවුපසය 'ඉරියාපථ සඞ්ඛාතං කුහන වත්ථු' යන්නෙන් අදහස් වේ.

සමහර පැවිද්දෝ සිවුපසය ලබා ගැනීමේ අදහසින් "මෙසේ සිවුරු පිරිකර දරන්නෝ මහා ගුණවත්හු ය, මේ ආචරිය උපාධ්‍යයන් සිටින අය ආර්යයෝ ය, මෙසේ කථා කරන්නෝ අධිගම ලාභීහු ය යනාදි වශයෙන් කියති. ගම්භීර වූ, ලෝකුත්තර වූ, ශූන්‍යතා පටිසංයුත්ත වූ ධර්ම කථා බෙණෙති. මෙසේ ලබා ගන්නා සිවුපස ප්‍රතිලාභය 'සාමන්ත ජප්පන සඞ්ඛාතං කුහන වත්ථු' යන්නෙන් අදහස් වේ.

මේ ආදී කුහන වත්ථූන් ඒ පසේබුදුරදුන්ට නොමැත. ඒ සියල්ල ම උන්වහන්සේ ප්‍රහීණ කළ සේක. (මෙයින් දැක්වෙන්නේ ආජීව පාරිශුද්ධි ශීල සඞ්ඛ්‍යාත අශෛක්‍ෂ සීලස්කන්ධය යි.)

නිම්මක්ඛෝ යන පදයෙන් දැක්වෙන්නේ ගුණමකුකම ඊර්ෂ්‍යාව, උන්වහන්සේ නැසූ බව ය.

'කසාවො' යනු සිත් කිලිටි කරන රාගාදි කසටයන් ය. රාග දෝෂ මෝහ කෝධ උපනාහ මක්ඛ පළාස ඉස්සා මච්ඡරිය මායා සාඨෙය්‍ය ථම්භ සාරම්භ මාන අතිමාන මද පමාද සියළු ක්ලේශ, සියළු දුච්චරිත, සියළු පරිළාහ, සියළු සන්තාප, සියළු අකුශලාභිසඞ්ඛාර යනාදිය උන්වහන්සේ නැසූ සේක.

'සබ්බ ලෝකේ භවිත්වා' යනුවෙන් දැක්වෙන්නේ උන්වහන්සේ, සියළු අපාය ලෝක-මනුස්ස ලෝක-දේව ලෝක - ස්කන්ධ ලෝක - ධාතු ලෝක-ආයතන ලෝක ආදි සියළු ලෝකයන් මැඩලූ බව ය.

මෙසේ සියළු ක්ලේශයන් ඤාණාලෝකයෙන් ප්‍රඥා ගින්දරෙන් හළු කොට ප්‍රහීණ කොට, සමුච්ඡින්න[1] කොට, ව්‍යුපසමනය[2] කොට, පටිප්පස්සද්ධත්වයට[3] පත්කොට, ක්ලේශයන් දෙවැනි කොට ගමන් නො ගත්තේ, දෙවැන්නකු සමඟ නො හැසුරුණේ එකලාව ම බගවේණ අඟක් සේ ම උන්වහන්සේ වැඩ වෙසෙති.

(මෙහිදී ඒ ඒ මාර්ගයෙන් ක්ලේශයන් ප්‍රහීණ වන ආකාරය විස්තර

1. සම්පූර්ණයෙන් මුලිනුපුටාදමා
2. නිවා, සංසිඳුවා
3. සංසිඳීමෙන් ශාන්ත බවට පත් කොට

විය යුතු ය. එය අති දීර්ඝ විස්තරයක් වන බැවින් මෙහි ලියා නැත. ගාථා 28 අවසානයේ දැක්වෙන ප්‍රහීණ සංයෝජන ප්‍රත්‍යාවේක්ෂාව කියන කොටස ද බලන්න).

## ගාථා අංක 23

**පාපං සහායං පරිවජ්ජයේථ**
**අනත්ථදස්සිං විසමේ නිවිට්ඨං**
**සයං න සේවේ පසුතං පමත්තං**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රට පැදකුණු කරන විට, කොටු ගෙවල් පිරුණු මිනිසුන්, පැරණි ධාන්‍ය ඉවතලනු දැක, දන් දීමට සිතයි. ඒ ගැන අමාත්‍යයන් ගෙන් විමසූ කල 'නත්ථි දින්නං' ආදිය කියමින් අමාත්‍යයෝ දන් දීම වළකති. මෙසේ තෙවරක් ම දන් දීමට යෑම වැළකූ පසු රජ කළකිරී පැවිදි වේ. පසේබුද්ධත්වයට පත්ව මේ උදානය පළ කරති.

**දුච්චරිතයෙහි නියැලුණු, අනර්ථය පෙන්වන්නා වූ, පාපකාරී සහායකයන් ගෙන් වෙන්වන්න. තෙමේ ද කාමාදියෙහි නො යෙදෙන්න. ප්‍රමාදයට නො වැටෙන්න. ඛඟවේණ අඟක් සේ එකලාවම හැසිරෙන්න** යන්න මේ ගාථාවේ සාමාන්‍ය අදහස ය.

මෙම ගාථාවේ විසමේ නිවිට්ඨං යනුවෙන් දැක්වෙන්නේ විසම වූ කාය කර්මයෙහි (කාය දුච්චරිතයෙහි) යෙදෙන, විසම වූ වචී කර්මයෙහි යෙදෙන, විසම වූ මනෝ කර්මයෙහි යෙදෙන, විසම වූ පාණාතිපාතයෙහි / අදින්නාදානයෙහි / කාමමිථ්‍යාචාරයෙහි / මුසාවාදයෙහි / පිසුනාවාචයෙහි / ඵරුසාවාචයෙහි / සම්ඵප්පලාපයෙහි / අභිජ්ඣාවෙහි / ව්‍යාපාදයෙහි / මිච්ඡා දිට්ඨියෙහි යෙදෙන, විසම වූ පඤ්ච කාම ගුණයෙහි යෙදෙන, විසම වූ පඤ්ච

නීවරණයෙහි යෙදෙන, විසම වූ සඞ්ඛාරයන්හි යෙදෙන, ඒවායෙහි ඇලෙන, ඒවායෙහි බැසගත්, ඒවායෙහි ගැලී සිටින යන අර්ථයන් ය.

මෙවැන්නෝ "නත්ථි දින්නං, නත්ථි යිට්ඨං" ආදී වශයෙන්, "දුන් දෙයෙහි විපාක නැත, හොඳ හෝ නරක වූ කර්මයන්ට ලැබෙන විපාකයන් නැත, මෙලොවින් පරලොවට යන අය නැත, පරලොවින් මෙලොවට එන අය නැත, මවට කරන හොඳ නරකෙහි විපාක නැත, පියාට කරන හොඳ නරකෙහි විපාක නැත, ඕපපාතික වූ සත්වයන් නැත, මේ ලෝකය ද පර ලෝකය ද සිය නුවණින් දැන ගත්, මැනවින් පිළිපන් ශ්‍රවණ බ්‍රාහ්මණයන් නැත" යනාදී අදහස් ද දක්වති. සිය දෘෂ්ටීන් අන් අයට කැවීමට උත්සාහ කරති.

මෙවැනි පාපකාරී අනර්ථය ම දක්වන්නන් ආශ්‍රය කිරීමෙන්, තමාගේ මේ ලෝකාර්ථය ද පිරිහෙන්නේ ය. පරලෝකාර්ථය ද පිරිහෙන්නේ ය. නිර්වාණ පරමාර්ථය ද පිරිහෙන්නේ ය. තමා තුළ ඇති හොඳ ගුණධර්ම නැති වී යන්නේ ය. තමා තුළ නො තිබූ අයහපත් ධර්ම වැඩෙන්නේ ය. තමා තුළ තිබූ අයහපත් අනර්ථකාරී ධර්ම තව තවත් වැඩෙන්නේ ය. අපාය මග ඇරෙන්නේ ය. නිවන් මග වැසෙන්නේ ය. අවිද්‍යාවෙන් යට වන්නේ ය. ප්‍රඥාව ඉස්මතු නො වන්නේ ය. තමා ප්‍රපාතයකට කඩා හැලෙන්නේ ය. අකුශලයෙන් හරිත වන්නේ ය. කුශලයෙන් හිස් වන්නේ ය. විනාශ මුඛයට ගමන් කරන්නේ ය. අනර්ථයක් ම, අවැඩක් ම, අයහපතක් ම සිදුවන්නේ ය. එබැවින් මෙබඳු පාපකාරී මිත්‍රයන් ගෙන් හා සහායකයන් ගෙන් වෙන් විය යුතු ය. ඔවුන් යහ මගට හැරවීමට තමා පොහොසත් නම්, ඒ අදහසින් ඇසුරු කළාට වරදක් නො මැති වුවත්, එය ඉතා ප්‍රවේශමෙන් කළ යුතු ය. තමා නො දැනුවත්ව ම තමනුත් ඒ තත්ත්වයට පත් වීමට හොඳටම ඉඩකඩ ඇති බැවිනි.

තමා ද රූප ශබ්ද ගන්ධ රස පොට්ඨබ්බ ආදී කාමයෙහි ඇලි ඇලී ගිජු වී එයට ම නැමුණු සිත් ඇතිව නො විසිය යුතු ය. (මෙහිදී ගාථා 16, 17 දක්වන ලද කාමාදීනව මෙනෙහි විය යුතු ය).

මෙසේම ප්‍රමාද විහරණයෙන් නො විසිය යුතු ය. කායාදී දුච්චරිතයෙහි සිත බැස ගැනීමක්, මැනවින් පුන පුනා බැස ගැනීමක්, කුසල් දහම්

වැඩීමෙහි සකසා නො කිරීමක්, සතතයෙන් (නිරන්තරයෙන්) නො කිරීමක්, ලීනභාවයක්[1], බහා තැබූ ඡන්ද විරිය ඇති බවක්, ආසේවනය නො කිරීමක්, නො වැඩීමක්, පුන පුනා නො වැඩීමක්, නො යෙදීමක්, පමා බවක් වේ ද එය ප්‍රමාදය නම් වේ. මෙවන් ප්‍රමාදයෙන් වෙන්ව, උපන් අකුසල දහම් දුරු කිරීමට ද, නූපන් අකුසල් දහම් නූපදවීමට ද, උපන් කුසල් දහම් වැඩි දියුණු කර ගැනීමට ද, නූපන් උපචාර, අපර්ණා සමාධි, විදර්ශනා ඥාණ මාර්ග ඵල ආදිය උපදවා ගැනීමට ද අප්‍රමාද විය යුතු ය.

මෙසේ අප්‍රමාද වූ ඒ බෝසතාණෝ, පසේ බුද්ධත්වයට පත්ව, ප්‍රමාද ආදී අනේකවිධ පාපකාරී අකුශල ක්ලේශ ධර්මයන් හා මුසු නො වී, ඛගවේණ අඟක් සේ එකචාරීව වැඩ සිටියහ.

## ගාථා අංක 24

**බහුස්සුතං ධම්මධරං භජේථ**
**මිත්තං උළාරං පටිභාණවන්තං**
**අඤ්ඤාය අත්ථානි විනෙය්‍ය කඞ්ඛං**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

කාශ්‍යප බුදුරදුන් කල ගතපච්චාගත වත් පිරූ දෙදෙනකු, පසුව බරණැස ඉපැද එක් අයකු පසේබුද්ධත්වයට පත් වේ. තමාගේ පැරණි යහළුවාට උපකාර කිරීමට සිතා පසේබුදුරදහු ඔහු (රජතුමා) හමුවීමට වඩිති. නම ඇසූ විට 'බහුස්සුත' යැයි වදාළහ. රජතුමා, දහම් දෙසීමට ඇරයුම් කරයි. පසේ බුදුරදහු "තණ්හක්ඛයෝ-ලෝභක්ඛයෝ - දෝසක්ඛයෝ, මෝහක්ඛයෝ" යනාදී වචන පමණක් දෙසති. නම බහුශ්‍රැත වූ නමුත් විචිත්‍ර කථා නැතැයි රජ සිතයි. පසේබුදුරදහු අහසින් වඩිති. පසුව මෙම වචනවල අරුත් නුවණින් කල්පනා කළ රජතුමා පසේබුද්ධත්වයට පත් වේ. මේ උදානය ඊට පසු ගැයූහ.

---

1. හැකිලුන ස්වභාවයක්

උළාර වූ, පටිභානවන්ත වූ, බහුශ්‍රැත වූ, ධම්මධර වූ, මිත්‍රයන් ඇසුරු කරව. සකල අර්ථයන් නුවණින් දැන, සැක දුරුකොට, ඛගවේණ අඟක් සේ එකලාව හැසිරේ යන අර්ථය මෙයින් දැක්වෙන්නේ ය.

මෙහි බහුස්සුත (බොහෝ දේ දත්) යන්නෙන් අදහස් වන්නේ පරියත්ති බහුශ්‍රැත භාවය හා පටිවේධ බහුශ්‍රැත භාවය යි. ආදි[1] කල්‍යාණ වූ, මජ්ඣෙ කල්‍යාණ වූ, පරියෝසාන කල්‍යාණ වූ, අර්ථවත් වූ, ව්‍යඤ්ජන සම්පන්න වූ, කේවල පරිපූර්ණ වූ, පාරිශුද්ධ වූ, උතුම් බ්‍රහ්මචරිය ප්‍රකාශවන්නා වූ, ධර්මයන් අසා දරා වචනයෙන් ප්‍රගුණ කොට, මනසින් විචාරා, සිටින බව පරියත්ති බහුශ්‍රැත භාවය ය. අෂ්ට සමාපත්ති, ජළභිඤ්ඤා[2], සතර මාර්ග-ඵල ආදිය අධිගම කළ බව පටිවේධ බහුශ්‍රැත භාවය ය.

ධම්මධර යන වචනයෙන් දැක්වෙන්නේ සුත්තං-ගෙය්‍යං-වෙය්‍යාකරණං, ගාථං, උදානං ඉතිවුත්තකං, ජාතකං, අබ්භුතධම්මං, වේදල්ලං. යන නවාංග ශාසනය ධාරණය කර ඇති බව ය.

'උළාර' යනු, ශ්‍රේෂ්ඨ වූ කාය වචී මනෝ සමාචාරයන් ගෙන් සමන්නාගත බව හා සීල සමාධි පඤ්ඤා විමුත්ති විමුත්තිඤාණදස්සන යනාදියෙන් සමන්නාගත වූ බව ය.

'පටිභානවන්තං' යනු අර්ථ ධර්ම නිරුත්ති පටිභාන යන පටිසම්භිදාවන් ගෙන් සමන්නාගත වන බව ය. මෙම පටිභානවත් භාවය පරියත්ති පටිභාන - පරිපුච්ඡා පටිභාන - අධිගම පටිභාන යනුවෙන් ත්‍රිවිධාකාර වේ. නවාංග බුද්ධ ශාසනය මැනවින් හදාරා ප්‍රගුණ කොට තිබීම පරියත්ති පටිභානවත් බව ය. අර්ථය ඤෙය්‍යය (න්‍යායය) ලක්ඛණ කාරණා, ඨානාඨාන ආදිය ගැන මැනවින් විමසා දරා සිටීම පරිපුච්ඡා පටිභානවත් බව ය. ලෝකෝත්තර ධර්මයන් අධිගම කිරීමෙන් ලැබෙන පටිභානවත් භාවය 'අධිගම පටිභාන' යන්නෙන් දැක්වේ.

"අඤ්ඤාය අත්ථානි" යනු ස්වාර්ථය[3], පරාර්ථය, උභයාර්ථය,

---

1. ආදි - මජ්ඣෙ - පරියොසාන 5 මුල-මැද-අග
2. පංච අංභිඤ්ඤා සහ ආශ්‍රවක්ෂය ඥානය. උප ග්‍රන්ථය ද බලන්න.
3. ස්වකීය අර්ථය (ආත්මාර්ථය)

දිට්ඨධම්මිකාර්ථය, සම්පරායිකාර්ථය හා නිබ්බාන පරමාර්ථය යන අර්ථයන් නුවණින් දැන සිටින බවය.

මෙවැනි ධර්මයන් ගෙන් සමන්නාගත වූ ඒ පසේබුදුපියාණන්ගේ ඇසුර ලැබූ බැවින් එම රජතුමා ද ඒ ධර්මයන් ස්වකීය සන්තානය තුළ වර්ධනය කර ගැනීමට ලැබී පසේ බුද්ධත්වයට පත් වීමට හැකි විය. එබැවින් කල්‍යාණ මිත්‍ර සම්පත්තියේ වටිනාකම මිල කළ නො හැක.

එසේ පසේබුද්ධත්වය ලැබූ උන්වහන්සේ ඛගවේණ අඟක් සේ ඒකචාරී විහරණයෙන් ම යුතුව වැඩ සිටි සේක.

## ගාථා අංක 25

**ඛිඩ්ඩං රතිං කාමසුඛංච ලෝකේ**
**අනලංකරිත්වා අනපෙක්ඛමානෝ**
**විභූසනට්ඨානා විරතෝ සච්චවාදී**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

විභූසිත බ්‍රහ්මදත්ත රජු ශරීරය සැරසීමට බොහෝ වේලා වෙහෙසීමෙන් පිටේ වේදනාවක් හට ගැනීම නිසා කළකිරී පැවිදි වී පසේ බුද්ධත්වයට පත්ව මේ උදානය පළ කළහ.

**ලෝකයෙහි ක්‍රීඩා ද, රතිය ද, කාම සුඛය ද සාරභූත වශයෙන් නො ගෙන, ඒ ගැන අපේක්ෂා විරහිතව, කායාදිය සැරසීම් වලින් වෙන්ව, සත්‍යවාදීව, ඛගවේණ අඟක් සේ එකලාව හැසිරේ යන්න** මෙම ගාථාවේ සාමාන්‍ය අර්ථය ය.

~~ක්‍රීඩාවන් රතීන් හා කාම සුඛයන් ගැන සාර ධර්ම වශයෙන් නො~~

ගෙන අනපේක්ෂිත වන ආකාරය පිළිබඳව ගාථා 7 හා ගාථා 16, 17 යන විස්තරයන්ට අනුකූලව සිතන්න.

"විභූසනට්ඨානා" හෙවත් සැරසීම් ගිහි පැවිදි දෙපක්ෂය විසින් ම කරනු ලැබේ. ගිහියන් තම සිරුර, දූ පුතුන්, ඇඳුම් පැළඳුම්, ගෙවල් දොරවල් ආදිය, මල් සුවඳ විලවුන් ආදී නොයෙක් අයුරින් සැරසීම් කරනු ලබන අතර, පැවිද්දෝ ද සිය කුණුකය සැරසීම් වශයෙන් හෝ චීවර - පාත්‍ර - සේනාසන සැරසීම් වශයෙන් සැරසීම් කරති. විසිතුරු කිරීමේ අදහසින් චීවර මැනවින් පඬු පෙවීම්-කොට්ට යට නවා මැනවින් තැබීම්, පාත්‍ර ඉතා මැනවින් තෙල් ගැල්වීම්, විසිතුරු අන්දමට පාත්‍ර ථවික මැසීම්, විසිතුරු ගමන් මළු වැනි වෙනත් පරිෂ්කාර දැරීම්, සේනාසනයන්හි විසිතුරු පාට ආලේප කිරීම්, ගෙබිම මැදීම්, මල් වැවීම්, මිදුල් විසිතුරු අන්දමින් ඇමදීම් යනාදිය ද පැවිද්දෝ කරති. හිස කෙස් ඉතා මැනවින් බෑම, ශරීරය මහත් කිරීම සඳහා බෙහෙත් වර්ග විටමින් වර්ග යනාදිය ගැනීම, සුවඳ සබන් ආලේප කිරීම, යනාදිය ද කය සැරසීමේ අභිලාෂයෙන් සමහරු වංචනික ධර්ම ක්‍රියාත්මක වීම ගැන නො දැන කරති. මේ සියල්ලන් ගෙන් වෙන් විය යුතු ය.

"සච්චවාදී" යන වචනයෙන් දැක්වෙන්නේ සත්‍යය කථා කරන, සත්‍යයෙන් සත්‍යය ගළපන, ස්ථිර කථා ඇති, ඇදහිය යුතු කථා ඇති බව හා ලෝකය හා සංවාද විරහිතව සිටින බව ය.

චතුරාර්ය සත්‍යය අවබෝධ කළ ඒ පසේබුදුපියාණෝ සච්චවාදීව සියළු ක්ලේශයන් ගෙන් වෙන්ව, මිදී, විසංයෝග වී ඛගවේණ අඟක් සේ ඒකචාරීව වැඩ සිටියහ.

## ගාථා අංක 26

**පුත්තංච දාරං පිතරංච මාතරං**
**ධනානි ධඤ්ඤානිච බන්ධවානි**
**හිත්වා කාමානි සකෝධිකානි**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බ්‍රහ්මදත්ත රජ කෙනෙක් කුඩා කලම රජකමට පත් වේ. රජ වී රාජ්‍යය කිරීමෙන් බොහෝ දුක් ලැබෙන බව පසුව සිතා, සියල්ල අතහැර පැවිදි වේ. පසුව පසේ බුද්ධත්වයට පත්ව මේ උදානය ගැයූහ.

**තමාට බාධකව පැවැති දූ පුතුන්, භාර්යාවන්, මව්පියන්, ධන ධාන්‍ය, බන්ධූන් හා කාමයන් අත්හැර දමා ඛගවේණ අඟක් සේ එකලාව ම හැසිරේ යන්න මෙහි සාමාන්‍ය අදහස ය.**

(මෙහි විස්තරයක් පසුගිය ගාථාවන්හි දක්වා ඇත. මෙය විස්තර කළ හැකි ගාථා බොහෝ ය. 2-3-6-7-9-10 ආදී තවත් ගාථා රාශියක මෙහි විස්තර දක්වා ඇත).

දූ පුතුන් සොයුරු සොයුරියන්, දෙමාපියන්, බන්ධූන්, ධන ධාන්‍ය ආදිය නුනුවණින් බලන විට පෙනෙන්නේ, තමාට සැපක් ලබා දීමට, සතුටක් ලබා දීමට, ආරක්ෂාවක් ලබා දීමට ඇති දේවල් හැටියට ය. තමාට ඇලුම් කරන, තමා ඇලුම් කරන, තමාට සෙනහසක් දක්වන දේ හැටියට ය.

එහෙත් නුවණින් විමසන විට දෙමාපිය සහෝදර සහෝදරියන් බන්ධූන් දූ පුතුන් ආදීන් හා ධන ධාන්‍ය ආදිය පෙනෙන්නේ, තමාගේ සසර ගමන දිග්ගැස්සීමට, තමා සසර දුකට ඇද දැමීමට, තමාට සසරින් ගැලවීමට නොදී එහි ම අල්ලා බැඳ තැබීමට පවත්නා මිතුරු වෙසින් පෙනී සිටිනා වධකයන් ලෙස ය. මාරයා එවූ මාර තොණ්ඩු ලෙසට ය.

මොවුන්ට ඇලුම් කළත් කවදා හෝ මේ සියල්ල ම අත්හැර දැමීමට සිදු වන්නේ ය. මොවුන්ට ඇලුම් නො කළත් කෙදිනක හෝ මේ සියල්ල අහිමි වී යන්නේ ය.

පෙර භවයන්හිදී සිටි කිසිදු නෑදෑ හිතමිත්‍ර දෙමාපිය සොයුරු සොයුරියන් හෝ කිසිදු කාම වස්තුවක් හෝ අද නැත. එහෙත් ඔවුන් නිසා එදා රැස් කළ කර්ම පසුපසින් ඇත. ඒ කර්ම වලට විපාක විඳීමට සිදු වන්නේ ඔවුන්ට නොව තමාට ම ය. දැන් සිටිනා මොවුන්ට සිදු වන්නේත් එය ම ය, මොවුන් නිසා සිදු වන්නේත් එය ම ය.

මොවුන් නිසා සිදු කරන කර්ම වලට අපා ගිනි මැද පිච්චීමට සිදු වන විට, ප්‍රේත ලෝකවල, තිරිසන් ලෝකවල බොහෝ කටුක වේදනා විඳීමට සිදු වන විට, දැන් තමා ඇලුම් කරනා මොවුන් කිසිවෙක් එදාට පිහිටට එන්නේ නැත. සතර අපායට මොවුන් නිසා වැටුනොත් කවදා නම් ගොඩ එන්න ද ? කවුරු නම් ඒ ගිනි වලින් මුදවාලයි ද ? කෙසේ නම් සසර දුකින් ගැලවෙන්න ද ? කෙදිනක නම් නිවන් ලබන්න ද ?

භයානක සසර ගිනි නිවා නිවනට යාමට අදහස් කරන තමා, එයට බාධා කරන සියළු දේ ඉවතලිය යුතු ය. මාරයා ගේ තොණ්ඩු වල මෙතෙක් සසර පැටලී සිටියා හොඳටම ප්‍රමාණවත් ය. දැන් ඒ තොණ්ඩු කඩා දමා ඉදිරියට ම යා යුතු ය. මාර බිල්ල, මාර බිල්ලක් ලෙසින් ම හඳුනා ගත යුතු ය.

එබැවින්, සතර අපායට ඇද දැමීමට, සසර දුකෙහි ගිල්වීමට සූදානම්ව සිටිනා මොවුන් හා කාමවස්තූන් ගැන කිනම් බැඳීමක් ද ? කවර ඇල්මක් ද ? කුමන සෙනහසක් ද ? මොන අපේක්ෂාවක් ද ? කවර සංසර්ගයක් ද ? කුමක් නිසා මේ සියල්ල අත් නො හරිම් ද ? කුමක් නම් උපාදාන කළ යුත්තේ ද ? කුමන හේතුවක් නිසා දුක්ඛ සමුදය බහා තැබිය නො යුත්තේ ද ? අනිත්‍ය වූ මේ සියල්ල, දුක් වූ මේ සියල්ල, අනාත්ම වූ මේ සියල්ල හා සම වන, අධ්‍යාත්මික බාහිර සංස්කාර ලෝකය කුමකට අභිනිවේශ[1] කරම් ද ? තුච්ඡ වූ, නිහීන වූ, ලාමක වූ, අසාර වූ, අනාත්ම වූ, දුක්ඛ වූ, සසර දුකෙහි ගිල්වන්නා වූ, මාරාපායාස වූ, ධාතුමාත්‍රයක් පමණක් වූ, පටිච්චසමුප්පන්නික[2] වූ, බිය විය යුතු වූ, හළ යුතු වූ, මෝහයට පත් කරලන්නා වූ, මුලාවෙන් බැඳ තබන්නා වූ, නිවන් සුවයෙන් ඈත් කරලන්නා වූ

1. තණ්හාවෙන් බැඳී, සතුටින් ඇලීම
2. හේතු නිසා හටගත්

මේ සියළු සංස්කාරයන් අත් හරිමි; ආදානය[1] නො කරමි; ශුන්‍ය වූ සංස්කාර ශුන්‍ය ලෙසින් ම බලමි.

මෙවන් විදර්ශනාමය සම්මර්ශනයන් තුළින් චතුරාර්ය සත්‍යාවබෝධයත්, ත්‍රිලක්ෂණාවබෝධයත්, අනුලෝමික ඛන්තියත්,[2] සම්මත්ති නියාමත්,[3] සාමඤ්ඤ ඵලයනුත්,[4] ඡළභිඤ්ඤාවනුත්, අධිගම කළ උන්වහන්සේ අනුපාදිශේෂ පරිනිබ්බානාපේක්ෂාවෙන් යුක්තව, ඛගවේණ අඟක් සේ ඒකචාරී විහරණයෙන් ම සමන්නාගතව වැඩ වෙසෙති.

## ගාථා අංක 27

**සඞ්ගෝ ඒසෝ පරිත්තමෙත්ථ සොඛ්‍යං**
**අප්පස්සාදො දුක්ඛමේවෙත්ථ භියෝ**
**ගළෝ ඒසෝ ඉති ඤත්වා මතීමා**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

පාදලෝල බ්‍රහ්මදත්ත රජ මාළිගා තුනක නළඟනන් ගේ නැටුම් දකිමින් තුටු වේ. කොපමණ කාලයක් ඒ දුටුවත් ආශාවේ නිමාවක් නැත. මෙම නිසා තෘෂ්ණාව තෘප්තිමත් කළ නො හැකි යැයි සිතා පැවිදි වේ. පසේබුද්ධත්වයට පත්ව මේ උදානය පළ කරති.

**පස්කම් ගුණය නිසා ලැබෙන සැපය සුළු ය. අල්ප ආශ්වාද සහිත ය. ඉන් අත්වන දුක බොහෝ ය. පස්කම් ගුණය ඇමකි. නුවණැත්තා මෙය දැන (ඉන් වෙන්වී) ඛගවේණ අඟක් සේ එකලාව වෙසේ.** මෙම ගාථාවේ සාමාන්‍ය අර්ථය මෙය යි.

---

1. උපාදාන කිරීම
2. අනුලෝම විදර්ශනා ඥානය
3. සෝවාන් ආදී මාර්ග ඥාන
4. සෝවාන් ආදී ඵල ඥාන

(මෙහි අර්ථ විවරණයක් පසුගිය ගාථා බොහොමයක දක්වා ඇත). සඞ්ග, බලිස, ආමිස, ලග්ගන ආදී මේ සියල්ල ම පස්කම් ගුණයට අධිවචන[1] වේ. ප්‍රිය වූ, ඉෂ්ට වූ, කාන්ත වූ, මනාප වූ, කාමූපසංහිත[2] වූ, රජනීය[3] වූ රූප-ශබ්ද-ගන්ධ-රස-පොට්ඨබ්බ යන ධර්මයෝ ඇත්තාහ. මෙම ධර්මයන් නිසා යම් සුවයක්, සුඛයක්, සාත ස්වභාවයක්, ආශ්වාදයක්, මිහිරක්, සිත පිනවන ස්වභාවයක්, සිත අලවන ස්වභාවයක් වේ නම් ඒ පංචකාමය යි.

මහා ඇතකු මඩ ගොහොරක සම්පූර්ණයෙන් එරී ගොඩ ඒමට නො හැකිව සිටින්නා සේ අන්ධ බාල පෘථජ්ජනයා පස්කම් සුවේ එරී ඇත. සත්වයකු ගැලවීමට නො හැකි සේ මහත් වූ යදම් පහකින් බැඳ තබා ඇත්තාක් සේ ඔහු පස්කම් සුවෙන් බැඳී ඇත. සිහි විකල් වූවකු සේ විපරීත සඤ්ඤාවෙන් මුලා වී ඇත. අසූචි සමඟ සෙල්ලම් කරමින් අසූචි අනමින් කමින්, ක්‍රීඩා කරන ළදරුවෙකු සේ මෝහයෙන් අන්ධ වී ඇත. පහන් දැල්ලකට පතින පළගැටියකු සේ කාම ගින්නෙන් දැවෙමින් ඇත. මරණ තුනක් ඇති මිනිසකු පැණි කන්නා සේ පස්කම් සුවෙහි නියැලී ඇත. මං මුළාවී, මහා යක්ෂ රාක්ෂ පුරයකට යන්නකු සේ සතර අපා මාර්ගයේ ගමන් කරමින් ඇත. අශ්වයකුට එල්ලූ කැරට් අලයක් සේ, පස්කම් සුව පසුපස දුවමින් ඇත. ඇමක් කටට ගත් මාළුවකු සේ පස්කම් සුව කටින් ගෙන ඇත. යක්ෂාවේශ වී නටන්නකු සේ, පස්කම් සුව නිසා දඟලමින් ඇත. වෙඩි කෑ ඌරකු සේ පස්කම් සුවය නිසා උත්සුක වී ඇත. දාසයකු සේ පස්කම් සුවයට වහල් වී ඇත. උගුලකට හසු වූ සත්වයකු සේ මාරයාගේ ගොදුරට බඳුන් වී ඇත. ඝන අන්ධකාරයක සිටින්නකු සේ පස්කම් අඳුරේ කිඳා බැස ඇත. පිපාසයට ලුණු දිය බොන්නකු සේ පස්කම් සුවෙන් අතෘප්තියට පත්ව ඇත. විදුලිය කොටන විට ඇති එළියෙන් නැටුමක් බලා සතුටු වන්නකු සේ තාවකාලික සුවයෙන් තුටු වෙමින් සසර දුකෙහිම ගැලී ඇත. අවදානම නො දැන විෂ මිශ්‍ර කැවුමක් කන්නකු සේ පස්කම් විෂ අනුභව කරමින් ඇත. මිත්‍ර වෙසින් සිටිනා වධකයකු සේ පස්කම් මිත්‍ර වධකයා ළං කර ගෙන ඇත. රත් වූ යකඩයක

1. පරියාය වෙනත් වචන
2. කාමය ඇති කරලීමට හැකි වූ, කාමය හා බැඳුණු
3. ඇලීම් ඇතිකරවන

පිච්චෙමින් එහි ම ඇලෙන අමු මස් කෑල්ලක් සේ කාමයෙන් පිච්චි පිච්චී එහි ම ඇලෙමින් ඇත. ඇට කැබැල්ලක් ලොවිනා බල්ලකු සේ පස්කම් සුව ලෙවමින් ඇත. තිරිසන් සතකු සේ තිරිසනුන් හා සම වී ඇත. කුණු වී ලේ සැරව ගලනා ගඩුවක් කසන්නකු සේ කාම පරිදාහය කසමින් ඇත. අසූචි වලකට කෝටුවකින් අනින්නකු සේ කාම අසූචි වලට අනිමින් ඇත. සූනබයකු සේ දුගඳ වූ දේ, සුවඳවත් ලෙස සිඹිමින් ඇත. සවසට ලැබෙනා පුන්නක්කු ටික බලාපොරොත්තුවෙන් දවස පුරා බර අදිනා ගොනකු සේ කාම බර අදිමින් ඇත. ඇතින්නක නිසා මිනිසුන්ගේ වධ හිංසාවට බඳුන් වන වල් ඇතකු සේ, කාමය නිසා මහත් වූ කරදර පීඩා වධ හිංසා දුක් දොම්නස් වලට මැදි වී ඇත. මිරිඟුව බලා දිවෙනා මුවකු සේ කාම සුඛය සොය සොයා දුවමින් ඇත. අසූචි පිරුන මල්ලක් ප්‍රිය කරන බල්ලකු සේ කාමය ප්‍රිය කරමින් ඇත. විසඝෝර නයකු සුරතල් කරන්නකු සේ කාමයන් සුරතල් කරමින් ඇත. හයක් හතරක් නො දන්නා මෝඩයකු සේ ධාතු මාත්‍රයක් අභිනිවේශ කරමින් ඇත. හේතුව නො දන්නකු සේ කාම දුක්ඛ සමුදය ම වඩමින් ඇත. සසර දුක නො දන්නකු සේ සසර දුක ම ප්‍රාර්ථනය කරමින් ඇත. මහා රෝගයක් සුව කරන තිත්ත කෂායක් අප්‍රිය කරන්නකු සේ නිර්වාණ මාර්ගය ප්‍රිය නො කරමින් ඇත. වණ කුෂ්ටයක් සුව කර ගෙන ලැබිය හැකි සුවය ගැන නො දැන එයම කස කසා තව තවා, තව තවත් වණ කරගන්නකු සේ දුක්ඛ නිරෝධය නො දැන ඇත.

මෙවන් තත්ත්වයක ඇලී ගැලී හිරවී සිටින සත්වයාට කෙදිනක නම් ප්‍රඥාලෝකයක් දැල්වේවි ද ? අවිද්‍යා අන්ධකාරයේ අතපත ගාමින් සිටිනා ඔහුට කෙදිනක නම් මාර්ගය පෙනේවි ද ? පැණි හැලියේ වැටුන ඇඹලයා එහි ම මිය යනු විනා කවදා ඉන් වෙන් වීමට සිතයි ද ? බිය විය යුතු වූ, ප්‍රාර්ථනා නො කළ යුතු වූ, හළ යුතු වූ, වෙන් විය යුතු වූ, දුරින්ම දුරු කළ යුතු වූ කාම සංස්කාරයන්, අනමතග්ග සංසාරයේ අනන්ත අප්‍රමාණ දුක් ලබා දුන්නා වූ කාමසංස්කාරයන්, අනාගත සසර දුකෙහි ගිල්වන කාම සංස්කාරයන්, තුච්ඡ වූ නිහීන වූ ලාමක වූ ජරා කාම සංස්කාරයන්, අනාත්ම වූ 'මම' නො වන 'මගේ' නො වන කාම සංස්කාරයන්, අනිත්‍ය වූ කාම සංස්කාරයන්, ශූන්‍ය වූ කාම සංස්කාරයන්, මාර

බිල්ලක් වූ කාම සංස්කාරයන් කුමක් නිසා නම් තවත් නළවන්නෙම් ද ? කාමයන් සහිත සියළු සංස්කාරයන් අපේක්ෂා විරහිතව ම අත්හරුව. පරසක්වලට වීසි වන සේ පයින් ගසව.

රූප බැලීමේ ආශාව අත්හරුව. ශබ්ද ඇසීමේ ආශාව බැහැර කරලව. සුවඳ දැනීමේ ආශාව වියලවාලව. රස දැනීමේ ආශාව පුච්චා හළු කර දමව. පොට්ඨබ්බයන්[1] දැනීමේ ආශාව විනාශ කරව.

චාතුම්මහාභූතික[2] උපාදාය රූපයක් වූ ඇසෙහි ඡන්දරාගය නසාලව. ධාතු මාත්‍රයක් වූ කනෙහි ඡන්දරාගය නැතිකර දමව. අනාත්ම වූ දිවෙහි ඡන්ද රාගය කපා හරුව. නිරර්ථක වූ නාසයෙහි ඡන්ද රාගය අත්හරුව. අසූචි පර්වතයක් වූ, ධාතු පර්වතයක් වූ, දුක් ආකාරයක් වූ, 'මම' 'මගේ' නො වන අනාත්ම වූ, අනිත්‍ය වූ, ශූන්‍ය වූ කුණු කයේ ඡන්දරාගය නැත්තට ම නැති වන සේ විනාශ වීමට පරමාණු බෝම්බයක් දමව.

සසරෙහි විඳි තාක් දුක් විඳින ලද සිතේ, අනාගත දුක් විඳිනු ලබන සිතේ, පටිච්චසමුප්පන්නික අනාත්ම වූ සිතේ, මුළා වූ, මුළාවට පත් කළ, මුළාවට පත්කරවාලන සිතේ, මහා ගිනි ජාලාවක් සේ බිය විය යුතු සිතේ ඡන්ද රාගය ගින්නෙහි ලා හළු කරව. අළු ටික ද දියකර පා කර හරුව.

අනිත්‍ය වූ චක්ඛු විඤ්ඤාණයේ, දුක් ලබා දුන්නා වූ චක්ඛු විඤ්ඤාණයේ, අනාත්ම වූ චක්ඛු විඤ්ඤාණයේ, නාම මාත්‍රයක් වූ චක්ඛු විඤ්ඤාණයේ, හේතූන් නිසා ඔහේ හට ගෙන ඔහේ නැති වන චක්ඛු විඤ්ඤාණයේ, සසර ගිනි ජාලාවේ බැඳ තබන රැහැනක් වූ චක්ඛු විඤ්ඤාණයේ, මෝහයෙන් වැළඳ ගත් චක්ඛු විඤ්ඤාණයේ, මෙතෙක් කල් සත්‍යය නො දැන සසරෙහි රැඳ වූ චක්ඛු විඤ්ඤාණයේ ඡන්ද රාගය සම්පූර්ණයෙන් ම බැහැර කරලව. බිය ලබා දුන්නා වූ, සැක ලබා දුන්නා වූ, ඊර්ෂ්‍යාව පහළ කරවාලවූ, මානය ජනිත කළා වූ, මෝහයෙන් මුළා කළා වූ, රාගයෙන් පුච්චන ලද්දා වූ, දෝෂයෙන් නසා විනාශ කළා වූ, නිරයට ඇද දැම්මා වූ,

1. ශරීර ස්පර්ශයට ගෝචරවන අරමුණු
2. පඨවි-ආපෝ-තේජෝ-වායෝ නිසා හටගත්

ප්‍රේත ලෝකයට තල්ලු කළා වූ, තිරිසන් ලොවේ බහාලන ලද්දා වූ, සසර දුකෙහි නිමග්න කළා වූ, අකුශල් ජනිත කරවාලවූ, සංයෝජන බැමි වලින් බඳින ලද්දා වූ, ක්ලේශයන් පහළ කර දුන්නා වූ, නිවන් මග වසාලන ලද්දා වූ, නිවනින් ඈත් කරන ලද්දා වූ චක්ඛු විඤ්ඤාණයේ ඡන්දරාගය සුණු විසුණු කර දමව.

සෝත විඤ්ඤාණයේ, ඝාන විඤ්ඤාණයේ, ජිව්හා විඤ්ඤාණයේ, කාය විඤ්ඤාණයේ, මනෝ විඤ්ඤාණයේ ඡන්ද රාගය පාගා පොඩිපට්ටම් කර දමව.

අනුපාදිශේෂ පරිනිර්වාණය ම බලාපොරොත්තු වන මට චක්ඛු සම්ඵස්සයක්,[1] සෝත සම්ඵස්සයක්, ඝාන සම්ඵස්සයක්, ජිව්හා සම්ඵස්සයක්, කාය සම්ඵස්සයක්, මනෝ සම්ඵස්සයක් කුමට ද ? නිවන ලබා නො දෙන ඒවා ගැන වූ ආශාව ඡන්දරාගය අත් හරුව. නිවනට පටහැනි සියළු ධර්ම බැහැර කරලව.
චක්ඛාදී මේවා නිසා ඇතිවන වේදනාවට තවත් කුමකට මුලා වෙම් ද ? ගිනි ගෙන දැවෙන යකඩ උලක් ඇනෙන්නා සේ දුක් දොම්නස් ලබා දෙන දුක්ඛ වේදනාව , වහා නැතිවන උපේක්ෂා වේදනාව හා පවතින මොහොතට පමණක් සැපක් දී, ඉන් විශාල මහත් ගිනි ජාලාවක් ලබා දෙන සුඛ වේදනාව හඳුනා ගත යුතු නොවේ ද ? කාම වස්තූන්ට ඇලුණේ ඒවායින් සුඛ වේදනාවක් ලබා දුන් නිසා නො වේ ද ? සුඛ වේදනාවක් ලබා නො දුන්නා නම් ඒවාට ඇලේවි ද ? එසේ නම් මෙතෙක් කල් ඇලුණේ කාම වස්තූන්ට නොව සුඛ වේදනාවට නො වේ ද ?

ඇස මට ඕනෑ විදියට පැවැත්විය නො හැකි ය. රූපය ද එසේ ය. ඒ දෙකෙහි ගැටීමෙන් ඇතිවන චක්ඛු විඤ්ඤාණය ද ඇති නො කර ගෙන සිටීමට නො හැකි ය; ඔවුන්ගේ එක් වීමෙන් ඇතිවන තත්වය වූ, චක්ඛු සම්ඵස්සය ද ඇතිවීම වැළැක්විය නො හැකි ය. එහෙත් මේවා නිසා ඉෂ්ඨ අරමුණෙහි ඇතිවන සුඛ වේදනාවත්, අනිෂ්ට අරමුණෙහි ඇතිවන දුක්ඛ වේදනාවත්, මධ්‍යස්ථ අරමුණෙහි

---

1 ඇසට රූපයක් ගැටීම නිසා ඇති වන සිත චක්ඛුවිඤ්ඤාණය යි. ඇස-රූප චක්ඛු විඤ්ඤාණ යන තිදෙනාගේ එකතුව චක්ඛු සම්ඵස්සය යි. කණ-නාසය-දිව-ශරීරය-මනස යන ඉන්ද්‍රියන්ටත් මේ අයුරින් උචිත පරිදි සිතන්න.

ඇතිවන උපේක්ෂා වේදනාවත් ඇතිවන්නේ රූප ශබ්ද ගන්ධ රස පොට්ඨබ්බ යන අරමුණ මුණ ගැසීමට පෙර ම, ඒ අරමුණු දෙස බැලීමට හුරු පුරුදු වී ඇති ආකාරයට අනුකූලව ය. රූපය ද ධාතු මාත්‍රයකි. ශබ්දය ද ධාතු මාත්‍රයකි. ගන්ධය ද ධාතු මාත්‍රයකි. රසය ද ධාතු මාත්‍රයකි. පොට්ඨබ්බය ද ධාතු මාත්‍රයකි. ඒ සියල්ල අනිත්‍ය ය. ඒ සියල්ල විසින් සසර දුක් උපදවන ලදී. ඒ සියල්ල නිසා සසරෙහි රැඳී සිටියෙමි. එබැවින් ඒ සියල්ල දුක් ය. ඒ සියල්ල මම නො වේ. මගේ නො වේ. මට ඕනෑ විදියට නො පවතී. එබැවින් අනාත්ම ය. පරම දුර්ගන්ධ වූ අසූචිවලත්, සුවඳ හමන සුපිෂ්පිත මලකත් ඇත්තේ පඨවි ආපෝ තේජෝ වායෝ වර්ණ ගන්ධ රස ඕජා පමණි. එහි ඇලීමට හෝ ගැටීමට දෙයක් නො මැත. එහි ඇලුනත්, චක්ඛු විඤ්ඤාණාදිය ඇති වේ. එහි ගැටුනත් චක්ඛු විඤ්ඤාණාදිය ඇති වේ. ඇලී ගැටී නො සිටියත් චක්ඛු විඤ්ඤාණාදිය ඇති වේ.

ඇසත් ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇති වෙමින් නැති වෙමින් පවතී. රූපය ද මොහොතක් මොහොතක් පාසා ඇති වෙමින් නැති වෙමින් නිරෝධයට පත් වේ. මේවායේ නැතිවීම ඇතිවීම අතර සංස්කාර නිරෝධයක් ඇත. චක්ඛු විඤ්ඤාණය ද සෑම ක්ෂණයක් පාසාම ඇති වෙමින් නැති වෙමින් නිරෝධයට පත් වේ. චක්ඛු සම්ඵස්සය ද එසේ ම ය. මේවායේ නැතිවීම හා ඇතිවීම අතර ද සංස්කාර නිරෝධයක් ඇත. මෙසේ සෑම මොහොතක් පාසා ම නිරෝධයට පත්වන මේ සංස්කාර නිසා ජනිත වන වේදනාව ද ඒ සංස්කාර නිරෝධය සමඟ ම නිරෝධ විය යුතු ය. එබැවින් වේදනාව ද ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇති වේ, නැති වේ. මේ වේදනාවේ නැතිවීම ඇතිවීම අතරද සංස්කාර නිරෝධයක් ඇත. මෙම යථාභූත ඤාණ දර්ශනය ඇත්නම්, ඇසට ඉෂ්ට හෝ අනිෂ්ට හෝ මධ්‍යස්ථ හෝ කවර ආකාරයක රූපයක් ගැටුනද, ඉන් ජනිත වන වේදනාව උපේක්ෂා වේදනාව ම වනු ඇත. අනෙක් ඉන්ද්‍රියයන්ට ද එසේම ය. එවිට ෂළඞ්ගුපෙක්ඛාව ස්ථාපිත වනු ඇත.

ඇස රූපය මෙන්ම නාමරූප සඞ්ඛ්‍යාත සෙසු සියළු සංස්කාර ලෝකය ම සෑම මොහොතක් පාසාම ඇතිවෙමින් නැතිවෙමින් නිරෝධයට පත් වේ. මේ මොහොතේ තිබූ සියළු සංස්කාර ලෝකය

ඊළඟ මොහොතේ දී සම්පූර්ණයෙන් ම නිරුද්ධ වනු ඇත. ඊළඟ මොහොතේ ඇත්තේ අළුත් සංස්කාරයන් ය. මෙවන් ක්‍රියා සන්තතියක් තුළ කවර නම් ලෝකයක් ද ? කවර නම් සතෙක් ද ? කවර නම් මමෙක් ද ? කවර නම් ස්ථිර භාවයක් ද ? සියල්ල සම්පූර්ණයෙන් ම ශූන්‍ය ය. (ගාථා 28 ද බලන්න).

මෙවන් විදර්ශනා චින්තාවන් තුළින් සංස්කාර නිරෝධය ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ වමින් නිරෝධ සත්‍යාවබෝධ කළ උන්වහන්සේ පසේ බුද්ධත්වයට පත්ව, සියල්ල අත් හැරීමෙන් ලබනා ලොවුතුරු සුවයේ ගැලෙමින්, තමා ද ඇතුළු වෙන් වෙන්ව සන්තති පරම්පරා වශයෙන් නිරෝධයට පත්වන නාමරූප සඞ්ඛ්‍යාත සත්ත්ව හා සංස්කාර දැකීම නිසා "ඒකචාරී භාවය" පරිච්ඡේද කිරීමෙන් ස්වයංක්‍රීය වූ ඒකචාරී භාවය ලබමින්, ඛගවිෂාණ අඟක් සේ හුදෙකලාව ම වැඩ වෙසෙති.

## ගාථා අංක 28

**සන්දාලයිත්වාන සංයෝජනානි**
**ජාලංව භෙත්වා සලිලම්බුචාරි**
**අග්ගීව දඩ්ඪං අනිවත්තමානෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

අනිවත්ත නම් බ්‍රහ්මදත්ත රජු ගින්දර නො නැවතී දැවෙමින් යන අයුරු දැක එය අරමුණු කොට පසේබුද්ධත්වයට පත්ව පළ කළ උදාන ගාථාවයි මේ.

**නො නැවතී දවාලන ගින්නක් සේ, දැල පලා යන මාළුවකු සේ, සංයෝජනයන් සිඳ දමා, ඛගවිෂාණ අඟක් සේ ඒකචාරීව හැසිරේ** යන්න මේ ගාථාවේ කෙටි අර්ථය යි.

සංසාර වට්ටයේ යොදවන බැඳ තබාලන, බැවින් සංයෝජන නම් වේ. සංයෝජන දහයක් ඇත. කාමරාග-පටිඝ-මාන-දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස-භවරාග-ඉස්සා-මච්ඡරිය-අවිජ්ජා යනුවෙන් එක් ආකාරයකින් මෙම සංයෝජනයන් දැක්වේ. මේවායින් දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස යන සංයෝජනයන් සෝවාන් මාර්ගයෙන් නැතිවේ. ඉස්සා-මච්ඡරිය-කාමරාග-පටිඝ සංයෝජනයන් අනාගාමී මාර්ගයෙන් නැති වේ. මාන-භවරාග-අවිජ්ජා යන සංයෝජන අරහත්ත මාර්ගයෙන් නැති වේ.

සක්කාය දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස-කාමරාග-පටිඝ-රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා යනුවෙන් තවත් ආකාරයකට මෙම සංයෝජනයන් දක්වා ඇත. ඒවායින් සක්කායදිට්ඨි-විචිකිච්ඡා සීලබ්බතපරාමාස-යන සංයෝජනයන් සෝවාන් මාර්ගයෙන් ද, කාමරාග හා පටිඝ සංයෝජනයන් අනාගාමී මාර්ගයෙන් ද, රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා යන සංයෝජනයන් අරහත්ත මාර්ගයෙන්ද නැති වේ.

සකෘදාගාමී මාර්ගයෙන් කාමරාග පටිඝ ඉස්සා මච්ඡරිය යන සංයෝජනයන් තුනී වේ.

දැවී ගෙන ඉදිරියට යන ගින්නක් දැවුණු ද්‍රව්‍යයන් කරා ආපසු නො එන්නාක් මෙන්, සෝවාන් ආදී මාර්ග වලින් නැසූ සංයෝජන ධර්මයන් නැවත ඇතිවන්නේ නැත.

'මම' 'මගේ' යන හැඟුමෙන් යුතුව, පංචස්කන්ධයේ ආත්මයක් ඇතැයි ගනු ලබන සක්කාය දිට්ඨිය නිසා, සත්වයා අගක් මුලක් නැති සංසාරයේ නැවත නැවත ඉපැදෙමින් බොහෝ දුක් විඳියි. 'මම' 'මගේ' යන්න ඒ ඒ සත්වයාගේ සිත තුළ පවතින හැඟීමක් මිස සත්‍ය වශයෙන් ඇති දෙයක් නො වේ. එය චිත්ත විපල්ලාසයකි.

පංචස්කන්ධයේ පවත්නේ පඨවි-ආපෝ-තේජෝ-වායෝ-ආකාස-විඤ්ඤාණ යන ධාතු හය පමණි. ශරීරයේ ඇති ආකාස ධාතුව, නාස් සිදුරු-කන් සිදුරු-උගුර-බඩ-කට-මල මාර්ග ආදී තැන් වල ප්‍රකටව ඇත. මේ හැර ඇට මස්, නහර ආදී ඝනව පිහිටා ඇති දේ

අතර ද ආකාශ ධාතුව පවතී. සන්ධි අතර ද ආකාශ ධාතුව ඇත. ආකාශ ධාතුව සන්ධි අතර නො මැති නම්, නැවීම් දිග හැරීම් වැනි දේවල් කිරීමට නො හැකි ය. මෙසේ ම සමේ ඉතා ළඟින් ළඟින් ආකාශ ධාතුව ඇත. එම ආකාශ ධාතුව තුළින් දහඩිය වුරුණු තෙල් ආදිය පිට වේ. සෑම රූප කලාප දෙකක් අතර ම ආකාශ ධාතුව ඇත. එක් එක් රූප කලාපයක් අනෙක් රූප කලාපයෙන් ආකාශ ධාතුවෙන් වෙන් වෙන් ව පවතී. එහෙත් එය ඉතා සියුම් බැවින් අන්වීක්ෂයකට විනා පියවි ඇසට නො පෙනේ. ශරීරයෙන් පිටත ඇති ආකාශ ධාතුවත්, ශරීරයේ ආකාශ ධාතුවත් අතර වෙනසක් නැත. ශරීරයේ ඇති ආකාශ ධාතුවට සත්වයකු පුද්ගලයකු මමකු ලෙස ආරෝපනය කිරීම කිසිසේත් නුසුදුසු ය. ආකාශ ධාතුවෙන් වෙන් වෙන්ව පවත්නා එක් එක් රූප කලාපයක් රූප කලාපයක් පාසාම මොහොතින් මොහොත රූප බිඳි බිඳී යාම සිදුවෙයි. අහසේ වෙන් වෙන්ව පවත්නා දූවිලි අණු සේ, ශරීරය ද ආකාශ ධාතුවෙන් වෙන් වූ බැවින්, වෙන් වෙන්ව ම ක්ෂණයක් පසා ඇති වේ, නැති වේ. නැවත ඇති වේ, නැවත නැති වේ. මෙම සන්තති ක්‍රියාවලිය නිරන්තරයෙන් ම වේගයෙන් සිදුවන බැවින් එය ඒකාකාරව පවත්නා ලෙසින් පෙනේ. වේගයෙන් කරකැවෙන රෝදයක නේමියන් නො පෙනී ඒකාකාරව පෙනෙන්නාක් මෙනි. ශරීරය ඇතුළු සජීව අජීව සියලු වස්තූන් අහසේ විසිර පවත්නා දූලි වැනි ය.

මෙම ශරීරයේ වායෝ ධාතු කොටස් 6 ක් ඇත. ඉක්කා වැටෙන විට ආදී අවස්ථා වලදී උඩ දෙස බලා ගමන් කරන වායෝ ධාතුවක් ඇත. මල පහකිරීම් වැනි අවස්ථාවල යට දෙස බලා ගමන් කරන වායෝ ධාතුවක් තිබේ. උදර කුහරය ඇතුළේ වායෝ ධාතුව ඇත. බඩවැල් අතරේ ද වායෝ ධාතුව ඇත. ආශ්වාස, ප්‍රශ්වාස වායෝ ධාතුව ද තිබේ. සුළඟක් හමන හමන දෙසට ගස් කොළන් නැමෙන්නාක් සේ, සිතට අනුකූලව අඟ පසඟ සොලවන චිත්තකිරිය වායෝ ධාතුවක් ද පවතී. බාහිර වායෝ ධාතුව හා අභ්‍යන්තර මෙම වායෝ ධාතූන් අතර වෙනසක් නැත. දෙක ම වායෝ ධාතූන් ම ය. බාහිර වායෝ ධාතුව 'මම' 'මගේ' නො වන්නාක් මෙන් අභ්‍යන්තර වායෝ ධාතුව ද 'මම' 'මගේ' නො වේ. වායෝ ධාතුවට සත්වයකු යැයි ආරෝපනය කිරීම කිසිසේත් ම නුසුදුසු ය.

මෙම ශරීරයේ තේජෝ ධාතු කොටස් 4 ක් ඇත. යටි පතුල් දැවිලි, පපුව දැවිලි වැනි දේ ඇති කරන තේජෝ ධාතුවක් ඇත. ආහාර දිරවන තේජෝ ධාතුවක් ඇත. රූප කලාප මෝරවන, ජරාවට පත් කරන, මහලු බව ඇති කරන තේජෝ ධාතුවක් ඇත. ශරීරයේ පවත්නා සාමාන්‍ය උෂ්ණත්වය යැයි කියන තේජෝ ධාතුවක් ඇත. මෙම තේජෝ ධාතුව උණ ගැනෙන විට ඉහළ නගී. ශරීරයේ යම් කිසි සිසිල් බවක් ඇත් නම් එය ද තේජෝ ධාතුව ම ය. මෙම තේජෝ ධාතුව හා බාහිර තේජෝ ධාතුව අතර වෙනසක් නො මැත. බාහිර තේජෝ ධාතුව 'මම' 'මගේ' නො වන්නේ නම්, අභ්‍යන්තර තේජෝ ධාතුව මම මගේ වන්නේ කෙසේ ද ?

මෙම ශරීරයේ අපෝ ධාතු කොටස් 12 ක් ඇත. පිත්තං, සෙම්හං, පුබ්බෝ, ලෝහිතං, සේදෝ, මේදෝ, අස්සු, වසා, ඛේලෝ, සිඞ්ඝානිකා, ලසිකා, මුත්තං යනුවෙන් දැක්වෙන පිත, සෙම, සැරව, ලේ, දහඩිය, මේදය, කඳුළු, වසා තෙල්, කෙළ, සොටු, සඳ මිඳුළු, මුත්‍ර ආදියෙහි ඇති ආපෝ ධාතුව හා බාහිර ආපෝ ධාතුව අතර කිසිඳු වෙනසක් නැත. සෙම් ටිකක් අස්සේ, සොටු ටිකක් අසසේ, මුත්‍ර ටිකක් අස්සේ මමකු සැඟවිලාවත් නැත. බාහිර ආපෝ ධාතුව සත්වයකු පුද්ගලයකු මමකු නො වේ. අභ්‍යන්තර ආපෝ ධාතුව ද මමකු නො වේ. ධාතු මාත්‍රයක් පමණි.

මෙම ශරීරයේ පඨවි ධාතු කොටස් 20 ක් ඇත. කේසා-ලෝමා-නඛා-දන්තා-තචෝ-මංසං-නහරු-අට්ඨි-අට්ඨි මිඤ්ජා-වක්කං-හදයං-යකනං-කිලෝමකං-පිහකං-පප්ඵාසං-අන්තං-අන්තගුණං-උදරියං-කරීසං-මත්ථලුංගමං (කෙස්-ලොම්-නිය-දත්-සම-මස්-නහර-ඇට-ඇට මිදුළු-වකුගඩු-හෘදය වස්තුව-අක්මාව-දලබුව-ඇල දිව-පෙනහැලි-මහ බඩවැල්-කුඩා බඩවැල්-වමනය-අසූචි-මොළය) යනුවෙන් දැක්වෙන්නේ එම කොටස් 20 ය. නියපොත්තක්, දතක්, ඇට කටුවක් වැනි දෙයක් බ්ලේඩ් තලයකින් වැනි දෙයකින් සීරුවොත්, කුඩා පිටි වැනි දෙයක් ලැබේ. නියපොත්තක් වැනි දෙයක් එය නිම වන තෙක්ම මෙසේ සීරිය හැකි ය. එවිට 'නියපොත්ත' යන සංඥාව නැති වී යයි. එහි ඇත්තේ පිටි වැනි දෙයක් පමණි. පිටි වැනි දෙයක් පැණි වැනි ආපෝ ධාතුවක් යොදා ගුලි කර ඇතිවාක් මෙන් මෙම පඨවි ධාතුව ආපෝ ධාතුව

නිසා එකට ඇලී පවතී. සජීව අජීව සියලු වස්තූන් ගේ තත්ත්වය මෙය යි. එකට එකතු වී එය එක් එක් ආකාරයක හැඩයකට සැදී ඇති නිසා මේවාට කෙස්, ලොම්, නිය, දත්, සම, ඇට ............. අත්, පය, මුහුණ, බඩ ආදී නොයෙක් නාමයන් සම්මත කරගෙන ඒ අනුව ව්‍යවහාර කරනු ලැබේ. පෙණ පිඩක් ගෙන අත්ලේ තබා ඇතිල්ලූ විට කිසිවක් නො පෙනී ඉතිරි නො වන්නාක් මෙන්, ඒකඝණව බැඳී ඇති තත්ත්වය නුවණින් අතුල්ලා බැලූ විට කිසිවක් ඉතිරි නො වේ. මුළු විශ්වයේ ම තත්වය මෙය ය.

මෙම පඨවි ආපෝ තේජෝ වායෝ යන ධාතු කොටස්, කර්ම චිත්ත ඍතු ආහාර යන හේතූන් නිසා ම ඇතිවෙමින් නැතිවෙමින් පවතී. හේතූන් වෙනස් වන වෙනස් වන ආකාරයට මේවා ද වෙනස් වේ. සිනහ වූ විට ඇති ප්‍රසන්න රූප, තරහා ගිය විට සම්පූර්ණයෙන් වෙනස් වේ. ශීතල ඇති විට උදා කාළයේ පැවති සෞම්‍ය රූප, දහවල් වූ විට උෂ්ණ වූ විට වෙනස් ස්වරූපයකට පත් වේ. සීතල ප්‍රදේශයකට ගිය විට සුදු පාට වන රූප, උෂ්ණ පළාතක ටික දිනක් සිටි විට කළු පාට වේ. ආහාර නො මැති විට මලානික වූ රූප, ආහාර ලද විට ප්‍රබෝධමත් වේ. මේ ආදී අයුරෙන් මේ රූපයෝ හේතූන් අනුව උපදිත්, හේතූන් වෙනස් වන විට විපරිනාමයට පත් වෙත්. හේතූන් නිරෝධයට පත් වන විට නිරෝධ වෙත්. සෑම ක්‍ෂණයක් පාසාම ද නිරුද්ධ වෙත්. කුඩා කල සිට ක්‍රමයෙන් මහලු භාවයට පත් වන අතරතුර කාලය තුළදී රූපයන්ගේ වෙනස් වන ස්වභාවය මැනවින් ප්‍රකට ය. හේතූන්ගේ සංයෝගයක් නො මැති නම්, අප කෙතෙක් ඒ රූප උපදවා ගැනීමට සිතුවත් මෙම රූප උපදවා ගත නො හැක. මෙම රූප විපරිනාමයට පත් වන්නේ අපට ඕනෑ විදියට නො වේ. මෙම රූප වෙනස් වීම අනිත්‍යයට යාම අපට වෙනස් කළ නො හැක. මෙම රූප කෙරෙහි අපගේ ඉසුරු බවක්, අධිපති බවක් නැත. හේතූන්ට අනුකූලව ම රූපයෝ පහළ වෙත්. හේතූන්ට අනුකූලව ම නිරුද්ධ වෙත්. එබැවින් ඒ රූප මම නො වේ. මගේ නො වේ. මට ඕනෑ විදියට නො පවතී. එබැවින් ඒ අනාත්ම ය. මෙසේ ම මේ ක්‍ෂණයේ පවතින රූපයෝ ඊළඟ ක්‍ෂණය වන විට කිසිවක් ඉතුරු නොවී සම්පූර්ණයෙන් ම නිරෝධයට පත් වෙත්. ඊළඟ ක්‍ෂණයේ ඇත්තේ අළුත් රූපයන් ය. එම රූපයන්ට ද  සිදු වන්නේ මෙයම ය. මෙම ක්‍රියාවලිය නිසා

ස්ථිර වශයෙන්, ධ්‍රැව වශයෙන් පවතින කිසිවක් නැත. මුළු විශ්වය පුරා ඇති ආකාශ ධාතුවේ ඇති සජීව අජීව සියලු දේ ම නුවණින් විමසන විට පෙනී යන්නේ ශුන්‍ය දෙයක් ලෙසිනි.

විඤ්ඤාණ ධාතුව ද ඒ හා බැඳි වේදනා සඤ්ඤා හා සංඛාරයන් ද (සංඛාර 5 වේදනා, සඤ්ඤා හැර ඉතිරි චෛතසික 50 නැත්නම් රූප-ශබ්ද-ගන්ධ-රස-පොට්ඨබ්බ-ධම්ම පිළිබඳ සිතුවිලි) හේතූන් අනුව ම පහළ වී හේතු නිරෝධයෙන් නිරෝධයට පත් වේ.

ඇසට රූපයක් ගැටුන විට මනසිකාරය පවතී නම්, චක්ඛු විඤ්ඤාණය පහළ වේ. එය පහළ වූයේ කිසිවකු ගේ බලපෑමකින් නො වේ. කිසිවකුට අවශ්‍ය පරිදි ද නො වේ. රූපයක් නො මැතිව කිසිවකුට චක්ඛු විඤ්ඤාණය උපදවා ගැනීමට ද නො හැකි ය. බෙරයකට ගැසූ විට ශබ්දයක් ඇති වන්නාක් මෙන්, චක්ඛු විඤ්ඤාණය ද හේතූන් නිසා පහළ වේ. හේතූන් අනුව ඉබේ ඇති වන එම සිත, "මම මගේ" යයි ගැනීම වැරදි ය. එය ධාතු මාත්‍රයක් පමණි.

මෙසේම කණට ශබ්දයක් හැපුණ විට ඒ දැන ගන්නා සෝත විඤ්ඤාණය පහළ වේ. ශබ්දයක් නො මැති නම් කොපමණ අවශ්‍යතාවය තිබුණත් කෙනකුට මෙම සෝත විඤ්ඤාණය ඇති කර ගත නො හැක. එය ඇති වූ වහාම නිරුද්ධ වේ. එම නිරුද්ධවීම වළක්වාලීමට තබා එසේ නිරුද්ධවීම ප්‍රමාද කරලීමටවත් කිසිවකුට නො හැකි ය. හේතූන් අනුව පහළ වන, ඒ අනුව නිරුද්ධ වන, තමාට අවශ්‍ය පරිදි පහළ නො වන තමාගේ ඉසුරු බවක් නැති මෙම සිත් 'මම' 'මගේ' යැයි ගැනීම මුළාවකි. ඝාන (නාසය)-ජිව්හා කාය-මනෝ විඤ්ඤාණයන් ද මෙසේ ම හේතූන්ගේ සංයෝගයෙන් ම පහළ වනු විනා ඒවා ඇති කරවන, නැති කරවන, හඳුනා ගනු ලබන, විඳිනු ලබන කිසිවෙක් නැත.

මෙම සිත්වල යෙදෙන වේදනා සඤ්ඤා ආදී සියළු චෛතසිකයෝ ම සිත සමඟ ම එකට ඉපැදී, සිත නිරුද්ධ වන විට ඒ සමඟ ම නිරුද්ධ වෙත්. සිත අනාත්ම නම් එහි යෙදෙන චෛතසිකයන් ආත්ම විය නො හැක. මෙම නාමයෝ හේතූන් අනුව ඔහේ ඇතිවී ඇතිවී නැතිවී නැතිවී යත් දී, එම නාමයන් පහළවීමට හේතු භූත වූ රූපයෝ

ද එසේම පටිච්චසමුප්පන්න[1] වශයෙන් ඇති වෙත්, නැති වෙත්. නාම රූපයන්ගේ මෙම තත්වය විනා මේ පංචස්කන්ධය තුළ සත්වයකු පුද්ගලයකු මමකු නැත. අනාත්ම ය. (ගාථා 1- 10-21-27 ද බලන්න).

මෙවැනි විදර්ශනාමය ඥාණ තුළින් ඒ බෝසතාණෝ සෝවාන් මාර්ගයෙන් සක්කාය දිට්ඨිය නැසූ හ. සෝවාන් මාර්ග ප්‍රතිලාභයට පෙරාතුව ම පටිච්චසමුප්පාදක ධර්මයන් සම්මර්ශනය කළ උන්වහන්සේ කඞ්ඛා විතරණ විසුද්ධියෙන් විසුද්ධත්වයට පත්ව සිටි බැවින්, මාර්ග ක්‍ෂණයේ ම විචිකිච්ඡාව නැසූහ. සෝවාන් මාර්ගයෙන් නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දුටු බැවින්, එය ලබන මාර්ගය වැඩූ බැවින්, පච්චවෙක්ඛණ ඥාණයන් පහළ වූ බැවින් සෝවාන් මාර්ගක්‍ෂණයේදී ම සීලබ්බතපරාමාසය ද නැසූහ. (සීලබ්බතපරාමාසය නැසීම සඳහා කළ යුතු භාවනාවක් නැත. විචිකිච්ඡා ප්‍රහාණයට උපකාර වනු පිණිස පටිච්චසමුප්පාද ධර්මයන් මාර්ගයට පෙරාතුව ම භාවනා මනසිකාරයට නැංවිය යුතු ය. මෙවැනි සම්මර්ශනයක් තුළින් ලත් චින්තාමය ඥාණය, විදර්ශනා භාවනාවෙන් ප්‍රත්‍යක්‍ෂ අවබෝධයක් වනු ඇත. පටිච්චසමුප්පාදය විවිධාකාරයෙන් විවිධ අයට අවබෝධ වේ. ඒ පිළිබඳ විස්තරයක් මෙහි ලියා නැත).

මෙසේ ධාතු වශයෙන් ද, තවද ආයතන වශයෙන් ද, ස්කන්ධ වශයෙන් ද, ඉන්ද්‍රිය වශයෙන් ද, පටිච්චසමුප්පාද වශයෙන් ද, අතීතානාගතපච්චුප්පන්න[2] කාල වශයෙන් ද, අජ්ඣත්ත බාහිර වශයෙන් ද යනාදී නොයෙක් අයුරින් සංස්කාර සම්මර්ශනය[3] කොට දිට්ඨි විසුද්ධියෙන් විසුද්ධත්වයට පත් ව, සෙසු විසුද්ධීන් ද විශෝධනය කරමින්, චතුසච්ච පටිවේධයෙන් හා ත්‍රිලක්ෂණාවබෝධයෙන් සෝවාන් මාර්ග ඵල පච්චවේක්ඛණ ඥාණ ප්‍රතිලාභ කිරීමෙන් පසුව, කාමරාග පටිඝයන්ගේ නොයෙක් ආදීනව දකිමින්, පෙරටත් වඩා ගැඹුරින් උදයබ්බයාදී විදර්ශනා ඥාණ පහළවීමෙන් පසු, දෙවන වරටත් සංස්කාර නිරෝධය දකිමින් සකෘදාගාමී මාර්ගය අධිගමනය කළ උන්වහන්සේ කාමරාග පටිඝ යන සංයෝජන ධර්මයන් එම මාර්ගයෙන් තුනී කළ සේක.

1. හේතුන් ගේ පහළවීම නිසා හටගත්
2. අතීතානාගතවර්තමාන
3. නුවණින් ඇති සැටි විමසා

මහා ගිනි කඳු දෙකකට මැදිව සිටින්නා සේ සත්වයා කාමරාග පටිස දෙකට මැදි වී සිටී. මේ පැත්තට ගැටුනත් ගින්නේ ය. අනෙක් පසෙහි ගැටුනත් ගින්නේ ය. පටිසය ජනිත වන්නේ "මට රිදුනා, මට පහර වැදුනා" යනාදී හැඟීම හා ඡන්ද රාගය අජ්ඣත්ත බාහිර සත්ත්ව සංස්කාර කෙරෙහි පැතිර පැවැත්ම නිසා ය. තමා ගේ මවගේ වියෝගයෙන් දුකක් පටිසයක් පහළ වන නමුත්, වෙනත් පෙදෙසක සිටිනා ඡන්දරාගයක් තම සිත තුළ නො මැති වෙනත්, ගැහැණියකගේ වියෝගය නිසා එවැනි පටිසයක් පහළ වන්නේ නැත. සියලු සත්ත්වයන් වෙන් වෙන්ව ස්වකීය කර්මානුරූපව හා හේතුන්ට අනුකූලව ඇති වෙමින් නැති වෙමින් යන නාම රූප පරම්පරාවන් විනා, කිසිවකුගේ නෑදෑ මිත්‍ර සම්බන්ධතාවයක් මත පවතින්නේ නො වේ. ස්වකීය ශරීරය ද එසේම ය. මෙම යථාර්ථය අවබෝධ කර ගත් තැනැත්තාට ඡන්දරාගයක් ජනිත වන්නේ අවිද්‍යාව නිසා ම පමණක් බව වැටහේ.

කාමරාගය සුබාශ්වාදයෙන් පැන නගී. සුබාශ්වාදය අශුභේ ශුභ සඤ්ඤා විපරීත සඤ්ඤාවෙන් පහළ වන්නකි. කිරි පණුවන්, වට පණුවන් ආදී පණුවන් ගෙන් ගහණ වූ, පරම දුර්ගන්ධ අසූචියෙන් පිරුණු, දුගඳ හමන ඉතා පිළිකුල් වමනයෙන් පිරුණු, මුත්‍ර වලින් බර වූ, බඩවැල් පිරී ඇති, කුණු ලේ සැරව සෙම් සොටු ආදියෙන් පිරී ගිය, ඇටසැකිල්ලෙන් සිටවුණු, අසූචි පිටවන මුඛවල් ඇති, මේද තට්ටුවෙන් වැසී ගිය, මෙම ශරීරයෙත්, මළ සිරුරකත් ඇත්තේ එක ම ජරා ගොඩකි. කුණු හමෙන් කළ ආලේපය නිසා එය ශුභ වශයෙන් දිස් වේ. එහෙත් කුණු හම පමණක් වෙන් කර ගත හොත්, එය ඇලීමට තබා බැලීමට ද අප්‍රියකර ය. ඒ කුණු හම ද ධාතු මාත්‍රයක් පමණි. එය ද විපරිනාමයට අනිත්‍යයට පත් වේ.

මලක්, විසිතුරු ගෙයක්, කාරයක් හෝ වෙනත් විසිතුරු දෙයක් වැනි වස්තුවක් ගත්තද එය ද අනිත්‍යයට පත් වේ. මලක් වියලී හෝ කුණුවී පණුවන් ගසා හෝ වීරූපත්වයට පත් වන්නේ ය. මෙවැනි තත්වයක් උදා නො වන ස්ථිර තත්වයක් ඇති යමක් ඇත්නම් එය වුව ද (එවැනි සංස්කාරයක් නැත) යමෙක් ආශ්වාද කරන්නේ නම්, එම සුළු ආශ්වාදය නිසා ඔහු සතර අපා ආදී මහත් ගිනි ජාලාවක් හිමිකර ගත්තකු බවට පත් වේ. රූප ශබ්ද

ගන්ධ රස පොට්ඨබ්බ ආදී ධර්මයන් සත්වයා සසරෙහි බැඳ තබන, සසරෙහි ගිල්වන, දුක් ගිනි ජාලාවකට ඇද දමන, සංස්කාරයන් ය. දෙවඟනක් දුටුව ද එම දෙවඟන දැකීමෙන්, ආශ්වාද කිරීමෙන් ලැබෙන්නේ සතර අපා ආදී සංසාර ගිනි ජාලාව නම්, එය ඇලුම් කළ යුත්තක් නො වේ. ප්‍රාර්ථනය කළ යුත්තක් නො වේ. ආශ්වාද කළ යුත්තක් නො වේ, ළං විය යුත්තක් නො වේ, හිමිකර ගත යුත්තක් නො වේ, සතුටු විය යුත්තක් නො වේ. එය ශුභ දෙයක්, ඉෂ්ට දෙයක්, මනාප දෙයක්, යහපත් දෙයක් වශයෙන් සැළකිය යුතු නො වේ. එයට බිය විය යුතු ය. එයින් වහා පැන යා යුතු ය. තමාගේ කාමරයට විසඝෝර නාගයකු වැනි සතකු ආවොත් ඒ සතා දැක දැක තුටු වෙවී ඉඳීම නොව, වහා ඌ ඉවත් කරලීමට කටයුතු කළ යුතු ය. ඇස කන නාසය ආදී සෑම ඉන්ද්‍රියකට ම ගෝචර වන රූපාදී සියළු ආරම්මණයන් දෙස බැලිය යුත්තේ මෙසේ ය. අප භයානක සසරට ඇද දමන, සසර ගිනි ජාලාවේ ගිල්වන, නිවනින් ඈත් කරවන කවර නම් සංස්කාරයක් ශුභ වශයෙන් සළකම් ද ? මුලාව නිසා එවැනි ශුභ බවක් දිස් වේ නම්, එය තමාගේ ම අනර්ථය පිණිස ම, අහිත පිණිස ම, දුක පිණිස ම, සසර පිණිස ම වේ. නිවන පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස නො වේ.

ඇස ගිනිගත් ගිනි ජාලාවකි. රූපය ද ගිනි ජාලාවකි. චක්ඛු විඤ්ඤාණය ද ගිනි ජාලාවකි. චක්ඛු සම්ඵස්සය ද ගිනි ජාලාවකි. චක්ඛු සම්ඵස්සජා වේදනාව ද ගිනිජාලාවකි. විපරීත මනසිකාර[1] වූ රූප සඤ්ඤාව ද ගිනි ජාලාවකි. රූප සංචේතනාව ද ගිනි ජාලාවකි. රූප තණ්හාව ද ගිනි ජාලාවකි. රූප විතක්කය ද ගිනි ජාලාවකි. රූප විචාරය ද ගිනි ජාලාවකි.

කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රියන් ද ඒ හා සම්ප්‍රයුක්ත වන නාමයන් ද, ඒ සම්ප්‍රයුක්ත ධර්මයන් නිසා පහළ වන රූපයන් ද මෙසේ ම ගිනි ජාලාවන් ය. මෙවැනි ගිනි ජාලාවන් ශුභ වශයෙන් දක්නේ නම් එය අවිද්‍යාව හැර අන් කවරක් ද ? කියා නිම කළ නො හැකි නිර්වාණ ශාන්තිය ලබා ගැනීමට නම්, සසරෙහි බැඳ තබන කාමරාග පටිඝ ආදී පහ කළ යුතු ධර්මයන් පහ කළ යුතු නො වේ ද ?

1. වැරදි ලෙස සිතන ලද සත්‍ය නො වන සිතුවිලි

එම සංස්කාරයන්ට මුලා වී, එම සංස්කාරයන් නලව නලවා සිටියා හොඳට ම දැන් ප්‍රමාණවත් ය. කිසිවක් හෝ කිසිවකු උපාදාන කළ යුතු නො වේ. සියල්ල අත්හළ යුතු ය. ධර්මය පවා හළ යුතු ය.

රූපයක් දැක තුටු වනවා කියන්නේ, හේතු සම්ප්‍රයෝගයෙන් පහළ වූ චක්ඛු විඤ්ඤාණ සිත නිසා ඇති වූ වේදනා චෛතසිකය ආශ්වාදාභිනිවේශය[1] කිරීම පමණි. එය හැර අන් දෙයක් එහි නැත. සෝත ඝාණ ආදී සෙසු ඉන්ද්‍රිය පටිබද්ධිත (සම්බන්ධ වූ) ආරම්මණාශ්වාදය ද මෙසේ ම ය. එම ආශ්වාදාභිනිවේශය පවා නාම ධාතු මාත්‍රයක් පමණි. එම නාම ධර්මයන් එලෙසින් ජනිත කරවාලීමට පුබ්බභාග අයෝනිසෝමනසිකාර මූලික විපරීත සඤ්ඤාව (=මුලින් නුවණින් මෙනෙහි නො කළ) හේතු ප්‍රත්‍යය විය. මෙම විපරීත සඤ්ඤා සම්ප්‍රයුක්ත ඡන්දරාග විනිබද්ධ තණ්හාව දුක්ඛ-සමුදය සත්‍යය ය. මෙය සර්වප්‍රකාරයෙන් ම පහ කළ යුතු ය.

මේ ආදී නොයෙක් අයුරින් විදර්ශනා මනසිකාර පැවැත් වූ උන්වහන්සේ සංස්කාරයන් ත්‍රිලක්ෂණයට නඟමින් අනාගාමී මාර්ගයට පත්ව, කාමරාග පටිඝ යන සංයෝජන නැසූ සේක.

මෙම සංසාරයේ එක් මොහොතක් හෝ රැඳී සිටිය යුතු නොවේ. ශුද්ධාවාසයක[2] ඉපැදුන ද එහි ඇත්තේ ද නාම රූප සන්තතියක් පමණි. එම සන්තතිය ද කවදා හෝ සම්පූර්ණයෙන් ම නිරුද්ධ වන්නේ ය. එබැවින් ශුද්ධාවාසයක හෝ කුමක් නිසා ඉපැදිය යුතු ද ? නේවසඤ්ඤානාසඤ්ඤායතන වැනි අරූප ලෝකයක ඉපැදුන ද එය ද කවදා හෝ අනිත්‍යයට පත් වන්නේ ය. රූපාරූප සෑම භවයක් ම නිරර්ථක ය. කිසිම භවයක් රැඳී සිටිය යුතු තැන් නො වේ. මේ මොහොතේ ම රහත් වී මේ මොහොතේ ම පිරිනිවන් පෑමට ඇත්නම් එය ම අගනේ ය. හාත්පසින් ගිනිගෙන දැවෙන භවයක් ගැන කවර නම් අපේක්ෂාවක් ද ? කුමක් හෝ සංස්කාරයක් ඇති තැනක කවර නම් සුඛයක් ද ? සියළු දුක්ඛ අනුභවනය කරනු ලබන විඤ්ඤාණයේ නිරෝධය ම ශාන්ත වන්නේ ය. සියළු වට්ට දුක්ඛයන් නිවාලන විඤ්ඤාණ නිරෝධයෙහි අගය කෙසේ

1. සුබ ආශ්වාදයට ඇලෙමින්, එයටම තුටුවෙමින්, එයම අල්ලාගෙන දඟලීම
2. අනාගාමී අය පමණක් උපදින බ්‍රහ්ම ලෝක 5.

නම් සිතා නිම කරම් ද ? සංස්කාරයන් ගේ පැවැත්ම ම දුක ය. සංස්කාරයන් ගේ සම්පූර්ණ නැවැත්ම ම සුඛය ය.

මෙම පංචස්කන්ධ සංඛ්‍යාත සංස්කාර පිණ්ඩය කෙරෙහි කවර නම් මමායනයක් ද ? එහි ලා කුමකට නම් මානයක් ඇති කර ගනිම් ද ? අසූචි රාත්තල් 5-10 ක් පමණ ඇතැයි මානී වම් ද ? මුත්‍ර බෝතලයක් දෙකක් ඇත, වමන රාත්තල් 5-10 ක් ඇත, බඩවැල් යාර 10 ක් ඇත, සෙම් පාත්‍රයක් පමණ ඇත, ඇටකටු ගොඩක් ඇත, එම නිසා මානය ඇතිකර ගනිම් ද ? නිරුත්සක වූ පඨවි ආපෝ තේජෝ වායෝ යන ධාතූන් ගැන, පටිච්චසමුප්පන්නික නාම ධර්මයන් ගැන කවර නම් මානයක් ද ?

මේ මොහොතේ පවත්නා නාමයෝ මේ මොහොතේ ම නිරුද්ධ වෙත්. මේ ක්‍ෂණයේ පවත්නා රූපයෝ ද මේ මොහොතේ ම නිරුද්ධ වෙත්. එවිට මේ මොහොතේ සිටි 'මමයා' ඊළඟ ක්‍ෂණය වන විට නැත. 'මමයා' මේ මොහොතේ ම සම්පූර්ණයෙන් ම නිරුද්ධ විය. එසේ නම් කවර නම් මමෙක් ද ? මමයකු නැත්නම් කුමන නම් මානයක් ද ?

'මමයකු' ඇතැයි යන අස්මිමානය අවිජ්ජාව ය. එම අවිද්‍යාව නිසාම කුශලාකුශල සංස්කාර අභිසඞ්ඛරණය සිද්ධ ය[1]. මෙම අවිජ්ජාවත් කුශලාකුශල සංස්කාරත් ඇති විට, නාම රූප ධර්ම පවත්වා ගෙන යෑමේ අපේක්ෂාව ඇත. මමයා ඇතැයි යන හැඟීම නිසාම උපාදාන කිරීම ද සිද්ධ වේ. මේ ධර්මයන්ගේ පැවැත්ම ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ කරවාලීමේ ප්‍රත්‍යයන් ය.

අවිද්‍යාව නිසා රූපස්කන්ධය ද තණ්හා දිට්ඨි මාන වශයෙන් උපාදාන කෙරේ; වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ යන ස්කන්ධයන් ද උපාදාන කෙරේ.

මේ මොහොතේ ම නැතිවන රූපස්කන්ධය උපාදාන කරනු ලබන්නේ නාමස්කන්ධයකිනි. එම නාමස්කන්ධය ද ඒ මොහොතේ ම නිරුද්ධ වන්නේ ය. වේගයෙන් හමනා සුළඟක් දැත දිගුකොට බැඳීමට යන

1. භවයේ රඳා සිටුවීමට අවශ්‍ය කර්ම භව රැස්වීම සිදු වේ.

ප්‍රයත්නයකදී දෑත එක් කිරීමට පෙරම සුළඟ නිරුද්ධ වී ගොස් ඇත. එවිට කෙසේ නම් බදා ගන්න ද ? කුමක් නම් බදා ගන්න ද ? රූපස්කන්ධය උපාදාන කිරීමට යාම ද මෙසේ ම ය. කුමක් නම් උපාදාන කරන්නද ? කෙසේ නම් උපාදාන කරන්න ද ? යථාර්ථය නො දන්නා-අවිද්‍යාවෙන් ජනිත කරවාලන-මානසික සංකල්පනා මාත්‍රයක් වූ උපාදානය, අවිද්‍යාව නිසා මනසේ සටහන් වී ඇති කල්පනා මාත්‍රයක් විනා, සත්‍ය වශයෙන් ගැනීමට ඇති දෙයක් නො වේ. මෙම තත්වය භාවනාවෙන් ප්‍රත්‍යක්ෂාවබෝධ වන විට එය එක්තරා ශූන්‍ය (හිස්) දර්ශනයක් පමණක් ලෙසින් දිස් වේ. වේදනා ආදී සෙසු ස්කන්ධ උපාදානයන් ද මෙලෙස ම ය.

මෙලෙස 'මමයා' ඇතැයි යන අස්මිමානය නිරුද්ධ වූ කල, අවිජ්ජාව නිරෝධ වන්නේ ය. එවැන්නකු තුළ, හේතුන්ට අනුකූලව පහළ වන නාම රූප ඔහේ පහළවීමට හැර තිබෙනවා විනා, ජීවිතාපේක්ෂාව නම් වූ නාම රූප පවත්වා ගෙන යාමේ අභිලාශයක් නැත. ඔහුගේ ක්‍රියාවන් කායික වාචසික මානසික ක්‍රියා මාත්‍රයන් ම පමණි. එබැවින් සංස්කාර ජනිත වීමක් ද නො වේ. මරණයට පත්වන මොහොතේ පවා, නාම රූපයන්ම නිරුද්ධ වන බව දන්නා ඔහු තුළ ඒ ගැන තැකීමක් ද නැත. එබැවින් ඒ නිරෝධයෙන් සංසාරික මෙතෙක් දැල්වුණු ගිනි ජාලාව සදහට ම නිවී යනු ඇත. මෙලෙස අවිජ්ජා නිරෝධයෙන් ප්‍රතිසන්ධි නිරෝධය සිද්ධ වේ. මේ ආදී අයුරින් අස්මිමානය දුරු කරලමින්, නැවත ඉපැදීමක් නැති බව දකිමින්, අරහත්ත භාවය අධිගම කළ ඒ බෝසතාණෝ රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන සංයෝජන ධර්මයන් නැසූ සේක.

සංයෝජන ධර්මයන් අවිද්‍යමාන වීමෙන් නික්ලේශී ඒකචාරී භාවය අධිගම කොට, දෙවැන්නකු රහිතව ම ඒ පසේබුදුපියාණෝ බගවේණ අඟක් සේ ම එකලාව වැඩ විසූහ.

## ප්‍රහීණ සංයෝජන - ප්‍රත්‍යවේක්ෂාව

සංයෝජනයන් ප්‍රහීණ වී ගිය ආකාරය ප්‍රත්‍යවෙක්ෂා ඥාන තුළින් ඉතා පැහැදිලිව ම අත් දැකිය හැකි ය. විවිධ අයට විවිධ අයුරින් මෙය අත්දැකිය හැකි වන අතර, මෙහි දැක්වෙන්නේ එවන් එක්

ආකාරයක් පමණි.

**සක්කාය දිට්ඨි :-** මුළු සිරුර පුරා පැතිරී ඇති රූප කොටස් දූවිලි සේ වැටහී, ඒවා ඉතා වේගයෙන් ඇතිවෙමින් නැතිවෙමින් යන හැටි පළමුව තමාට ම ප්‍රත්‍යක්ෂ වේ. මේ රූප කොටස් බිඳෙන වේගය කොපමණදැ'යි සිතා ගැනීමට පවා නො හැකි තරම් ය. එතරම් වේගයෙන් බිඳී යන රූප කොටස් සෑම එකක් ම දකින්නේ සිතෙනි. එම සිතුවිලි එක් ක්ෂණයකදී කිව නො හැකි තරමක් ඇති වේ. එක් ක්ෂණයකදී සිතට පෙනී යන්නේ කොපමණ නම් කෝටි කෝටි ගණන් රූපද, එම රූප කොටස් දක්නා එපමණ ම කෝටි කෝටි ගණන් සිත් ද පහළ වේ. රූප බිඳෙන විට ම, එම රූපවල එල්ලී පැවැති සිත් ද බිඳ වැටේ. මේ නාම රූප දෙකේ ම මෙලෙසින් සිදුවන වේගවත් අනිත්‍යතාවය (ක්ෂණික නිරෝධය) බලමින් සිටින විට, එක කෙස් ගසක් පමණ ඉදිරියට ගත් මුළු ඇඟ ම, ඊළඟ කේස ගස ළඟට ගෙන යන විට සම්පූර්ණයෙන් ම නිරුද්ධ වන අතර, ඒ දුටු සිත් ද නිරුද්ධ වී යන හැටි ප්‍රත්‍යක්ෂ වේ. මෙවිට "මමයා" කියා ගැනීමට කිසිවකු ඉතිරි නො වන බව ප්‍රත්‍යක්ෂ වේ. "කෝ මේකෙ මමෙක් ?" යැයි වැටහෙන විට ම, මෙහි නිත්‍ය වශයෙන්, ධ්‍රැව වශයෙන්, සදාකාලික වශයෙන් පවත්නා ආත්මයක් නො මැති බව නැවත කිසි දිනක වෙනස් නො වන පරිදි ම හදවතේ කැවී යයි.

**විචිකිච්ඡා :-** ඉහත කී දර්ශනය ලබනවාත් සමඟම, නාම රූප දෙකේ නිරුද්ධ වී යාම ද පෙනේ. කිසිත් නැති ශූන්‍යතාවයක් මෙවිට හිතට වැටහේ. මේ ශූන්‍යතාවයත් අනිත්‍ය, අනාත්ම හා නිරෝධ වන බව දකින විට සිත නිවී යයි. මෙය නිර්වාණ නිරෝධ සත්‍යයයි. මෙවැනි ප්‍රත්‍යක්ෂ දැනීමක් ලබා ගත් විට නිවන් ගැන කවර නම් සැකයක් ද ? ඒ නිවන් මග පෙන්වා දුන් බුදුරදුන් ගැන කවර සැකයක් ඉතිරි වේ ද ? ඒ නිවන් දුටු සංඝ රත්නය කෙරෙහි කෙසේ නම් සැකයක් මතු ඇති වේ ද ?

පෙර සිදු වූනේත්, මේ ලෙසින් සිදු වූ නාම-රූප ඇතිවෙමින් නැතිවෙමින් යාම ය. දැන් සිදු වන්නේත් මෙය ය. මතුවට සිදු වන්නේත් මෙය ම ය. මෙලෙස වැටහී ගියවිට අතීත අනාගත පච්චුප්පන්න

කාලත්‍රය පිළිබඳව හා අජ්ඣත්තික බාහිර සත්ව ශරීර සඞ්ඛ්‍යාත හේතු-ඵල පරම්පරාවන් ගැන සැකයක් ඉතිරි නො වීම ගෙවී යේ.
මේ දක්වා ගමන් ගත් මාර්ගයෙන් අභිමතාර්ථ ප්‍රතිඵලය සිද්ධ වූ බැවින් ත්‍රි ශික්‍ෂාව කෙරෙහි ද සැකයක් ඉතිරි නො වේ.

**සීලබ්බත පරාමාශඃ** ඉහත කී විචිකිච්ඡාවත්, මෙම සීලබ්බතපරාමාශාවත් යන සංයෝජන දෙකෙහි ම ප්‍රහීණ වීම සිදු වන්නේ, නිරෝධ සත්‍යාවබෝධය ප්‍රත්‍යක්‍ෂ වීම නිසා ඉන් ජනිත කරලූ ප්‍රතිඵලයක් ලෙසිනි. සෝවාන් ඵල ප්‍රතිලාභයෙන් පසුව කිසි විටක අන් අයුරකින් විසුද්ධියක් ලබා ගැනීමට අදහසක් පහළ නො වේ. එය තමාට ම ප්‍රත්‍යක්‍ෂ ය. එය ඵල ප්‍රාප්තියෙන් සිදු වූ ප්‍රතිඵලයක් විනා, මාර්ග සිත පහළවන විට, සක්කාය දිට්ඨිය නැති වී යාම මෙන් ප්‍රත්‍යක්‍ෂ ලෙස දර්ශනය වන ධර්මයන් නො වේ.

**කාමරාග - පටිඝ සංයෝජන දෙක :** මේ සංයෝජන දෙක ම එකම වේදනාවේ පැති දෙකක් පමණි. කාමරාගයට විරුද්ධව පටික්කුලයත්, පටිඝයට විරුද්ධව මෛත්‍රියත් පුබ්බභාග පටිපදාවක් ලෙස වැඩුවත්, කාමරාග-පටිඝ යන දෙක නැති වන්නේ, පටික්කුල හා ශුභ යන ස්වභාවයන් දෙක ම සම්පූර්ණයෙන් ම නැති වී යාමෙනි.

ලස්සන රූපයක් දුටු විට, රූපයේ පාඩුවේ රූපය ඔහේ පවතී. සිත තුළින් ම එය ලස්සන ය, ලස්සන ය, හොඳ ය, පියකරු ය, ගැහැණියක් ය, තරුණියක් ය, යනාදී වශයෙන් නොයෙක් ආකාරයේ සඤ්ඤාවන් පහළ වේ. මෙය සංඥාස්කන්ධය යි. එම සංඥාවට අනුව, සුඛ වේදනාවක්ද සිත තුළ ම ඇති වේ. මෙය වේදනාස්කන්ධය යි. මේ සුඛ වේදනාව ම සිතින් උපාදාන කරගෙන, නොයෙක් ආකාරයේ කුශලාකුශල සිතුවිලි ජනිත කරවාලයි. මෙය සංස්කාර ස්කන්ධය යි. මේ සියල්ල ම සිදු වන්නේ සිත තුළ පවත්නා අවිද්‍යාව නිසා ය. රූපයේ පාඩුවේ රූපය ඔහේ පවතිත්දී, සිත විසින්ම සිතම අල්ලා ගෙන දඟලයි; බාහිර රූපයක් අල්ලා ගෙන නැත. අවිද්‍යාවෙන් බරවී ඇති සිතකට මෙය නො වැටහේ. එවිට වැටහෙන්නේ බාහිර වස්තූන් නිසා ම එය සිදු වන ලෙසිනි.

සතුරකු වැනි අප්‍රිය රූපයක් ඇසට ගැටුන විට, සිත එහි ගැටේ.

සිතට දොම්නසක් පටිඝයක් ඇති වේ. ලස්සන රූපය මෙන් ම අනිෂ්ට රූපය ද, රූපයේ පාඩුවේ ඔහේ පවතී. ගැටීම ඇති වුනේ කලින් කී සේ ම සිත තුළින් ම ය. සිතේ තිබෙන මෝඩකමට, එයට අනිෂ්ට සංඥාවක් ඇති කර ගෙන, එම සංඥාවෙන් දුක්ඛ වේදනාවක් උපදවා ගෙන, එම දුක්ඛ වේදනාව ම උපාදාන කර ගෙන නොයෙක් අකුශල සංස්කාර රැස් කර ගනී. සැබැවින් ම ගැටෙන්නේ බාහිර රූපයක් අල්ලා ගෙන නො ව, සිත සිත ම අල්ලා ගෙන ය. ගැටුනේ තමා ගේ ම සිතට ය. ඇලුනේ තමා ගේ ම සිතට ය. අවිද්‍යාවට මෙය නො පෙනේ.

ලස්සන කැත, ප්‍රිය අප්‍රිය ස්වභාවය පවතින්නේ සිතේ විනා බාහිර වස්තුවක නො වේ. එකම රූපය කෙනකුට මිහිරි දෙයකි. තව කෙනකුට අමිහිරි දෙයකි. මෙම ලස්සන කැත, ප්‍රිය අප්‍රිය ගතිය සිතින් ම, සිතේ තිබෙන අවිජ්ජාව නිසා ඇති කරගත් දෙයකි.

රූප මෙන් ම, ශබ්ද-ගන්ධ-රස-පොට්ඨබ්බ යන ධර්මයන්ට ද මෙය එකසේ ම පොදු ධර්මතාවයකි.

සිතින් ම නොයෙක් සංඥා ඇති කර ගෙන, සිතින් ම එම සංඥාවට අනුකූලව වේදනා ඇති කර ගෙන, සිතින් ම එය උපාදාන කර ගනිමින් නොයකුත් කායික-වාචසික-මානසික කුශලාකුශල සංස්කාරයන් ඇති කර ගෙන මෙතෙක් කල් දැඟලූ හැටි, ඒ නිසා ම මෙතෙක් කල් සසර ගින්නේ දැවි දැවී දුක් විඳි හැටි කොපමණ නම් මෝඩ ක්‍රියාවක් ද ?

මෙය සර්වප්‍රකාරයෙන්ම තමාට ම ප්‍රත්‍යක්ෂ වේ.

මෙය ප්‍රත්‍යක්ෂ වූ විගස ම, "මොන අන්දමේ රූප ශබ්ද ගන්ධ රස පොට්ඨබ්බ ධර්මයන් තිබුණත් වැඩක් නැහැ, දෙවඟනක් හිටියත් වැඩක් නැහැ, මේ බාහිර වස්තූන්වල රාගයක් පටිඝයක් නැහැ, තමාගේ ම සිතින්, තමාගේ ම සිත අල්ලා ගෙන තමාගේ ම සිතට යි කිපුනේ, තමාගේ ම සිතටයි ඇලුනේ, ඇලීම ඇතිවන්නේ සුඛ වේදනාවට, ගැටීම ඇතිවන්නේ දුක්ඛ වේදනාවට, ඇලුනත්, ගැටුනත්, කොයි වේදනාව ඇති වුනත් එය නැතිවී අනිත්‍යයට යනවා, මෙම

වේදනාව ඇතිවී නැතිවී යාම හැර එය විඳින්නකු නැහැ, එම වේදනාව විඳින "මමකු" කියා කෙනකු සිටිනවා යන වැරැදි අවබෝධය, මෝඩකම නිසා ම, ඒ වේදනාව උපාදාන කර ගෙන, එයින් සංස්කාර රැස් කර ගනිමින්, සසර දුකෙහි ම ගැලෙමින් මෙතෙක් කල් අනන්ත අප්‍රමාණ දුක් වින්දා, මේක කොච්චර මෝඩකමක් ද" ආදී ලෙසින් යථාභූත ඥානයක් පහළ වේ. මෙවිට බාහිර වස්තූන්ගෙන් සිත කැඩී ඉවත් වූවා සේ වෙන්වී යයි.

මෙම ප්‍රත්‍යාක්‍ෂාවබෝධය තුළින් තව දුරටත් භාවනාවේ යෙදන විට, තමාගේ ම රූපයත්, ඉන් බැහැර සජීව-අජීව සියළු දේවලුත්, කලින් ලත් අත්දැකීම් තව දුරටත් තීව්‍ර කරවමින්, පඨවි ආදී ධාතූන් ලෙසින් වැටහී, මුළු ලොවම ඉපිදි ඉපිදී බිඳ-බිඳී යන ධාතු ගොඩක් ලෙස වැටහේ. මෙය කලින් මාර්ග වලදී දුටුවේ තමාගේ ම රූපය කෙරෙහි පමණි. දැන් එය මුළු ලොව පුරා ම පැතිරී පවත්නා දර්ශනයක් වේ.

මෙය මැනවින් පිළිබිඹු වන විට ම, ගැහුණුන්-මිනිසුන්-දෙවියන්-බ්‍රහ්මයන්-භූතයන්-තිරිසනුන්-ගස්කොළන්-ගෙවල් දොරවල් ආදී මෙතෙක් කල් සිතින් ම සිතා සිටි, සැබෑ නො වන, ඒ සියළු සංඥාවන් ම නිරුද්ධ වේ. මේ සංඥා නිරෝධයත් සමඟම, සිතේ නිරුද්ධවීයාමත් ප්‍රත්‍යක්‍ෂ වේ. මෙවිට නාම-රූප නිරෝධයෙන් සිත නිවනට පත්ව විසංකාරගත වේ.

මේ තත්ත්වය විවිධාකාරයෙන් පසුව දැකිය හැකි ය.

උදාහරණයකට ලස්සන ගැහැණියක ගේ ශරීරයක් එක් පසෙකෙනුත්, තමාගේ ශරීරය මැදත්, මිනිසකු ගේ රූපයක් අනෙක් පැත්තෙත් තිබෙන ලෙසින් සිතින් සිතා ගෙන, ගැහැණිය ගේ හම ඉවත්කර එහි ඇතුළේ ඇති ජරා ගොඩ පසෙකට සිතින් දමන්න. මිනිසා ගේ සමත් ඉවත්කර එහි තුළ ඇති ජරා ගොඩත් කලින් ගැහැණියගේ ජරාගොඩට ම දමන්න. එවිට එහි ගැහැණියක, මිනිහෙක කියා දෙයක් නො මැති බව ප්‍රත්‍යක්‍ෂ වේ. දැන් තමා ගේ සමත් සිතින් ඉවත් කර, තම සිරුර තුළ ඇති ජරා ගොඩ කලින් ජරා ගොඩට ම දමන්න. දැන් ඒ ජරා ගොඩේ ගැහැණියක, මිනිහෙක, මමය කියා දෙයක් නැති බව වැටහේ. මතුපිට සමේ

මම-ගැහැණිය-මිනිහා යන හැඟීම තිබූ බව අවබෝධ වේ. දැන් ඒ සම් තුනත්, ඒ ජරා ගොඩට ම දමන්න. එහි මිනිහෙක් ය, ගැහැණියක් ය, මමෙක් ය, කියා දෙයක් නැති බව ප්‍රත්‍යක්‍ෂ වී සම්පූර්ණයෙන් ම සිත නිරුද්ධ වී නිවී යන ශූන්‍ය දර්ශනයෙන් පසු, එහි නිරෝධයත් දැකීමෙන් සිතට නිර්වාණය අරමුණු වේ. මෙය සිදු වන්නේ ගැහැණුන් මිනිසුන් ලස්සන කැත ආදී හිතා ගත් සංඥා නිරුද්ධ වී යාම කලින් දුටු අයකුට පමණි.

ලස්සන, කැත, ඇලීම, ගැටීම සියල්ල ම සිතින්ම සිතා ගත් දේ විනා, බාහිර දෙයක එවැන්නක් නැති බව ප්‍රත්‍යක්‍ෂ වී යාම දැකිය හැකි ක්‍රමයක් මෙසේ ය.

ඉතා ලස්සන කලින් දුටු ගැහැණියක ගේ රූපයක් ගැන සිතා ගෙන "ලස්සනයි ලස්සනයි" කියා එයම හිතන්න. අනාගමී මාර්ගයෙන් සමාධිය සම්පූර්ණව සිටින නිසා, මෙවිට එම රූපය, ජලයේ හෝ කැඩපතක දිස්වන පිළිබිඹුවක් සේ මොළයේ පැහැදිලිව ම පෙනී යයි. මෙම ඡායාව අවශ්‍ය නම් හදවතට වුවත් ගෙන යා හැකි ය. ඇත්තෙන් ම "නාම-රූප" යැයි මේ දක්වා ලියා ඇති සෑම තැනකම "රූප" වශයෙන් වැදගත් බවක් උසුලන්නේ මෙලෙස සිතට පෙනී යන රූප පමණි. සිතට පෙනී නො යන, මොනම රූපයකින්වත් වැඩක් නැත. සිත රූපයක් අල්ලා නො ගත් විට, ඒ රූප කෙතෙක් ලස්සන වුවත්, කැත වුවත්, සතුරන් වුවත්, මිතුරන් වුවත්, ගැහැණුන් වුවත්, මිනිසුන් වුවත්, කවරකු වුවත්, වැඩක් නැත.

උදාහරණයකට දැන් තමාගේ 'පිටුපස පැත්ත' ගැන සිතන්න. මේ සිත පහළ වීමට පෙර, පිට තිබුණ බව වත් සිත දන්නේ නැත. දැන් ශරීරයේ කලවා වැනි වෙනත් කවර කොටසක් ගැන හෝ සිතන්න. ඒ සිතන කොටස් තිබෙන බවවත්, සිතට වැටහෙන්නේ ඒ පිළිබඳව සිතක් ඇති වුවහොත් පමණි.

එවැනි සිතක් ඇති නො වූ සියළුම රූප-ශබ්ද-ගන්ධ-රස-පොට්ඨබ්බ-ධම්ම වල කිසිම වැදගත් බවක් නො මැත; කිසිම වැඩක් ද නැත.

දැන් කලින් සිතමින් සිටිය ගැහැණියගේ, හම සිතින් ගලවා, එහි තුළ ඇති බඩවැල්, අසූචි, ලේ මුත්‍ර ආදිය පිරී ඇති හැටි ගැන සිතන්න. එය ද පෙර සේම මෙවිට, පිළිඹිබුවක් සේ මොලයේ දිස් වේ. දැන් "කැතය-කැතය" කියා සිතන විට එයට අනුරූපව කැත පිළිබිඹුවක් දිස් වූ හැටිත්, "ලස්සනය, ලස්සනය" කියා සිතන විට එයට අනුකූල පරිදි ලස්සන පිළිබිඹුවක් දිස් වූ බවත් ප්‍රත්‍යක්‍ෂ වේ.

මේ දෙක ම සිතින් සිතා ගෙන සිටින දෙයක් විනා, සත්‍ය දේවල් නො වේ. ශුභ භාවය සත්‍යයක් නො වේ. පිළිකුල් ස්වභාවය ද සත්‍යය දෙයක් නො වේ. ඒවා සිතේ මවා ගැනීම් ය. ධාතු ගොඩවල් පඨවි-ආපෝ ආදී ධාතු ගොඩවල් ම ය. සිතින් ම ඒ ධාතු ගොඩවල් ගැහැණුන් මිනිසුන්, ලස්සන කැත ආදී ස්වභාවයන්ට පත් කරවන හැටි ප්‍රත්‍යක්‍ෂව ම වැටහෙන විට, කලින් සේ ම සංඥා නිරොධයෙන් සිදු වන විසංකාර ගත වීම සිදු වේ.

දැන් මීට පසුව, ලස්සන කැත, ආදී හැඟීම් සියල්ල ම සිතේ ම මායාවක් බව වැටහී යාම නිසා, ඕනෑම කැත දෙයක් දෙස සිතට කිසිම කැතක් නො මැතිව බලා ගෙන සිටිය හැකි ය. මෙලෙස ම ඕනෑම ලස්සන දෙයක් දෙස කිසිම ආශ්වාදයකින් තොරව බලා සිටිය හැකි ය. මෙය බුදුරදුන් මෙලෙස වදාරා ඇත. **"සචේ ආකඞ්ඛෙය්‍ය පටික්කූලේ අප්පටික්කූල සඤ්ඤී විහරෙය්‍ය, අප්පටික්කූල සඤ්ඤී තත්ථ විහරති"** - ඉදින් පිළිකුල් දෙයෙහි, පිළිකුල් නො මැති ලෙසින් සිටීමට අභිමත නම්, පිළිකුල් දෙයෙහි පිළිකුලක් නො මැතිව වෙසේ.

## අර්හත් මගින් ප්‍රහීණ වන සංයෝජන.

**රූපරාග :** පංචස්කන්ධයේ විශේෂයෙන් ම රූප ස්කන්ධයේ ආදීනව, සර්වප්‍රකාරයෙන් ම කිසිදු අඩුවක් නො මැතිව සිද්ධ වූ විට පමණක් රූපරාගය නැත්තට ම නැතිවී යනු ඇත.

"ලබන ආත්මයේ සම්මා සම්බුද්ධත්වයට පත් වුනත් වැඩක් නැහැ. මේ දුක් ගිනි ජාලාව වූ නාම-රූප දෙකක් පවතින බුද්ධත්වයකින් මට මොන වැඩක් ද ? ලබන ආත්මයේ තබා තව අවුරුදු 5 කින්

10 කින් ලැබෙන සම්මා සම්බුද්ධත්වයටත් වඩා, දැන් සිදුවන මේ ගිනි ජාලාවේ නිවී යාම ම හොඳයි. දැන් රහත් වී මේ මොහොතේ ම පිරිනිවන් පාන්නට තිබෙනවා නම් හොඳයි. එකම ක්ෂණයක්වත් භවයේ සිටීමට අවශ්‍ය නැහැ." මේ ආදී ලෙසින් තමාගේ හදවත තුළින් ම ඉතා තියුණු ලෙසින් මෙය මතුවී එනු ඇත. දුක්ඛ සත්‍යයේ මෙයින් එහාට අවබෝධ වීමට දෙයක් නැත.

මෙම අවබෝධයෙන් පසුව දිගටම භාවනාවේ යෙදෙන විට, භාවනාවට නගමින් සිටිනා තම ශරීරයේ රූප කොටස් ක්‍රමයෙන් දියවී දියවී යන හැටි ප්‍රත්‍යක්ෂ වේ. ඊට පසු මේ දියවී යාම මුළු විශ්වයට ම පැතිරී මුළු විශ්වය ම දියවී යයි. ඊළඟට මේ දියවී යාම දුටු සිතත් දියවී දියවී යන අයුරු ප්‍රත්‍යක්ෂ වේ. මෙවිට සර්ව සම්පූර්ණ විශ්ව-ශූන්‍යතා දර්ශනයක් සිතට පෙනී යනු ඇත.

මෙම දියවී යාම, කලින් අනාගාමී මාර්ගයෙන් දුටු දර්ශනයට වඩා ඉතා ගැඹුරු ශූන්‍යතා දර්ශනයකි. කලින් දුටුවේ, නිමි නිමී දැල්වී දැල්වී යන බල්බ් වැලක් සේ, ඉපිද ඉපිදී බිඳි-බිඳී යන නාම-රූපයන් ය. මෙහිදී දකින්නේ ඉතා දිග බල්බ් වැලක, මුල් මුල් බල්බ් එක පිළිවෙළින් දැල්වී, නැවත නො දැල්වෙන සේ නිවී යාමේදී ඒ නිවී ගිය බල්බ් තිබූ කොටසේ පවත්නා කිසිත් නැති "අහස" දැකීම වැනි ශූන්‍යතා දර්ශනයකි.

මෙයින් පසු "රූප-නිමිත්ත" සර්ව සම්පූර්ණයෙන් ම නිරුද්ධ වේ. ඇස් දෙක පියා ගෙන අත දෙස හිතින් බලන විට ඒ අතේ සටහන සිතට පෙනේ. මේ ආදී ලෙසට සිතට පෙනෙන රූප සටහනට "රූප-නිමිත්ත" යැයි මෙහි ලියා ඇත. මෙවිට සිතට පෙනී යන සියළු රූප නිමිති නිරුද්ධ වී ගොස් සර්ව සම්පූර්ණ විශ්ව ශූන්‍යතාවයක් සිතට ප්‍රත්‍යක්ෂ වේ.

මෙය ආකිඤ්චඤ්ඤායතන තුන්වන අරූපාවචර ධ්‍යාන සිතට බොහෝ දුරට සමාන ය. නො මැති නම් ආකාසානඤ්චායතන පළමු අරූපාවචර ධ්‍යාන සිතට සමාන ය.

මේ පිළිබඳව සැකයක් ඇති කෙනෙක් ඇත්නම්, මජ්ඣිම නිකායේ

ආනෙඤ්ජ සප්පාය සූත්‍රය බලත්වා. (මෙම විස්තරයේ අවසානය බලන්න).

අටුවා ආදී පොත් වල දක්වා ඇති පරිදි "රූපරාගය යනු රූපාවචර බ්‍රහ්ම ලෝකවල සිටීමට පවත්නා රාගය යැ"යි කියන කියමනට වඩා මෙය ඉන් එහා ඇති ඉතා ගැඹුරු දර්ශනයකි. මෙයින් පසුව ඕනෑම අවස්ථාවක "රූපරාගය නැතිවී ගිය හැටි පෙනේවා"යි සිතූ විගසම "ශරීර නිමිත්ත" සිතට නො පෙනී ගොස් ශරීරය හිස් අහස්-සෙවනැල්ලක් මෙන් දිස් වේ. අවශ්‍ය නම්, ශරීරයේ එක් කොටසක් පමණක් වුව ද මෙලස සෙවනැලලක් සේ දැකීමට ද හැකි ය.

**අරූපරාගය** :- මෙය ප්‍රත්‍යවේක්ෂා කරන විට, කලින් බලමින් සිටි "අරූප සිත" ද නිරුද්ධ වී යාම සිතට පෙනී, සිතට නිවන අරමුණු වේ. මෙයද, "අරූපරාගය යනු අරූපාවචර බ්‍රහ්ම ලෝකවල සිටීමේ කැමැත්ත ය" යන කියමනට වඩා ඉන් එහා ඇති ඉතා ගැඹුරු සත්‍ය දර්ශනයකි. කිසිඳු ධ්‍යානයක් නො ලබා හෝ කිසිඳු ධ්‍යානයක් පාදක කර නො ගෙන හෝ ශුෂ්ක විදර්ශකයකු වශයෙන් භාවනා කරන කෙනකු වුව ද, රහත් වනනේ අරූපාවචර ධ්‍යානයකට සිත පත් වූ පසුව ය. අනාගාමී මාර්ග ඵල ප්‍රතිලාභයෙන් සිතේ සමාධිය ස්ථාපිත වී ඇති නිසා, මෙය පුදුම විය යුත්තක් නො වේ. මෙය සමහර විට ඔබ නො පිළිගන්නවා ඇති. එහෙත් සත්‍යය එය යි. එසේ නො මැති නම්, රූපරාග-අරූපරාග යන දෙක ම සිඳී යන්නේ නැත. රූපය ඉක්ම වීමෙන් රූපරාගයත්, අරූපය ඉක්ම වීමෙන් අරූපරාගයත් අපරිශේෂ පරිදි ම නිරුද්ධ වේ.

**මාන** :- කලින් කී සර්ව සම්පූර්ණ විශ්ව ශූන්‍යතා දර්ශනයෙන් ම "මමයා" සම්පූර්ණයෙන් ම කිසිවක් ඉතිරි නොවී දියැවී යාම දුටු විට, අස්මිමානය සම්පූර්ණයෙන් ම නිරුද්ධ වේ. මෙය කලින් දුටු ස්ථිර-ධ්‍රැව-සදාකාලික ආත්මයක් නො මැති බව දන්නා සක්කාය දිට්ඨි ප්‍රහාණයට වඩා, "මමයා" සර්ව සම්පූර්ණයෙන් ම කිසිවක් ම ශේෂ නො වී දියැවී ගොස්, අහස බඳු සෙවනැල්ලක් බවට පරිවර්තනය කරනු ලබන ප්‍රත්‍යක්ෂාවබෝධ දර්ශනයකි.

**උද්ධච්චය** :- අර්හත් මගින් නැතිවන උද්ධච්චය පොත්වල දක්වා

ඇති "සිතේ නො විසුරුණු, අළු ගොඩකට ගලක් ගැසුවා වගේ පවත්නා තත්වය" නො ව, කිසිඳු සිතක් ඇති නො වී, කිසිම අරමුණක නො එල්ලී, ඉපැදීමක් බිඳීමක් නො මැතිව නිසල වී ගිය දැනීම් මාත්‍රයක් පමණක් ඉතිරි වී යාමකි. උද්ධච්චය නැතිවී යාම ප්‍රත්‍යවේක්ෂා කරන විට ම මෙම තත්වය උදා වේ. **"චේතෝ විමුත්තිං පඤ්ඤා විමුත්තිං දිට්ඨෙව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති"** යන දේශනාවේ 'චෙතෝ විමුත්තිය' යනුවෙන් දක්වා ඇත්තේ මේ ස්වභාවය ය.

එහි ඇති පඤ්ඤා විමුත්තිය බැලීමට අවශ්‍ය නම්, "පඤ්ඤා විමුත්තිය පෙනේවා"යි අධිෂ්ඨාන කොට සිත දෙස බලා සිටින්න. පළමුව චෙතෝ විමුත්තිය පෙනී, එයත් අනිත්‍ය සංස්කාර ධර්මයක්, අනාත්ම ධර්මයක් යන්න වැටහී එම චෙතෝ විමුත්තියත් නිරුද්ධ වී යාමෙන් දක්නා පඤ්ඤා විමුත්තිය මෙවිට සිතට ප්‍රත්‍යක්ෂ වේ.

**අවිජ්ජා** :- ලෞකික සුඛයේ ඉමිහිරිම රසය ලබා දෙන ස්වභාවය දක්නා මෙම ප්‍රත්‍යවේක්ෂාව ඉතා සාත සහගත අවස්ථාවකි. මෙය ප්‍රත්‍යවේක්ෂා කරන විට ම, සිත භවාංග ගත වේ. එනම් ප්‍රතිසන්ධි විඥානයට සිත පත් වේ. මනුෂ්‍ය ප්‍රතිසන්ධි අවස්ථාවේ දී ඇස් කන් නාසා ආදී කිසිඳු ඉන්ද්‍රියක් නො මැති නිසා, ඒ ඉන්ද්‍රියන් සම්බන්ධ කිසිඳු සිතක් ඇති නොවී පවත්නා නිසල ශාන්ත මනෝද්වාරික සිතක් පමණක් ඇති වේ. මෙම තත්වය දැන් මෙහි දී උදා වේ. සිහින නො පෙනෙන ඉතා ගැඹුරු නින්දකට පත්වී සිටින කෙනකුට එම තත්වය දැනෙන ස්වභාවයක් ඇත් නම්, අන්න එවැනි තත්වයකි. මුළු විශ්වය ම නො පෙනී යන, කිසිවක් නැති ගැඹුරු දැනීම් මාත්‍රයකි.

මේ තත්වයෙන් පසු අවිද්‍යාව නිරුද්ධ වී යන ආකාරය නොයෙක් ආකාරයෙන් බැලිය හැකි ය. අර්හත් මාර්ගයෙන් එක් අයුරකින් පමණක් පෙනී යන මෙය, ප්‍රත්‍යවේක්ෂා ඥාන තුළින් විවිධාකාරයෙන් අත්දැකිය හැකි ය.

උදාහරණයකට :- "මේ භවාංග සිත එල්ලුනේ බාහිර ගැහැණියකගේ හා මිනිහකු ගේ ශුක්‍ර ධාතු ටිකක යි. ඒ බාහිර ධාතු පවා එදා 'මම'

'මගේ' කියා ගත්තා නේ ද ? බාහිර ධාතු 'මම' 'මගේ' යැයි ගැනීම කොතරම් මෝඩකමක් ද ? ඒ භවාංග සිතට අනතුරුව ම ඇති වන සිත් වලින්, මෙය 'මම ය' 'මගේ ය' කියා ආශා ඇති වුනා නේ ද ? මේ තරම් ගිනි ජාලාවක් පවත්වා ගෙන යනු ලබන මූල බීජය බඳු මේ ගිනි ජාලාව දල්වන්නාට ඇලීම, ඇලුම් කිරීම කෙතරම් මෝඩ ද ? මේ ගිනි ජාලාවේ, මෙම චිත්ත පරම්පරාවේ පැවැත්ම ම දුක යි, එහි නැවැත්ම ම සුඛ යි. එහෙත් මේ ගිනි ජාලාව පවත්වා ගෙන යන්න ආශා කිරීම (භවාශාව) කොපමණ මෝඩ කමක් ද ? මේ සිත ඉපිදී නැතිවුනා. ඒ නැතිව ගිය දෙයකට ආශා කළාට මොනවාද ඉතිරි වී ගියේ. නැතිවී ගිය දෙයකට ආශා කිරීම කොච්චර මෝඩකමක් ද ? මේවා නො තේරීම නිසා නේද එයට ආශා කළේ. මේ සියල්ලම නුදුටු අවිද්‍යාව මෙන්න" කියා ප්‍රත්‍යක්ෂව පෙනී යන විට ම පහනක් නිවී යන්නා සේ අවිද්‍යාව නිවී යාම ප්‍රත්‍යක්ෂ වේ. නිවනට සිත පත් වේ.

අති ගැඹුරු සමාධිමත් ස්ථාවර භාවයන් උසුලන මේ අවස්ථාවේදී භවාංග සිතේ පැවැත්ම ද දකිමින් මේ යට කී සිතිවිලිද ඥාණ වශයෙන් පහළ වී යාම දැකිය හැකි ය.

තවත් උදාහරණයකට :- "මේ භවාංග සිත පහළ වුනේ, අතීත භවයේ මරණ මොහොතේ සිහි වූ කර්මය නිසයි. ඒ කර්මය ඒ ජීවිතය නැතිවී යාමටත් පෙරදීම නිරුද්ධ වී ගියා. අතීත භවයේදී චුතියට පත් වූයේ ඒ භවයේ භවාංග සිතයි. ඒ භවයත් නිරුද්ධයි, ඒ කර්මයත් නිරුද්ධයි, ඒ භවාංග සිතත් නිරුද්ධයි. මොනවද ඉතිරි වුනේ. සම්පූර්ණ හිස්.

එදා මේ ගිනි ජාලාව පවත්වා ගෙන යාමේ භව ආශාව තිබුණා. මේ ගිනි ජාලාව 'මම' කියා ගත්තා. එසේ එදා ගැනීම නිසා, අද මේ ගිනි ජාලාව දැල්වෙනවා. ගින්න, ගින්න ලෙසින් ම නො ගත් එක කොච්චර මෝඩකමක් ද ? එදා ඒ මෝඩකම නො තිබුණා නම්, අද කවුද ඉන්නේ ?" මෙය ප්‍රත්‍යක්ෂව ම පෙනී යන විට, සියල්ල ම නිවී ගොස් සිත නිවනට පත් වේ.

තවත් උදාහරණයකට :- මේ මහා ගිනි ජාලාව පැවතී ගෙන යන්නේ මේ භවාංග සිත නිසා නේද ? එවිට මේ දුක් ගොඩ ඵලය යි.

භවාංගය හේතුව යි.

මේ භවාංග සිත පවතින්නේ අතීත භවයේ සිදු වූ ප්‍රතිසන්ධිජනක කර්ම විපාක ශක්තිය නිසා නේද ? එවිට භවාංග සිත ඵලය යි. කර්මය හේතුව යි.

ඒ කර්මය සිදු කළේ ඇයි ? අවිද්‍යාව නිසා නොවේ ද ? එවිට කර්මය ඵලය යි. අවිද්‍යාව හේතුව යි.

අවිද්‍යාව ඇතිවූයේ ඇයි ? මම මගේ ලෙසින් ගත් අස්මිමානය නිසයි. එවිට අවිජ්ජාව ඵලය යි. අස්මිමානය හේතුව යි.

ඒ අස්මිමානය ඇති වූයේ ඇයි ? අවිජ්ජාව නිසා නේද ? එවිට අස්මිමානය ඵලය යි, අවිජ්ජාව හේතුව යි.
මෙසේ හේතුව ඵලය වෙමින්, ඵලය නැවත හේතුව වෙමින් අවිජ්ජා මූලයට ම මෙය පරාවර්තනය වේ. මේ ප්‍රත්‍යක්‍ෂව ම පෙනී යන විට ම, සිත නාම-රූප නිරෝධයට පත් වේ.

පටිච්ච සමුප්පාදය නොයෙක් ආකාරයෙන් වැටහේ. මෙය ඉන් එක් ආකාරයකි. කොයි ආකාරයෙන් එය වැටහුනත්, අවිජ්ජාවේ මූලයට ම නැවත නැවතත් පරාවර්තනය වීම දැකිය හැකි ය.
අවිජ්ජා නිරෝධයෙන් පසුව **'අකුප්පා චෙතෝ විමුත්තිය'** යැයි දැක්වෙන විමුත්ත සිත උදා වේ. ඒ විමුත්ත සිත ඇති වූ විගස ම මේ පංචස්කන්ධය කොටස් දෙකක් බවට පත්වේ. එනම්,
(i) නො ඉපදී, නිරුද්ධ නො වී, අඛණ්ඩ ලෙස ම දිව යන දැනීම් මාත්‍රයක් ඇති වේ. ඒ දැනීම් මාත්‍රය එකකි.
(ii) ඒ දැනීම් මාත්‍රය එලෙස ම පවතිද්දී, එයට මතු පිටින් ඇස් කන් ආදී ඉන්ද්‍රියන්ට ගොදුරු වන අරමුණු අනුව, සිත් ඇති වෙමින් නැති වේ. මෙය වෙනත් එකකි.

මේ නො වෙනස්ව අඛණ්ඩ ලෙස පවත්නා විමුත්ත සිත හදවතින් පිටතට නො යයි. එහි කිසිම අරමුණක් නැත. අරමුණක් නො මැතිව සිතක් නො පවතී යන අභිධර්මයේ දැක්වෙන සම්ප්‍රදායික සිද්ධාන්තය ඉක්මවා ගිය තත්වයකි මේ. මේ ගැන සැකයක් ඇත් නම් අලගද්දූපම

සූත්‍රයේ (මජ්ඣිම නිකාය) දැක්වෙන මේ පාඨය ගැන සිතන්න.

**"එවං විමුත්ත චිත්තං වො භික්ඛවෙ භික්ඛුං සඉන්දා දේවා සබ්‍රහ්මකා සපජාපතිකා අන්වේසං නාධිගච්ඡන්ති ඉදං නිස්සිතං තථාගතස්ස විඤ්ඤාණන්"ති.**

මෙහි සිංහල අනුවාදය දක්වා ඇත්තේ මෙසේය :- "මහණෙනි, මෙසේ මිදුණ සිත් ඇති මහණහු, ශක්‍රයා සහිත, මාරයා සහිත, බ්‍රහ්මයා සහිත, දෙවියෝ සොයන්නාහු නමුත්, තථාගතයා ගේ නොහොත් රහතන් වහන්සේ ගේ විඥානය මේ අරමුණු ඇසුරු කොට පවතී' යැයි දැන නො ගනිත්."

මේ විමුත්ත සිත කිසිම අරමුණක නො එල්ලී තනිව ම, හුදකලාව ම, එකලාව ම, කේවලීව පවතී. ඇඟට මොන අන්දමේ දරුණු වේදනාවක් දැනුනත්, මෙය එලෙස ම නො වෙනස්ව පවතී. වේදනාව ඇල්ලීමට මේ සිත යන්නේ නැත. බාහිර ලෝකයේ කිසිවකු හෝ කිසිවක් ගැන කිසිම බැඳීමක් නො මැතිව වෙන්ව ම පවතී. අභ්‍යන්තර තමාගේ පංචස්කන්ධය කෙරෙහි ද නො බැඳී වෙන්ව ම පවතී. අවශ්‍ය නම් කිසිවක් නො සිතා දිගට ම මේ සිතින් ම සිටිය හැකි ය. අවශ්‍ය නම් මෙයට මතුපිටින් පවත්නා සිතින් කථාබහ ආදිය කළ හැකි ය. කිසිම දුකක් මෙයට නො දැනේ. එහි කිසිම සංඥාවක් ද නො මැත. තුන් ලොව ම අතහැර දමා, හුදු දැනීම් මාත්‍රයක් ලෙසින් අඛණ්ඩ ලෙස පවත්නා මේ සිත හුදකලාව ම හැසිරෙන බැවින් 'ඒකචාරී ය'. කොපමණ ඈත කැලයක තනිව ම සිටියත්, මේ සිත නො මැති නම් එය සැබෑ ඒකචාරී බවක් නො වේ. මිනිසුන් ලක්ෂ කෝටි ගණනක් මධ්‍යයේ සිටියත්, විසංයුත්තව ම පවත්නා මේ සිත වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ඒකචාරී භාවය උසුලයි. එය ලොව්තුරු හුදකලාවකි.

අවිජ්ජා නිරුද්ධ වීමෙන් චිත්ත සඞ්ඛාර නිරෝධ වේ (අවිජ්ජා නිරෝධා, සඞ්ඛාර නිරෝධෝ) කියන්නේ මේ තත්වයට යි.

මේ සිත මෙලෙස අඛණ්ඩව පවත්නේ අතීත භවයේ සිදු කළ කර්මයේ විපාක ශක්තිය තවමත් ඇති බැවිනි. එම අතීත භවයේ

සිදු කළ කර්ම විපාක ශක්තිය ද මොහොතක් පාසා දැන් ගෙවෙමින් පවතී. මරණ මොහොතේ දී ඒ කර්ම විපාක ශක්තිය සම්පූර්ණයෙන් ම කිසිවක් ශේෂ නො වී ම නිරුද්ධ වේ.

අවිජ්ජා නිරෝධයෙන් චිත්ත සඞ්ඛාර නිරෝධයට පත්ව ඇති බැවින් අනාගත ප්‍රතිසන්ධි විඥානයන් ද පහළ නො වේ. එවිට මේ දැන් පවත්නා කර්ම විපාක ශක්තියත් නිරුද්ධ ය. අනාගත කර්ම ඇතිවීමක් ද නැත. සියළු ම කර්ම ශක්තීන් ක්‍ෂය වී යනු ඇත. මේ කර්මක්‍ෂය තත්වය ප්‍රත්‍යක්‍ෂව ම අවබෝධ වන විට, කිසිවක් ම ඉතිරි නො වී සම්පූර්ණයෙන් ම නිරුද්ධ වී යන පරම කෝටික ශුන්‍යතා දර්ශනයක් අත් දැකිය හැකි ය. එය අනුපාදිසේස නිර්වාණ ධාතුව මෙලොවදී ම තරමකට හෝ අත් දකින ආකාරය යි.

මේ දර්ශනයත් සමඟ ම හදවත තුළින් ඉබේම මෙය නික්මෙනු ඇත. "**ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තයාති**" ජාතිය ක්‍ෂය විය. බ්‍රහ්මචාරී දිවිය බැස නිම කොට ඇත. මෙයින් එහාට කිරීමට දෙයක් නො මැත. "**විමුත්තස්මිං විමුත්තමිති පජානාති**" සම්පූර්ණ වශයෙන් ම විමුත්ත වූ විට, එසේ විමුත්ත වී ඇති බව දැන ගනී.

සත්‍යය වශයෙන් ම දුක කියන්නේ, රහත් චුති සිතින් මෙහා පවත්නා සියල්ල ම ය. සැබෑ දුක්ඛ නිරෝධ වන්නේ රහත් චුති සිතින් පසු තත්වය යි.

විමුත්ත සිතත් සංස්කාර නාම මාත්‍රයකි. නිවන නොවේ. එය ද නින්දට ගිය විට නො තේරේ. එනම් එය ද අනිත්‍යය ය. චුතියෙන් සම්පූර්ණයෙන් ම නිරුද්ධ වී යන බැවින් ද (**විඤ්ඤාණං අත්ථමාගමා**) අනිත්‍යය ය. කෙතෙක් ඵල සමවතකට සම වදිමින් නිවන් රස වින්දත්, ඒ ඵල සමවතින් පසුව එය නැත. එය ද එබැවින් අනිත්‍යයය. නිරෝධ සමාපත්තියන් වුව ද පවත්තේ ඒ කාලයට පමණි.

යමක් අනිත්‍ය නම්, එය සැබෑ සැපක්, සදාකාලික සැපක් ලෙස ගැනීම නුසුදුසු ය.

**'යදනිච්චං තං දුක්ඛං'** යමක් අනිත්‍ය නම් එය දුකය යන්න මෙහි අදහස යි.

මේ නිසා සදාකාලික නිර්වාණ සුවය යනු රහතන් වහන්සේ ගේ පරිනිර්වාණයෙන් පසුව ඇති තත්වයකි. ඉන් මෙහා සියල්ල ම දුක්ඛ සත්‍යය වේ. සැබෑ දුක්ඛ නිරෝධය කියන්නේ රහත් චුති සිතින් පසු තත්වය යි.

මේ තත්වයට පත් නො වූ කිසිවකු මෙය නො පිළිගනු ඇත. එහෙත් සත්‍යය එය යි.

දුකක් ම පවතී. දුකක් ම නිරෝධ වේ. වෙන දෙයක් නො මැත. අනුපාදිශේෂ නිර්වාණ ධාතුව මෙලොව දී ම, තරමක් දුරට හෝ, අත්දැකිය හැකි වන්නේ මෙය ප්‍රත්‍යක්ෂ වූ කෙනකුට පමණි.

මෙසේ සංයෝජනයන් නසා, ඒ නැසූ සංයෝජනයන් සම්පූර්ණයෙන් ම නැසූ බව ප්‍රත්‍යවෙක්ෂා ඥාන තුළින් ඒකාන්ත ලෙසම දැන ගෙන, විමුත්ත-විසංයුත්ත-ඒකචාරී-අකුප්පා චෙතෝ විමුත්තියෙන් සමන්නාගතව, ඒ පසේබුදුපියාණෝ වැඩ හුන්හ.

*මජ්ඣිම නිකාය* - ආනෙඤ්ජ සප්පාය සූත්‍රයේ දැක්වෙන පාඨයක්. (1) **"පුනචපරං භික්ඛවේ අරියසාවකෝ අරඤ්ඤගතෝවා රුක්ඛමූලගතෝවා, සුඤ්ඤාගාරගතෝවා, ඉති පටිසඤ්චික්ඛති "සුඤ්ඤමිදං අත්තේනවා අත්තනියේනවා"ති. තස්ස එවං පටිපන්නස්ස තබ්බහුල විහාරිනෝ ආයතනේ චිත්තං පසීදති, සම්පසාදේ සති ඒතරහි වා ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජති, පඤ්ඤාය වා, අධිමුච්චති ....**

*සිංහල අනුවාදය* : යළිදු මහණෙනි, ආර්ය ශ්‍රාවක අරණ්‍යයට ගියේ වේවයි, වෘක්ෂ මූලයට ගියේ වේවයි, ශූන්‍යාගාරයට ගියේ වේවයි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරයි. මේ පංචස්කන්ධය (මම ය, මගේ ය) යන ආත්මයෙන් ද ආත්මනීය භාවයෙන් ද ශූන්‍ය වේ. මෙසේ පිළිපන් මේ ශූන්‍ය ප්‍රතිපදාව බහුලකොට වෙසෙන ඔහුගේ සිත ආයතනයේ පහදී.

සම්ප්‍රසාදය ඇති කල්හි ඉහාත්මයෙහිම (මෙම ආත්මයෙහි ම) රහත් බව හෝ ප්‍රත්‍යක්ෂ කරයි. ආකිඤ්චඤ්ඤායතන සමවතට හෝ සමවදී."

(2) "**සුනබපරං -පෙ- ඉති පටිසඤ්චික්ඛති නච මම ක්වචිනි. කිස්මිචි කිඤ්චනත්ථාති. තස්ස එවං -පෙ- අධිමුච්චති.** තවද මහණෙනි, අරියශ්‍රාවක මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරයි. මම කිසි තැනක් හි ආත්මය ඇතියෙම් නො වෙමි. කිසි අනෙක් අයට පළිබෝධ ඇතියෙම් නො වෙමි. කිසි තැනක් හි මෙරමාගෙ (අන් අයගේ) ආත්මය ද නොද දක්මි. කිසි තැනක් හි මගේ පළිබෝධාවන් නැතැ'යි. මෙසේ පිළිපන් මේ ප්‍රතිපදාව බහුල කොට වෙසෙන ඔහුගේ සිත ආයතනයේ පහදී. සම්ප්‍රසාදය ඇති කල්හි, ඉහාත්මයෙහි ම රහත් බව හෝ ප්‍රත්‍යක්ෂ කරයි, ආකිඤ්චඤ්ඤායතන සමවතට හෝ සමවදී..." (බුද්ධ ජයන්ති ප්‍රකාශන - මජ්ඣිම නිකාය).

*සැළකිය යුතුයි :-*
(මෙතැන් සිට දක්වා ඇති ගාථාවන්හි දැක්වෙන්නේ ඒ ඒ ගාථාවල අන්තර්ගත මුඛ්‍යාර්ථය හා එම අර්ථ හඳුන්වාදීම් මාත්‍රයක් පමණි. විස්තරයක් දක්වා නැත).

## ගාථා අංක 29

**ඔක්ඛිත්ත චක්ඛු න ච පාදලෝලො**
**ගුත්තින්ද්‍රියෝ රක්ඛිත මානසානෝ**
**අනවස්සුතෝ අපරිඩය්හමානෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

චක්ඛුලෝල නම් බ්‍රහ්මදත්ත රජ නාට්‍යාංගනාවන් ගේ රැඟුම් දකිමින්

තුටු වන විට, පරඹුවන් කෙරෙහි ලොල් බවක් ඇති වූ කල්හි, එයට නිගාකර, තණ්හාවේ දෝෂ දැක, පැවිදි ව පසේබුද්ධත්වයට පත්ව ගැයූ ප්‍රීති වාක්‍යය මෙම ගාථාවෙන් දැක් වේ.

**පහතට හෙලූ ඇස් ඇති, දස්සනකාමී, ගමනෙහි ලොල් නො වූ ආරක්ෂිත චක්ඛාදී ඉන්ද්‍රියන් ඇති, සංවුත (සංවර වූ) මනසකින් හෙබි, රාගාදී ක්ලේශයන් ගෙන් තෙත් නො වී, පරිළාහයෙන් නො දැවෙමින්, ඛගවේණ අඟක් සේ ඒකචාරීව හැසිරේ** යන්න මෙහි කෙටි අදහස යි.

පැවිද්දන් විසින්, ගාම නගරයන්ට පිවිසෙන කල සංවුතව යා යුතු ය. ඇස්-ඇත්-රථ-පාබල-පුරිස-ඉත්ථි-වීථි-සාප්පු-උඩ-යට-බොහෝ ඈත - හා නා නා දෙස නො බලමින් පහතට හෙලූ ඇස් ඇතිව යා යුතු ය. ඇසින් රූප දැක නිමිති අනුනිමිති ශුභ සුබ ආදී වශයෙන් ප්‍රමාණ කිරීම් නො කළ යුතු ය. නැටුම්-ගැයුම්-වැයුම් ආදිය බැලීමට නො යා යුතු ය. හේතුවක් නො මැතිව දස්සන කාමයෙන් යුතුව ආරාමයෙන් ආරාමයට, විහාරයෙන් විහාරයට, ග්‍රාමයෙන් ග්‍රාමයට, නගරයෙන් නගරයට, ජනපදයෙන් ජනපදයට, රටින් රටට නො යා යුතු ය. දර්ශන කාමයෙන් යුතුව, වංචනික ධර්මයන්ගේ ක්‍රියාකාරී ස්වභාවය අවබෝධ කොට නො ගෙන, විහාර-ප්‍රාසාද-ගුහා-ලෙන්-කුටි-උපට්ඨාන ශාලා-රුක්ඛ මූල ආදිය හෝ බැලීමට නො යා යුතු ය. මේවායින් අකුශල සංස්කාර රැස්වීමත්, සසර දුක වැඩි වීමත්, නිවන් මගින් ඈත් වීමත්, ඉන්ද්‍රිය සංවර ශීලය අපිරිසිදු වීමත්, කාලය අපතේ යාමත්, මුට්ඨස්සතිය[1] වර්ධනය වීමත්, ගුණධර්ම පිරිහී යාමත් ආදී අනර්ථයක් ම සිදු වේ.

**"චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තගග්ගාහී හොති...."** ආදී වශයෙන් වදාළ පරිදි ඇස කන ආදී ඉන්ද්‍රියන් ආරක්ෂා කර ගත යුතු ය. එම ඉන්ද්‍රියන් නිසා ලෝභ දෝෂ ආදී අකුශල ධර්මයන් මතු වී ඒමට ඉඩ නො දිය යුතු ය. මනෝ දුච්චරිත මතු වීමට අවකාශ නො දිය යුතු ය. රූපාදී ආරම්මණයන්හි ඇලීම් ගැටීම් වලින් තොරව සිටීම නිසා ක්ලේශ වලින් සිත තෙත් නො වී සිටීමට උත්සුක විය යුතු ය. රාග දෝෂ මෝහ ආදී පිරිළාහ සන්තාප වලින් නො දැවී සිටීම

1. මුළාවට පත් කරවන, සතිය නො මැති බව.

පිණිස මෝහයට නැගී සිටීමට ඉඩ නො දිය යුතු ය.

ඒ පසේබුදුපියාණෝ මේ සියල්ලෙන් වෙන්ව, විවේකයෙන් යුතු වූයේ, අධ්‍යාත්මික චෙතෝ සමථ සමාධි සම්පන්නව, ඛගවේණ අඟක් සේ එකලාව වැඩ විසූහ.

## ගාථා අංක 30

**ඕහාරයිත්වා ගිහි බ්‍යඤ්ජනානි**
**සංඡින්න පත්තෝ යථා පාරිඡත්තෝ**
**කාසායවත්ථෝ අභිනික්ඛමිත්වා**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

චාතුමාසික බ්‍රහ්මදත්ත රජු උයන් කෙළියට යත්දී මල් පිපී පිරී තිබූ ගසකින් මලක් කඩා ගනී. සෙස්සෝ ද එලෙසම මල් ගෙන යති. පසුව ආ අය කොළ ද ගෙන යති. රජු ආපසු එන විට මල් ගස, කොළ ද විරහිතව ඇති අයුරු දැක කළකිරී මාළිගවෙන් නික්මී පැවිදි වේ. පසුව පසේ බුද්ධත්වයට පත්ව මේ උදානය ගැයූහ.

**කොළ හැලී ගිය කොබෝලීල ගසක් සේ, ගිහි සලකුණු හැර දමා කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම ඛගවේණ අඟක් සේ හුදකලාව ම හැසිරේ.** මෙම ගාථාවේ කෙටි අදහස එය යි. (මෙහි විස්තර, ගාථා 10 ට සමාන ය).

## ගාථා අංක 31

**රසේසු ගේධං අකරං අලෝලෝ**
**අනඤ්ඤපෝසී සපදානචාරී**
**කුලේ කුලේ අප්පටිබද්ධ චිත්තෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බ්‍රහ්මදත්ත රජ කෙනකු බොජුන් කෙරෙහි රස තෘෂ්ණාව ඇති වූ බව දැක කළකිරී පැවිදිව පසේබුදුවීමෙන් පසු ගැයූ උදානය මෙය ය.

**රසයෙහි ගේධ නො කොට (නො ඇලී), ලොල් නොවී, සපදානචාරිකංගයේ[1] යෙදෙමින්, වෙනත් කිසිවකු පෝෂණය නො කරමින්, කිසිම කුලයක් කෙරෙහි බැඳීමක් නො මැති ව, ඛගවේණ අඟක් සේ එකලාව හැසිරේ** යන්න මෙහි සාමාන්‍යාර්ථයයි.

තුවාලයකට බෙහෙත් ගල්වන්නා සේ, පුත්‍ර මාංශය අනුභව කරන්නා සේ, බර ගෙන යාමට රථ නේමියකට තෙල් ගල්වන්නා සේ ආහාරයෙහි ගිජු නොවී මුසපත් නො වී, නො ඇලී, නිස්සරණාධ්‍යාශයෙන්[2] යුක්ත ව, ආහාරයෙහි පටික්කූල සඤ්ඤාව උපදවමින් ආහාර ගත යුතු ය.

කිසිම කුලයක් කෙරෙහි හෝ ගණයා කෙරෙහි හෝ ආවාස චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්පච්චය කෙරෙහි පටිබද්ධ සිතක් ඇති නො කර ගත යුතු යි. (ගාථා 3 බලන්න). චන්ද්‍රූපම පටිපදාව අනුගමනය කරමින් කුලයන් කරා පිවිසිය යුතු යි. චන්ද්‍රයා නැඟෙන විට කිසිවකු කෙරෙහි සෙනහසක් බැඳීමක්, කැමැත්තක් නැතිව ම නැඟේ. එහෙත් මිනිස්සු හඳට කැමැති වෙති. හඳ අඳුර දුරු කරමින් එළිය පතුරවමින් නැඟේ. එසේ ම භික්ෂුව ද කිසිම කුලයකට නො බැඳී නො ඇලී කෙලෙස් අඳුර දුරු කරමින් ඥාණාලෝකය පතුරවමින් කුලයන් කරා එළඹිය යුතු ය. (සං. නිඃ 2 චන්ද්‍රූපම සූත්‍රය).

ඒ පසේබුදුපියාණෝ සද්ධිවිහාරික ආදී පෝෂණය කළ යුතු

1. අනු පිළිවෙලින් ගෙයින් ගෙට පිණ්ඩපාත යාම
2. සසර දුකින් ගැළවීමේ අදහසින්

දෙවැන්නකු නො මැත්තේ, මේ ගුණ ධර්මයන් ගෙන් සමන්නාගතව බඟවේණ අඟක් සේ එකලාව හැසුරුණ සේක.

## ගාථා අංක 32

**පහාය පඤ්චාවරණානි චේතසෝ**
**උපක්කිලේසේ බ්‍යපනුජ්ජ සබ්බේ**
**අනිස්සිතෝ ඡෙත්වා සිනේහ දෝසං**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බරණැස් රජ කෙනකු පළමු ධ්‍යාන සිත ආරක්ෂා කර ගැනීමට රාජ්‍යය හැර පැවිදි වී පසේ බුද්ධත්වයට පත්ව කළ උදානය මෙය යි.

**පංච නීවරණයන් අත්හැර, චිත්ත උපක්කිලේස සියල්ල දුරු කොට තණ්හා දිට්ඨි ස්නේහයන් හා ද්වේශය සිඳ දමා, අනිශ්‍රිතව බඟවේණ අඟක් සේ එකලාව හැසිරේ යන්න මෙහි සාමාන්‍ය අදහස යි.**

උපක්කිලේස යනු රාග-දෝස-මෝහ-කෝධ-උපනාහ-මක්ඛ-පලාස-ඉස්සා-මච්ඡරිය-මායා-සාඨෙය්‍ය-ථම්භ-සාරම්භ-මාන-අතිමාන-මද-පමාද යනාදිය යි. (ස්නේහයන් සිඳ දමා - ගාථා 2 බලන්න).

රූප-ශබ්ද-ගන්ධ-රස-පොට්ඨබ්බ-ධම්ම-කුල-ගණ-ආවාස-ලාභ-යස-ප්‍රශංසා-සුඛ-චීවර-සේනාසන-පිණ්ඩපාත-ගිලානපච්චය-භේසජ්ජ පරික්ඛාර-නව භව-අතීතානාගතපච්චුප්පන්න, දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත ධර්ම ආදී නොයෙක් ධර්මයන් හා තණ්හාවෙන් හෝ දිට්ඨියෙන් නො බැඳී සිටීම අනිස්සිත භාවය ය.

ඒ පසේබුදුපියාණෝ තණ්හා ස්නේහය ද, දිට්ඨි ස්නේහය ද, දෝෂය ද සිඳ දමා, ඇසෙහි අනිශ්‍රිතව, කනෙහි අනිශ්‍රිතව-නාසයෙහි-දිවෙහි-ශරීරයෙහි-රූපයෙහි-ශබ්දයෙහි....පෙ....[1] විඤ්ඤාත ධර්මයන් කෙරෙහි

1. පෙර ඡේදයේ දක්වා ඇති සියළු කරුණු.

අනිශ්‍රිතව, පංච නීවරණයන්ගෙන් හා සියළු චිත්තෝප්පක්ලේශයන් ගෙන් වෙන් වී ඛඟවේණ අඟක් සේ එකලාව හැසුරුණු සේක.

## ගාථා අංක 33

**විපිට්ඨිකත්වාන සුඛංච දුක්ඛං**
**පුබ්බේවච සෝමනදෝමනස්සං**
**ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බරණැස් රජ කෙනකු චතුර්ථ ධ්‍යානය ආරක්ෂා කර ගැනීමට පැවිදිව පසේ බුදු වී මේ උදාන ගාථාව පළ කළහ.

**"සුඛස්සච පහානා දුක්ඛස්සච පහානා, පුබ්බේව සෝමනස්ස දෝමනස්සානං අත්ථංගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛා සති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති"** යනාදී ලෙසින් වදාරා ඇති පරිදි චතුර්ථ ධ්‍යානයේ ගුණාංග මෙම ගාථාවෙන් දැක් වේ.

**කයෙහි හට ගන්නා සුඛ දුක්ඛ පහකොට, මානසික සෝමනස්ස දෝමනස්සයන් උපචාර අවස්ථාවන්හිදී ම දුරු කොට, දුක් නො වූ, සුඛ නො වූ, උපෙක්ඛා සති පාරිශුද්ධියෙන් යුතුව, ඛඟවේණ අඟක් සේ එකලාව හැසිරේ** යන්න මෙහි සාමාන්‍ය අදහස ය.

මෙහි 'විසුද්ධං යනුවෙන් දැක්වෙන්නේ කාමච්ඡන්දාදී පංච නීවරණයන් හා විතක්ක විචාර පීති සුඛ සංඛ්‍යාත නව විධ පච්චනීක ධර්මයන්[1] ගෙන් විමුත්ත වූ බව ය.

පඨමජ්ඣානයෙන් දුක්ඛය ද, දුතියජ්ඣානයෙන් දෝමනස්සය ද, තතියජ්ඣානයෙන් සුඛය ද චතුර්ථඣානයෙන් සෝමනස්සය ද පහ වේ.

---

1. ප්‍රතිවිරුද්ධ ධර්මයන්

'සමථං' යනුවෙන් දැක්වෙන්නේ සිතේ යම් අරමුණක නිසලව සිටින බවක්, බැසගෙන සිටින බවක්, මොනවට සිටින බවක්, චිත්තයාගේ නො විසිරීමක්, නො පැතිරීමක්, නො විසුරුණු සිත ඇති බවක් යනාදී ධ්‍යාන ලක්‍ෂණයන් ය.

ඒ පසේ බුදුපියාණෝ චතුර්ථජ්ඣානය පාදක කොට විදසුන් වඩා පසේබුද්ධත්වයට පත්ව ශුද්ධව, විසුද්ධව, නික්ලේශීව, පහවූ උපක්කිලේස ඇතිව, මෘදු වූ, කර්මනීය වූ, ස්ථිත වූ, නිශ්චලත්වයට පත්ව ඛගවේණ අඟක් සේ ඒකචාරීව වැඩ විසූහ.

## ගාථා අංක 34

**ආරද්ධ විරියෝ පරමත්ථ පත්තියා**
**අලීන චිත්තෝ අකුසීත වුත්ති**
**දළ්හ නික්කමො ථාම බලූපපන්නෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

ප්‍රත්‍යන්ත රාජ්‍යයක රජ කෙනකු ඥාණ බලය නිසා මුළු දඹදිව ජය ගනී. මේ ඥාණ බලයෙන් මුළු දඹදිව ජය ගත්තත් එය නිබ්බිදාව සඳහා හේතු නො වේ යැයි සිතා පැවිදි වේ. පසුව පසේබුදු වී මේ ප්‍රීති වාක්‍යය පළ කළහ.

**නිර්වාණාර්ථය සඳහා ලීන නොවූ, කුසීත නොවූ සිත් ඇතිව, දැඩි වූ නික්කමධාතු සඞ්ඛ්‍යාත ඇරඹූ විරිය සමාදානය ඇතිව, කාය බල හා ඥාණ බල ඉපැදී ඛගවේණ අඟක් සේ එකලාව හැසිරේ** යනු මේ ගාථාවේ කෙටි අදහස ය.

උපන් අකුසල් දුරුලීමට, නූපන් අකුසල් නූපදවීමට, උපන් කුසල් වැඩි දියුණු කර ගැනීමට, නූපන් කුසල් උපදවා ගැනීමට කරනු ලබන සතර සම්මප්ප්‍රධාන වීරිය මෙම ගාථාවෙන් දැක් වේ. "**කාමං තචෝ**

**ච නහාරුච අට්ඨීච අවසිස්සතු. උපසුස්සතු සරීරේ මංස ලෝහිතං. යං තං පුරිස ථාමේන පුරිස විරියේන පුරිස පරක්කමේන පත්තබ්බං න තං අපත්වා විරියස්ස සණ්ඨානං භවිස්සති"** - සමත් නහරත් ඇටත් පමණක් ඉතිරි වෙතොත් ඉතිරි වේවා, ලේ මස් වියලී යතොත් වියළී යේවා, එහෙත් ගත් උත්සාහය අත් නො හරිමි යනාදී වශයෙන් දැක්වෙන චතුරංග සමන්නාගත වීරියම මෙහි ලා ප්‍රධාන ය. 'ථාම' යනුවෙන් දැක්වෙන්නේ කායික වීරිය, කාය බලය ය.

බලූප්පන්නෝ යනුවෙන් දැක්වෙන උපන් ඥාණ බලයන්ට විදර්ශනා ඥාණයන්, මග්ග ඵල ඥාණයන්, පච්චවෙක්ඛණ ඥාණයන්, පටිසම්භිදා ආදී ඥාණයන්, ඍද්ධිවිධ ආදී ෂඩ් අභිඥ්ඥා ඥාණයන් ආදිය අන්තර්ගත ය. තවද සමථබල, විපස්සනා බල, දස ඛීණාසව බල ආදිය ද මෙයට ඇතුළත් වේ.

මෙවන් කාය බල, ඥාණ බලයන් ගෙන් සමන්නාගතව, ආරම්භ ධාතු නික්කම ධාතු පරක්කමධාතු ආදී ආරබ්ධ වීරියයන් යුක්තව උන්වහන්සේ ඛගවේණ අඟක් සේ එකලාව ම විසූහ.

## ගාථා අංක 35

**පටිසල්ලානං ඣාන මරිඤ්චමානෝ**
**ධම්මේසු නිච්චං අනුධම්මචාරි**
**ආදීනවං සම්මසිතා භවේසු**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

පළමු ධ්‍යාන සිත ආරක්ෂා කිරීමට රාජ්‍යය හැර පැවිදි වූ බ්‍රහ්මදත්ත නම් රජකු පසේබුද්ධත්වයට පත්ව ගැයූ උදානයයි මේ.

මෙහි සාමාන්‍ය අදහස මෙසේ ය :-

**කාය විවේක ආදී විවේකයෙන් යුතුව, ධ්‍යාන පිරිහෙළීමට ඉඩ නොදී, සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්හි නියැලෙමින්, සියළු**

**භවයන්හි ආදීනව සම්මර්ශණය කොට, ඛඟවේණ අඟක් සේ එකලාව වෙසේ.**

උපදවා ගත් ධ්‍යානයන් වශී භාවයට පත් කර ගැනීමත්, නො උපන් ධ්‍යානයන් උපදවා ගැනීමට උත්සුක වීමත් 'ඣාන මරිඤ්චමානෝ' යන්නෙන් අදහස් වේ.

'ධම්මේසු' යන්නෙහි අන්තර්ගත වන්නේ සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් ය.

අනුධම්මචාරී යනු නිවනට අනුලෝමව වූ ප්‍රතිපත්ති මාර්ගයෙහි ගමන් කිරීම ය. ශීල පරිපූර්ණකාරී භාවය, ගෝපිත ඉන්ද්‍රියන් ඇති බව, භෝජනේ මත්තඤ්ඤුතාව, ජාගරියානුයෝග, සතිසම්පජඤ්ඤ ආදී චරණයන් ගෙන් හෙබි සම්මා පටිපදාව, අපච්චනික පටිපදාව, අනිවත්ත පටිපදාව, අනුලෝම පටිපදාව ආදිය මෙහි ලා ගැනේ. මෙම පටිදාව අවිච්ඡින්නව, අඛණ්ඩව, නිරතුරුව, නො සිඳ පවත්වා ගෙන යාම 'නිච්චං' යන වචනයෙන් අදහස් වේ. කාම රූප අරූප ආදී නව විධ භවයන් අනිත්‍ය බව දකිමින්, දුක්ඛ බව දකිමින්, අනාත්ම බව දකිමින්, ශූන්‍ය බව දකිමින්, භයක් වශයෙන් දකිමින්, ආදීනව-නිබ්බිදා-මුඤ්චිතුකම්‍යතා ආදී විදර්ශනා ඤාණ පහළ කර ගනිමින්, නිබ්බිදානුපස්සනා, විරාගානුපස්සනා, නිරෝධානුපස්සනා, පටිනිස්සග්ගානුපස්සනා ආදී අනුපස්සනාවන් දියුණු කර ගැනීම "ආදීනවං සම්මසිතා භවෙසු" යන පදයෙන් ජනිත වන අදහස ය.

මෙවන් ධර්මයන් ගෙන් සමන්නාගත උන්වහන්සේ ඛඟවේණ අඟක් සේ ඒකචාරී වූ සේක.

## ගාථා අංක 36

**තණ්හක්ඛයං පත්ථයං අප්පමත්තෝ**
**අනේළ මූගො සුතවා සතීමා**
**සඞ්ඛාත ධම්මෝ නියතෝ පධානවා**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

බරණැස් රජ කෙනකු වීථි සංචාරය කරන විට ස්ත්‍රියක දැක රාගය ඉපැදීම ගැන කළකිරී පැවිදිව පසේබුදු වී කළ උදානය මෙය යි. **තණ්හක්ඛය සඞ්ඛ්‍යාත නිර්වාණය අපේක්ෂා කරමින්, අප්‍රමාදව, ව්‍යක්තව, ශ්‍රැතවත්ව, සතිසම්පජඤ්ඤයෙන් සමන්නාගතව, සම්මප්පධාන වීරිය සහිතව, පිරිසිඳ දන්නා ලද දහම් ඇතිව, ආර්ය මාර්ග නියාමයට පත්ව, ඛගවේණ අඟක් සේ එකලාව හැසිරේ** යන්න මේ ගාථාවේ කෙටි අදහස යි.

රූප ශබ්ද ගන්ධ රස පොට්ඨබ්බ ධම්ම යන තණ්හා ක්ෂය කිරීම නම් වූ තණ්හක්ඛය, නිවනට කියනු ලබන අධිවචනයකි. රාගක්ඛය, දෝසක්ඛය, මෝහක්ඛය, ගතික්ඛය, උප්පත්තික්ඛය, පටිසන්ධික්ඛය, භවක්ඛය, සංසාරක්ඛය, වට්ටක්ඛය යනාදී පරියාය වචනයන් ද නිවන සඳහා ව්‍යවහාර කෙරේ.

අනේළමූගෝ යන්නෙන් කෙළතොළු නො වූ, ව්‍යක්තවත්, පණ්ඩිත, පඤ්ඤාසම්පන්න, බුද්ධි සම්පන්න, නිපක යනාදී අදහස් දැක් වේ.

සුතවා යන්නෙන් බහුශ්‍රැත, බොහෝ දෑ දන්නා යන අර්ථය හැඳින්වේ.

සතීමා යන්නෙන් සතිසම්පජඤ්ඤයෙන් සමන්නාගතව සතර සතිපට්ඨාන ධර්මයන්හි නියැලුණු යන අදහස දැක් වේ.

සඞ්ඛාතධම්මෝ යනුවෙන් දැක්වෙන්නේ (i) සියළු තෛභූමික සඞ්ඛාර ධර්මයන් අනිත්‍යාදී වශයෙන් උපපරික්ඛනය කළ බව[1], පරිඤ්ඤාත කළ බව (පිරිසිඳ දත් බව), නුවණින් විමසන ලද බව

1. නුවණින් විමස විමසා විනිවිද දක්නා ලද බව.

(ii) ඤාත පරිඤ්ඤාවෙන්[1] දත් දේ තීරණ පරිඤ්ඤාවෙන් තුලිත කරන ලද බව (iii) හා ඤාත තුලිත ධර්මයන් භාවනාවෙන් ප්‍රත්‍යක්‍ෂාවබෝධ කළ බව ය.
(ගාථා අංක 1 විස්තරය බලන්න).

නියතෝ යනුවෙන් දැක්වෙන්නේ චතු අරියමග්ග ඤාණ පටිවේධ කළ බව ය.

නියාමං වුච්චන්ති චත්තාරො අරියමග්ගා. චතුහි අරියමග්ගේහි සමන්නාගතෝති නියතෝ. නියාමං පත්තෝ සම්පත්තෝ අධිගතෝ, ඵස්සිතෝ, සච්ඡිකතෝති නියතෝ (නිද්දේස)

පධානවා යනුවෙන් දැක්වෙන්නේ, බහා නො තැබූ චතුසම්මප්පධාන වීරියෙන් යුක්ත බව, නො ලිහිල් වීරියධුර ඇති බව, අඛණ්ඩ ස්ථිර විරියච්ඡන්දය ඇති බව හා විරියින්‍ද්‍රිය, විරිය බලය, විරිය සම්බොජ්ඣංගය, සම්මා වායාම යනාදී බෝධි පාක්ෂික ධර්මයන් පරිපූරණය කරන ලද බව ය.

(අප්පමත්තෝ ගාථා 23 බලන්න).

මෙම ගුණයන්ගෙන් සමන්නාගත වූ ඒ පසේබුදුරදහු බගවේණ අඟක් සේ ඒකචාරී විහරණයෙන් ම සමන්නාගතව වැඩ විසූහ.

## ගාථා අංක 37

**සීහෝව සද්දේසු අසන්තසන්තෝ**
**වාතෝව ජාලම්හි අසජ්ජමානෝ**
**පදුමංව තෝයේන අලිප්පමානෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

---

1. පිරිසිඳ දත් නුවණින්.

රජ කෙනෙක් සිංහයකු ගේ නො බිය බව ද, දැලෙහි සුළඟ නො බැඳෙන බව ද, නෙලුම් මල් ජලයේ නො තැවරී ඇති බව ද දැක, මෙය පාදක කොට විදසුන් වඩා පසේබුද්ධත්වයට පත් වේ. ඊට පසුව පළ කළ ප්‍රීති වාක්‍යය මේ ගාථාවෙන් දැක් වේ.

මෙහි සාමාන්‍ය අදහස මෙසේ ය.

**සිංහයකු ශබ්ද ඇසී තැති නො ගෙන සිටිනා සේ, දැළෙහි සුළං නො බැඳෙන සේ, නෙලුම් මල් ජලයෙහි නො තැවරී ඇති සේ ඛඟවේෂාණ අඟක් මෙන් එකලාව වෙසේ.**

මෙම උපමාවන් ගෙන් දැක්වෙන්නේ කිසිදු සංස්කාරයක් කෙරෙහි තණ්හාවෙන් හා දිට්ඨියෙන් නො බැඳී සිටින බව ය. (ගාථා 3-4-14 ආදියෙහි මේ විස්තර දක්වා ඇත).

මෙසේ විසංයෝග වූ ඒ පසේබුදුරදුහු කිසිවක් හෝ කිසිවකු සමඟ සංයෝග නොවී ඛඟවේෂාණ අඟක් සේ ම ඒකාචාරී වූහ.

## ගාථා අංක 38

**සීහෝ යථා දාඨාබලී පසය්හ**
**රාජා මිගානං අභිභුය්‍ය චාරී**
**සේවේථ පන්තානි සේනාසනානි**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

රජකු සිවුරඟ සෙනඟ ගෙන පසල් දනව්වක සටනකට යත්දී, සිංහයකු දැක බෙර ආදිය ශබ්ද කරයි. සිංහයා නො බියව සිටී. තෙවරක් ම මෙසේ ශබ්ද කරවූ විට සිංහයා සීහනාද කරයි. රජු නැඟ සිටි ඇතා පවා බියවී දුවයි. රජු අත්තක එල්ලී දිවි ගළවා ගෙන පසේබුදුවරයකු හමු වේ. තමාට බියක් නොවූ බව පසේබුදුරදුහු වදාරති. මෙය අසා එවැනි නො බිය බවක් ලබා ගැනීමේ අදහසින් රජු පැවිදි වේ. පසේ

බුද්ධත්වයට පත්ව මේ උදානය පළ කරති.

**මෘගරාජ සිංහයා සියළු සතුන් මැඩ (වනයේ) හැසිරෙන්නා සේ වන සෙනසුන් සේවනය කරමින්, ඛගවේණ අඟක් සේ ඒකචාරීව වෙසේ යන්න මේ ගාථාවේ සාමාන්‍ය අර්ථය යි.**

සිංහයා සියළු සතුන් අභිභවනය කොට වනයේ හැසිරෙන්නා සේ, ඒ පසේබුදුරදහු සත්ත්ව සඞ්ඛාර සියළු ධර්මයන් ප්‍රඥාවෙන් මැඩ අභිභවනය කොට වන සෙනසුන්හි එකලාව හැසිරෙති. (ගාථා 5-18-19 න් හි මෙහි විස්තර දැක්වේ).

## ගාථා අංක 39

**මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං**
**ආසේවමානෝ මුදිතංච කාලේ**
**සබ්බේන ලෝකේන අවිරුජ්ඣමානෝ**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

මෛත්‍රී ධ්‍යාන සිත් ආරක්‍ෂා කර ගැනීමට රාජ්‍යය හැර පැවිදි වූ රජ කෙනකු පසේබුද්ධත්වයට පත්ව මේ උදානය පළ කළහ.

**මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර බ්‍රහ්ම විහරණයන් සුදුසු කල්හි ආසේවනය කරමින්, මුළු ලෝකයා කෙරෙහි නො ගැටී ඛගවේණ අඟක් සේ එකලාව වෙසේ යන්න මේ ගාථාවේ කෙටි අදහස යි.**

සතර බ්‍රහ්ම විහරණයන් වඩන විට සියළු සත්වයන් කෙරෙහි අප්පටිකූලව,[1] මනසිකාර පැවැත්වෙන බැවින් මුළු ලෝකයා කෙරෙහි ම ගැටීමක් නොවේ. විශේෂයෙන් උපේකෂා භාවනාව

1. පිළිකුලක් නො මැතිව

වඩන විට කම්මස්සකතාව[1] මෙනෙහි වෙමින් සියළු සත්වයන් කෙරෙහි මැදහත් බවක් ම ඇති වේ.

සතර බ්‍රහ්ම විහරණයන්ට 'විමුත්ති' යන වචනය යෙදෙන්නේ, ඒ ඒ ධ්‍යානයන්ට අනුකූලව, කාමච්ඡන්දාදි නීවරණයන් ද, විතක්ක විචාරාදී ධ්‍යානාංග ද යන පච්චනීක ධර්මයන් ගෙන් මිදීමක් සිදු වන බැවිනි.

'කාලේ' යනුවෙන් මේ ගාථාවේ දක්වා ඇත්තේ සතර බ්‍රහ්ම විහරණයන් වැඩීමට සුදුසු කල්හි යන අර්ථය දක්වීමට ය. පළමුව මෙත්තාව ද, ඉන් නැගී සිට කරුණාව ද, ඊට පසුව මුදිතාව ද, ඉනික්බිතිව උපේක්ෂාව ද වැඩීම 'කාලේ' යන වචනාර්ථය දක්වීම සඳහා අටුවාව දක්වා ඇති එක් මතයකි. එවැනි අනුපිළිවෙලකින් තොරව වුව ද, මෙම ධ්‍යානයන්ට සමවැදීමේ අපහසුතාවයක් පැන නැගෙන්නේ නැත.

මෙම සතර බ්‍රහ්ම විහරණ ධ්‍යාන පාදක කොට විදසුන් වඩා පසේ බුද්ධත්වයට පත්ව උන්වහන්සේ ඛගවේණ අඟක් සේ එකලාව ම වැඩ විසූ සේක.

## ගාථා අංක 40

**රාගංච දෝසංච පහාය මෝහං**
**සන්දාලයිත්වාන සංයෝජනානි,**
**අසන්තසං ජීවිත සඛ්ඛයම්හි**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

රජගහ නුවර ඇසුරු කොට වැඩ සිටි මාතංග නම් අවසාන පසේබුදුපියණෝ අප බෝධිසත්වයන් ජනිත වූ බව දැන, එදින ම උන්වහන්සේ ගේ ද ආයු සංස්කාර නිමවී ඇති බව දැක, පසේ බුදුවරුන් සාමාන්‍යයෙන් පිරිනිවෙන හිමවත මහාප්පාත නැමැති

1. කර්මය අනුව පවත්නා බව

පර්වතයට වැඩ මේ ගාථාව දේශනා කොට පිරිනිවී වදාළ සේක.

**රාගයද දෝෂයද මෝහයද සිඳ දමා, සියළු සංයෝජනයන් විනාශ කොට, ජීවිත අවසානයේ තැති ගැන්මක් නො මැතිව, ඛඟවේණ අඟක් සේ එකලාව හැසිරේ යන්න මෙහි කෙටි අර්ථය යි.**
(ගාථා 28 හි මෙය විස්තර කර ඇත).

එම පසේබුදුපියාණෝ රාග දෝෂ මෝහ ප්‍රහාණය කොට, දස සංයෝජනයන් පලාපියා, ජීවිත පරියෝසානයේ[1] නො බියව, උත්‍රාස නොවී[2], පළා නො ගොස්, ප්‍රහීණ කළ බිය හා බිය අරමුණු ඇතිව, ලොමු දැහ ගැනුම් නො මැතිව, නො සැලී ජීවිත නිකාන්තිය[3] බැහැර කොට, අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් පහනක් නිවී ගියා සේ නිවී ගිය සේක.

## ගාථා අංක 41

**භජන්ති සෙවන්තිච කාරණත්ථා**
**නික්කාරණා දුල්ලභා අජ්ජ මිත්තා**
**අත්තත්ථපඤ්ඤා අසුචි මනුස්සා**
**ඒකෝ චරේ ඛග්ග විසාණ කප්පෝ**

එක් රජකු අසනීප වී දුබල වූ විට, රජු ගේ ස්ත්‍රීහු වෙනත් ස්ථාන වලට යති. රජු සුව වූ පසුව පැමිණෙත්. මෙය අත්හදා බැලීමට රජු තෙවරක් ම අසනීප බව හඟවයි. ඒ හැම වාරයකදී ම ස්ත්‍රීන් තමා අතහැර දමා යන හැටි දැක කළකිරී පැවිදි වේ. පසේබුද්ධත්වයට පත්ව මේ උදානය පළ කරති.

---

1. ජීවිත අවසානයේ
2. තැති නොගෙන
3. ජීවිත ඇල්ම

**මිනිස්සු කාරණයක් උදෙසා ම, ආත්මාර්ථය සළකා ම (අන් අය) භජනය සේවනය පයිරුපාසනය කරති. ආත්මාර්ථය නො සළකන ආර්ය මිත්‍රයන් දුර්ලභ ය. මනුෂ්‍යයෝ අපිරිසිදු කාය කර්ම ආදියෙන් යුක්තයහ. (එබැවින්) ඛගවේෂා අඟක් සේ එකලාව ම හැසිරේ** යන්න මේ ගාථාවේ සාමාන්‍ය අදහස ය.

තමාට ලාභ ප්‍රයෝජන ආදී කිසිවක් අපේක්ෂාවෙන් ම (කාරණත්ථා) බොහෝ අය තවකකු ආශ්‍රය කරති. එවැනි ස්වකීය අර්ථය ම නො සළකා (නික්කාරණා) තවත් අයකුට මොලොව පරලොව නිර්වාණාර්ථ පෙන්වා දෙමින් ඇසුරු කරන උතුම් මිත්‍රයන් දුර්ලභ ය.

අත්තත්ථපඤ්ඤා යනුවෙන් මෙහි දක්වෙන්නේ ආත්මාර්ථකාමී පුද්ගලයන් ය. "අත්තානං යෙව ඕලෝකෙන්ති - න අඤ්ඤන්ති" යනුවෙන් එය අටුවාවේ දක්වා ඇත. මිනිස්සු අපිරිසිදු කාය කර්ම වචීකර්ම හා අපිරිසිදු මනෝ කර්මයන්හි නිරත වෙති. පාණාතිපාත ආදී දස අකුසල් කරති. අපිරිසිදු වූ දස මිච්ඡත්තයන්හි[1] නියැලෙති. ඔවුහු 'අසුචී මනුස්සා' යනුවෙන් මෙහි දක්වා ඇත. මෙවැන්නන් ගෙන් වෙන් වී සිටීම ට සුදුසු ය. (ගාථා 23 බලන්න).

මෙවැන්නන් ගෙන් වෙන් වූ ඒ බෝසතාණෝ විදසුන් වඩා පසේබුද්ධත්වයට පත්ව ඛගවේෂා අඟක් සේ අදුතියකව වාසය කළහ.

---

1. ආර්ය අෂ්ඨාංගික මාර්ගයට ප්‍රතිවිරුද්ධ අංග 8 (මිච්ඡා දිට්ඨි, මිච්ඡා සංකප්ප, මිච්ඡා වාචා, මිච්ඡා කම්මන්ත, මිච්ඡා ආජීව, මිච්ඡා වායාම, මිච්ඡා සති, මිච්ඡා සමාධි) හා මිච්ඡා විමුත්ති, මිච්ඡා විමුත්ති ඤාන දස්සන.

# උප ග්‍රන්ථය

**ගාථා 1**

1. **බෝධිපාක්ෂික ධර්ම**

| | |
|---|---|
| 1. සතර සතිපට්ඨාන | 1 - කායානුපස්සනාව<br>2 - වේදනානුපස්සනාව<br>3 - චිත්තානුපස්සනාව<br>4 - ධම්මානුපස්සනාව |
| 2. සතර සම්මප්පධාන | 1 - උපන් අකුසල් දුරු කිරීමට<br>2 - නූපන් අකුසල් නූපදවීමට<br>3 - නූපන් කුසල් උපදවා ගැනීමට<br>4 - උපන් කුසල් දියුණු කරගැනීමට<br>............ කරනු ලබන උත්සාහයන් |
| 3. සතර ඍද්ධිපාද | 1 - ඡන්ද ඍද්ධිපාද (කැමැත්ත)<br>2 - චිත්ත ඍද්ධිපාද (සිත)<br>3 - විරිය ඍද්ධිපාද (වීර්යය)<br>4 - වීමංසා ඍද්ධිපාද (ප්‍රඥාව) |
| 4. පඤ්ච ඉන්ද්‍රිය<br>5. පඤ්ච බල | සද්ධා-වීරිය-සති-සමාධි-ප්‍රඥා |
| 6. සත්ත බොජ්ඣංග | සති-ධම්මවිචය-විරිය-පීති-පස්සද්ධි-සමාධි-උපෙක්ඛා |
| 7. ආර්ය අෂ්ඨාංගික මාර්ගය | සම්මා දිට්ඨි, සම්මා සංකප්ප,<br>සම්මා වාචා, සම්මා කම්මන්ත,<br>සම්මා ආජීව, සම්මා වායාම,<br>සම්මා සති, සම්මා සමාධි |

2. **පටිච්ච සමුප්පාද ධර්මයන්**

අවිද්‍යාව හේතුවෙන් සංස්කාර හටගනී

සංස්කාර හේතුවෙන් විඥානය හටගනී
විඥානය හේතුවෙන් නාමරූප හටගනී
නාමරූප හේතුවෙන් සළායතන හටගනී
සළායතන හේතුවෙන් ඵස්ස හටගනී
ඵස්ස හේතුවෙන් වේදනා හටගනී
වේදනා හේතුවෙන් තණ්හා හටගනී
තණ්හා හේතුවෙන් උපාදාන හටගනී
උපාදාන හේතුවෙන් භව හටගනී
භව හේතුවෙන් ජාතිය හටගනී
ජාතිය හේතුවෙන් ජරා, මරණ, ශෝක, පරිදේව ආදී දුක් හටගනී

අවිද්‍යා නිරෝධයෙන් සංස්කාර නිරෝධ වේ
සංස්කාර නිරෝධයෙන් විඥානය නිරෝධ වේ
විඥාන නිරෝධයෙන් නාමරූප නිරෝධ වේ
නාමරූප නිරෝධයෙන් සළායතන නිරෝධ වේ
සළායතන නිරෝධයෙන් ඵස්ස නිරෝධ වේ
ඵස්ස නිරෝධයෙන් වේදනා නිරෝධ වේ
වේදනා නිරෝධයෙන් තණ්හා නිරෝධ වේ
තණ්හා නිරෝධයෙන් උපාදාන නිරෝධ වේ
උපාදාන නිරෝධයෙන් භව නිරෝධ වේ
භව නිරෝධයෙන් ජාති නිරෝධ වේ
ජාති නිරෝධයෙන් ජරා, මරණ ආදි දුක් නිරුද්ධ වේ.

3. **ආශ්‍රව ධර්ම 4**
   1 කාමාශ්‍රව
   2 භවාශ්‍රව
   3 දිට්ඨාශ්‍රව
   4 අවිජ්ජාශ්‍රාව

4. **චතුරාර්ය සත්‍යය**

දුක්ඛාර්ය සත්‍යය පිරිසිඳ දත යුතුය
දුක්ඛ සමුදය ප්‍රහාණය කළ යුතුය.
(අවිජ්ජා-භව තණ්හා ආදිය)
දුක්ඛ නිරෝධ සත්‍යය සාක්ෂාත් කළ යුතුය. (විජ්ජා-විමුත්ති)
මාර්ග සත්‍යය වැඩිය යුතුය (සමථ - විපස්සනා)

**5. ඵස්සායතනය 6.**

1 ඇසට රූපයක් පෙණුන පසු පහළ වන සියළුම නාම ධර්මයනුත් ඇසත් චක්ඛු සම්ඵස්සායතනයයි.

2 සිට 6 කණට - ශබ්ද
නාසයට - ගඳ සුවඳ
දිවට - රස
කයට - ස්පර්ශ (පොට්ඨබ්බ) හා
මනසට - ධම්ම (මනසට අරමුණු වන දේ)
හමු වූ පසු පහළ වන නාම ධර්මයනුත්, කණ නාසය ආදී ඉන්ද්‍රියයනුත් ඒ ඒ ඵස්සායතනයන් වේ. එනම් සෝතඵස්සායතනය-ඝාන සම්ඵස්සායතනය-ජිව්හා සම්ඵස්සායතනය-කාය සම්ඵස්සායතනය හා මනෝ සම්ඵස්සායතනය යි.

**6. පඤ්චුපදානස්කන්ධ** - රූප, වේදනා, සංඥා. සංස්කාර, විඥාන

මේවායේ සමුදය : රූප සමුදය ආහාර යි. වේදනා, සංඥා - සංස්කාර සමුදය ඵස්සයයි. විඥාන සමුදය නාම රූපයි.

මේවායේ නිරෝධය : ආහාර, ඵස්ස, නාම-රූප යන හේතු නිරෝධයෙන් ඒ ඒ ස්කන්ධ නිරෝධය වේ.

මේවායේ ආශ්වාදය : මේවා තුළින් යම් සුඛයක්, සුවයක් ආශ්වාදයක් ලැබේ නම් එය එකිනෙක ස්කන්ධයේ ආශ්වාදය යි.

මේවායේ ආදීනව : මේවා අනිත්‍ය බව, දුක් බව හා විපරිනාමයට වෙනස් ස්වරූපයකට පත්වන බව.

මේවායේ නිස්සරණය : මේවා කෙරෙහි පවත්නා ඡන්දරාගය (කැමැත්ත හා ඇලීම) නැති කර ගැනීම යි ; නැති වී යාම යි.

**7. මහාභූත 4** පඨවි ධාතුව, ආපෝ ධාතුව, තේජෝ ධාතුව, වායෝ ධාතුව

මේවායේ සමුදය : ආහාර යි.

| | | |
|---|---|---|
| මේවායේ නිරෝධය | : | ආහාර නිරෝධයෙන් මේවා නිරුද්ධ වී යාමයි. |
| මේවායේ ආශ්වාදය | : | මේ තුළින් ලැබෙන සුඛය, ආශ්වාදය යි. |
| මේවායේ ආදීනවය | : | මේවායේ අනිත්‍ය-දුක්ඛ, විපරිනාම භාවයයි. |
| මේවායේ නිස්සරණය | : | මේවා කෙරෙහි පවත්නා ඡන්ද රාගය නැති වී යාමයි. |

8. **අධ්‍යාත්මික ආයතන 6** ඇස-කණ-නාසය-දිව-ශරීරය-මනස
   **බාහිර ආයතන 6** රූප-ශබ්ද-ගන්ධ-රස-පොට්ඨබ්බ-ධර්ම

9. **රූපාවචර ධ්‍යාන 4**
   පළමු වන ධ්‍යානය
   දෙවන ධ්‍යානය
   තුන්වන ධ්‍යානය
   සතරවන ධ්‍යානය

   **අරූපාවචර ධ්‍යාන 4**
   ආකාසානඤ්චායතනය
   විඤ්ඤාණඤ්චායතනය
   ආකිඤ්චඤ්ඤායතනය
   නේවසඤ්ඤානාසඤ්ඤායතනය

10. **විදර්ශනා ඥාන**
    1. නාම-රූප පරිච්ඡේද ඥානය.
       (නාම-රූප වෙන් වෙන්ව දැකීමේ නුවණ).
    2. පච්චය පරිග්ගහ ඥානය.
       පංචස්කන්ධ ආදී සංස්කාර ඇතිවීමේ හේතු හෙවත් සමුදය දැක අවබෝධ වීම.
    3. සම්මර්ශන ඥානය -
       සියළුම සංස්කාර අනිත්‍ය-දුක්ඛ-අනාත්ම ආදී ලෙසින් නුවණින් දැක අවබෝධ කර ගැනීම.
    4. උදයබ්බය ඥානය -
       පංචස්කන්ධයේ ම ඇතිවීම හා නැතිවීම දැක අවබෝධ වීම.

5. භංග ඥානය -

පංචස්කන්ධ ධර්මයන් ගේ ම බිඳී බිඳී යාම ම ඉතා ප්‍රකටව පෙනීම.

6. භයතුපට්ඨාන ඥානය -

පංචස්කන්ධයන් ගේ පැවැත්මේ ඇති භයානක බව අවබෝධ වීම.

7. ආදීනව ඥානය :

පංචස්කන්ධයන් පැවැත්මේ ඇති මහා ආදීනවයන් පෙනී යාම.

8. නිබ්බිදානු ඥානය -

සංස්කාර කෙරෙහි තදින් ම කළකිරීම

9. මුඤ්චිතුකම්‍යතා ඥානය -

සංස්කාරයන් සියල්ලම අත හැරීමට ම ඇතිවන කැමැත්ත.

10. පටිසඞ්ඛානු ඥානය :

සංස්කාරයන් ගෙන් මිදීමට ඒවා අනිත්‍ය, දුක්ඛ. අනාත්ම ආදී ලෙසින් අවබෝධ වී යා යුතු බව දැකීම.

11. සංස්කාරුපෙක්ඛා ඥානය -

සියළුම සංස්කාර කෙරෙහි සම්පූර්ණයෙන් ම මැදහත් සිතින් ඒවායේ අනිත්‍ය-දුක්ඛ-අනාත්ම ස්වභාවයන් ඉතා ප්‍රකටව පෙනී ම.

12. අනුලෝම ඥානය :

සියළුම සංස්කාර අනිත්‍ය-දුක්ඛ-අනාත්ම ලෙස ඉතා ප්‍රකටව අවබෝධ වීමෙන් පසුව, නිවනට අනුලෝමව සියළු සංස්කාර සිතින් ගිලිහී යමින් අත හැරීයාම දැකීම.

13. ගෝත්‍රභූ ඥානය :

සියළුම සංස්කාර සිතින් අතහැරී නිවන දෙසට යොමු වී, නිවන අරමුණු වීමට ඉතා ආසන්න අවස්ථාවේ ඇතිවන නුවණ. මෙම ඥානයට අරමුණු වන්නේ නිවන යි.

14. මග්ග ඥාන -

සෝවාන්-සකෘදාගාමී-අනාගාමී-අරහත් යන මාර්ගයන්ට පත්වීම පිළිබඳ නුවණ.

15. ඵල ඥානය -

සෝවාන් ඵලය-සකෘදාගාමී ඵලය-අනාගාමී ඵලය-

අරහත් ඵලයට පත් වීම පිළිබඳ නුවණ

16. ප්‍රත්‍යවේක්ෂා ඥාන :

ඒ ඒ මාර්ග ඵල අවස්ථාවන්හි දී පහළ වූ සමාධි-ප්‍රඥා ආදී විවිධ ධර්මයන් පැහැදිළිව (මාර්ග ඵල අවබෝධයන්ට පසුව) දැකීම, ඒ ඒ මාර්ග වලින් ප්‍රහීණ වූ සංයෝජන ධර්ම ආදිය දැකිම, මාර්ග සිත් හා ඵල සිත් වෙන් වෙන්ව ඉතා පැහැදිලිව දැක අවබෝධ වීම.

**11. මග්ග චරියා ඵල චරියා** — ඉහත කී මාර්ග-ඵල හා ප්‍රත්‍යවේක්ෂා ඥාන දැකීමෙන් පසු ඇතිවන ජීවන චරියාව යි.

**12. අධිමුච්චන සද්ධා** — කිසි දිනක අඩු නො වන පරිදි බැඳී පවත්නා වූ නො සැළෙන අවෙච්චප්පසාද ශ්‍රද්ධාව යි.

**13. දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සාමි .......** — ඇස-කන-නාසය-දිව-ශරීරය-මනස යන ඉන්ද්‍රියන්ට රූපාදී අරමුණු හමු වූ පසු, ඒ අරමුණු ගැන කිසිම සිතිවිල්ලක් නො ඉපදී, දැකීම් මාත්‍රයෙන් ම, ඇසීම් මාත්‍රයෙන් ම, දැනීම් මාත්‍රයෙන් ම නැවැතී පැවැතීම යි.

**14. ක්ලේශ ප්‍රහාණ :**

(1) තදංග ප්‍රහාණ

තාවකාලිකව යටපත් වී යාම.

(2) වික්ඛම්භන ප්‍රහාණ

සමථ ධ්‍යාන අවස්ථා වැනි අවස්ථාවන්හිදී සැහෙන කාලයක් කෙලෙස් යටපත් වී පැවැතීම.

(3) සමුච්ඡේද ප්‍රහාණ

නැවත නූපදින ලෙස මාර්ග ඵල අවබෝධයන්ට පසුව ඇතිවන ප්‍රහීණ වී යාම

(4) පටිප්පස්සද්ධි ප්‍රහාණ

රහත් වීමෙන් පසුව ඇතිවන සිත තුළ

නිරායාසයෙන් පහළ වන සංසිඳී නිවී යන ස්වභාවය.

15. දස්සන චරියා - ආර්ය සත්‍යයන් දැකීමෙන් පසුව ඇතිවන හැසිරීම් ස්වභාවය.

අභිනිරෝපන චරියා - යහපත් සංකල්පනාවන්හි ස්ථාවර ලෙස ම පිහිටා සිටීමෙන් පසු උද්ගත වන හැසිරීම් ස්වභාවය.

පරිග්ගහ චරියා - වචනය සම්පූර්ණ ලෙසින් ම සංවර වී යාමෙන් පසුව, සම්මා වාචාව පමණක් ම පිරිවර කරගත්, සම්මා වාචාව ම අයත් කරගත් හැසිරීම් ස්වරූපය.

සමුට්ඨාන චරියා - කායික පාපයන් ගෙන් සම්පූර්ණයෙන් ම මිදී යාමෙන් හා කාය දුශ්චරිතයන් ගෙන් සම්පූර්ණයෙන් ම නැඟී සිටීමෙන් පසු ඇතිවන හැසිරීම් රටාව යි.

වෝදාන චරියා - ජීවිතය පවත්වා ගෙන යාම සඳහා කිසිදු නුසුදුසු ක්‍රියවක් නො කර ඉතා පිරිසිදු ලෙස ජීවනය පවත්වා ගෙන යාම යි.

පග්ගහ චරියා - කුශල් අකුශල් සියල්ල ම බැහැර වී ගිය පසු, කිසිදා ථීනමිද්ධයට, මැලිබවට යට නො වන වීර්යයවත් ජීවන රටාව යි.

උපට්ඨාන චරියා - සතියෙන් යුතුව සිටීම්' යි සිතන විගසම, නිරායාසයෙන් සර්ව සම්පූර්ණව සතිය පිහිටා සිටින, සතියෙන් යුතුව ම කටයුතු කරන චරියා ස්වභාවය යි.

අවික්ඛේප චරියා - රහත් විමුත්ත සිත උදා වූ පසු, නො සැලෙන සේ පිහිටන අකුප්පා චේතෝ විමුත්තියෙන් යුතුව සිටින ස්වභාවය යි.

**ගාථා 3**

**මිත්‍රයන් -**

**මිත්‍ර වේශයෙන් පෙනී සිටින මිත්‍ර නො වන අය 4 කි.**

1. 1 - මිතුරා ගෙන් කුමක් හෝ හැරගෙන යාමටම සිතන්නා

   2 - සුළු දෙයක් දී බොහෝ දේ බලාපොරොත්තු වන්නා

   3 - තමාට කරදරයක් වූ විට පමණක් ආශ්‍රය කිරීමට එන්නා

   4 - තමන්ගේම ප්‍රයෝජනය සඳහා පමණක් ම ඇසුරු කරන්නා.

   මෙම සතර දෙනා "අඤ්ඤදත්ථු හර" (ඒකාන්තයෙන් ම කිසිවක් හැර ගෙන ම යන) මිත්‍ර ප්‍රතිරූපක අමිත්‍රයන් වේ.

2. යම් උදව්වක් ඉල්ලන විට "ඉස්සර ඉල්ලුවා නම් දෙන්නට තිබුණා" කියා අතීතයෙන් සංග්‍රහ කරෙන, නැත්නම් "තව ටික කලකින් නම් කරන්නට තිබුණා, දැන් හරි අපහසුයි" කියා අනාගතයෙන් සංග්‍රහ කරන, හිස් නිරර්ථක වචන වලින් පමණක් සංග්‍රහ කරන, වර්තමාන ක්‍රියාවන්හි යම් යම් වැරැදි ව්‍යසන පමණක් දක්වන අය 'වචී පරම' මිත්‍ර ප්‍රතිරූපක අමිත්‍රයන් වේ.

3 පවක් කළත්, පිනක් කළත් දෙකට ම හොඳ කියන, එය අනුමත කරන, ඇති තැන ගුණ කියන, නැති තැන දොස් පවරන අගුණ කියන අය 'අනුප්පියභාණී' මිත්‍ර වෙසින් එන අමිත්‍රයන් ය.

4 රහමෙර පානය සඳහා මිත්‍ර වන, නැටුම් ගැයුම් බැලීමට යාම සඳහා මිත්‍ර වන, දූ කෙළියෙහි යෙදීමේ දී යහළු වන, නො කල්හි වීථි සංචාරයෙහි යෙදීම පිණිස යහළු වන අය 'අපායසහායක' මිතුරු වෙසින් එන අමිත්‍රයන් ය.

**සුහද මිත්‍රයන්**

1 බීමත් වීම වැනි අවස්ථාවක දී වැටෙන මිතුරා රැක ගන්නා, ඔහු ගේ ධනය රැක දෙන, බියට පැමිණි මිතුරාට පිහිට වෙන අවශ්‍ය කටයුත්තක දී අවශ්‍ය ප්‍රමාණයටත් වඩා උදව් කරන 'උපකාරක' මිත්‍රයා සුහද මිතුරෙකි.

2 තම මිතුරාට රහස් නො සඟවන, මිතුරාගේ රහස් අන් අයට නො කියන, විපතකදී අත් නො හරින, මිතුරා වෙනුවෙන් ජීවිතය පරදුවෙන් වුවද කටයුතු කරන අය 'සමානසුඛදුක්ඛ' සුහද මිතුරෙකි.

3 පිනෙහි යොදවන, පවින් වළක්වන, පෙර අසා නැති ධර්ම ඇසීමට සළස්වන, සුගතිගාමී මග කියා දෙන අය 'අත්ථක්ඛායි' සුහද මිතුරෙකි.

4 මිතුරා ගේ පිරිහීමේදී නො සතුටු වන, ඔහුගේ දියුණුවේ දී සතුටු වන, මිතුරාගේ අගුණ කීම වලක්වාලනු ලබන, මිතුරා ගේ ගුණ කියන අයට පසසන අය 'ආනුකම්පික' සුහද මිත්‍රයෙකි. (සිඟාල සූත්‍රය - දීඝ නිකාය).

**ගාථා 4**

1 **ධාතු**

කාම ධාතු - කාම ලෝක 11. එනම්

දිව්‍ය ලෝක 6 - මනුෂ්‍ය ලෝකය හා අපාය 4

රූප ධාතු - රූපාවචර බ්‍රහ්ම ලෝක 16

අරූප ධාතු - අරූපාවචර බ්‍රහ්ම ලෝක 4

2 **භව**

කාම භව - රූප භව - අරූප භව

ඉහත කී කාමා ධාතු ආදී ලෝකයන් ම කාම භව ආදී ලෙසින් හැඳින්වේ.

ඒකවෝකාර භව

රූපස්කන්ධය පමණක් පවත්නා අසඤ්ඤසත්තය.

චතුවෝකාර භව

නාමස්කන්ධ 4 පමණක් පවත්නා අරූපාවචර ලෝක 4.

පඤ්චවෝකාර භව

පඤ්චස්කන්ධයම පවත්නා සෙසු ලෝක.

අසඤ්ඤී භව

සිත නැති කය පමණක් පවත්නා අසඤ්ඤසත්ත ලෝකය.

නෙවසඤ්ඤීනාසඤ්ඤී භව.

සංඥාවක් ඇත්තෙත් නැති නැත්තෙත් නැති 4 වන අරූපාවචර ලෝකය.

සඤ්ඤී භව

ඉහත කී ලෝක 2 හැර සෙසු ලෝක.

3. **දිට්ඨ සුත මුත විඤ්ඤාත ධර්ම** - දකින ලද, අසන ලද, නාසයෙන් හා දිව ශරීරය හා මනස යන සෙසු ඉන්ද්‍රියන් ගෙන් දැන ගන්නා ලද නොයෙක් අරමුණු.

**ගාථා 8**

1 **ඉතරීතර සන්තුෂ්ටිය** : චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලනාපච්චය, භේසජ්ජ පරික්ඛාර යන සිවුපසය පිළිබඳව ලද දෙයින් සතුටුවීම, ලද දෙයින් සතුටුවීම ගැන ගුණ කීම, වැරැදි ආකාරයෙන් සිවුපසය නො සෙවීම, සිවුපසය නො ලැබුණාට අසතුටට පත් නො වීම, ලද සිවුපසය වුවත් ගිජු නො වී මුලා නො වී, සසර දුකින් මිදීමේ අදහසින් ම පරිභෝග කිරීම.

2 **පටිපදා**

සම්මා පටිපදා :

ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අනුව පිළිවෙත් පිරීම.

අනුලෝම පටිපදා :

නිවනට ඒකාන්ත වශයෙන් ම හේතුවන සතර සතිපට්ඨාන ආදී බෝධි පාක්ෂික ධර්ම වැඩෙන පිළිවෙතක් අනුගමනය කිරීම.

අපච්චනික පටිපදා :

නිවනට පටහැනි වූ, නිවනින් ඈත් කරවන ප්‍රතිපත්ති වලින් ඈත්ව නිවනට අවිරුද්ධ වූ පිළවෙත් පූරණය.

ධම්මානුධම්ම පටිපදා :

නිර්වාණය අවබෝධ කිරීමට හේතු වූ බුදු-පසේබුදු-මහ රහතන් වහන්සේලා ගමන් ගත් ධර්ම මාර්ගයෙහි ගමන් කිරීම.

අන්වත්ථ පටිපදා :

මාර්ග ඵල අවබෝධයෙන් නසන ලද ක්ලේශ ධර්ම නැවත නූපදවන්නා වූ මාර්ගයක් අනුගමනය කිරීම.

3. **ඉන්ද්‍රිය ගුත්තද්වාරතා** : ඇස-කණ-නාසය-දිව-ශරීරය-මනස යන

ඉන්ද්‍රියන්ට රූපාදී අරමුණු හමු වූ පසු, ඒ අරමුණු කෙරෙහි ඇලෙන්නේත් නැතිව, ගැටෙන්නේත් නැතිව, තණ්හා පටිස ඇති නො කරගෙන මැදහත්ව සිටීම. ඒ හමු වූ අරමුණු, නිමිති-අනුනිමිති වශයෙන් නො ගෙන, අකුශල ධර්ම සිත තුළින් මතු වී ඒමට ඉඩ නොදී ඉන්ද්‍රියන් සංවර කර ගැනීම.

4. **ජාගරියානුයෝගය** : බොහෝ කොට නො නිඳා, පමණට නිඳා ගනිමින් නිදි වැරීම.

5. **භෝජනේ මත්තඤ්ඤුතාවය** :

මෙම ආහාර ගන්නේ ක්‍රීඩා ආදිය පිණිස නොව, මේ කය අලංකාරවත් කිරීම ආදිය පිණිස නොව, මේ කය පැවැත්ම සඳහා ම ය, යැපීම සඳහා ම ය, බඩගිනි වේදනා නැති කර ගැනීම සඳහා ම ය, බ්‍රහ්මචාරී මෙම ජීවිතයට අනුග්‍රහය සඳහා ම ය, එසේ ම තමාට හිතකර නො වූ ආහාර නො ගැනීමෙන් හා පමණට ආහාර ගැනීම නිසා නව (අළුත්) ශාරීරික වේදනා ඇතිවන්නේ නැත ය, මෙම ආහාර පඨවි ආදී ධාතු මාත්‍ර පමණි; මෙම ආහාර, ගත් පසු වමනය අසූචි ආදී පරම දුර්ගන්ධ පිළිකුල් තත්ත්වයට පත් වන්නේ ය, ආදී ලෙසින් ප්‍රත්‍යවේක්ෂා කොට නුවණින් යුතුව ආහාර ගැනීම මින් අදහස් කෙරේ.

6 **පුඤ්ඤාභිසඞ්ඛාර** - සියළුම කුශල සංස්කාර
**අපුඤ්ඤාභි සඞ්ඛාර** - සියළුම අකුශල සංස්කාර
**ආනෙඤ්ඤාභිසඞ්ඛාර** - ධ්‍යාන සිත්

7 **අත්ථි ආසවා අධිවාසනා පහාතබ්බා** -

ඉවසීමෙන් මැඩලිය යුතු ආශ්‍රව ධර්ම ඇත. මෙය මජ්ඣිම නිකායේ සබ්බාසව සූත්‍රයේ දක්වෙන පාඨයකි. එම සූත්‍රයේ දක්වෙන ඉතිරි කොටස් වල මාතෘකා පාඨ මෙසේ ය.

**අත්ථි ආසවා පරිවජ්ජනා පහාතබ්බා** :

වෙන් වී ඈත් වී ප්‍රහාණය කරගත යුතු ආශ්‍රව ධර්ම ඇත. පාප මිත්‍රයන්, නපුරු සතුන්, අගෝචර ස්ථාන ආදිය උදාහරණ යි.

**අත්ථි ආසවා විනෝදනා පහාතබ්බා :**

කාම-ව්‍යාපාද-විහිංසා විතර්ක හා උපනුපන් අකුශල ධර්ම, දෝෂ සළකා වීර්යයෙන් පහ කළ යුතු ආශ්‍රව වේ.

**අත්ථි ආසවා පටිසේවනා පහාතබ්බා :**

සිවුපසය පරිභෝග කිරීමේදී ප්‍රත්‍යවේක්ෂා කොට (උදා : ඉහත භෝජනේමත්තඤ්ඤුතාවය බලන්න) යෝනිසෝමනසිකාරයෙන්, නුවණින් කරමින්, පහ කළ යුතු ආශ්‍රව ධර්ම ඇත.

**අත්ථි ආසවා සංවරා පහාතබ්බා :**

යෝනිසෝමනසිකාරයෙන් යුතුව, ඇස කණ, නාසය ආදී ඉන්ද්‍රියන් සංවර කර ගැනීමෙන් මැඩලිය යුතු ආශ්‍රව ධර්ම තිබේ. (ඉහත ඉන්ද්‍රිය ගුත්තද්වාරතා කොටස බලන්න).

**අත්ථි ආසවා භාවනා පහාතබ්බා :**

භාවනාව තුළින් ප්‍රහාණය කළ යුතු ආශ්‍රව ධර්ම තිබේ.

**අත්ථි ආසවා දස්සනා පහාතබ්බා :**

කෙලෙස් ධර්ම වැඩෙන යම් මෙනෙහි කිරීමක් ඇත් ද ඒවා මෙනෙහි නො කොට, අයෝනිසෝමනසිකාරයෙන් වෙන්ව, මෙනෙහි කළ යුතු අනිත්‍ය-දුක්ඛ-අනාත්ම-චතුරාර්ය සත්‍ය ආදී ධර්ම නුවණින් මෙනෙහි කරමින් නිවැරදි දර්ශනයන් තුළින් මැඩලිය යුතු ආශ්‍රව ධර්ම ඇත.

## ගාථා 9

**සුඤ්ඤතපටිසංයුත්ත ධර්ම :**

ශුන්‍යතාවය විදහා දක්වන, මතු කරවා ලන දේශනා. (අපගේ 'ශුන්‍යතාවය හා නිවන' යන පොත බලන්න).

## ගාථා 11-12

**විවේක :**

කාය විවේක -

විවේකයට බාධා පැමිණිය හැකි ස්ථාන හෝ අය ගෙන් ඈත්ව, ආරණ්‍යයක හෝ ගසක් මුල හෝ ශූන්‍යාගාරයක හෝ නිදහස්ව කාය විවේකයෙන් යුතුව විසීම.

චිත්ත විවේක -

සිත තුළින් විවිධ සිතුවිලි හෝ නීවරණ ආදී කිසිම චිත්ත

සංස්කාරයක් ගලා නො යමින් සිත සමාධිමත්ව පවත්වාගෙන යාම. පියවින් ම මේ තත්ත්වය උදා වන්නේ රහත් වී විමුත්ත සිත උද්ගත වූ පසුව ය.

උපධි විවේක -

කෙලෙස් වලින් තොරව සිත පවත්වාගෙන යාම යි. මෙහි උපරිම අවස්ථාව රහත් විමුත්ත සිත යි.

විහරණ

**දිව්‍ය විහරණ** : ධ්‍යාන වලට සම වදිමින් සිටීම

**බ්‍රහ්ම විහරණ** : මෙත්තා-කරුණා-මුදිතා-උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ තුළින් ඇතිකර ගන්නා චෙතෝ විමුත්තිවලට (ධ්‍යාන වලට) සම වැදී සිටීම.

**අරිය විහරණ** : ඵල සමවත් සුව විඳිමින් සිටීම.

සමාධි

අනිමිත්ත සමාධි :

සිතට පෙනී යන සියළුම සංස්කාර නිමිති නො පෙනී, නිමිති විරහිත සමාධියෙන් යුතුව සිටිනා තත්ත්වය යි.

අප්පණිහිත සමාධි :

සකල සංස්කාරයන් කෙරෙහිම කිසිම ඇලීමක්, ආශ්වාදයක් හෝ ප්‍රාර්ථනයක් නො මැති ව, සංස්කාර අත හැරී ගිය විට ඇතිවන සමාධි තත්ත්වය යි.

සුඤ්ඤත සමාධි :

සමථ වශයෙන් අරූපාවචර ධ්‍යාන වලට සමවදිමින් හෝ විදර්ශනා වශයෙන් භාවනා කොට මුළු විශ්වය ම ශූන්‍ය සේ දකිමින්, ශූන්‍යතාවය අත්දකිමින් සිටිනා සමාධිය යි.

## ගාථා 13

කුහනා, ලපනා ........... මෙම සියල්ල ම භික්ෂුවක් විසින් ආජීව පාරිසුද්ධි ශීලය ආරක්ෂා කර ගැනීම සඳහා නො කළ යුතු දේ ය.

**කුහනා** :- සිවුපසය ලබා ගැනීම සඳහා කරනු ලබන කුහකකම් හෝ කපටිකම් කුහනා නම් වේ. ප්‍රත්‍යය

ලබා ගැනීමේ අටියෙන් ම

(i) ලැබෙන පරිෂ්කාරාදිය ප්‍රත්‍යක්‍ෂ කිරීමත්,

(ii) දකින අය පැහැදෙන විධියට, සතියෙන් ඉරියවු පවත්වා ගෙන යාම නැත්නම්, ගසක් මුල සිටීම වැනි දේ කිරීමත්,

(iii) ධ්‍යාන-මාර්ග-ඵල ආදිය තමා තුළ ඇතැ'යි පෙනෙන අයුරින් කථා කිරීමත් මෙයට ඇතුළත් ය.

**ලපනා** : ගරු බුහුමන් ලාභ සත්කාර ලබා ගැනීමේ අදහසින් අන් අය ගේ සිත් ගන්නා අයුරින් කථාබහ කිරීම.

**නේමිත්තකා** : යම් යම් දේ ලබා ගැනීමේ අදහසින් ඒ දේ පිළිබඳව නිමිති පහළ වන සේ කථා කිරීම, හැසිරීම ආදිය මේ යටතේ ගණන් ගැනේ.

**නිප්පේසිකතා** : ලාභාපේක්ෂාවෙන් ම අන් අයට ඇනුම්පද කීම මෙයින් අදහස් වේ. "මෙයා මහ දාන පතියෙක්නේ - හරියට දීමෙහි ආනිශංස දන්නවනේ" ආදී කීම් උදාහරණ ලෙස දක්විය හැකි ය.

**ලාභේන ලාභං නිජිගිංසනතා** : වඩා හොඳ දේවල් ලබා ගැනීමේ තණ්හාවෙන් තමාට ලැබෙන පරිෂ්කාර හුවමාරු කර ගැනීම මෙයට ඇතුළත් වේ.

**පුප්ඵදාන ආදිය** : ගිහියන් සතුටු කිරීම පිණිස, ප්‍රත්‍යයන් ලබා ගැනීම පිණිස ආදී ක්ලේශ නිශ්‍රිත සිතින් මල් දීම-හුණගස් / දඬු දීම, දර, කොළ ජාති, ගෙඩි වර්ග, ඇඟ ගල්වන දේ, දැහැටි, මුව සෝදන දිය දීම ආදී දේවල් දීම මින් අදහස් කෙරේ.

**තිරච්ඡාන විද්‍යා** : ජීවත්වීම සඳහා, මන්ත්‍ර ශාස්ත්‍ර වැඩ කිරීම, නැකත් බැලීම ආදිය කිරීම, අත් පා ලකුණු බලා පලාපල කීම, වෙදකම් කිරීම් ආදී දේවල් මෙයට ඇතුළත් වේ.

**චාටු කම්‍යතා** - ලාභාපේක්ෂාවෙන් චාටු කථා කියමින් අන් අය සතුටුවන අන්දමේ කථා කීම.

**මුග්ගසුප්පතා** : දායකයන් සතුටු කිරීමට සත්‍යයත් අසත්‍යයත් දෙකම මිශ්‍ර කොට කථා කිරීම.

**පාරිභට්යතා** : ගිහියන් තුටු කරවීමේ අදහසින් ඔවුන් ගේ දරුවන් සුරතල් කිරීම.

**පිට්ඨිමංසිකතා :** ඉදිරියේ දී නැති ගුණ පවා ඇති සේ දක්වමින් දායකයන් වර්ණනා කිරීමත්, නැති තැන අගුණ කීමත් මින් අදහස් වේ.

මේ ආදී තවත් බොහෝ කරුණු, චූල සීල, මධ්‍යම සීල, මහා සීල ආදී ලෙසින් ප්‍රභේදගත කර දැක්විය හැකි ය. වැඩි විස්තර සාමඤ්ඤ ඵල සූත්‍රය - බ්‍රහ්මජාල, සෝණදණ්ඩ, කූටදන්ත, සුභ, කේවට්ට, තේවිජ්ජ ආදී ඕනෑම සූත්‍රයක් බලා දත හැකි ය. (දීඝ නිකාය).

## ගාථා 15

**දෙතිස් කථා :**

පැවිද්දන් විසින් නො කළ යුතු කථා මින් දැක් වේ.

1. රාජ කථා :- රජුන් පිළිබඳ, රජය පිළිබඳ, දේශපාලනය පිළිබඳ කථා
2. චෝර කථා :- සොරුන් පිළිබඳ කථා
3. මහා මත්ත කථා :- මහ ඇමතින් පිළිබඳ කථා
4. සේනා කථා :- සේනා පිළිබඳ කථා
5. භය කථා :- බිය පිළිබඳ කථා
6. යුද්ධ කථා :- යුද්ධ පිළිබඳ කථා
7. අන්න කථා :- ආහාර පිළිබඳ කථා
8. පාන කථා :- පාන පිළිබඳ කථා
9. වත්ථ කථා :- වස්ත්‍ර පිළිබඳ කථා
10. සයන කථා :- යහන් පිළිබඳ කථා
11. මාලා කථා :- මල් පිළිබඳ කථා
12. ගන්ධ කථා :- සුවඳ පිළිබඳ කථා
13. ඤාති කථා :- නෑයන් පිළිබඳ කථා
14. යාන කථා :- යානවාහන පිළිබඳ කථා

15-18 ගාම-නිගම-නගර-ජනපද කථා - ගම්, නියම් ගම්, නගර, ජනපද පිළිබඳ කථා

19-22 ඉත්ථි-පුරිස-කුමාර-කුමාරි කථා - ස්ත්‍රීන්, පුරුෂයන්, කුමාරයන්, කුමාරියන් පිළිබඳ කථා

23. සූර කථා - (ක්‍රීඩා වැනි) ශූරයන් පිළිබඳ කථා
24. විසිඛා කථා - වීථි පිළිබඳ කථා (මෙරට හෝ පිටරට)
25. කුම්භට්ඨාන කථා - ජලස්ථාන හෝ වැව්-පොකුණු ආදී

තැන් ගැන කථා

26. පුබ්බපේත කථා : මිය ගිය ඥාතීන් පිළිබඳ කථා

27. නානත්ත කථා : නිරර්ථක සම්පප්ප්‍රලාපමය කථා

28. ලෝකක්ඛායිකං : ලෝකය පිළිබඳ කථා

29. සමුද්දක්ඛායිකං : සමුද්‍ර පිළිබඳ කථා

30-31 ඉති භවාභව කථා : ලෞකික දියුණුව පිළිබඳ කථා, ලෞකික පිරිහීම පිළිබඳ කථා

32. තිරච්ඡාන කථා : පලාපල කීම් - ස්ත්‍රී පුරුෂ ආදී ලක්‍ෂණ විද්‍යාවන් වැනි තිරච්ඡාන විද්‍යාවන් පිළිබඳ කථා, පස්කම් සැප පිළිබඳ කථා- ආත්මය පෙළීම පිළිබඳ කථා.

**කළ යුතු කථා**

1. අප්පිච්ඡ කථා - අල්පේච්ඡ භාවය ගැන කථා
2. සන්තුට්ඨි කථා - ලද දෙයින් සතුටු වීම පිළිබඳ කථා
3. පවිවේක කථා - කාය, චිත්ත, උපධි ආදී විවේක පිළිබඳ කථා
4. අසංසග්ග කථා - නො බැඳී, නො ඇලී සිටීම් ගැන කථා
5. විරියාරම්භ කථා - මාර්ග-ඵල-නිර්වාණ-ධ්‍යාන ආදිය ලැබීමට වීර්යය කිරීම ගැන කථා
6. සීල කථා - ශීල ගැන කථා
7. සමාධි කථා - සමාධීන් පිළිබඳ කථා
8. පඤ්ඤා කථා - ප්‍රඥාව පිළිබඳ කථා
9. විමුත්ති කථා - විමුත්තිය පිළිබඳ කථා
10. විමුත්ති ඤාණ දස්සන කථා - විමුත්තිය ලබා ඇති ආකාරය දක්මේ ප්‍රඥාව ගැන කථා
11. බෝධිපාක්ෂික ධර්ම කථා - සතර සතිපට්ඨාන ආදී සත් තිස් බෝධිපාක්ෂික ධර්ම ගැන කථා
12. මග්ග, ඵල, නිබ්බාණ කථා - සෝවාන් ආදී මාර්ග, එම ඵල නිර්වාණය ගැන කථා.

## ගාථා 17

අවසාන කොටසේ ඇති කාමාදීනව දක්වෙන කොටසේ නො

තේරේ යැයි සිතූ වචන සමහරක්.

පළිබෝධයකි - භාවනා කිරීමට, නිවන් මග යාමට බාධා පමුණුවන්නකි.

සංයෝගත්වයකි - කාමරාග සංයෝජනයෙන් බැඳී යාමකි.

ආයූහනයකි - අකුශල කර්ම සංස්කාර රැස්වීමකි. දුක්ඛ සමුදය සත්‍යය රැස්වීමකි.

මුට්ඨස්සතියකි - සම්මා සතිය නැතිවී, සිහි මුලාවට පත්වීමකි

සන්තාපයකි - පරිළාහයකි. කාම ගින්නෙන් තැවීමකි. දැවීමකි.

ප්‍රපාතයකි. ගුණ ධර්මවලින් පිරිහී ප්‍රපාතයට ඇද වැටීමකි. ජාති ජරා ආදී ප්‍රපාතවලට ඇද වැටීමකි.

අදාන්තභාවයකි - නො දමුණු, අසංවරශීලි බවකි..

විපරීත ජාලාවකි - අශුභ දේ සුභ වශයෙනුත්, දුක් කාමය සැප වශයෙනුත්, දුක් ලබා දෙන දුක්ඛ සමුදයක් වූ කාමය සැපක් ලෙසිනුත් ආදී විවිධ ලෙස විපරීත භාවයකින් වෙලී පැටලී යාමකි, සංඥාවෙන් මුලාවට පත්වීමකි. (සඤ්ඤා විපල්ලාසයකි).

ධාතු මාත්‍රික ඡන්දයකි ඃ ඡන්දය ආදී නාම ධාතු මාත්‍රයක් ඇති වී නැති වී යාම පමණි.

## ගාථා 18

**අයෝනිසෝ මනසිකාර**

අනිත්‍ය වූ සංස්කාර නිත්‍ය ලෙසින් හෝ
දුක්ඛ වූ සංස්කාර සුබ වශයෙන් හෝ
අශුභ වූ සංස්කාර ශුභ වශයෙන් හෝ
අනාත්ම වු සංස්කාර ආත්ම ලෙසින් හෝ
මෙනෙහි කිරීම නුනුවණින් මෙනෙහි කිරීමකි;
අයෝනිසෝ මනසිකාරයකි.

**යෝනිසෝමනසිකාර** - අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන්, අශුභ වශයෙන්, ශූන්‍ය වශයෙන්, හේතු ඵල ධර්මතා වශයෙන්, ආර්ය සත්‍ය වශයෙන්, නාමරූප-ස්කන්ධ-ධාතු-ආයතන-ආදී වශයෙන් මෙනෙහි කිරීම නුවණින් මෙනෙහි කිරීමකි; යෝනිසෝමනසිකරයකි.

**ගාථා 21**

**සක්කාය දිට්ඨි** - පංචස්කන්ධ ලෝකය තුළ ආත්මයක් ඇතැයි සිතේ පවත්නා හැඟීම. මෙය 20 ආකාරයකින් ඇතිවිය හැක.

රූපය ආත්මය ය-ආත්මය රූපවත් ය-ආත්මය තුළ රූපය ඇත-රූපය තුළ ආත්මය ඇතැයි රූපය පිළිබඳව සක්කාය දිට්ඨිය හතර ආකාරයකින් ඇතිවිය හැකි ය.

වේදනාව ආත්මය ය- ආත්මය වේදනාවත් ය-වේදනාව තුළ ආත්මය ඇත-ආත්මය තුළ වේදනාව ඇත.

සංඥාව ආත්මය ය-ආත්මය සංඥාවත් ය-සංඥාව තුළ ආත්මය ඇත-ආත්මය තුළ සංඥාව ඇත.

සංස්කාර ආත්මය ය-ආත්මය සංස්කාරවත් ය-සංස්කාර තුළ ආත්මය ඇත-ආත්මය තුළ සංස්කාර ඇත.

විඥානය ආත්මය ය-ආත්මය විඥානවත් ය-විඥානය තුළ ආත්මය ඇත-ආත්මය තුළ විඥානය ඇත ය කියා සෙසු ස්කන්ධ ගැන ද සක්කාය දිට්ඨිය ඇතිවිය හැකි ය.

**දසාකාර මිච්ඡාදිට්ඨි** : (ගාථා අංක 23 ද බලන්න).

1. දන් දීමෙන් ලැබෙන විපාකයක් නැත.
2. මහා දාන වලින් ලැබෙන විපාකයක් නැත.
3. යාග-හෝම වැනි දේවල විපාකයක් නැත.
4. පින් පව්වල විපාකයක් නැත.
5. පරලොව සිටින්නන් මෙලොවට එන්නේ නැත.
6. මෙලොව සිටින්නන් පරලොව යන්නේ නැත.
7. මවට කරන හොඳ හෝ නරක වල විපාක නැත.
8. පියාට කරන හොඳ හෝ නරක වල විපාක නැත.
9. ඕපපාතික සත්වයන් නැත.
10. තමන් ගේ ම නුවණින් මෙලොවක් පරලොවක් දැන ප්‍රකාශ කරන ශ්‍රමණ බ්‍රාහ්මණයන් නැත යන මිච්ඡා දිට්ඨි 10 දස වත්ථුකා මිච්ඡා දිට්ඨීන් වේ.

**දසාකාර අන්තගග්ගාහිකා දිට්ඨි**

1. සදාකාලික ශාස්වත වූ ආත්මයක් ඇත.
2. මරණින් පසු ආත්මය-නැසී යන්නේ ය.

3. ආත්මය අන්තයක් ඇති සීමිත එකක් ය.
4. ආත්මය අන්තයක් නැති අසීමිත එකක් ය.
5. ජීවයත් ශරීරයත් එකම ආත්මය ය.
6. ජීවය හෝ ආත්මය වෙන එකකි, ශරීර වෙනත් එකකි.
7. කෙනකු මළත් ආත්මය නො මැරේ. මරණින් මතු ආත්මය ඇත.
8. මරණින් පසු ආත්මයක් නැත.
9. මරණින් මතු ආත්මයක් ඇත කියා හෝ නැත කියා කියන කරුණු 2 ම විය හැක. මරණින් මතු ආත්මයක් තිබෙන්නටත් පුළුවන. නො තිබෙන්නට ද පුළුවන.
10. මරණින් මතු ආත්මයක් ඇත්තේ ද නො වේ, නැත්තේ ද නො වේ යන මිච්ඡා දිට්ඨි 10 දසවත්ථුකා අන්තගග්ගාහිකා දිට්ඨි නමින් හැඳින් වේ.

දෙසැට මිච්ඡා දිට්ඨි

1. ආත්මය සදාකාලික ලෙස ගන්නා ශාස්වත දෘෂ්ටි 4 කි.
2. ලෝකය දෙවියන් මැව්වේ ය, විඥානය සදාකාලික ය ආදී ලෙසින් ගන්නා ඒකච්ච ශාස්වත දෘෂ්ටි 4 කි.
3. ආත්මයට අන්තයක් ඇත; නැත ආදී ලෙසින් උපදනා අන්තානන්තික දෘෂ්ටි 4 කි.
4. කිසි දෘෂ්ටියක් ඇත කියා හෝ නැත කියා හෝ මගේ පිළිගැනීමක් නැතැයි ආදී ලෙසින් ඇතිවන අමරාවික්ඛෙප දෘෂ්ටි 4 කි.
5. හේතුවකින් තොර ව ඉබේ ම ආත්මය පහළ වී යැයි ගනු ලබන අධිච්චසමුප්පන්න දෘෂ්ටි 2 කි.
6. මරණින් මතු පවතින රූපවත් ආත්මයක් ඇත, අරූපී ආත්මයක් ඇත ආදී ලෙසින් උපදනා සඤ්ඤීවාද දාෂ්ටි 16 කි.
7. මරණින් පසු සංඥාවක් ඇති ආත්මයක් ඇත, සංඥාවක් නැති ආත්මයක් ඇත ආදී විවිධාකාරයෙන් පහළ වන අසඤ්ඤීවාද දෘෂ්ටි 8 කි.
8. මරණින් පසු සංඥාවක් ඇත්තේත් නැති, නැත්තේත් නැති ආත්මය ඇත ආදී ප්‍රභේද ගත වූ නේවසඤ්ඤීනාසඤ්ඤී දෘෂ්ටි 8 කි.

9. මරණින් මතු ආත්මයක් නැත ආදී ලෙසින් ඇතිවන උච්ඡේද වාද දෘෂ්ටි 7 කි.

10. පංච කාම තුළින් ඉන්ද්‍රියන් පිණවමින් සිටීම, ධ්‍යාන වලට සම වැදී සිටීම වැනි දේ පරම දිට්ඨ ධම්ම නිර්වාණයැයි ආදී ලෙසින් පහළ වන දිට්ඨ ධම්ම නිර්වාණ වාද දෘෂ්ටි 5 කි.

මේවා යේ විස්තර දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රය බලා දත හැකි ය.

**ගාථා 24**

අෂ්ට සමාපත්ති : රූපාවචර ධ්‍යාන 4 හා අරූපාවචර ධ්‍යාන 4 ට සමවැදී සිටීම.

**ඡළභිඤ්ඤා** : ඍද්ධිවිධ ඥාන 6 කි.

1. මනෝමය ඍද්ධි (තමා හා සමාන රූප මැවීම).
2. ඍද්ධි විධ (විවිධාකාර ඍද්ධි ප්‍රාතිහාර්ය පෑම).
3. දිබ්බචක්ඛු (සාමාන්‍ය ඇසට නො පෙනෙන දෙවිවරුන් බ්‍රහ්මයන්, අමනුෂ්‍යයන්, බොහෝ ඈත දේවල්, ගල් පර්වත ආදියෙන් වැසි ඇති දේවල් වැනි දේ දැකීම.
4. දිබ්බ සෝත : ඉතා සියුම් ශබ්ද, බොහෝ ඈත තිබෙන ශබ්ද, දෙවියන් බ්‍රහ්මයන් කියන දේ පවා ඇසීම වැනි දේ ඇසිය හැකි බව.
5. පරචිත්ත විජානන (අනුන් ගේ සිත් දැකීම).
6. පුබ්බේනිවාසානුස්සති (පෙර ආත්ම භාවයන් දැකීම).

(අවසාන ඥාන 5 හා ආශ්‍රවක්ෂය ඥානය, ඡළභිඤ්ඤා වශයෙන් දක්වන අවස්ථාද ඇත).

නවාංග ශාසනය :

1. සුත්තං - මංගල සූත්‍රය, රතන සූත්‍රය ආදී සූත්‍ර නමින් දැක්වෙන දේශනා
2. ගෙය්‍යං - ගාථා සහිත සූත්‍ර දේශනා. (උදා සංයුක්ත නිකායේ සගාථක වර්ගයේ දේශනා)
3. වෙය්‍යාකරණං - ගාථා රහිත ධම්මචක්කප්පවත්තන සූත්‍රය

වැනි දේශනා. මුළු අභිධර්ම පිටකය ම වෙය්‍යාකරණය වේ.

4. ගාථං - ධම්මපද ගාථා, ථෙර ථෙරී ගාථා වැනි ගාථාවන්.
5. උදානං - බුදුරජාණන් වහන්සේ හෝ රහත් වූ අය විසින් පළ කළ ප්‍රීති වාක්‍ය (උදා. උදාන පාළි).
6. ඉතිවුත්තකං - 'වුත්තමිදං භගවතා' භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දේශිත ය යනුවෙන් දක්වෙන දසුත්තර සූත්‍රය, ඉතිවුත්තක පාළියේ දේශනා ආදිය.
7. ජාතකං - අපණ්ණක ජාතකය වැනි ජාතක පාළියේ දේශනා.
8. අබ්භූත ධම්මං - ආශ්චර්ය, අබ්භූත ධර්ම ලෙසින් දේශිත දේශනා.
9. වේදල්ලං - අවබෝධයක් සතුටක් ලබන, අසන ලද ප්‍රශ්න වලට දෙන ලද පිළිතුරු දේශනා. උදාහරණ වශයෙන් - සක්ක පඤ්හ, මහා පුණ්ණම, මහා වේදල්ල, චුල්ල වේදල්ල වැනි සූත්‍ර.

පටිසම්භිදා 4

1. **අර්ථ පටිසම්භිදා** : බුද්ධ දේශිත ධර්මයන්හි විවිධ අර්ථ අවබෝධ කර ගැනීමේ හැකියාව. මතුපිට අර්ථය, ගැඹුරු අර්ථය, සැඟවුණු වැසුන අර්ථය, පමුණුවා ගත යුතු අර්ථය, පරමාර්ථමය අර්ථය වැනි අර්ථයන් මැනවින් අවබෝධ වී යාමේ ශක්තිය. මේ අර්ථ අවබෝධය තුළින් ම තමාගේ අර්ථ සිද්ධිය (ස්වාර්ථය), අන් අයගේ අර්ථ සිද්ධිය (පරාර්ථය) ඒ දෙකම (උභයාර්ථය), මේ ලෝකාර්ථය (දිට්ඨධම්මිකාර්ථය) පරලෝකාර්ථය (සම්පරායිකාර්ථය), නිර්වාණාර්ථය වැනි අර්ථ සිද්ධීන් ඒ ධර්මය තුළින් ලබා දෙන ආකාරය ද පැහැදිළිව අවබෝධ වේ.
2. **ධම්ම පටිසම්භිදා** : බුද්ධ දේශිත ධර්මයන් තුළින් පෙන්වනු ලබන ප්‍රායෝගික ධර්මය මෙය යැයි කියා සහ ඊට සම්බන්ධිත වෙනත් බුද්ධ දේශනා මේ මේ යැයි සිතට වහා පෙනී යන ශක්තිය.

3. **නිරුත්ති පටිසම්භිදා :** බුද්ධ දේශිත වචන සැදෙන්නේ මේ මේ අයුරුනුයි කියා දැකිය හැකි බව.
4. **පටිභාන පටිසම්භිදා :** බුද්ධ දේශිත ධර්මයන්, නා නා විධ ආකාරයෙන් එකවර වහා පෙනී යන ශක්තිය. විශේෂයෙන් ම ඒ ධර්මයන් ප්‍රායෝගිකව විවිධ විවිධ ආකාරයන් ගෙන්, ගැඹුරු වූ කිඳා බසින නුවණකින් මෙන් ම, අති වේගවත් ජවන ප්‍රඥාවකින් වහා වැටහී යන්නේ පටිභාන පටිසම්භිදාව තුළිනි.

## ගාථා 26

**අභිනිවේශ කිරීම :** සතුටත් සහිත තණ්හා හරිත සිතකින් උපාදාන කරගෙන අල්ලාගෙන ආශ්වාද කිරීම.

## ගාථා 27

**ඡළඞ්ගුපේඛාව :** අංග 6 කින් යුතු උපේක්ෂාව. ඇස-කණ-නාසය-දිව-ශරීරය හා මනස යන ඉන්ද්‍රියන්ට රූප ශබ්ද ආදී අරමුණු හමු වූ පසු, කිසිම ඇලීමක් බැඳීමක් ගැටීමක් නැතිව, කිසිම සිතුවිල්ලක් ඇති නො වී, මැදහත් ව, දැකීම්-ඇසීම්-දැනීම් මාත්‍රයෙන් ම නතර වන රහත් කෙනකු ගේ සාමාන්‍ය සිතේ ස්වභාවය මෙය ය.

## ගාථා 28

**සංයෝජන :** සසර බැඳ තැබීමට හේතු වන ධර්ම

අභිධර්ම ක්‍රමයට :

කාමරාග-පටිඝ-මාන-දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බත පරාමාස භවරාග-ඉස්සා-මච්ඡරිය-අවිජ්ජා.

(ඉස්සා = ඊර්ෂ්‍යාව, මච්ඡරිය = මසුරුකම)

සූත්‍ර ක්‍රමයට :

සක්කාය දිට්ඨි - සදාකාලික අත්මයක් ඇත යන හැඟීම හෝ මේ පංචස්කන්ධය ලෝකයේ ආත්මයක් ඇත කියන හැඟීම. ඉහත අභිධර්ම ක්‍රමයට අනුව 'දිට්ඨි'

කියා දැක්වෙන්නේ ද මෙය ම ය.

විචිකිච්ඡා - බුද්ධ, ධර්ම, සංඝ, පෙර භව, මතු භව, පෙර-මතු භව දෙක ම, ත්‍රි ශික්ෂාව හා හේතුඵල පටිච්ච සමුප්පාද ධර්ම ගැන ඇතිවන සැකය.

සීලබ්බතපරාමාස - දුකින් නිදහස් වීමට සිතා ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් පිට වෙනත් ක්‍රම අනුගමනය කිරීම.

කාමරාග - කාමාශ්වාදය විඳීමට ඇති කැමැත්ත.

පටිඝ - ගැටීම, අමනාපය, තරහව ආදී ගැටීම හා සම්බන්ධිත දේ.

රූප රාග - රූප ධර්ම සිතින් උපාදාන කරගෙන සිටීම.

අරූප රාග - අරූප වූ නාම ධර්ම සිතින් උපාදාන කරගෙන සිටීම

(රූප රාග, අරූප රාග යන දෙකම භව රාග ලෙසින් අභිධර්ම ක්‍රමයට අනුව දැක් වේ).

මාන - මම කියා කෙනකු සිටී යැයි සිතන අස්මිමානය.

උද්ධච්ච - සිත තුළින් නිරායාසයෙන් සිතිවිලි ගලා එන ස්වභාවය.

අවිජ්ජාව - චතුරාර්ය සත්‍යයන් ප්‍රත්‍යක්ෂ ලෙස ම අවබෝධ නො වීම ආදී නො දත්කම.

**ශුද්ධාවාස** : අනාගාමී අය පමණක් ඉපදෙන බ්‍රහ්ම ලෝක 5.

1. අවිහ
2. අතප්ප
3. සුදස්ස
4. සුදස්සි
5. අකනිට්ඨ

## ගාථා 32

### උපක්කිලෙස

රාග-දෝස-මෝහ

කෝධ (ක්‍රෝධය) - උපනාහ (වෛරය)

මක්ඛ (කළගුණ අවලංගු කිරීම) - පලාස (තමාට වඩා උසස් අය හා තමා සමකොට සිතීම)

ඉස්සා (ඊර්ෂ්‍යාව) - මච්ඡරිය (මසුරුකම)
මායා (තම පව්, වැරැදි ආදිය සඟවා අන් අය රැවටෙන ලෙස කටයුතු කිරීම) -
සාඨෙය්‍ය (තමා තුළ නැති ගුණ ඇති සේ හැඟෙන සේ කටයුතු කිරීම)
ථම්භ (කණුවක් සේ නො නැමෙන තද ගතිය)
සාරම්භ (අනුන්ට වඩා ඉහළින් සිටීමේ කැමැත්ත)
මාන (මානය) - අතිමාන (අන් අය පහත් කොට සළකා තමා උසස් කොට සළකන ගතිය)
මද (ආඩම්බර ගතිය)
පමාද (දුසිරිතයෙහි යෙදෙමින්, සුචරිතයෙහි නො යෙදෙමින් ප්‍රමාදයට වැටීම)

## ගාථා 35

**අනුපස්සනා** - නුවණින් විනිවිද දකිමින් කරනු ලබනා විදර්ශනා භාවනාවන්. මේවා 18 ක් පටිසම්භිදාමග්ග පාළියේ දක්වා ඇත.

1. **අනිච්චානුපස්සනා** - සංස්කාර අනිත්‍ය ලෙස දකිමින්, නිත්‍ය සංඥාව දුරු කර ගැනීමේ විදර්ශනා භාවනාව.
2. **දුක්ඛානුපස්සනාව** - සංස්කාර දුක් ලෙස දකිමින් සුඛ සංඥාව දුරු කර ගැනීම
3. **අනත්තානුපස්සනා** - පංචස්කන්ධය අනාත්ම ලෙස දැක ආත්ම සංඥාව දුරු කිරීම
4. **නිබ්බිදානුපස්සනා** - සංස්කාර කෙරෙහි කළකිරී, සංස්කාර කෙරෙහි පවත්නා නන්දිය (සප්‍රීතික තෘෂ්ණාව) දුරු කිරීම
5. **විරාගානුපස්සනා** - සංස්කාර කෙරෙහි නො ඇල්ම, විරාගය ඇති කර ගනිමින් රාගය දුරු කිරීම.
6. **නිරෝධානුපස්සනා** - සංස්කාරයන් ගේ නිරෝධය දකිමින් සමුදය (ඇතිවීමේ හේතු) දුරු කිරීම.
7. **පටිනිස්සග්ගානුපස්සනා** - සංස්කාර අත හරිමින් ආදානය (සිතින් අල්ලා ගෙන සිටීම) අතහැරීම

මේ 7 සත් අනුපස්සනා නමින් හැඳින් වේ.

8. **භයානුපස්සනා** - සංස්කාර ක්‍ෂය වීම දකිමින් සන්තති වශයෙන් පවත්නා ඝන සංඥාව දුරු කිරීම.

9. **වයානුපස්සනා** - සංස්කාරයන් ගේ වැය වීම දකිමින් ආයූහනය (රැස් කිරීම) දුරු කිරීම,

10. **විපරිනාමානුපස්සනා** - සංස්කාර වෙනස් ස්වරූපයන්ට පරිවර්තනය වන ආකාරය දකිමින් ධ්‍රැව (සදාකාලික) සංඥාව දුරු කිරීම.

11. **අනිමිත්තානුපස්සනා** - සංස්කාර සිතට පෙනී යන විට ඇතිවන 'නිමිති' නැති වන සේ, සංස්කාර අනිමිත්ත වශයෙන් දර්ශනය වීම.

12. **අප්පණිහිතානුපස්සනා** - සංස්කාර දුක් නිසාම ප්‍රාර්ථනය නො කළ යුත්තක් බව දකිමින්, සුඛ සහගත ප්‍රාර්ථනා (පණිධිය) අතහැරීම.

13. **සුඤ්ඤතානුපස්සනා** - සංස්කාර ශූන්‍ය වශයෙන් දකිමින් අභිනිවේශය (ආශ්වාද කරමින් ඇලීම) දුරු කිරීම.

14. **අධිපඤ්ඤා ධම්මානුපස්සනා** - සංස්කාර අනිත්‍ය-දුක්ඛ-ශූන්‍ය බව විනිවිද දකිමින්, සාරාදාභිනිවේශය (සංස්කාර සාරවත් දෙයක් ලෙස ගෙන අභිනිවේශ කරමින් උපාදාන කිරීම) අත හැරීම.

15. **යථාභූතඤාණදස්සනානුපස්සනා** - සංස්කාරයන්ගේ ඇත්ත ඇති සැටියෙන් ම යථා තත්ත්වය දකිමින් සම්මෝහාභිනිවේශය (මුලා වී සංස්කාර අභිනිවේශ කර ආදානය කිරීම) අත හැරීම.

16 **ආදීනවානුපස්සනා** - සංස්කාරයන් ගේ ආදීනවයන් මැනවින් දැක, ආලයාභිනිවේශය (සංස්කාර කෙරෙහි ආලයෙන් බැඳී අභිනිවේශ කිරීම) අත හැරීම.

17 **පටිසඞ්ඛානුපස්සනා** - සංස්කාරයන් ගෙන් මිදීමට අනිත්‍ය-අනාත්ම ලෙසින් දැක අත හැරීම හැර අන් උපායක් නැතැයි දකිමින් අප්පටිසඞ්ඛය (වැරදි උපායන්) අත හැරීම.

18. **විවට්ටානුපස්සනා** - මුළු විශ්වයේ ම සකල සංස්කාරයන් ම අනිත්‍ය-දුක්ඛ-අනාත්ම ලෙස දකිමින් සංයෝගාභිනිවේශය (සසරෙහි බැඳ තබන සංයෝජන ධර්මයන් අභිනිවේශ කිරීමේ අවිද්‍යාව) අත හැරීම.